අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி, உயர்கல்வி தொழிற் கல்வி அமைச்சு

Ministry of Education, Higher Education and Vocational Education

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

## வருடாந்த செயல்திறன் அறிக்கை

# Annual Performance Report

# 2024



**වෙළුම I - සාමාන්‍ය අධ්‍යාපනය**

இதழ் I - பொதுக் கல்வி

**Volume I - General Education**

## වෙළුම් පෙළගැස්ම

| | | |
|---|---|---|
| වෙළුම I | - | සාමාන්‍ය අධ්‍යාපනය |
| වෙළුම II | - | උසස් අධ්‍යාපනය |
| වෙළුම III | - | වෘත්තීය අධ්‍යාපනය |

## இதழ்களின் ஒழுங்கமைப்பு

| | | |
|---|---|---|
| இதழ் I | - | பொதுக் கல்வி |
| இதழ் II | - | உயர் கல்வி |
| இதழ் III | - | தொழிற் கல்வி |

## Series of volumes

| | | |
|---|---|---|
| **Volume I** | - | **General Education** |
| **Volume II** | - | **Higher Education** |
| **Volume III** | - | **Vocational Education** |

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

## අධ්‍යාපන අමාත්‍යාංශය
## වැය ශීර්ෂය - 126

**- සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය -**

**රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020හි 12.2 ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.**

**2025 ජුනි**

**නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව**
**සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**ඉසුරුපාය,**
**බත්තරමුල්ල.**

CM 42604 - 50 (2025/07) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2024.12.31 දිනට)

### අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය

ආචාර්ය හරිනි අමරසූරිය මැතිණිය

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය**
මධුර සෙනෙවිරත්න මැතිතුමා

**වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය**
නලින් හේවගේ මැතිතුමා

### ලේකම්

නාලක කලුවැව මයා

**පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් ප්‍රධාන අංශ හා නිලධාරීන්**

අතිරේක ලේකම් (පාලන) රා. ආ. - ඒ. ජේ. එස්. එස්. එදිරිසූරිය මයා

අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා) - ආර්. බී. ගන්කේවල මිය

අතිරේක ලේකම් (විනය හා විමර්ශන) - සී. සමන්ති වීරසිංහ මිය

අතිරේක ලේකම් ( ආයතන ) - ඒ. ජේ. එස්. එස්. එදිරිසූරිය මයා

අතිරේක ලේකම් (ප්‍රසම්පාදන හා ඉදිකිරීම් ) - එස්. ඩී. ලියනගේ මිය

අතිරේක ලේකම් (පාලන-පිරිවෙන් අධ්‍යාපන අංශය) - පී. එල්. පත්මකුමාර මයා

අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) රා. ආ. - එම්. ඒ. වාසනා සුරංගි එදිරිසූරිය මිය

අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන) - යූ. ටී. දික්කුඹුර මිය

අතිරේක ලේකම් (පාසල් කටයුතු ) - පී. ආර්. කාරියවසම් මිය

අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන) රා. ආ. - එම්. ඒ. වාසනා සුරංගි එදිරිසූරිය මිය

අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) - එන්. ඒ. හඳුන්පතිරණ මහතා

අතිරේක ලේකම් (විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන) - පී. සී. කේ. පිරිස්යාල මිය

අතිරේක ලේකම් (පිරිවෙන් අධ්‍යාපන සංවර්ධන) - නාලක පෙරේරා මයා

අතිරේක ලේකම් (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ) රා. ආ. - එම්. ඒ. වාසනා සුරංගි එදිරිසූරිය මිය

අතිරේක ලේකම් (ඉංජිනේරු) - ආර්. එම්. එල්. ඩී. බණ්ඩාර මිය

අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - ආර්. එන්. දොඩම්පේ ගමගේ මිය

ප්‍රධාන මූල්‍ය නිලධාරී I - ඒ. එස්. ඩී. අලුත්ගේ මිය

ප්‍රධාන මූල්‍ය නිලධාරී II - ආර්. පී.පී. අබේකෝන් මිය

ප්‍රධාන අභ්‍යන්තර විගණක - ටී. සී. පී.ප්‍රනාන්දු මිය

## පටුන


**01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

| | | |
|---|---|---|
| **1.1** | හැඳින්වීම | **01** |
| **1.2** | ආයතනයේ දැක්ම, මෙහෙවර, විෂයපථය හා ආයතනයේ අරමුණු | **02** |
| **1.3** | ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් | **03** |
| **1.4** | අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය | **06** |
| **1.5** | අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන | **07** |
| **1.6** | විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු | **09** |

**02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

| | | |
|---|---|---|
| **2.1** | විශේෂ ජයග්‍රහණ හා ළඟා කර ගත් ප්‍රගතිය | **13** |
| **2.2** | පවත්නා අභියෝග | **76** |
| **2.3** | ඉදිරි ඉලක්ක | **77** |

**03 පරිච්ඡේදය - මූල්‍ය කාර්යසාධනය**

| | | |
|---|---|---|
| **3.1** | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | **83** |
| **3.2** | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | **84** |
| **3.3** | මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය | **85** |
| **3.4** | මූල්‍ය ප්‍රකාශ සටහන් | **87** |
| **3.5** | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | **88** |
| **3.6** | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය | **88** |
| **3.7** | මු.රෙ.**208** ප්‍රකාර ව වෙනත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | **89** |
| **3.8** | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය | **90** |
| **3.9** | විගණකාධිපතිවරයාගේ වාර්තාව | **91** |

**04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක**

| | | |
|---|---|---|
| **4.1** | ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | **128** |

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය**

| | | |
|---|---|---|
| **5.1** | හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු | **134** |
| **5.2** | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | **138** |

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**

| | | |
|---|---|---|
| **6.1** | සේවක සංඛ්‍යා කළමනාකරණය | **139** |
| **6.2** | ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම | **139** |
| **6.3** | මානව සම්පත් සංවර්ධනය | **142** |

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව**

| | | |
|---|---|---|
| **7.1** | අනුකූලතා වාර්තාව | **198** |

# 01. පරිච්ඡේදය
# ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

අධ්‍යාපනයේ නව යුගය සංලක්ෂිත වන්නේ, ප්‍රමිතිගත, අන්තර්ගතය කේන්ද්‍ර කර ගත් ප්‍රවේශයක සිට, වේගයෙන් වෙනස් වන අනාගත අභියෝග සඳහා සිසුන් සූදානම් කිරීම සඳහා නිර්මාණය කර ඇති පුද්ගලාරෝපිත, කුසලතා මත පදනම් වූ ඉගෙනීම වෙත මූලික ව මාරු වීමෙනි. තාක්ෂණික ත්වරණය, ගෝලීය අන්තර් සම්බන්ධිතභාවය සහ අවිනිශ්චිත අනාගතයකට අනුවර්තනය වීමේ අවශ්‍යතාව මගින් අර්ථ දක්වා ඇති නූතන ලෝකයට අධ්‍යාපනයේ ප්‍රතිචාරය ලෙස නම්‍යශීලී ඉගෙනුම් කාලසටහන්, ව්‍යාපෘති පාදක සහ අන්තර් විෂය ඉගෙනුම් පරිසරයන් තුළ පහසුකම් සපයන්නන් සහ උපදේශකයින් බවට පරිණාමනය වන ගුරුවරුන් ආදි නව ඉගෙනුම් ආකෘති නිර්මාණය කිරීමේ අභියෝගය ද අප හමුවේ පවතී. නව්‍ය තාක්‍ෂණික භාවිත, විවේචනාත්මක චින්තනය, ඩිජිටල් සාක්ෂරතාව, සමාජ චිත්තවේගීය කුසලතා සහ ව්‍යවසායක නිර්මාණශීලීත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙන ගෝලීය පුරවැසිභාවය ගොඩ නැංවීම සඳහා ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය මෙහෙයවීම පැවරී ඇත්තේ අධ්‍යාපන අමාත්‍යාංශයටයි.

එකී වගකීමට අනුරූප ව අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ප්‍රධාන කාර්යභාරය ලෙස 2030 තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට දැනුමෙන් හා වෘත්තීයභාවයෙන් සන්නද්ධ මානව සම්පත සවිබල ගැන්වීම, ගෝලීය පුරවැසියන් නිර්මාණය ඉලක්ක කර ගත් නව විෂය මාලා සහ ඉගෙනුම් ද්‍රව්‍ය ප්‍රවර්ධනය, ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් උදෙසා ආරක්ෂිත, නවීන හා උසස් තාක්ෂණික පරිසර හිතකාමී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අධ්‍යාපනයේ සම ප්‍රවේශය තහවුරු කිරීම පිණිස සුභසාධන වැඩසටහන් ඵලදායී ව හා තිරසර ව ක්‍රියාත්මක කිරීම, සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් හා අධ්‍යාපන සාධන මට්ටම් ඉහළ නැංවීමට අවශ්‍ය ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම මෙන් ම, පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම ආදිය ප්‍රමුඛ ව හඳුනා ගත හැකි ය.

මේ වාර්තාව සම්පාදනය කරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය මෙන් ම ඊට අනුබද්ධ ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, උසස් අධ්‍යාපන අංශය, වෘත්තීය අධ්‍යාපන අංශය ආදි සියලු ම අනුබද්ධිත ආයතන හා දෙපාර්තමේන්තු විසින් 2024 වර්ෂයේ සිදු කරන ලද කාර්යභාරය පසු විපරම් කරමින් ඒවායේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම උදෙසා ය.

2022.07.22 දිනැති ගැසට් නිවේදනයට අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය හා අනුබද්ධ ආයතන පිළිබඳ විස්තර 1.3 හා 1.5 ඡේදවලින් දක්වා ඇත.

මෙම කාර්යසාධන වාර්තාව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්තමාන තත්ත්වය, අනාගත ගමන්මඟ හා දිශානතිය පිළිබිඹු කරන සුවිශේෂ ප්‍රකාශනයක් ලෙස හැඳින්විය හැකි ය.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, විෂයපථය හා ආයතනයේ අරමුණු

දැක්ම

ශ්‍රී ලාංකේය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් බිහි කර එමගින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම

මෙහෙවර

පාර්ශ්වකරුවන් තෘප්තිමත්භාවයට පත් වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මක තත්ත්වයන් සාක්ෂාත් වන පරිදි නවීකෘත අධ්‍යාපන ප්‍රවේශයන් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට අනුගත විය හැකි දක්ෂ පුරවැසි පිරිසක් බිහි කිරීම

විෂය පථය

ජාතික ප්‍රතිපත්ති මත පිහිටා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අංශ සම්බන්ධ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, කාර්යක්ෂම හා මහජන හිතකාමී අයුරින් රාජ්‍ය සේවා සැපයීම සහතික කිරීම සහ නාස්තිය සහ දූෂණය පිටුදැකීම සඳහා පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම, මුල් ළමාවියේ සිට උසස් අධ්‍යාපනය දක්වා ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඇතුළු සියලු ම දරුවන්ට බාධාවකින් තොර අධ්‍යාපනයට ප්‍රවේශ වීම සහතික කිරීම, වෘත්තීය හා තාක්‍ෂණික අධ්‍යාපනය ප්‍රවර්ධනය, තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දූරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම, පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා සහාය වීම, ජාතික පාසල් අධීක්‍ෂණය, පුද්ගලික සහ ජාත්‍යන්තර පාසල් නියාමනය, රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය හා අධ්‍යාපන ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, රැකියා වෙළෙඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා වෘත්තීය අධ්‍යාපනය නවීකරණය, බෞද්ධ හා පාලි අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම ආදිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ.

ආයතනයේ අරමුණු

වර්තමාන රජය විසින් ඉදිරිපත් කරන ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ යටතේ දේශයේ සංවර්ධන ක්‍රියාදාමයේ දී අධ්‍යාපනයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ.

ඒ අනුව පහත සඳහන් සුවිශේෂ අරමුණු ළඟා කර ගැනීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරමින් පවතී.

- නිදහස් අධ්‍යාපනය හා සම ප්‍රවේශය
- මානව සංවර්ධනයට සහ සේවා නියුක්තියට අදාළතාව
- සියල්ලන්ට ම පිළිගත හැකි බව
- සමාජයට වග වන පුරවැසියන්
- තිරසර බව හා නවෝත්පාදනය
- යාවජීව අධ්‍යාපනය

## 1.3 ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්ති මත පිහිටා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශ විෂයය පථයට අයත් වන මහජන සේවා කාර්යක්ෂම ව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
- පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික අංශ අතර මනා සම්බන්ධතාවක් ඇති වන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ගෝලීය අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ශ්‍රී ලාංකික ළමා හා යෞවන පරපුරට ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම
- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම
- පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම
- සෑම දරුවෙකුට ම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහතික කිරීම
- ජාතික ආර්ථිකයට සාධනීය දායකත්වයක් සහ ක්‍රියාශීලී ව සාමාජීය වගකීම් ඉටු කළ හැකි පුරවැසියන් බවට පත්කිරීමෙහිලා දරුවන් සූදානම් කරවීමට පාසල් තුළ විෂයය බාහිර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම
- ජාතික පාසැල් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම
- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල ව ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසැල් නියාමනය කිරීම
- අධ්‍යාපනයේ ගුණාත්මක භාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම
- විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම
- ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන සහ අනෙකුත් අධ්‍යාපන සේවාවන්වල පිරිස් කළමනාකරණ කටයුතු

- පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය
- පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- සියලු පාසැල්වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පංති කාමර, ගුරුවරුන්ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියලු භෞතික පහසුකම් දියුණු කිරීම
- ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නූතන තාක්ෂණික පහසුකම් යොදා ගැනීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය
- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- අධ්‍යාපන සුදුසුකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථා ඇති කිරීම
- දේශීය හා විදේශීය රැකියා වෙළඳ පොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම
- පාසල් අධ්‍යාපනය හැර යාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම
- යෝග්‍ය වෘත්තීය පුහුණු ආයතන තාක්ෂණවේදී උපාධි පිරිනමන ආයතන බවට පත් කිරීම
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූප ව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම
- වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුළත් කරමින් විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම
- ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මගින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම
- 10 වසර සිට 13 වසර දක්වා වෘත්තීය අධ්‍යාපන ධාරාව හඳුන්වා දීම හරහා විවිධ කාර්මික ක්ෂේත්‍රවල සේවය කිරීමට සිසුන් සූදානම් කිරීම
- හෙද පාසැල්, ජාතික හෙද විශ්වවිද්‍යාලයක් වෙත ඒකාබද්ධ කිරීම
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම
- විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- නව සොයා ගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙලඹවීම
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිපාලනයට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය සහ සංවර්ධනය කිරීම
- විශ්වවිද්‍යාල වෙත ඇතුළත් කර ගැනීමේ දී පවතින ප්‍රමාදයන් තුරන් කිරීම

- තෘතීයික අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම
- පශ්චාත් උපාධි අධ්‍යාපන සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සැපයීම
- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව අන්තර් ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමග අනුබද්ධ වීම හා සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම
- උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ග පුළුල් කිරීම සඳහා යෝග්‍ය නිර්ණායක හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම සඳහා සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂය මාලා සංශෝධනය කිරීම
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම
- ශ්‍රී ලංකාවේ සුදුසුකම් සහිත සිසුන්ට ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ වීමට හැකි වන ලෙස ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය සහ ප්‍රතීතනය කිරීම
- බෞද්ධ හා පාලි අධ්‍යාපනය ඉහළ නැංවීම සහ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම
- ගෝලීය අවශ්‍යතාවට ගැළපෙන පරිදි සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය ම ආවරණය වන ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
- තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දූරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම
- ඵලදායි ඉගැනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම හා ඔවුන්ගේ කුසලතා සංවර්ධනය
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතනවල පැවරී ඇති අනෙකුත් සියලු ම විෂයයන්ට අදාළ කටයුතු
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් සියලු ම ආයතන අධීක්ෂණය කිරීම

## 1.4 අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය (2024.12.31 දිනට අනුමත)

### Organizational Structure of the Ministry of Education, Higher Education and Vocational Education (as at 31.12.2024)



## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන

1. විභාග දෙපාර්තමේන්තුව
2. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
4. ගුරු විද්‍යාල
5. යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව
6. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
7. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව
8. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල
9. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
10. ජාතික අධ්‍යාපන ආයතනය
11. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය
12. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා අනුබද්ධ ආයතන
13. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
14. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
15. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)
16. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
17. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීම් අධිකාරිය
18. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
19. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
20. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
21. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

22. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු රාජ්‍ය විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන

23. බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය

24. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

25. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

26. දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය (SACTD)

**(මූලාශ්‍රය : 2024.11.25 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය)**

## 1.6 විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු - මහා පරිමාණ/විදේශ අරමුදල් ව්‍යාපෘති සාරාංශය

| | ව්‍යාපෘතිය | අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන වෙන් කිරීම (2024) | කාලසීමාව | භෞතික ප්‍රගතිය (2024) |
|---|---|---|---|---|---|
| 1 | තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සහ ගුරු පුහුණු පද්ධතිය ස්ථාපිත කිරීම.(KOICA ව්‍යාපෘතිය) | KOICA/ GOSL | රු.මි. **2620.00** | 2017-2025 | **96 %** |
| 2 | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා වන ජාතික හා පළාත් සම්පත් මධ්‍යස්ථානය | CF | රු.මි. **73.00** | 2015-2024 | 95% |
| 3 | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා වන අන්තර්කරණ අධ්‍යාපන සංවර්ධනය කිරීම | JICA / GOSL | රු.මි. **20.00** | 2019-2024 | 100 % |
| 4 | ද්විතීයික අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම (ICT Hub) | EDCF/GOSL | රු.මි. **1100.00** | 2019-2026 | 0.5% |
| 5 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) | ලෝක බැංකුව | රු.මි. **2000.00** | 2018-2025 | 88% |
| 6 | තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන | OFID/GOSL | | 2018-2024 | 79% |
| 7 | ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) | ADB | රු.මි. **1410.00** | 2021-2026 | 53.5% |
| 8 | බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත ජාතික පාසල පොළොන්නරුව ඉදිකිරීම | ඉන්දියානු අරමුදල් | රු.මි. **100** | 2017-2024 | 83% |
| 9 | UNICEF ව්‍යාපෘතිය (පූර්ව ළමාවිය අධ්‍යාපනය, ඩිජිටල් පුරවැසි කුසලතා, ආදිය) | UNICEF | | 2024 | 100% |
| 10 | ඉන්දියානු අරමුදල් යටතේ වතු පාසල් 9ක් වැඩිදියුණු කිරීම | ඉන්දියානු අරමුදල් (Indian Grant) | රු.මි. 236 | **2022 – 2027** | **0%** |

*සැ. යු.* **1.** බොහෝ ව්‍යාපෘති මුල් කාලසීමාවන් දීර්ඝ කර ඇත.

**2.** ප්‍රගතිය පිළිබඳ දත්ත **2024** දෙසැම්බර් **31** දිනට යාවත්කාලීන කර ඇත.

**3.** සමහර ව්‍යාපෘති සඳහා වටිනාකම් පසුව සංශෝධනය කර ඇත.

# සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# 02. පරිච්ඡේදය
# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

අධ්‍යාපන ආංශික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම (2020 - 2025) ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රමයේ සාධාරණත්වය, සමානාත්මතාව, ගුණාත්මකබව, කාර්යක්ෂමබව හා ප්‍රමාණාත්මකබව තහවුරු කිරීමේ අරමුණු පෙරදැරි ව රටෙහි තිරසර සංවර්ධනය ළඟා කර ගැනීම උදෙසා සකස් කර ඇත. තිරසර සංවර්ධන අභිමතාර්ථයන්හි අධ්‍යාපනය නියෝජනය කරන සිව්වන අභිමතාර්ථය ඉටු කර ගැනීමෙහි ලා එමගින් කෙරෙන බලගැන්වීම අතිමහත් ය.

උක්ත ආංශික සංවර්ධන උපායමාර්ගික සැලැස්මෙහි (2020 - 2025) ප්‍රධාන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා ක්ෂේත්‍ර (Thrust Area) හතර සහ ඒ හා සබැඳි සංරචක පහත සටහනෙන් දක්වා ඇත. මූල්‍යකරණ යාන්ත්‍රණය ගොඩ නැංවීම හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඉහළ අවධානයක් යොමු කරමින් පළාත් අධ්‍යාපන අධිකාරීත්වය සමඟ සහසම්බන්ධතාවෙන් යුතු ව මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

ඒ අනුව, සාමාන්‍ය අධ්‍යාපනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ආංශික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම (2020-2025)ට අනුව පහත සඳහන් ප්‍රධාන තේමා 4 යටතේ, විවිධ වූ වැඩසටහන් / ව්‍යාපෘති 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදි.

1. සම සාධාරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම : සෑම දරුවෙකු සඳහා ම සම සාධාරණ ඉගෙනුම් අවස්ථා ලබා දීම
2. සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම
3. සාමාන්‍ය අධ්‍යාපනයේ හිමිකාරීත්වය හා සේවා සැපයීම ශක්තිමත් කිරීම
4. සාක්ෂි මත පදනම් වූ අධ්‍යාපනයේ ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම්කරණය වැඩිදියුණු කිරීම

## අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම - ප්‍රමුඛතා ක්ෂේත්‍ර හා සංරචක

### ප්‍රමුඛතා ක්ෂේත්‍රය 01

සම සාධාරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම : සෑම දරුවෙකු සඳහා ම සම සාධාරණ ඉගෙනුම් අවස්ථා ලබා දීම

- නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තහවුරු කිරීම
- ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සම ප්‍රවේශ අවස්ථා සහ සහභාගීත්වය වැඩි කිරීම
- ආරක්ෂිත හා ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් තහවුරු කිරීම
- ශිෂ්‍යයින්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය ඉහළ නැංවීම
- ක්‍රමවත් වෘත්තීය මාර්ගෝපදේශ හා ශිෂ්‍ය උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### ප්‍රමුඛතා ක්ෂේත්‍රය 02

සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම

- විෂය මාලාව විවිධාංගීකරණය හා නවීකරණය
- ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය කිරීම
- කුසලතා සපිරි මානව ප්‍රාග්ධනයක් බිහි කිරීම සඳහා විද්‍යා, තාක්ෂණ, ගණිත හා ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම
- පරිවර්තීය කුසලතා, මනෝ සමාජීය කුසලතා සාරධර්ම හා ආචාරධර්ම කෙරෙහි නැඹුරු වූ පුළුල් අධ්‍යාපන ප්‍රවේශයක්
- ගුරු සංවර්ධනය ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය
- තක්සේරුකරණය හා ඇගයුම් ක්‍රියාවලිය දියුණු කිරීම
- ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලීන් ප්‍රවර්ධනය
- ශිෂ්‍ය ඉගෙනුම් ඵල ඉහළ නැංවීම : ජාත්‍යන්තර සබඳතා ස්ථාපිත කිරීම

### ප්‍රමුඛතා ක්ෂේත්‍රය 03

සාමාන්‍ය අධ්‍යාපනයේ හිමිකාරීත්වය හා සේවා සැපයීම ශක්තිමත් කිරීම

- පාසල් සුපරීක්ෂණ සේවාව පිහිටුවීම තුළින් අධ්‍යාපනයේ ප්‍රමිතීන් තහවුරු කිරීම
- පාසල් බලගැන්වීම සඳහා පාසල් සංවර්ධන ප්‍රවර්ධන වැඩසටහන හා පාසල් පාදක කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ජාතික, පළාත්, කලාප හා කොට්ඨාස මට්ටමින් කළමනාකරණය හා පරිපාලනය ශක්තිමත් කිරීම
- අධ්‍යාපන සේවාවන්ගේ නිලධාරීන්ගේ වෘත්තීය හැකියා සංවර්ධනය

### ප්‍රමුඛතා ක්ෂේත්‍රය 04

සාක්ෂි මත පදනම් වූ අධ්‍යාපනයේ ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම්කරණය වැඩිදියුණු කිරීම.

- අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, පර්යේෂණ, ප්‍රතිඵලපාදක නියාමනය හා ඇගයීම් ශක්තිමත් කිරීම
- අධ්‍යාපනයේ කාර්යසාධනය සම්බන්ධ මහජනතාව දැනුවත් කිරීම
- ආංශික සබඳතා ස්ථාපිත කිරීම

## 2.1 විශේෂ ජයග්‍රහණ හා ළඟා කර ගත් ප්‍රගතිය

**සම සාධාරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම : සෑම දරුවෙකු සඳහා ම සම සාධාරණ ඉගෙනුම් අවස්ථා ලබා දීම.**

| වැඩසටහන | ආයෝජනය (රුපියල් මිලියන) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| පාසල් නිල ඇඳුම් | * 850,387,966.27<br>** 226,057,497.83 | 4,559,420ක් සිසුන් සඳහා පාසල් නිල ඇඳුම් ලබා දී ඇත. |
| පාසල් පෙළපොත් | 3,936,460 | 1 – 11 ශ්‍රේණිවල සියලු ම සිසුන් සඳහා පාසල් පෙළපොත් ලබා දී ඇත. |

* අමාත්‍යාංශයෙන් කරනු ලැබූ මිල දී ගැනීම් අවශ්‍යතාවෙන් 20% ක වියදම

* චීන රජයෙන් ප්‍රදානයක් වශයෙන් ලැබුණු 80% ක නිල ඇඳුම් රෙදි ප්‍රමාණය නිෂ්කාශනය හා බෙදා හැරීමේ වියදම

| වැඩසටහන / ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය/ වෙන් වී ඇති ප්‍රතිපාදන 2024 රු.මි. | මූල්‍ය ප්‍රගතිය රු.මි. | භෞතික ඉලක්කය (ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව/ ඒකක ප්‍රමාණය) | ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව/ ඒකක ප්‍රමාණය |
|---|---|---|---|---|
| පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ වැඩසටහන | රජයේ අරමුදල් - රු.මි.100 | රජයේ අරමුදල් මගින් වැයකර ඇති මුදල රු. මි. 99.99 | මිලියන 1.5 | මිලියන 1.5 |
| සුරක්ෂා සිසු රක්ෂණ වැඩසටහන | රු.මි.2,000 | රු .මි.1,201.61 | සියලු ම රජයේ පාසල් සිසුන් සඳහා | සිසුන් 2,838ක් සඳහා |
| ප්‍රජනන සෞඛ්‍යය වැඩසටහන (UNFPA) | රු.මි.0.29 | -රු.මි. 0.26 | වැඩසටහන් 01 | විදුහල්පතිවරු 92ක් සඳහා |
| සෞඛ්‍යය ප්‍රවර්ධන වැඩසටහන (GEMP) | රු.මි. 4.00 | රු. මි.1.77 | වැඩසටහන් 08 | පුහුණු කළ ගුරු උපදේශක/ ගුරුවරුන් 471 |
| පාසල් සිසුවියන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන | රු.මි.1,000 | රු.මි. 680.47 | සියලු ම පළාත් පාසල් සහ වතු ජාතික පාසල් 07ක් | සිසුවියන් 609,292 |

<u>ශිෂ්‍යාධාර ප්‍රදාන</u>

| වැඩසටහන | ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිලාභය |
|---|---|---|
| නව නිපැයුම්, සෞන්දර්ය, ක්‍රීඩා යන ක්ෂේත්‍රවල දක්ෂතා දැක්වූ නිපුණයන්ට දෙන සුභග ශිෂ්‍යත්ව | 285<br><br>845 | 25,000 x 285 = රු.7,125,000.00<br><br>25,000 x 845 = රු.21,125,000.00 |
| අඩු ආදායම්ලාභී පවුල්වල 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වලාභීන් සඳහා ශිෂ්‍යාධාර | 125,000 (වසරකට) | 125,000 x 750 x 10 = රු.937,500,000 |
| අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය හදාරන සිසුන් සඳහා ශිෂ්‍යාධාර | 700 | රු.10,500,000.00 |
| අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය හදාරන සිසුවියන්ට සුජාත දියණි ශිෂ්‍යත්ව | 250 | රු. 3,750,000.00 |
| අ.පො.ස. (උසස් පෙළ) අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව | 150 (වසරකට) | මෙම වර්ෂයේ ශිෂ්‍යත්වය ක්‍රියාත්මක වී නැත. |
| අ.පො.ස. (උසස් පෙළ) ගණිත විෂයධාරාවේ සිසුන්ට ඩයලොග් ශිෂ්‍යත්ව | 30 (වසරකට) | රු.75,000.00 |

**2024** වර්ෂයේ දී ආහාර ලබා දීමේ වැඩසටහන යටතේ ආවරණය වන මුළු පාසල් හා සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | 2024 | |
|---|---|---|
| | පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
| බස්නාහිර | 1,154 | 262,359 |
| මධ්‍යම | 1,318 | 185,397 |
| දකුණ | 947 | 174,016 |
| උතුර | 901 | 87,782 |
| නැගෙනහිර | 1,016 | 158,917 |
| වයඹ | 1,119 | 194,371 |
| උතුරුමැද | 731 | 119,931 |
| ඌව | 784 | 112,738 |
| සබරගමුව | 986 | 148,154 |
| මුළු එකතුව | 8,956 | 1,443,665 |

## පාසල් ළමුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම

### පාසල් සිසුන් සඳහා ආහාර ලබා දීමේ වැඩසටහන

පාසල් ආහාර වැඩසටහන සම්බන්ධ ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සකස් කිරීම, උපදෙස් නිකුත් කිරීම, ජාතික මට්ටමේ නියාමනය හා වාර්ෂික ව පාසල් ලේඛන අනුමත කිරීම.

- මේ යටතේ ආහාර සැපයුම්කරුවන් වෙත මුදල් ගෙවීම මේ යටතේ ආහාර සැපයුම්කරුවන් වෙත මුදල් ගෙවීම සඳහා සෘජුව ම පළාත් කාර්යාල වෙත රු.මි. 16,600ක් ලබා දුන් අතර, එම ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත රු.මිලියන 6117.22ක ප්‍රතිපාදන ප්‍රමාණයක් පසුව පළාත් වෙත ලබා දෙන ලදී.
- පාසල් 7,012ක සිසුන් 957,395ක් සඳහා ලෝක ආහාර වැඩසටහන යටතේ ආහාර සැපයුම්කරුවන් වෙත සාමාන්‍ය සහල් මෙට්‍රික් ටොන් 1,249.5ක්, සබලකරණය කරන ලද සහල් මෙට්‍රික් ටොන් 1,698.40ක් හා පරිප්පු මෙට්‍රික් ටොන් 767.25ක් ලබා දී ඇත. මෙහි මූල්‍ය වටිනාකම රු.මි.9,732ක් වන අතර ආහාර ද්‍රව්‍ය අදාළ ස්ථාන වෙත ප්‍රවාහනය වෙනුවෙන් ලෝක ආහාර වැඩසටහන මඟින් රු.මි.22ක් ලබා දී ඇත.
- ලෝක ආහාර වැඩසටහන යටතේ දත්ත පද්ධතියට අදාළ දත්ත නිලධාරීන් පුහුණු කිරීම සඳහා පළාත් 09 වෙත රු. මි. 1,455,622.56ක් ලබා දී ඇත.
- Save the Children ආයතනය මඟින් පාසල් 850ක සිසුන් 97,751ක් වෙනුවෙන් ආහාර සැපයුම්කරුවන් වෙත සබලකරණය කරන ලද සහල් මෙට්‍රික් ටොන් 770ක් පරිප්පු මෙට්‍රික් ටොන් 119.3ක් රෝස සැමන් මෙට්‍රික් ටොන් 5.76 ක්, එළවළු තෙල් මෙට්‍රික් ටොන් 15ක් ලබා දි ඇත. එහි මූල්‍යමය වටිනාකම රු.මි.55.6ක් වේ.
- 306 ජාත්‍යන්තර සිංහ සමාජ මඟින් පාසල් 40ක සිසුන් 2,360ක් වෙනුවෙන් දිවා ආහාරවේල ලබා දේ.

### සුරක්ෂා සිසු රක්ෂණ වැඩසටහන

- සියලු ම රජයේ පාසල්, පිරිවෙන්, උපකෘත විශේෂ පාසල්, රජයේ අනුමත පෞද්ගලික පාසල් සිසුන් මි. 4.1ක් සඳහා සුරක්ෂා සිසු රක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක වේ. 2024 වර්ෂය වෙනුවෙන් රු.මි.2,000ක මුදලක් ප්‍රතිපාදන ලෙස වෙන් වී ඇති අතර එමඟින් 2024 වසර වෙනුවෙන් පාසල් සිසුන් 2,838ක් සඳහා රු .මි. 1,201.61ක මුදලක් වැය කර ඇත.
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනය වෙත 2020 වසර සඳහා රු.මි. 29ක් , 2021/2022 වසර සඳහා රු. මි. 4.4ක් ගෙවා ඇති අතර, 2024/2025 වර්ෂයට අදාළව රු.මි. 1.7ක මුදලක් ප්‍රවාරණය සඳහා ගෙවා ඇත. 2021/2022 වසර සඳහා රු.මි. 67ක මුදලක් ගෙවීමට නියමිත ය.
- 2024/2025 වසර සඳහා රු.මි. 917.1ක් පළමු වාරික මුදල ලෙස ගෙවා ඇති අතර, 2024/2025 වර්ෂයට අදාළ ව රු.මි. 444.3ක් දෙවන වාරික මුදල ලෙස ගෙවීමට නියමිත ය.

### සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන යටතේ සෑම පාසලක්ම නියෝජනය වන පරිදි පාසල් සිසුන්ගේ මානසික සෞඛ්‍ය පිළිබඳව මනා අවබෝධයක් ඇති උපාධ්‍යායවරයෙක් (Mentor) නම් කිරීමේ අරමුණින් සෞඛ්‍ය ප්‍රවර්ධන හා උපදේශනය ගුරු උපදේශකවරු / ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් 04ක් පවත්වන ලදී. මේ යටතේ 2024 වර්ෂය තුළ දී විදුහල්පතිවරු/ගුරු උපදේශකවරු 234 පුහුණු කර ඇත.
- මනෝ සමාජීය යහපැවැත්ම පිළිබඳ පළාත් හා කලාප සෞඛ්‍ය ප්‍රවර්ධන සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පවත්වා නිලධාරීන් 84 දෙනෙකු දැනුවත් කරන ලදී.
- පාසල් ගුරුවරුන් සඳහා බෝ නොවන රෝග හා පිළිකා හඳුනා ගැනීමේ සෞඛ්‍ය සායන දෙකක් ගාල්ල බද්දේගම ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලයේ දී හා ගා/ ඇල්පිටිය ආනන්ද මහා විද්‍යාලයේ දී පවත්වන ලද අතර ගුරුවරු 305 දෙනෙක් සහභාගී වූහ.

සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

- 2024 වර්ෂයේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන සහතිකකරණ වැඩසටහන යටතේ ස්වයං ඇගයීමේ තොරතුරු කැඳවා ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ද සහයෝගයෙන් ජාතික ඇගයීමේ වැඩසටහන සිදුකිරීමට නියමිත ය.
- පාසල් සිසුන්ගේ කායික / මානසික ගැටලු කළමනාකරණය පිළිබඳ විදුහල්පතිවරු / ගුරුවරුන් දැනුවත්විය යුතු කරුණු පිළිබඳව පොත් පිංචක් සැකසීමට අදාළ මූලික පියවර ගෙන ඇත.
- පාසල් සිසුන්ගේ කායික හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ ද ඵලදායී ලෙස පාසල තුළ ක්‍රියාත්මක වීම සම්බන්ධව ගැටලු වාර්තා වී ඇති බැවින් මෙම ගැටලු හඳුනාගනිමින් මෙම වැඩසටහන් සාර්ථකව පාසල් තුළ ක්‍රියාත්මක කළ හැකි ආකාරය අධ්‍යයනය කිරීම සඳහා නියාමන වැඩසටහනක් සිදුකිරීමට මධ්‍යම පළාතේ වලපනේ කලාපය තෝරාගෙන ඇත. එහි පළමු වැඩසටහන 2024.10.10 – 11 දෙදින පාසල් 32ක් සඳහා පවත්වන ලදි.
- ගෝලීය පාසල් සෞඛ්‍ය සමීක්ෂණය සඳහා සමීක්ෂණ කණ්ඩායම් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ පාසල 40 ක ගුරුවරුන් 76 දෙනෙකු පුහුණු කිරීමේ වැඩසටහනක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සංවිධානයෙන් 2024.09.13 දින පවත්වන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝනොවන රෝග ඒකකය සමඟ ඒකාබද්ධව "සෞඛ්‍යවත් ජීවිතයක් පවත්වා ගැනීම පිළිබඳ දීප ව්‍යාප්ත අන්තර් පාඨශාලීය දැනුම මිනුම තරගයට අදාළ කටයුතු අවසන් කර ඇත.

## අපයෝජන නිවාරණ හා ප්‍රජනන සෞඛ්‍යය වැඩසටහන

- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ළමුන් පිළිබඳ කාරක සභාවේ උපදෙස් පරිදි ප්‍රජනන සෞඛ්‍ය හා ලිංගිකත්ව අධ්‍යාපනය පිළිබඳ අමතර කියවීම් පොත් 04 ක් සකස් කර එම පොත්වල e version ඉ තක්සලාවේ පළ කරන ලදී. (මල් වගේ අපි, නව යොවුන්විය ළඟයි, 12+ නව යොවුන් වියට පා තබමු, 14+ අසිරිමත් නව යෞවනය) මෙම පොත් මුද්‍රණය කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් සිටී.
- දරුවන් අපයෝජනය වීම, දරුවන් අපරාධ වලට පෙළඹවීම හා යොමු වීම වැළැක්වීම සඳහා ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය සහ ටීම් හීරෝ කණ්ඩායම විසින් අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව පාසල් මට්ටමින් සිසුන් සහ දෙමාපියන් දැනුවත් කිරීම සඳහා “දරුවන්ට සුබ වසරක්” ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ පාසල් 17 ක සිසුන් 8,196 ක් හා දෙමාපියන් 3,637 ක් 2024.12.31 දින වන විට දැනුවත් කර ඇත.
- 8, 9, 10, 11 ශ්‍රේණිවල සිසුන් දැනුවත් කිරීම සඳහා මඟ හැරුණු පාඩම “ආරක්ෂාවේ පාඩම” ලෙස විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහන ගරු අග්‍රාමාත්‍යතුමියගේ සහභාගීත්වයෙන් නාගානන්ද බෞද්ධ විශ්ව විද්‍යාල ශ්‍රවනාගාරයේ දී 2024.10.01 දින පවත්වන ලදී. ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිසාව සහ ටීම් හීරෝ (Team Hero) කණ්ඩායම අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව පාසල් මට්ටමින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර 2024.12.31 දින වන විට වැඩසටහන් 04ක් පවත්වා සිසුන් 2,000 ක් හා දෙමාපියන් 1.200ක් පමණ දැනුවත් කර ඇත.
- ප්‍රජනන සෞඛ්‍යය වැඩසටහන (UNFPA) යටතේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන මාසයට අදාළව අපයෝජන නිවාරණ හා වයසට ගැලපෙන පරිදි පාසල් සිසුන් වෙත ලිංගිකව අධ්‍යාපනය ලබා දීම පිළිබඳව වලපනේ කලාපයේ විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.

## පාසල් සිසුවියන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන

- සියලුම පළාත් පාසල් සහ වතු ජාතික පාසල් 07ක පාසල් සිසුවියන් 800,000ක් සඳහා රු. 1,200ක් වටිනා තිළිණපත් බෙදාදීම මේ යටතේ සිදු කෙරිණි. එහි පළමු අදියර යටතේ රු. 600ක් වටිනා තිළිණපත් බෙදාදීම 2024.06.10 – 2024.08.23 දින දක්වා සිදු කළ අතර දෙවන අදියර 2024.09.01 – 2024.10.21 දක්වා ක්‍රියාත්මක විය.
- 2024 වර්ෂයේ පාසල් සිසුවියන්ට සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහනට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් වැය කළ මුදල රු .මි. 680.47කි.

**2024 වර්ෂයේ දී ආහාර ලබා දීමේ වැඩසටහන යටතේ ආවරණය වන මුළු පාසල් හා සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ.**

| | 2024 | |
|---|---|---|
| | පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
| බස්නාහිර | 1154 | 262,359 |
| කොළඹ | 331 | 81,895 |
| ගම්පහ | 452 | 108,185 |
| කලුතර | 371 | 72,275 |
| මධ්‍යම | 1318 | 185,397 |
| නුවර | 558 | 91,129 |
| මාතලේ | 264 | 36,492 |
| නුවරඑළිය | 496 | 57,776 |
| දකුණ | 947 | 174,016 |
| ගාල්ල | 357 | 59,871 |
| මාතර | 309 | 56,071 |
| හම්බන්තොට | 281 | 58,074 |
| උතුර | 901 | 87,782 |
| යාපනය | 409 | 42,695 |
| මන්නාරම | 120 | 10,763 |
| වවුනියාව | 163 | 14,716 |
| මුලතිව් | 115 | 9,926 |
| කිලිනොච්චි | 94 | 9,682 |
| නැගෙනහිර | 1016 | 159,388 |
| මඩකලපුව | 558 | 91,348 |
| අම්පාර | 173 | 27,254 |
| ත්‍රිකුණාමලය | 285 | 40,786 |
| වයඹ | 1119 | 194,371 |
| කුරුණෑගල | 795 | 126,726 |
| පුත්තලම | 324 | 67,645 |
| උතුරුමැද | 731 | 118,704 |
| අනුරාධපුරය | 505 | 80,914 |
| පොලොන්නරුව | 226 | 37,790 |
| ඌව | 784 | 108,033 |
| බදුල්ල | 528 | 59,588 |
| මොනරාගල | 256 | 48,445 |
| සබරගමුව | 986 | 148,204 |
| රත්නපුර | 529 | 86,440 |
| කෑගල්ල | 457 | 61,764 |

පාලන අංශය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත්වන පාලන අංශය ශාඛා 15කින් සමන්විත ය. සාමාන්‍ය අධ්‍යාපන අංශය යටතේ සේවයේ නියුක්ත 1421ක් පමණ වන නිලධාරීන්ගේ නිවාඩු, සියලුම වර්ගයේ ණය අනුමත කිරීම, විවිධ දීමනා සහ ගෙවීම් සම්බන්ධ නිර්දේශ සහ අනුමැතීන් ලබා දීම (සන්නිවේදන දීමනා, අතිකාල දීමනා, ගමන් වියදම් දීමනා, නිවාඩු දින වැටුප් දීමනා, සංග්‍රහ දීමනා, ඡායා පිටපත් දීමනා), ඉසුරුපාය පරිශ්‍රයේ නිලධාරීන්ට අමතරව සියලුම ජාතික පාසල්, විද්‍යාපීඨ, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන, රජයේ ගුරු විද්‍යාලවල සේවයේ නියුක්ත කාර්යය මණ්ඩලවල නිලධාරීන්ගේ කෙටි/ දීර්ඝ කාලීන දේශීය හා විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීම, සංශෝධනය කිරීම, අවලංගු කිරීම හා දීර්ඝ කිරීමට අදාළ සියලු කටයුතු, චක්‍රලේඛ අංක නිකුත් කිරීම, රාජකාරී හැඳුනුම්පත්, නිදහස් දුම්රිය බලපත්‍ර සහ තෝරාගත් නිලධාරී කාණ්ඩවල තීරු බදු රහිත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි.

තව ද, ඉසුරුපාය පරිශ්‍රයට අදාළ ආරක්ෂක, සනීපාරක්ෂක, විදුලිය, ජලය, දුරකථන, විදුලි සෝපාන හා වායු සමීකරණ (AC) නඩත්තු කටයුතු, විදුලි ජනක යන්ත්‍රවල නඩත්තු කටයුතු, සියලු ම අලුත්වැඩියාවන් ඇතුළු ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදු කරනු ලබයි. අමාත්‍යාංශයට අදාළ තැපෑල, ශ්‍රවණාගාර පාලනය, මධ්‍යම ලේඛනාගාරය, භාෂා පරිවර්තන ඒකකය, මහජන දින සම්බන්ධීකරණ කටයුතු, අමාත්‍යාංශය සතු නිල නිවාස සම්බන්ධ කටයුතු යනාදිය ද පාලන අංශයට යටතේ වන කර්තව්‍යයන් වේ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ මැතිවරණ කටයුතුවල දී අදාළ සම්බන්ධීකරණයන් මෙන්ම වත්කම් බැරකම් ප්‍රකාශ සම්බන්ධ කටයුතු ද පාලන අංශය මඟින් මෙහෙයවනු ලබයි.

1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල පරිපූරක විධිවිධාන පනත යටතේ වන පාසල්වල, ජාතික පාසල්වල සහ ඉඩම් අත්පත් පනත යටතේ කටයුතු කරනු ලබන පාසල්වල ඉඩම් ගැටලුවලට අදාළව ද මෙම අංශය මඟින් කටයුතු සිදු කරනු ලබයි.

තව ද, අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් මෙන්ම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු යොමු කිරීම, පාර්ලිමේන්තු උපදේශන කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා, අයවැය කාරක සභා සහ ආංශික අධීක්ෂණ කාරක සභා, මානව හිමිකම් කොමිෂන් සභා සහ පාර්ලිමේන්තු කොමසාරිස් සම්බන්ධ රාජකාරීවලට අදාළ සම්බන්ධීකරණ කටයුතු ද පාලන අංශය යටතට අදාළ ය. ඉසුරුපාය පරිශ්‍රයට අයත් සියලු ම වාහන සම්බන්ධයෙන් වන ප්‍රවාහන රාජකාරී කටයුතු ද පාලන අංශයෙන් මෙහෙයවනු ලබයි.

තව ද, 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉදිරිපත්වන තොරතුරු ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම, අභියාචනා සඳහා තොරතුරු කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම, අමාත්‍යාංශය වෙත යොමුවන දුරකථන ඇමතුම් අදාළ අංශ වෙත යොමු කිරීම සහ අදාළ තොරතුරු ක්ෂණික දුරකථන ඇමතුම් පද්ධතිය (Hot Line) ඔස්සේ යොමු කිරීම මෙන්ම සාමාන්‍ය අධ්‍යාපන අංශයට අදාළව යොමුවන සියලුම නීති කෘත්‍යයන්ට අදාළව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම වැනි ඉහත සඳහන් කරනු ලැබූ සියලුම කර්තව්‍යයන්වල වගකීම පාලන අංශය යටතේ පැවරී ඇත.

අංශය යටතේ පවතින ශාඛා :

- සාමාන්‍ය පාලන ශාඛාව
- ගොඩනැගිලි කළමනාකරණ ශාඛාව
- තැපැල් ශාඛාව
- ඉඩම් ශාඛාව
- ප්‍රවාහන ශාඛාව
- ශ්‍රවණාගාරය
- මධ්‍යම ලේඛනාගාරය
- මධ්‍යම පුස්තකාලය
- නිවාඩු සංචිතය
- පාර්ලිමේන්තු කටයුතු ශාඛාව
- නීති අංශය
- ජාතික මෙහෙයුම් මැදිරිය
- RTI තොරතුරු මධ්‍යස්ථානය
- රිසෝග්‍රාෆ් අංශය
- භාෂා පරිවර්තන ඒකකය

2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය :

- රජයේ ප්‍රතිපත්තීන්ට අනුගතවෙමින් ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන එන්ජින් ධාරිතාවය වැඩි වාහන 10 ක් අපහරණයට මෙන්ම, භාවිතයෙන් ඉවත් කරන ලද වාහන 11ක් අපහරණයට ද කටයුතු සම්පාදනය කරන ලදී.
- 2024 වසරට අදාළව ලැබුණු ලිපි ප්‍රමාණය 864,00 කි.
- 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල පරිපූරක විධිවිධාන පනත යටතේ පවරාගත් පාසල් සම්බන්ධ නව දත්ත පද්ධතියක් ස්ථාපිත කරන ලදී.

- අමාත්‍ය මණ්ඩල සංදේශ / සටහන් 94 ක් අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර, පාර්ලිමේන්තු ප්‍රශ්න 44 ක් සඳහා පිළිතුරු සැපයීම, මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලිවලට අදාළ කටයුතු 409 ක්, මහජන පෙත්සම් කාරක සභාව වෙතින් ඉදිරිපත්වන පැමිණිලි සම්බන්ධ කටයුතු 99 ක්, පාර්ලිමේන්තු කොමසාරිස් වෙතින් ඉදිරිපත් වූ පැමිණිලි සම්බන්ධ කටයුතු 10 ක් සහ විවිධ කාරක සභා සම්බන්ධ කටයුතු 88 ක් ඉටු කරන ලදී.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයට අදාළව නඩු කටයුතු 379 ක් සම්බන්ධයෙන් කටයුතු සිදු කරනු ලබයි.
- 2024 වර්ෂය තුළ තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීම් 718 ක් යොමු වූ අතර, ඉන් ඉල්ලීම් 550 ක් සඳහා 2024 වර්ෂය තුළ පිළිතුරු සපයා ඇත.
- ජාතික මෙහෙයුම් මැදිරිය වෙත යොමු වූ දුරකථන විමසීම්/ පැමිණිලි 7012 ක් සඳහා සහ ඉ - තැපැල වෙත යොමු වූ ලිපි 5945 ක් සඳහා ප්‍රතිචාර දක්වා ඇත.
- මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වූ නිලධාරීන්ගේ කෙටි කාලීන/ දීර්ඝ කාලීන විදේශ නිවාඩු 2394 ක් සහ දේශීය නිවාඩු 161 ක් සම්බන්ධයෙන් අනුමත කිරීම, අවලංගු කිරීම, සංශෝධනය කිරීම සහ දීර්ඝ කිරීම සම්බන්ධයෙන් කටයුතු සිදු කර ඇත.
- ඉහත කටයුතුවලට අතිරේකව අමාත්‍යාංශයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් සම්බන්ධයෙන් පාලන අංශය මඟින් දෛනිකව ඉටුකරනු ලබන රාජකාරී හා යටිතල පහසුකම් සැපයීමේ රාජකාරි කාර්යක්ෂමව ඉටු කර ඇත.

## ඒකාබද්ධ සේවා නොවන ශාඛාව

මෙම අංශය, අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා) යටතේ ක්‍රියාත්මක වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත්වීම් ලබා ඇති ජාතික පාසල්,ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානයන්ට අනුයුක්තව සේවය කරනු ලබන අධ්‍යාපන අනධ්‍යයන කාර්ය මණ්ඩලවල බඳවා ගැනීම්, ස්ථාන මාරු කිරීම්, උසස් කිරීම්, විනය පරිපාලන හා විශ්‍රාම ගැන්වීම් ඇතුළු ආයතනික කටයුතු මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

2024 වර්ෂයේ ලබාගත් විශේෂ ජයග්‍රහණ

බඳවා ගැනීම්

බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය යටතේ පුහුණුව ලැබූ පුහුණුලාභීන් 220 දෙනෙකු සඳහා පහත පරිදි ස්ථිර පත්වීම් ලබා දෙන ලදී.

- කාර්ය සහායක - 142
- පාසල් ආරක්ෂක - 36
- සේවා සහායක - සනීපාරක්ෂක - 42

කළමනාකරණ සහකාර තාක්ෂණික (ඛණ්ඩ 2) සේවා ගණයේ සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන තරග විභාගය පවත්වා ඉන් සමත්වූ 47ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත. (සුදුසුකම් ලත් 27 දෙනෙකු සඳහා 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අවසන් වූ පසු පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.)

වාර්ෂික ස්ථාන මාරු

පහත සඳහන් පරිදි අධ්‍යාපන අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරුධාරීන් 1737ක් සඳහා වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරුවීම් ලබා දී ඇත.

| අනු අංකය | තනතුර | ස්ථානමාරු නියෝග සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අරක්කැමි | 82 |
| 2 | කාර්ය සහායක | 383 |
| 3 | ක්‍රීඩා පුහුණුකරු | 158 |
| 4 | තාක්ෂණ පීඨ සහායක | 15 |
| 5 | පාසල් ආරක්ෂක | 154 |
| 6 | පුස්තකාල සහායක | 189 |
| 7 | රසායනාගාර සහායක | 274 |
| 8 | රසායනාගාර සහකාර | 39 |
| 9 | ලේඛන සහකාර | 69 |

| අනු අංකය | තනතුර | ස්ථානමාරු නියෝග සංඛ්‍යාව |
|---|---|---|
| 10 | ශිෂ්‍ය නිවාසාධිකාරී | 21 |
| 11 | මූල්‍ය සහකාර | 17 |
| 12 | සේවා සහායක - සනීපාරක්ෂක | 160 |
| 13 | ජලනල කාර්මික | 04 |
| 14 | උතුරු/ නැගෙනහිර පළාත් වලට අයත් උක්ත තනතුරුධාරීන් | 172 |

එකතුව - 1737

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම

- ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL1) / ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (PL2) සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පළමු විභාගය 2024.02.27 හා 2024.02.28 දින වල අයදුම්කරුවන් 200ක් සඳහා පවත්වන ලදි.
- උක්ත දෙවන විභාගය අරමුණු කරගනිමින් අයදුම්කරුවන් 954 ක් සඳහා 2025 වර්ෂයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම
- ක්‍රීඩා පුහුණුකරු සහ කළමනාකරණ තාක්ෂණික නොවන (MN1) සේවා ගණයට අයත්, ලේඛන සහකාර, සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී යන තනතුරුධාරීන් 3557ක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා ප්‍රතිඵල ලබා දීම අවසන් කිරීම

කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ආයතනික කටයුතු

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල, සම්බන්ධීකරණය කර ගනිමින් සියලු ම ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල සේවය කරන තනතුරුධාරීන්ගේ ආතනික කටයුතු පහත පරිදි ඉටු කරන ලදි.

- පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීම් - 1305
- ශ්‍රේණි උසස් කිරීම් - 965
- විශ්‍රාම ගැන්වීම් - 235
- සේවයෙන් මුදාහැරීම් - 100
- කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීම. – 800ක් පමණ සිදු කර ඇත.

- ♦ දීර්ඝ කාලීනව ගැටලුවක්ව පැවති , පළාත් රාජ්‍ය සේවය යටතේ පත්වීම් ලබා පසුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ජාතික පාසල්හී සේවයට එක්වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලය ජාතික සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය ලබාගැනීම
- ♦ 2019 වර්ෂයේ පුස්තකාල සහායක බඳවා ගැනීම් පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශනය වෙමින් පැවති විමර්ශනය අවසන් වීම.

2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය

(ධාරිතා සංවර්ධන වැඩසටහන් නොවන)

- ♦ අනධ්‍යයන තනතුරුධාරීන් රැසක් නියමිත වේලාවට වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් නොකර ස්ථාන මාරු ක්‍රියාවලිය මඟහැර සිටින බවත් ඒ හේතුවෙන් විශාල අනධ්‍යයන සේවකයින් පිරිසක් අනිවාර්ය ස්ථාන මාරු කාලසීමාව ඉක්මවා ප්‍රියමනාප සේවා ස්ථානවල රැදිසිටින බවත් නිරීක්ෂණය වූ බැවින් කලාප අධ්‍යාපන කාර්යාල මඟින් සියළු අනධ්‍යන කාර්ය්‍ය මණ්ඩල පිළිබඳ තොරතුරු මාර්ගගතව ගෙන්වා ගෙන, අනධ්‍යන තනතුරුධාරීන්ගේ වර්තමාන සේවා ස්ථානය හා එහි සේවා කාලය පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කරන ලදී.එම දත්ත පද්ධතිය හේතුවෙන් 2024 වර්ෂයේ සිදුකරනු ලැබූ වාර්ෂික ස්ථාන මාරු සංඛ්‍යාවේ පහත සඳහන් ආකාරයට 113% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදි.

ඒකාබද්ධ සේවා අංශය

2024 වර්ෂයේ ශාඛාවේ කාර්ය භාරය හා ප්‍රගතිය:

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කර ගනිමින්

- ♦ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ සේවය කරන දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් සියලු ම නිලධාරීන්ගේ, අමාත්‍යාංශගත තනතුරුවල නිලධාරීන්ගේ හා ඒකාබද්ධ සේවය යටතේ වන නිලධාරින්ගේ සියලු ම ආයතනික කටයුතු ඉටු කිරීම.

| | |
|---|---|
| පත් කිරීම් | 07 |
| ස්ථිර කිරීම් | 188 |
| උසස් කිරීම | 10 |
| ශ්‍රේණිගත උසස් වීම් | 377 |
| විශ්‍රාම ගැන්වීම් | 16 |
| ස්ථාන මාරු | 20 |
| ඉල්ලා අස්වීම් | 08 |
| මුදා හැරීම් | 175 |

- අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සියලු ම ජාතික පාසල්, විද්‍යා පීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල සේවයේ නියුතු ඒකාබද්ධ සේවයට අයත් නිලධාරින් සම්බන්ධ හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල ආයතනික කටයුතු සම්බන්ධීකරණය
- අමාත්‍යාංශයේ සේවයේ නියුතු සියලු ම නිලධාරින් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට බඳවා ගැනිම්, ප්‍රතිලාභ අයදුම්පත් යොමු කිරිම හා සම්බන්ධ සියලු රාජකාරී කටයුතු ඉටු කිරිම
- අමාත්‍යාංශය, සියලු ම ජාතික පාසල්, විද්‍යා පීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන හා අනුබද්ධිත ආයතන සඳහා කාර්යය මණ්ඩල තනතුරු අනුමත කර ගැනීම.

<u>2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය</u>

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

  විභාග කොමසාරිස් ජනරාල් ලෙස එච්. ජේ. එම්. සී. ඒ. ජයසුන්දර මහතා කොන්ත්‍රාත් පදනම මත මාස 03ක කාලයක් සඳහා පත් කිරීම.
- ජාතික අධ්‍යාපන ආයතනය

  ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස මහාචාර්ය මංජුලා විභාසිනී විදානපතිරණ මහත්මිය 2024.12.20 දින සිට පත් කිරීම හා ඇයට වැටුප් හා දීමනා ගෙවීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම.
  - ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවට සමාජිකයන් පත් කිරීම.
  - ආයතන සභාවේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට සමාජිකයන් පත් කිරීම.
- රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

  රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති ලෙස ටී.එම්.ඩී.කේ. උජිත බණ්ඩාර මහතා 2024.11.20 දින සිට පත් කිරීම.
- රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම

මීට අමතරව ,

- විවිධ කමිටු සඳහා අමාත්‍යාංශයීය නියෝජිතයන් නම් කර යැවීම.
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CM/08/Vol III හා 2024.02.09 දිනැති ලිපිය මඟින් පුරප්පාඩු පිරවීමට අනුමත කර ඇති මෙම අමාත්‍යාංශයේ පහත සඳහන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු 06 සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අදාළ ගැසට් නිවේදනය ඉදිරියේ දී පළ කිරීමට නියමිත අතර අදාළ බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල කමිටු අනුමැතිය ලබා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.
- 2024 වර්ෂය සඳහා ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදය යටතේ 2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලදි.

| කළමනාකරණ සේවා නිලධාරී සේවය | 184 |
|---|---|
| සංවර්ධන නිලධාරි සේවය | 117 |
| ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය | 38 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 11 |
| කාර්යාල සේවක සේවය | 14 |
| පුස්තකාලයාධිපති සේවය | 01 |

- 2024 වර්ෂය සඳහා වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රමවේදය යටතේ 2025.02.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු ලබා දෙන ලදි.

| කළමනාකරණ සේවා නිලධාරී සේවය | 38 |
|---|---|
| සංවර්ධන නිලධාරි සේවය | 67 |
| ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය | 12 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 6 |
| කාර්යාල සේවක සේවය | 4 |
| පුස්තකාලයාධිපති සේවය | 7 |

- 10. රියදුරු තනතුරු අනුමත නොමැති ජාතික පාසල් 26ක් හා අනුමත තනතුරු සංඛ්‍යාව වැඩිකර ගත යුතු ජාතික පාසල් 02ක් සඳහා ඒකාබද්ධ සේවයේ රියදුරු තනතුරු 31ක් අළුතින් ඇති කිරීමට යෝජනා කර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමට ලිපි යොමු කර ඇත.
- 11. නව ජාතික පාසල් 53ක් සඳහා ඒකාබද්ධ සේවයේ තනතුරු අනුමත කර ගැනීම සඳහා ලිපි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

## විනය හා විමර්ශන

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඒ යටතේ පාලනය වන දිවයින පුරා පිහිටි ජාතික පාසල්, විද්‍යාපීඨ, ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථාන ආදී ආයතනවල සේවය කරන විවිධ සේවාවන්ට අයත් නිලධාරීන් විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ උපදෙස් සංග්‍රහ, මුදල් රෙගුලාසි, අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ, කාර්ය පටිපාටික රීති ආදියට පටහැනිව ක්‍රියා කර ඇති අවස්ථාවන්හි දී. ඒ සම්බන්ධව ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයට අනුව මූලික විමර්ශන සිදු කිරීම සහ විෂමාචාර අනාවරණය වන නිලධාරීන් සම්බන්ධයෙන් විනය බලධරයා වශයෙන් විනයානුකූලව කටයුතු කිරීම සහ විනය බලධරයා නොවන නිලධාරීන් සම්බන්ධයෙන් ඔවුනගේ විනය බලධරයා වෙත තොරතුරු ඉදිරිපත් කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

අංශය යටතේ පවතින ශාඛා

i. විනය ශාඛාව

ii. විමර්ශන ශාඛාව

## ආයතන අංශය

ශ්‍රී ලංකා ගුරු සේවය හා ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය යන සේවාවන් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත රාජකාරී කටයුතු හා මෙරට සිසු දරු දැරියන්ගේ අධ්‍යාපනය නඟා සිටුවීම උදෙසා වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව පවත්වාගෙන යාමට අවශ්‍ය ගුරු අවශ්‍යතා කාලීනව සහ අවස්ථාවන්ට උචිත පරිදි සම්පූර්ණ කිරීමේ කාර්ය භාරය ඵලදායී අයුරින් සිදු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා වැඩිදියුණු කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම හා මෙම ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

අංශය යටතේ පවතින ශාඛා :- ගුරු ආයතන ශාඛාව, ගුරු උපදේශක ශාඛාව සහ ජාතික පාසල් ගුරු මාරු ශාඛාව.

ගුරු ආයතන ශාඛාව - ජාතික පාසල් සේවය සඳහා ගුරු භවතුන් බඳවා ගැනීම හා ඒවායේ සේවය කරන ගුරු භවතුන්ගේ සේවා උසස්වීම්, තාවකාලික හා ස්ථිර මුදාහැරීම්, නැවත සේවයේ පිහිටුවීම්, ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට පත් කිරීම හා ස්ථාන ගත කිරීම ආදී ආයතනික කටයුතු සිදු කිරීම ගුරු ආයතන ශාඛාවේ ප්‍රධාන කාර්යභාරය වේ.

ගුරු ස්ථාන මාරු ශාඛාව

ජාතික පාසල් ගුරු භවතුන් සඳහා

- ගුරු ස්ථාන මාරු නිර්ණායක සකස් කිරීම.
- ජාතික ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තියට අදාළ සංශෝධන සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම

- ජාතික පාසල් ගුරු මාරු ක්‍රියාවලිය සැලසුම් කිරීම
- ජාතික පාසල් ගුරු මාරු මාර්ගතව සිදු කිරීමේ දත්ත පද්ධතිය සැකසීම සඳහා දත්ත කළමණාකරන ශාඛාවේ නිලධාරින් හා සම්බන්ධ වී කටයුතු කිරීම
- ගුරු ස්ථාන මාරු ජාතික පාසල් ගුරුභවතුන්ගේ ඉල්ලීම් සඳහා වාර්ෂික ස්ථාන මාරු හා එකම පාසලේ සේවය කළ හැකි උපරිම සේවා කාලයක් සම්පූර්ණ කළ ගුරුභවතුන්ගේ අනිවාර්යය ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම.
- සුහද ගුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම
- ගුරුභවතුන්ගේ සේවා අවශ්‍යතාවය, පෞද්ගලික දුෂ්කරතා සහ ගර්භණීතාවය වැනි කරුණු මත තාවකාලික අනුයුක්ත කිරීම් ලබා දීම.
- ජාතික පාසල් ගුරුභවතුන් පළාත් රාජ්‍ය සේවයට නිදහස් කිරීම.
- සේවා අවශ්‍යතා මත සහ විමර්ශන නිර්දේශ මත ස්ථාන මාරු සිදු කිරීම.
- ජාතික පාසල් ගුරු ඌනතා අතිරික්තතා හඳුනා ගැනීම හා විධිමත් ගුරු තුලනය සඳහා යාවත්කාලීන මාර්ගගත ක්‍රමයක් හරහා තොරතුරු පවත්වා ගැනීම යනාදී කටයුතු මෙම ශඛාවේ කාර්යභාරය වේ.

ගුරු උපදේශක අංශය

අංක 2182/36 හා 2020.07.01 දිනැති ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාව අනුව සුදුසුකම්ලත් ගුරුවරුන් ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කරන ලද අතර එම ගුරු උපදේශකවරුන් සම්බන්ධ ආයතන කටයුතු හා නව බඳවාගැනීම් සම්බන්ධ කටයුතු කිරීම සඳහා 2023.07.06 දින ගුරු උපදේශක අංශය ස්ථාපනය කරන ලදී.

ගුරු ආයතන අංශය

| තනතුර | ජාතික පාසල් | පළාත් පාසල් | එකතුව |
|---|---|---|---|
| 2018-2020 ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 -1 (ආ) ශ්‍රේණියට බඳවාගැනීම - 2024.04.01 | 312 | 8 | 320 |
| විදේශ භාෂාවන් සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - 1 (අ) ශ්‍රේණියට බඳවාගැනීම - 2024.02.05 | 163 | 0 | 163 |
| සංවර්ධන නිලධාරී අභ්‍යාසලාභී භික්ෂූන් වහන්සේලා ගුරු සේවයට බඳවාගැනීම | 8 | 0 | 8 |
| අ.පො.ස.(උසස්පෙළ ) විද්‍යාව හා තාක්ෂණවේදය, විදේශ භාෂා හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වන විෂයන් සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 -1 (අ) ශ්‍රේණියට බඳවාගැනීම - 2024.07.08 | 1706 | 0 | 1706 |
| ජාතික හා පළාත් පාසල්වල ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 -1 (ඇ) ශ්‍රේණියට බඳවාගැනීම - 2024.07.08 | 106 | 321 | 427 |
| එකතුව | 2295 | 329 | 2624 |

## ප්‍රසම්පාදන අංශය

අමාත්‍යාංශයේ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරිම සහ පාසල් සිසුන් සඳහා රජය මගින් ලබාදෙන සහනාධාර වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.

අංශය යටතේ පවතින ශාඛා - 01. ප්‍රසම්පාදන ශාඛාව
02. පාසල් සැපයීම් ශාඛාව

**2024 වර්ෂයේ ලබාගත් විශේෂ ජයග්‍රහණ**

පාසල් සිසුන් වෙත ලබා දෙන සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා ජංගම දූරකතන/පරිගණක මෘදුකාංගයක් හඳුන්වාදීම

**2024 ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන් වල ප්‍රගතිය**

පාසල් සිසුවියන් හට සනීපාරක්ෂක තුවා මිලදී ගැනීම සඳහා වවුචරයක් ලබාදීම හා එම වැඩසටහන ජංගම දූරකතන/පරිගණක මෘදුකාංගයක් මගින් ක්‍රියාත්මක කිරිම

<u>2024 වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සාරාංශය</u>

ප්‍රධාන ව්‍යාපෘති කාණ්ඩ අනුව

- ප්‍රධාන සම්පූර්ණ කළ ව්‍යාපෘති (රු.මි. 100ට වැඩි)
  - පාසල් නිල ඇඳුම් රෙදි චීන සමූහාණ්ඩුවෙන් ප්‍රදානයක් ලෙස ලබා දෙන ලදි.
  - පාසල් 1000ක් සඳහා ස්මාර්ට් පන්ති කාමර විසඳුම් (රු.මි. 1,600) - 80%
  - පාසල් සපත්තු වවුචර් (රු.මි. 1,500) - අවලංගු කරන ලදී★
  - පාසල් දැරියන් සඳහා සනීපාරක්ෂක තුවා (රු.මි. 960) - 100% සම්පූර්ණයි.
  - ප්‍රාථමික අංශ සඳහා සිසු ඩෙස්ක් හා පුටු (රු.මි. 134.8) - 95%

- ප්‍රධාන ක්‍රියාත්මක යටිතල පහසුකම් ව්‍යාපෘති (Key Ongoing Infrastructure Projects)
  - ඊ-තක්සලාව සඳහා Server පහසුකම් (රු.මි. 260) - සම්පූර්ණයි.
  - PABX දූරකථන පද්ධතිය (රු.මි. 34) - 30% සම්පූර්ණයි.
  - CCTV කැමරා පද්ධතිය (රු.මි. 4) - 10% සම්පූර්ණයි.
  - සූර්ය බල පැනල පද්ධති (විවිධ ස්ථානවල) - විවිධ අදියරයන්හි පවතී.

- ප්‍රධාන අධ්‍යාපනික මූලාරම්භයන් (Major Educational Initiatives)
  - තාක්ෂණික නවීකරණ විද්‍යාගාර උපකරණ (රු.මි. 83.06) - 95% සම්පූර්ණයි.
  - ජෛව පද්ධති තාක්ෂණ උපකරණ (රු.මි. 60) - 95% සම්පූර්ණයි.
  - පිරිවෙන් සඳහා ලැප්ටොප් හා උපකරණ (රු.මි. 400) - 95%සම්පූර්ණයි.
  - ගුරු පුහුණු පද්ධති ගෘහ භාණ්ඩ (KOICA) (රු.මි. 19.28) - 95% සම්පූර්ණයි.

- සැලකිය යුතු සේවාවන් (Notable Services)

  ශිෂ්‍ය රක්ෂණය (සුරක්ෂා) (රු.මි. 7112.3) - සම්පූර්ණයි.(වසර 3ක් සඳහා ගිවිසුම්ගත වී ඇත)

  ආරක්ෂක සේවා (රු.මි. 50) - සම්පූර්ණයි.

  සනීපාරක්ෂක සේවා (රු.මි. 40) - සම්පූර්ණයි.

  ගොඩනැගිලි නඩත්තුව (රු.මි. 30) - 65% සම්පූර්ණයි.

  අරමුදල් මූලාශ්‍ර : CF (ඒකාබද්ධ අරමුදල) , KOICA,GEMP(සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය) , TRC, SESIP (ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන ව්‍යාපෘතිය), UNESCO

## පිරිවෙන් අධ්‍යාපන අංශය

පිරිවෙන් අධ්‍යාපන අංශය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර, දිවයින පුරා පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම සඳහා ප්‍රධාන වගකීමක් ඉටු කරයි. මෙය සාම්ප්‍රදායික බෞද්ධ පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය රැක ගැනීමත් සමඟ, නූතන අධ්‍යාපන මාර්ගෝපදේශ හා ජාතික සංවර්ධන ඉලක්කවලට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වේ.

අංශය තුළ ඇති ශාඛා

- පාලන ශාඛාව – කාර්ය මණ්ඩලය, ශිෂ්‍ය කටයුතු සහ පිරිවෙන්වල සාමාන්‍ය මෙහෙයුම් කළමනාකරණය
- පිරිවෙන් අධ්‍යාපන ශාඛාව – පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව අධ්‍යයනය පිළිබඳ අධීක්ෂණය හා විධිමත් කිරීම
- සංවර්ධන ශාඛාව – පිරිවෙන්වල පවතින සංවර්ධන ව්‍යාපෘති, පුහුණු වැඩසටහන්, මාර්ගෝපදේශ සහ සැලසුම් සැකසීම, ක්‍රියාවට නැංවීම හා නියාමනය කිරීම
- ගිණුම් ශාඛාව – මූල්‍ය කළමනාකරණය, අරමුදල් බෙදාහැරීම හා වියදම් පාලනය

2024 වසර ළඟා කර ගත් ඉලක්ක

- රු. මිලියන 70ක් වෙන් කරමින් පිරිවෙන් 175ක නවීකරණය සාර්ථකව සිදුකෙරිණි.
- ගුරු වැටුප් හා ශිෂ්‍යාධාර දීම.
- රු. මිලියන 2ක් ආයෝජනය කරමින් පිරිවෙන් දත්ත කළමනාකරණ පද්ධතිය (PDMS) ආරම්භ කිරීම.
- ගුරු කාර්ය දර්ශකය සහ වෘත්තීය උපදෙස් සංග්‍රහය සහ පන්ති කළමනාකරණ පොත මුද්‍රණය.
- ගුරුවරුන්ට සහ කාර්ය මණ්ඩලයට පුහුණු වැඩසටහන් සඳහා රු. මිලියන 3.3ක් වෙන්කළ අතර, මෙය සාර්ථකව ක්‍රියාත්මක විය.
- රු. මිලියන 16ක් වෙන් කරමින් ඩෙස් හා පුටු ලබා දීම.
- කාර්ය මණ්ඩලය සඳහා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සහ නඩත්තු කිරීම.

තාක්ෂණ අමාත්‍යාංශයෙන් ලැබුණු රු. මිලියන 400ක් යටතේ පිරිවෙන් 342කට ඩිජිටල් උපකරණ බෙදාදීම. (Smart Board 65”, Desktop, Laptop, Printer, UPS, ආදිය)

මූල්‍යමය ප්‍රගතිය

| ව්‍යාපෘතිය | වෙන්කළ මුදල (රු. මිලියන) | වියදම් (රු. මිලියන) | ශේෂය | ප්‍රගතිය % |
|---|---|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශය | 26.789 | 22.271 | 4.518 | 83.13% |
| සාමාන්‍ය පරිපාලන | 269.4 | 262.522 | 6.878 | 97.44% |
| ප්‍රතිවාර වියදම් | 6,717.6 | 6,654.5 | 63.1 | 99.06% |
| මූල්‍ය ආධාර | 167.6 | 156.66 | 10.94 | 93.47% |
| මුළු වියදම | **7,181.38** | **7,095.95** | **85.236** | **98.81%** |

**2025 වසර සඳහා ප්‍රධාන ඉලක්ක**

- ♦ මූල්‍ය ආධාර කාලානුකූලව ලබාදීම
  - සියළු වැටුප් සහ දීමනා 100% කාලානුකූලව ලබාදීම
  - කාර්ය මණ්ඩලය රැඳී සිටීම 90% ඉක්මවීම
  - සියලුම සුදුසුකම් ලත් ශිෂ්‍යයන්ට ශිෂ්‍යාධාර ලබාදීම
- ♦ පිරිවෙන් අධීක්ෂණය හා තත්ත්ව සහතික කිරීම
  - ක්ෂේත්‍ර අධීක්ෂණ 25%කින් වර්ධනය කිරීම
  - අධීක්ෂණ වාර්තා නිර්දේශ 3 මස ඇතුළත ක්‍රියාත්මක කිරීම
  - 100% පිරිවෙන් ආවරණය සහ අනුකූලතාව පරීක්ෂාව
- ♦ අධ්‍යාපන සම්පත් ප්‍රවේශය ව්‍යාප්ත කිරීම
  - ආධාර ලැබෙන ආයතන 275ට අධ්‍යාපන උපකරණ බෙදාදීම
  - ප්‍රාචීන අධ්‍යාපන පොත් ආයතන 60 කට වඩා බෙදාදීම
  - 3,500 සම්භාෂා සඟරා මුද්‍රණය
- ♦ ශිෂ්‍ය සන්නිවේදන හා උපකාර වැඩිදියුණු කිරීම
  - සපත්තු වවුචර් ලබාදීම සිසුන් 33000 ක් ලෙස ඉහළ දැමීම
  - 95% වවුචර් භාවිතය
  - ශිෂ්‍ය ආධාර 100% වසර මැදට පෙර ලබාදීම
- ♦ දෙමළ භාෂා දක්ෂතා වැඩිදියුණු කිරීම
  - දෙමළ ගුරු 50කට වැඩි පිරිසක් බඳවාගැනීම.
  - දෙමළ විභාගය සමත් අනුපාතය 15%කින් වැඩි කිරීම.

- ගුරු පුහුණු වැඩසටහන් සහ ඉගැන්වීම් තත්ත්වය වර්ධනය
  - පිරිවෙන් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩ සටහන හා විෂය සංවර්ධන වැඩසටහන් 50කට වඩා පැවැත්වීම.
  - ඉගැන්වීමේ තත්ත්වය 20%කින් වැඩිවීම
  - මාණ්ඩලික නිලධාරීන් Laptop ලබාදීම සහ පුහුණු කිරීම
- සිසුන්ගේ මූලික පහසුකම් සංවර්ධනය
  - ශිෂ්‍ය 825 කට ආදර්ශ මූලික පහසුකම් කට්ටල ලබාදීම
  - පහසු හා සුවදායි ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම
- ශිෂ්‍ය පුහුණු මඟින් ආකල්ප සංවර්ධනය
  - ශිෂ්‍යයන් සඳහා පුහුණු වැඩසටහන් 100+.
  - 80%කට වඩා ආකල්ප සහ හැසිරීම්වල වැඩිදියුණු වීම
- විෂය නිර්දේශ නවීකරණය
  - විෂය නිර්දේශ සංශෝධනය
  - අපේක්ෂිත කාලය තුළ විෂය නිර්දේශ හඳුන්වා දීම
  - 75%ක විෂය නිර්දේශ වසර අවසානය වන විට ක්‍රියාත්මක වීම
- සන්නිවේදන හා සමන්විත පද්ධතිය සංවර්ධනය
  - අභ්‍යන්තර සන්නිවේදන 80%ට වඩා ඩිජිටල් තාක්ෂණය භාවිත සිදුකිරීම
  - පිරිවෙන් හා අංශය අතර සන්නිවේදන 100% සම්පූර්ණ කිරීම

## අධ්‍යාපන සේවා ආයතන අංශය

අධ්‍යාපන පරිපාලන සේවය ගුරු ගුරු අධ්‍යාපනඥ සේවය හා විදුහල්පති සේවය යන සේවාවන්හි නිලධාරීන්ගේ ආයතනික කටයුතු සිදු කෙරෙන්නේ මේ අංශය යටතේ ය.

<u>ගුරු අධ්‍යාපනඥ ශාඛාව</u>

ගුරු අධ්‍යාපනඥ සේවයේ නව නිලධාරින් බඳවා ගැනීම ස්ථිර කිරිම, උසස් කිරිම,තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කිරිම, පත්වීම් පෙරදාතම් කිරීම, විශ්‍රාම ගැන්වීම, වැටුප් විෂමතා සඳහා උපදෙස් ලබා දිම, සේවයට අදාළ ශ්‍රේණ්යාධිකරණ නඩු සඳහා වූ කටයුතු, සේවා ව්‍යවස්ථාව යාවත්කාලින කිරීම, නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමේ කටයුතු, සේවයට අදාළ මානව හිමිකම් සහ මහජන පෙත්සම්කාරක සභා, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු දිම මෙම අංශය මඟින් සිදු කරයි.

අංශය යටතේ පවතින ශාඛා : ගුරු අධ්‍යාපනඥ ශාඛාව<br>
විදුහල්පති ශාඛාව<br>
අධ්‍යාපන සේවා ආයතන ශාඛාව

**2024 වර්ෂයේ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් 706ක් සීමිත බඳවා ගැනීමට අදාළව මූලික සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා අවසන් ලේඛන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර විවෘත බඳවා ගැනීම් මඟින් 384ක් බඳවා ගැනීමට අදාළව මූලික සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත. එසේම ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විධිමත් පරිදි තනතුරු සඳහා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ සිදු කර ඇත.**

**විදුහල්පති ශාඛාව**

**විදුහල්පති සේවාවේ බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ ක්‍රියාවලිය සාධාරණ හා සමානාත්මතාවයෙන් යුතුව ව්‍යවස්ථානුකූලව කටයුතු ඉටු කිරීමෙන් ගුණාත්මක විදුහල්පති සේවාවක් ලබා දීමට පෙළ ගැසෙන විදුහල්පති ශ්‍රේණිධාරීන් පිරිසක් සඳහා අවශ්‍ය පසුබිම සැකසීම සම්බන්ධ කාර්යය භාරය මෙම අංශය මඟින් සිදු කරයි.**

**03. 2024 වර්ෂයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ බඳවා ගැනීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම් සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.**

| විෂයය | ප්‍රමාණය |
|---|---|
| සීමිත තරඟ විභාගයක් මඟින් III ශ්‍රේණියට බඳවා ගැනීම් | 167 |
| සේවයේ ස්ථිර කිරීම් | 857 |
| විශ්‍රාම ගැන්වීම් | 510 |
| උසස් කිරීම් - II ශ්‍රේණියට | 1064 |
| - I ශ්‍රේණියට | 511 |

<u>අධ්‍යාපන සේවා ආයතන ශාඛාව</u>

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ,

- තනතුරේ ස්ථිර කිරීම
- සන්ධාන භාෂා ප්‍රවීණතාවයෙන් නිදහස් කිරීම
- අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවයෙන් නිදහස් කිරීම
- II, I හා විශේෂ ශ්‍රේණියට උසස් කිරීම
- වැටුප් වර්ධක ලබා දීම
- වැටුප් පරිවර්තන සිදුකිරීම
- ස්ථාන මාරු හා තාවකාලික අනුයුක්ත කිරීම්
- මුදාහැරීම් කටයුතු
- තීරුබදු රහිත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම
- භාෂා දීමනා ලබාදීම
- විධායක දීමනා ලබාදීම
- විශ්‍රාම ගැන්වීම ඇතුළු අනෙකුත් ආයතනික කටයුතු
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට විවෘත, කුසලතා හා සීමිත යන පදනම් යටතේ නවක නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීම හා ඊට අදාළව ඉදිරිපත් වන ගැටළු, මහජන පැමිණිලි, ඉල්ලීම් සම්බන්ධ ලිපිවලට පිළිතුරු සැපයීම, අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිරීක්ෂණ, නිර්දේශ ලබාදීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග හා සන්ධාන භාෂා විභාගය ගැසට් කිරීමට අදාළ කටයුතු, එම විභාග ප්‍රතිඵල දන්වා යැවීම හා කාර්යක්ෂමතා කඩඉම් සහන ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව සම්බන්ධ සියලු කටයුතු.
- විදුහල්පති තනතුරු පුරප්පාඩු වන,

a) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල්

b) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II / III ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල්

c) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල් සඳහා සම්මුඛ පරීක්ෂණ මඟින් විධිමත් පරිදි විදුහල්පතිවරුන් පත්කිරීමට අදාළ සියලු ම රාජකාරි කටයුතු

- ඉහත සඳහන් ජාතික පාසල්වලට අවශ්‍ය අවස්ථාවල දී රාජකාරි ආවරණය සඳහා විදුහල්පතිවරුන් පත්කිරීමට අදාළ සියලු ම රාජකාරි කටයුතු

- අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතනවලට පුරප්පාඩු වන අධ්‍යාපන අධ්‍යක්ෂ/ කොමසාරිස්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කොමසාරිස් (ගුරු ආයතන) සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ යන තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසු නිලධාරීන් පත් කිරීමේ කටයුතු යාවත්කාලීනව සිදුකිරීම හා ඒ සම්බන්ධ දත්ත පවත්වාගෙන යාම.
- පැරණි සේවා ව්‍යවස්ථානුකූලව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ උසස් වීම් පිළිබඳ ලැබෙන අභියාචනා පිළිබඳව කටයුතු කිරීම.
- මානව හිමිකම්, මහජන පෙත්සම් කාරක සභාවේ පැමිණිලි, අල්ලස් හෝ දූෂණ විමර්ශන, පාර්ලිමේන්තු අනු කාරක සභා හා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු සම්බන්ධයෙන් අදාළ රාජකාරි ඉටුකිරීම
- ඔම්බුඩ්ස්මන් වෙතින් ලැබෙන පැමිණිලි, පාර්ලිමේන්තු උපදේශක කාරක සභා පැමිණිලි හා පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාළ රාජකාරි කටයුතු
- **1996.12.18** හා **1997.07.31** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද නිලධාරීන්ගේ ආයතනික හා වැටුප් සම්බන්ධ කටයුතු යාවත්කාලීනව සිදු කිරීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධාරීන්ගේ, **1994-2014** දේශපාලන පළිගැනීම් සහන සම්බන්ධයෙන් කටයුතු කිරීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු
- තොරතුරු දැනගැනීමේ පනතට අදාළව අධ්‍යාපන සේවා ආයතන ශාඛාව වෙත යොමුකරන විමසීම් සඳහා පිළිතුරු ලබාදීම
- අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය හා දත්ත පද්ධතිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම
- අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙනත් ශාඛාවලින් විමසා සිටින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ විවිධ තොරතුරු ලබාදීම
- වෙනත් අමාත්‍යාංශ හා විවිධ ආයතනවලින් විමසා සිටින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ විවිධ තොරතුරු ලබාදීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ ආයතන කටයුතු සඳහා අවශ්‍ය විනය විමර්ශන වාර්තා කැඳවීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සම්බන්ධ විගණන විමසීම් සඳහා පිළිතුරු ලබාදීම

**2024** වර්ෂයේ අධ්‍යාපන සේවා ආයතන ශාඛාව මඟින් සිදුකරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

| | ප්‍රධාන කාර්යය | වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | ප්‍රගතිය |
|---|---|---|---|
| **1** | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත බඳවා ගැනීම 2020/2021(2022) | **75,795.75** | ලිඛිත විභාගය හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යන අංශ දෙකෙන්ම ලැබූ මුලු ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබූ 62 දෙනෙකු සඳහා 2024.05.18 හා 19 දෙදින සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වා 2024.07.03 දින 60 දෙනෙකු සඳහා පත්වීම් ලබා දී ඇත.<br>02 දෙනෙකු සඳහා පත්වීම් තාවකාලිකව අත්හිටුවා ඇත. |
| **2** | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම 2020/2021 (2023) | **1,397,795.00** | 2023.09.23 දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ලිඛිත තරඟ විභාගය සමත් 735 දෙනෙකු සඳහා 2024.08.21 දින සිට 2024.09.07 දක්වා දින 10 ය ක දී සාමාන්‍ය හා වාචික සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. |
| **3** | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම 2020/2021 | - | අංක 2237 හා 2021.07.16 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද බඳවා ගැනීමේ නිවේදනය අනුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් 2023.07.29 දින පවත්වන ලද උක්ත තරඟ විභාගයේ ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අයත් තනතුරුවලට බඳවා ගැනීම සඳහා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට හා වාචික සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් 147 දෙනෙකුගේ නම් ඇතුළත් නාම ලේඛනය ප්‍රකාශයට පත් කර ඇති අතර 2024.10.23 හා 24 දෙදින තුළදී සාමාන්‍ය හා වාචික සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. |
| **4** | අධ්‍යාපන අධ්‍යක්ෂ/ කොමසාරිස් තනතුරු සඳහා පත්කිරීම් | **32,094.00** | අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල පුරප්පාඩුව පවතින අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු දහනවයක් (19) සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තෝරා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය 2024 අප්‍රේල් මස අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පවත්වන ලද අතර සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු 16 ක් සඳහා නිලධාරීන් පත් කර ඇත. |
| **5** | ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) තනතුර සඳහා නිලධාරියෙකු පත්කිරීම | **3,650.00** | අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) තනතුර සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු තෝරා පත්කර ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණ 2024.10.29 දින අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ දී පවත්වන ලදී. |

| | ප්‍රධාන කාර්යය | වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | ප්‍රගතිය |
|---|---|---|---|
| 6 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු සඳහා පත්කිරීම් | 5,975.00 | නැගෙනහිර හා සබරගමුව පළාත්වල පුරප්පාඩුව පවතින පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා සුදුසු නිලධාරීන් තෝරා ගැනීම සඳහා 2024 ජූලි මස 30 වන දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස එම්.අයි.ඩී.ඩී.සී. ඉද්දමල්ගොඩ මහත්මිය තෝරා පත් කර ඇත. |
| 7 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | 4,530.00 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ 2024.07.01 දිනට පවතින පුරප්පාඩු 07 ක් සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා 2024.09.18 වන දින සම්මුඛ පරීක්ෂණ පවත්වා එහි ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත. |
| 8 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල්වල විදුහල්පති පත්කිරීම් | 58,282.00 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල් 50ක විදුහල්පති තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාලව 2024 මැයි මස 07, 09, 11 හා 13 යන දිනවලදී පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත ජාතික පාසල් 29ක් සඳහා විදුහල්පතිවරුන්ට 2024.07.23 දින පත්වීම් ලබාදුන් අතර ඉන් 23 දෙනෙකු පත්වීම් භාරගත් බවට දන්වා ඇත. |
| 9 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II/ III ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල්වල විදුහල්පති පත්කිරීම් | - | 2024.06.30 දිනට පුරප්පාඩු වන ජාතික පාසල් 12ක් සඳහා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අනුමැතිය ඉල්ලා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත ලිපියක් යොමු කිරීමට නියමිතය. |
| 10 | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල්වල විදුහල්පති පත්කිරීම් | 2023 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුර දැරිය යුතු ජාතික පාසල් 74ක විදුහල්පති තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාලව 2023 සැප්තැම්බර් මස 08, 09, 13, 15 හා 21 යන දිනවලදී පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත ජාතික පාසල් 29ක් සඳහා විදුහල්පතිවරුන්ට 2024.06.13 දිනැතිව පත්වීම් ලබා දී ඇත |
| 11 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සන්ධාන භාෂා විභාගය | - | 2024 දෙසැම්බර් මාසයේ දී විභාගය පැවැත්වීම සඳහා 2024.10.18 අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය වන ලෙස 2024.09.27 දින ගැසට් පත්‍රයේ පල කර ඇත. |

| | ප්‍රධාන කාර්යය | වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | ප්‍රගතිය |
|---|---|---|---|
| 12 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ<br>• I ශ්‍රේණියට උසස් කිරීම්<br>• II ශ්‍රේණියට උසස් කිරීම්<br>• ස්ථාන මාරු හා තාවකාලික අනුයුක්ත<br>• විශ්‍රාම ගැන්වීම්<br>• වාහන බලපත්‍ර | - | <br>65<br>300<br><br>192<br>85<br>150 |

**ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය**

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ සම සාධාරණත්වය ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව තහවුරු කෙරෙන ප්‍රතිපත්තිමය ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය, අනාගත දැනුම පදනම් වූ ආර්ථික හා සාමාජීය ප්‍රවණතා සමඟ සැසඳෙන ශ්‍රී ලාංකේය මානව සම්පත නිර්මාණය කිරීමෙහි ලා සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියෙහි වගකීම ඉටුකෙරෙන අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම් හා නියාමන ක්‍රමවේද සහතික කිරීම සඳහා සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ ගුණාත්මක බව, ආර්ථික කාර්යක්ෂමතාව හා ඵලදායිතාව තහවුරු කෙරෙන ප්‍රතිපත්ති හා ජාතික නිර්ණායක හඳුනා ගැනීම, මානව භෞතික හා මූල්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කරමින් දිගු කාලීන අධ්‍යාපන ඵල අත්පත් කර ගැනීම සඳහා සැලසුම් සම්පාදනය හා ප්‍රගති සමාලෝචනය මගින් අධ්‍යාපන පද්ධතියේ ප්‍රගමනය සඳහා දායක වෙයි.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සම්පාදනය එම සැලසුම් නියාමනය කිරීම කාර්යසාධන වාර්තා, ප්‍රගති වාර්තා අයවැය ප්‍රගති සමාලෝචන කටයුතු ඉටු කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වාර්ෂික වාර්තාකරන කටයුතු ඉටුකිරීම විදේශීය ආයතන හා සම්බන්ධීකරණය, විදේශීය පුහුණු කටයුතු සංවිධානය සැමට අධ්‍යාපන අරමුණු ඉටු කර ගැනීම සඳහා ජාතික ක්‍රමෝපායන් සකස් කිරීම අධ්‍යාපන සංවර්ධනයට අදාළ පර්යේෂණ සම්බන්ධීකරණ හා මෙහෙයවීම, විදේශ ආධාර ව්‍යාපෘති හා ආධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය මෙන් ම මානව සම්පත් සංවර්ධනයට අදාළ සැලසුම්, පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය හා නියාමනය ආදිය මේ අංශයේ කාර්යභාරයයි.

අංශය යටතේ පවතින ශාඛා

සැමට අධ්‍යාපනය ශාඛාව

මානව සම්පත් සංවර්ධනය ශාඛාව

ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව

නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

විදේශ ආයතන හා විදේශ කටයුතු ශාඛාව

**ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය - ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ**

- තිරසර සංවර්ධන දර්ශක අංක 4.1.1 වෙත ළඟා වීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ගෝලීය නිපුණතා රාමුව අනුව සකස් කළ 3 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ සාක්ෂරතා හා ගණිත හැකියා ඇගයීම ජාතික මට්ටමින් පවත්වා දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීම
- ශ්‍රී ලංකාවට සුවිශේෂ තිරසර සංවර්ධන දර්ශක 13කට අදාළ දර්ශක අගයන් හා සන්ධිස්ථාන අගයන් ගණනය කර අදාළ පාර්ශ්ව වෙත දත්ත වාර්තා කිරීම
- 2021 වර්ෂයේ පවත්වන ලද තෙවන ශ්‍රේණිය සාක්ෂරතා හා ගණිත හැකියා ඇගයීම් වාර්තාව සිංහල දෙමළ ඉංග්‍රීසි භාෂා තුනෙන් ම පිටපත් 1900ක් මුද්‍රණය කර අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ශාඛා, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ සියලු කලාප අධ්‍යාපන කාර්යාල වෙත බෙදා හැරීම
- අ.පො.ස. (උ.පෙ) වෘත්තිය විෂය ධාරාව ක්‍රියාත්මක පාසල් සඳහා පාසල් පාදක මූල්‍ය ප්‍රදාන ලබා දීම
- 2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළව වෘත්තීය විෂයධාරාව සඳහා අනුමත ක්‍රියාත්මක කිරීමේ සැලසුම යොමු කරන ලද පාසල් 26කට රු. 150000ක බැගින් මූල්‍ය ප්‍රදාන ලබා දී ඇත.
- සිසුන් සඳහා පැමිණීම පදනම් කරගත් සිසු දීමනා ලබා දීම සිදු කර ඇත.
- උසස් පෙළ වෘත්තීය පුහුණු පාඨමාලා වෙත බඳවා ගත් සිසුන්ගේ පැමිණීම පිළිබඳ දත්ත ලබා ගැනීමට අදාළ Google දත්ත පත්‍රය පාසල් වෙත යොමු කිරීම
- පුහුණු පාඨමාලා සඳහා සහභාගිත්වය පිළිබඳව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ සිසුන් 1713ක් සඳහා පැමිණීම පදනම් කර ගත් දෛනික සිසු දීමනාව ගෙවා අවසන් කිරීම
- 2023 වර්ෂයේ උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවට ඇතුළත් වූ සිසුන් 10099ක් වෘත්තීය පුහුණු ආයතන 18 වෙත යොමු කිරීම
- වෘත්තීය පුහුණුව සඳහා යොමු කර ඇති සිසුන්ගේ පාඨමාලා ගාස්තු ගෙවීම
- වෘත්තීය පුහුණු ආයතන 13ක් වෙත අදාළ කාර්තු සඳහා පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කර ඇත.
- වෘත්තීය විෂය ධාරාවේ සිසුන් යොමු කළ හැකි වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාව පුළුල් කිරීම
- වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම සම්බන්ධ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කර කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇති අතර නව ආයතන තෝරා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා 4ක් පවත්වා ඇත.
- ආබාධ සහිත සිසුන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෙනිවැල්කොළ ශිෂ්‍යෝදා පුහුණු මධ්‍යස්ථානය තුළ පහසුකම් සංවර්ධනය කර පාඨමාලා අවශ්‍යතා ලබා දී වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කිරීම
- පාසල් 28ක හා ආයතන 26ක අධීක්ෂණ කටයුතු අවසන් කිරීම
- දේශීය සහ අනුමත විදේශීය ශිෂ්‍යත්ව සහිත ව පශ්චාත් උපාධි හදාරන නිලධාරීන් සඳහා මූල්‍ය දායකත්වයක් ලබා දීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විවෘත සහ විශේෂ ශ්‍රේණියේ ගුරු අධ්‍යාපනඥ සේවයේ සීමිත සහ ශ්‍රී ලංකා විදුහල්පති ශ්‍රේණියේ දිශාභිමුඛ වැඩසටහන් පැවැත්වීම
- කාර්ය මණ්ඩල පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- GEM ව්‍යාපෘතිය යටතේ පාසල් 500ක් ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් ප්‍රතිඵල සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සහ පාසල් 500ක ගණිතය ඉගෙනුම් ප්‍රතිඵල සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම
- 10,11 ශ්‍රේණි ඉංග්‍රීසි භාෂා සහ 2 සහ 3 ශ්‍රේණිය ගණිතය ඩිජිටල් ඉගෙනුම් ද්‍රව්‍ය පාසල් වෙත ලබා දීම
- 3 සහ 5 ශ්‍රේණි ඉංග්‍රීසි භාෂා සහ 4 සහ 5 ශ්‍රේණිය ගණිතය ඩිජිටල් ඉගෙනුම් ද්‍රව්‍ය සංවර්ධන ආරම්භ කිරීම
- අධ්‍යාපන කලාප 75%ක පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ඉලක්ක සම්පූර්ණ කිරීම
- පාසල් 3000ක අභ්‍යන්තර හා බාහිර ප්‍රජා පාදක පාසල් ගුණාත්මක තහවුරුව සම්පූර්ණ කිරීම
- අධ්‍යාපන කලාප 75%ක පාසල් නගා සිටුවීම බලගැන්වීමේ වැඩසටහනේ ප්‍රතිඵල අත්කර ගැනීම
- නියාමන හා ඇගයීම් රාමුවේ හඳුනා ගත් දර්ශක සකස් කිරීම/ගණනය කිරීම සහ සැලසුම් ක්‍රියාවලිය සඳහා එහි භාවිතය පිළිබඳ තාක්ෂණික වැඩ සැසියක් පැවැත්වීම
- නියාමන හා ඇගයීම් රාමුව මත පළාත් 09 නිලධාරින් සඳහා මාර්ගගත සැසි පැවැත්වීම
- NEMIS මත පදනම් ව නියාමන ආකෘති සකස් කර පරිශීලක මාර්ගෝපදේශය සංශෝධනය කිරීම
- වාර්ෂික කාර්යසාධන වාර්තාව හා අයවැය ප්‍රගතිය සඳහා ඉදිරිපත් කරන ප්‍රගති වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අධ්‍යාපන සංවර්ධන කමිටු රැස්වීම් සහ අනෙකුත් රැස්වීම් පැවැත්වීම
- අධ්‍යාපන සංවර්ධනය සඳහා ක්‍රියාත්මක මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ ව්‍යාපෘතිවල නියාමන සහ ඇගයීම් කටයුතු කිරීම
- මධ්‍ය කාලීන හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම් නියාමනය තුළින් ඉදිරි අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම
- පළාත් මට්ටමින් සිදු කළ යුතු අධ්‍යාපන පර්යේෂණ සම්බන්ධයෙන් පළාත් පර්යේෂණ නිලධාරින් සමඟ උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සඳහා යෝජනා ලබා ගැනීම හා ජාතික මට්ටමින් සිදු කරනු ලබන කාර්යයන් පිළිබඳ දැනුම්වත් කිරීම
- අධ්‍යාපන වෘත්තිකයින්ට සිය පර්යේෂණ අධ්‍යයන එළි දැක්වීමට අවස්ථා සැලසීම සඳහා අත්වැලක් සපයමින් පර්යේෂණ ලිපි සමාලෝචනය කිරීම හා අධ්‍යාපන පර්යාලෝක සඟරාව සඳහා ලැබුණු ලිපි 10ක් සමාලෝචනයට බඳුන් කිරීම
- පුහුණුව සහ වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම තුළින් අධ්‍යාපන පර්යේෂණවල නියුතු පාර්ශ්වකරුවන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම
- පර්යේෂණ අධ්‍යයනවල අනාවරණ ප්‍රචලිත කිරීමේ මාධ්‍යයක් ලෙස පාසල් සිසු පර්යේෂණ කණ්ඩායම් භාර ගුරුභවතුන් පුහුණු කිරීමේ මාර්ගගත කාර්ය සැසි පැවැත්වීම
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා ඒකාබද්ධව පර්යේෂකයින් සඳහා ශාස්ත්‍රීය ලේඛන කලාව පිළිබඳ දින 3ක සහතිකපත් පාඨමාලාවක් පැවැත්වීම
- පර්යේෂණ සතිය / දින ක්‍රියාකාරකම් පැවැත්වීම
- 'පාසල් පර්යේෂණ සතිය'ට සමගාමී ව ප්‍රථම වතාවට 2024 පාසල් පර්යේෂණ දිනය ජාතික මට්ටමින් 2024.10.09 වැනි දින කොළඹ ආනන්ද විද්‍යාලයේ දී පැවැත්වීම

- සාක්ෂ්‍ය පදනම් කර ගත් තීරණ ගැනීමේ සංස්කෘතියක් පාසල් පද්ධතිය තුළ නිර්මාණය කිරීම තුළින් දැනුමින් පිරි අනාගතයකට දැයේ පාසල් දරුවන් යොමු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන "සිසු පර්යේෂකයෝ" වැඩසටහනේ අවසාන වශයෙන් තේරී පත් වූ සිසු පර්යේෂණ කණ්ඩායම් ඇගයීමට ලක් කිරීම හා සිසු පර්යේෂණ සමුළුව (symposium) පැවැත්වීම
- සිසු පර්යේෂණ යෝජනාවලි ඇගයීමේ කාර්ය සැසි පැවැත්වීම
- පර්යේෂණ ක්ෂේත්‍ර තීරණය කිරීම සඳහා අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීමෙන් පර්යේෂණ ප්‍රමුඛතා හඳුනා ගැනීම සඳහා පළාත් හා කලාප අධ්‍යාපන නිලධාරීන් සමඟ බුද්ධිකලම්භන කාර්ය සැසි හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- පර්යේෂණ අනාවරණ ප්‍රකාශන මගින් එළි දැක්වීම, බෙදා හැරීම, සම්මන්ත්‍රණ පැවැත්වීම හා පර්යේෂණ මත පදනම් ව අධ්‍යාපනික ද්‍රව්‍ය සංවර්ධනය කිරීම
- සිසු පර්යේෂණ ජර්නලය පිටපත් 1500ක් මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කිරීම
- අධ්‍යාපන පර්යාලෝක සඟරාව වෙළුම 10 පිටපත් 2000ක් මුද්‍රණය කිරීම
- අධ්‍යාපන පර්යේෂණ මාර්ගෝපදේශය දේශීය සමාලෝචකයින් දෙදෙනෙකු ලවා සමාලෝචනය කරවා ගැනීම
- මාර්ගෝපදේශය පිළිබඳ සහ ගුණාත්මක පර්යේෂණ පිළිබඳ තාක්ෂණික පුහුණු සැසි පැවැත්වීම
- SESIP වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පර්යේෂණ අධ්‍යයන අධ්‍යයන 3ක් සිදු කිරීම සඳහා තෝරා ගෙන ඇති අතර ඉන් 2ක් බාහිර ආයතන ලවා සිදු කර ගැනීමට අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම හා ඒ අනුව ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ මූලික පියවර ගැනීම සඳහා අදාළ ලංසු ලියවිලිවල ඇතුළත් කිරීම සඳහා වන සේවා කොන්දේසි අඩංගු පත්‍රිකාව සකසා අවසන් කිරීම
- විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගත් නිලධාරීන්ගේ තොරතුරු හා නාමයෝජනා 101ක් විදේශ සම්පත් දෙපාර්තමේතුව වෙත යැවීම
- ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ හා අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් රාජ්‍ය අමාත්‍යවරුන්ගේ නිල විදේශ සංචාර සම්බන්ධ කටයුතු කිරීම
- අධ්‍යාපන අමාත්‍යාංශය හා එයට අයත් වන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ රාජකාරි විදේශ සංචාර සම්බන්ධ කටයුතු කිරීම හා නිලධාරීන් 279ක් විදේශ සංචාර සඳහා සහභාගී වී ඇත.
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයට ධනාත්මක ප්‍රතිලාභ සහතික කෙරෙන ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් සම්බන්ධ කටයුතු කිරීම
- Commonwealth Learning සඳහා වාර්ෂික දායක ගාස්තු ගෙවීම (USD 30000)
- ජාත්‍යන්තර විශේෂඥයින්ට අධ්‍යාපනයට අදාළ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා නොමිලේ වීසා නිකුත් කිරීම සඳහා විදේශ අමාත්‍යාංශය වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීම
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතනවලට විදේශීය ජාතිකයන් බඳවා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් පිළිබඳව විදේශ අමාත්‍යාංශයට / ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නිරීක්ෂණ ඉදිරිපත් කිරීම
- අධ්‍යාපන/පාසල් සිසුන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම (සියලු ආධාර හා ව්‍යාපෘති සෘජුව ම එම ආධාර ලබා දෙන ආයතන විසින් පාසල් වෙත ලබා දෙන පරිදි සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදු කරනු ලැබේ.)

## පාසල් කටයුතු අංශය

ශ්‍රී ලංකාවේ සියලු ම ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම, ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙහි කඩ ඉම් ලකුණු අනුව පාසල් ලබාදීම හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැලසීම ඇතුළු සියලු ම ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබා දීම පිළිබඳ 37/2020 චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහයට අනුව කටයුතු කිරීම, මුස්ලිම්, දෙමළ හා වතු පාසල් සංවර්ධන කටයුතු හා අධීක්ෂණය, රජයේ අනුමත සියලු පෞද්ගලික පාසල් අධික්ෂණය හා නියාමනය, පාසල් පුස්තකාල සංවර්ධනය උදෙසා කටයුතු කිරීම හා අධීක්ෂණය, පාසල් ළමුන් අතර ආගමික සංහිඳියාව ඇති කිරීම, පාසල් පුස්තකාල සඳහා ගුණාත්මක පොත් හඳුනා ගෙන ඒ සඳහා පුස්තකාල සහතික ලබා දීම සහ රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව හා සම්බන්ධීකරණය හා අධික්ෂණය සිදු කෙරෙන්නේ මේ අංශය යටතේ ය.

අංශය යටතේ පවතින ශාඛා

- ජාතික පාසල් ශාඛාව
- පාසල් කටයුතු ශාඛාව
- නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව
- පෞද්ගලික පාසල් ශාඛාව
- මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව
- දමිළ පාසල් සංවර්ධන ශාඛාව
- වතු පාසල් සංවර්ධන ශාඛාව
- පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව
- අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය
- සාමය හා සංහිඳියාව ඒකකය

### ළමා කෘති පිළිබඳ ජාතික සමුළුව (NCCB)

අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් Room to Read Sri Lanka ආයතනය සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ළමා පොත් ප්‍රකාශන ක්ෂේත්‍රය විධිමත් හා ප්‍රමිතිගතකිරීමට නිසි යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා ළමා පොත් පිළිබඳ ජාතික සමුළුව ස්ථාපනය කර ඇත.

එ මඟින් නිර්මාණය කරන ලද ළමා පොත් පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනාවලියේ කෙටුම්පත 2024.09.28 දින කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලද අතර එම කෙටුම්පත විද්වත් ප්‍රතිචාර සඳහා හඳුන්වා දෙන ලදී.

එසේම මෙම වැඩසටහන මඟින් සිදු කරන ලද වැඩමුළුවලදී පුහුණුව ලැබූ ලේඛකයින්, චිත්‍ර ශිල්පීන්, සංස්කාරවරු සහ සැලසුම් ශිල්පීන් හා කලා අධ්‍යක්ෂවරුන් විසින් නිර්මාණය කරන ලද ළමා පොත් 40ක් අතුරින් 16ක් සඳහා NCCB ලාංඡනය හා බලපත්‍රය ලබා දෙන ලදි.

**II. කියවීම් රුචිකත්වය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (Read to Fly ව්‍යාපෘතිය)**

අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව, ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ Room to Read Sri Lanka ආයතනය සමඟ එක්ව ප්‍රාථමික අංශයේ සිංහල හා දෙමළ මාධ්‍ය පාසල් සිසුන්ගේ කියවීම දුර්වලතා හඳුනාගෙන ඔවුන්ගේ කියවීමේ වේගය, ලිවීම හා කියවීමේ රුචිකත්වය සංවර්ධනය සඳහා Read to Fly නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 06 තුළ 2024.02.07 දින සිට 2024.02.16 දින දක්වා නියාමන වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. ඒ අනුව, ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමට කටයුතු කරන ලදී.

**2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය :-**

**ළමා කෘති පිළිබඳ ජාතික සමුළුව (NCCB)**

මෙම වැඩසටහන මඟින් ළමා පින්තූර කතා පොත් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ලේඛකයින්, චිත්‍ර ශිල්පීන්, සංස්කාරවරු සහ සැලසුම් ශිල්පීන් හා කලා අධ්‍යක්ෂවරුන් පුහුණු කිරීමේ වැඩමුළු 24 ක් පමණ පවත්වන ලදී. එම නිර්මාණ ශිල්පීන් විසින් ළමා පින්තූර කතා පොත් 40ක් පමණ නිර්මාණය කරන ලදී.

**කියවීම් රුචිකත්වය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (Read to Fly ව්‍යාපෘතිය)**

මහනුවර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 06 තුළ පාසල් 66 (සිංහල මාධ්‍ය පාසල් 47 දෙමළ මාධ්‍ය පාසල් 19 ක්) තුළ 1 ශ්‍රේණිය සිසුන් 745 (සිංහල - 519 හා දෙමළ 226) සහ 2 ශ්‍රේණිය සිසුන් 780 (සිංහල - 543 හා දෙමළ 237) සඳහා Read to Fly නමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

මේ සඳහා 1 හා 2 ශ්‍රේණි සඳහා තක්සේරු පත්‍රිකා දෙකක් නිර්මාණය කරන ලද අතර ගුරු උපදේශකවරු 50 කගේ දායකත්වයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන මඟින් ලබා ගන්නා ලද දත්ත සංඛ්‍යාලේඛණ ශාඛාව සමඟ එක්ව පරිගණකගත කරන ලද දත්ත ඇසුරින් වාර්තාවක් සකස් කරන ලදී. එම වාර්තාව එළිදැක්වීමෙන් අනතුරුව 2025 වසර අවසන් වන විට සෑම සිසුන්ගේ ම සිංහල හා දෙමළ භාෂාවල වත්මන් කියවීමේ මට්ටම තක්සේරු කිරීම සඳහා මෙවලමක් සංවර්ධනය කර ප්‍රාථමික සිසුන්ගේ කියවීමේ දුර්වලතාවයන්ට පිළියම් යෙදීම සහ සිසුන්ගේ කියවීමේ හැකියාවන් වැඩි කිරීම සඳහා ප්‍රතිකාර්ය ක්‍රියා මාර්ග සැපයීම සඳහා ප්‍රාථමික ගුරුවරුන්ට බෙදා හැරීමට අපේක්ෂිත ය.

- " අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 1 සිංහල පිටපත් 1000ක් හා දෙමළ පිටපත් 500ක් මුද්‍රණය කිරීම සහ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් වෙත බෙදා හැරීම. (රු. මිලියන 1.911)
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා විභාග පහසුකම් සැපයීමේ උපදෙස් සංග්‍රහය සකස් කිරීම. (රු මිලියන 0.5)
- වර්ගීකරණය අනුව විශේෂ අවශ්‍යතා සහිත සිසුන් හඳුනා ගැනීම සඳහා වූ මොඩියුලය සකස් කිරීම හා මුද්‍රණය කිරීම සහ පළාත් වෙත බෙදා හැරීම. (රු. මිලියන 2.0)

- ජාත්‍යන්තර ආබාධිත දිනයට අදාළ ජාතික සැමරුම් වැඩසටහන "ශිෂ්‍යෝදා " විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනයේදී සිසුන්, ගුරුභවතුන්, දෙමාපියන් නිලධාරීන් 347 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සිදු කිරීම. (රු,මිලියන 0.374)
- ජාත්‍යන්තර සාක්ෂර දින ජාතික සැමරුම් වැඩසටහන නැගෙනහිර පළාතේ දෙහිඅත්තකන්ඩිය අධ්‍යාපන කලාපයේ හේනානිගල දකුණ විද්‍යාලයේ දී සිසුන් සහ ආදී වාසීන් 460 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්වීම. (රු. මිලියන 0.759)
- අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ මාර්ගෝපදේශය සහ පාසල් යටිතල පහසුකම් සහ පාරිසරික සැකැස්ම පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ මුද්‍රණය කිරීම සහ පළාත් වෙත බෙදා හැරීම (රු.මි.3.4)
- "ශිෂ්‍යෝදා " විශේෂ හා අන්තකරණය අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනයෙහි විශේෂ අධ්‍යාපන ඒකක පිහිටු වීම, දෙමාපියන් සඳහා ආදායම් ඉපයීමේ පාඨමාලා ක්‍රියාත්මක කිරීම සහ විශේෂ අවශ්‍යතා සිසුන්ට වෘත්තීය පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- උපකෘත විශේෂ පාසල් 09ක් අධීක්ෂණය සහ නියාමනය කිරීම (රු.මිලියන 0.25)
- විශේෂ අධ්‍යාපන කලාපීය තක්සේරුකට්ටල 61ක් සඳහා ඒකක සඳහා තක්සේරුකට්ටල ලබාදීම (රු,මිලියන 2.0)
- වතු පාසල්වල ගුරුභවතුන් පුහුණු කිරීම සඳහා ඉන්දියානු රජයේ ගුරු පුහුණුකරුවන් විසින් පුහුණු කිරීමේ වැඩසටහනක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය මත, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් වතු පාසල් ගුරුවරුන් සඳහාම විශේෂයෙන් නිර්මාණය කරන ලද වැඩසටහනකි.
- මෙය මාස තුනක් පුරාවට මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත්වල වතු පාසල්වල අ.පො.ස. (සා.පෙළ) විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් උගන්වනු ලබන වතු පාසල් ගුරු භවතුන්ව STEM අධ්‍යාපනය සම්බන්ධව ගුරුවරුන් 1842ක් පුහුණු කිරීම සිදු කරන ලදී.
- රු.මි.25.0ක් ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිතයට ගනු ලබන ද්‍රව්‍ය මිල දී ගැනීමට එක් පාසලකට රු.මි.0.1 බැගින් ජාතික පාසල් 250කට හා රු.මි. 5.0 (ගෙවීම් - මුදල් ශාඛාවේ මූලිකත්වයෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවලට ලබාදීමට කටයුතු කර ඇත.
- ජාතික පාසල්වල පවතින යන්ත්‍රසූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව සඳහා උපරිමය රු.මි.0.1 වන ලෙස ජාතික පාසල් 110කට ලබා දී ඇත.
- ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම (ජාතික පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම. ජාතික පාසල් 266ක් සඳහා රු.මි. 133කි. ආරම්භක අවස්ථාවේ දී ලබා දෙන 50%ක ප්‍රදාන මුදල ජාතික පාසල් 266කට(රු.මි.66.5) ලබා දී අවසන්ව ඇති අතර විදුහල්පතිවරුන් විසින් පළාත් ඉංජිනේරු කාර්යාල නිලධාරීන් වෙතින් ඇස්තමේන්තු අනුමත කර ගැනීමෙන් පසු එම අනුමත ඇස්තමේන්තුවලට අනුව ප්‍රදාන මුදල් ලද ජාතික පාසල්වල වැසිකිළි/ කැසිකිළි අලුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත. මුළු ප්‍රදාන මුදලින් ඉතිරි 50% රු.මි.66.5ක මුදල 2024.12.31 දින පාසල් සංවර්ධන සමිති ගිණුම්වලට බැර කිරීම අවසන් ව ඇති අතර පාසල් පරිශ්‍ර තුළ එකී අලුත්වැඩියා කටයුතු කර ගෙන යනු ලබයි.

- කඩා ඉවත් කිරීම්/ ඉදිකිරීම්වලට අදාළ ගොඩනැගිලි අවශ්‍යතා තහවුරු කිරීම සඳහා ස්ථානීය පරීක්ෂාව, නිර්දේශ ලබාදීම් සිදු කිරීම
- අඩු කාර්ය සාධනයක් ඇති දෙමළ ජාතික පාසල් 10ක් නංවාලීම
- දෙමළ මාධ්‍ය පාසල්වල විදුහල්පතිවරුන්, ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සඳහා O/L සහ A/L සිසුන්ගේ කාර්යසාධනය වැඩි කිරීම පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම
- සමස්ත ලංකා පාසල් මුස්ලිම් සංස්කෘතික තරගය - 2024 පවත්වන ලදි.
- මද්‍රසා අධ්‍යාපන විශේෂඥ කමිටු සමාජිකයින් හා අදාළ පාර්ශ්වකරුවන් සඳහා වන වැඩමුළු පවත්වන ලදි.
- විද්‍යාපීඨ ශික්ෂණ ලාභී ගුරුවරුන් 3000ක් සඳහා සංහිඳ පාමුල වැඩමුළු 11ක් පවත්වන ලදි.
- පාසල් ළමයි 360ක් හා පාසල් ගුරුවරුන් 72ක් සඳහා සහෘද යාත්‍රා වැඩමුළු පවත්වන ලදි.
- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරු ආයතනික කටයුතු සිදු කිරීම
- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල සහ අනිකුත් බාහිර ආයතනවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියා පටිපාටි ශක්තිමත් කිරීම
- අනෙකුත් රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන හා (ජාත්‍යන්තර පාසල්, වෙනත් පෞද්ගලික පාසල්) සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම
- කියවීම් කඳවුරු ක්‍රියාත්මක කිරීම පුහුණු කිරීමේ දෙදින නේවාසික වැඩමුළු පැවැත්වීම.
- පුස්තකාල පුහුණු අත්පොත සකස් කිරීම
- පාසල් පුස්තකාල උපදෙස් සංග්‍රහය අනුව පාසල් පුස්තකාල ක්‍රියාත්මක කිරීම
- කියවීම් කඳවුරු ක්‍රියාත්මක කිරීම (බස්නාහිර පළාත)

## තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන අංශය

සමස්ත අධ්‍යාපන පද්ධතියේ ඩිජිටල් පරිවර්තනය සහතික කිරීම සඳහා ඩිජිටල් පරිවර්තනයට සහය වීම සහ ඒ සඳහා ආරම්භයක් ලබා දීම මෙම අංශයේ ප්‍රධාන අරමුණයි.

ඒ සඳහා අදාල වන කාර්යන් ප්‍රධාන අංශ තුනක් යටතේ ක්‍රියාත්මක කිරීම මෙම අංශය යටතේ සිදුවේ. ඒවා නම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනය ( ICT Education) , අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය (ICT for Education) හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා (ICT services) වේ.

අංශය යටතේ පවතින ශාඛා ;-

1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව
2. දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව
3. ඩිජිටල් අධ්‍යාපන හා යටිතල පහසුකම් සංවර්ධන ශාඛාව
4. දත්ත කළමනාකරණ හා තොරතුරු පද්ධති සංවර්ධන ශාඛාව

**2024 වර්ෂයේ ලබා ගත් විශේෂ ජයග්‍රහණ :-**

2024 වර්ෂයේ පවත්වන ලද තොරතුරු තාක්ෂණ ශූරයෝ තරඟාවලියේ තරුණ පරිගණක විද්‍යාඥයා (YCS) තරඟය අධ්‍යාපන අමාත්‍යාංශය හා තොරතුරු තාක්ෂණ කර්මාන්ත කරුවන්ගේ මණ්ඩලය එක්ව ක්‍රියාත්මක කරන ලදී. මෙම තරඟයේ විශිෂ්ඨ දක්ෂතා දැක්වූ රජයේ පාසල් සිසුන් තුන් දෙනෙකු හා ජාත්‍යන්තර පාසල් එක් සිසුවකු බෲනයි නුවර පැවත්වන ලද ජාත්‍යන්තර APICTA තරගය සඳහා සහභාගි විය. එම සිසුන් විසින් රිදී සම්මානයක්, කුසලතා සම්මාන 2ක් සහ සහභාගීත්ව සහතිකයක් ජයග්‍රහණය කර ඇත.

- ඉ - ඉගෙනුම් අන්තර්ගත නිර්මාණය විධිමත් කිරීම සඳහා ක්‍රමවේදයක් ලෙස ඉ ඉගෙනුම් අන්තර්ගත ප්‍රතීතන රාමුව හඳුන්වා දෙන ලදී. UNICEF ආයතනය වෙත ලබාදුන් යෝජනාවකට අනුව පත්කරන ලද විදේශීය විෂය විශේෂඥ උපදේශකවරයකුගේ සම්පත් දායකත්වයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය හා අනුබද්ධ සියලුම ආයතනවල සහභාගීත්වය හා එකඟතාවය ඇතිව මෙය ක්‍රියාත්මක කරන ලදී.

**2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය :-**

- පාසල් මට්ටමින් ඉගෙනුම් කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සර්වර් පහසුකම් ලබාගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සර්වර් යන්ත්‍ර ලබා ගන්නා ලදී. රු.මි. 259.87 ක වියදමින් පාසල් 3000ක් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධති ලබාදීම සඳහා ප්‍රමාණවත් පහසුකම මේ මගින් ලබාගෙන ඇත.
- පළාත් පාසල් 920ක් සඳහා ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර අලුත්වැඩියා කළ පරිගණක හා උපාංග සංඛ්‍යාව 15,000කි.
- ජාතික පාසල් 47ක් සඳහා ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර අලුත්වැඩියා කළ පරිගණක හා උපාංග සංඛ්‍යාව 1,200කි. භෞතික ප්‍රගතිය 95% කි.
- ඉහත 2 හා 3 වැඩසටහන් සඳහා සමස්ත මූල්‍ය ප්‍රගතිය 96% කි.
- පාසල් සඳහා ෆයිබර් අන්තර්ජාල සබඳතා ස්ථාපිත කිරීම යටතේ 2024 වර්ෂයේ දී පාසල් 2000 ක් සඳහා ෆයිබර් අන්තර්ජාල පහසුකම් ලබා දීමට අපේක්ෂිත විය. මේ වන විට පාසල් 500 ක් සඳහා ෆයිබර් අන්තර්ජාල සබඳතා ලබා දී ඇත. මෙම ෆයිබර් අන්තර්ජාල මාසික බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය රු. මිලියන 29ක මුදලක් 2024 වසරේ අවසානයේ පාසල් වෙත ලබා දීමට කටයුතු සැලසුම් කර මේ වන විට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ Server පද්ධතිය Upgrade කිරීම සඳහා රු. මි. 23.5 ක ප්‍රතිපාදන වෙන් වූ අතර රු. මි. 23.41ක වියදමින් එම කාර්ය අවසන් කර ඇත.
- ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ ඇති ගුරු මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS Teacher HRM) යාවත්කාලීන කිරීමට අදාළව ගම්පොළ කලාප අධ්‍යාපන කාර්යාලයේ විෂය භාර නිලධාරීන් සඳහා මාර්ගගත ලෙස පරිශීලක පුහුණුව ලබා දෙන ලදී. (එම කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සිදු කරන ලද ඉල්ලීම පරිදි) තවද, බස්නාහිර, දකුණ හා වයඹ පළාත්හි සියලුම කලාප අධ්‍යාපන කාර්යාලවල විෂය භාර නිලධාරීන් සඳහා ද මාර්ගගත ලෙස පරිශීලක පුහුණුව ලබා දෙන ලදී.

## අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය

අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශයේ කාර්යයන්

**1.** විෂයමාලාව මගින් අපේක්ෂිත නිපුණතා කරා සිසුන් ළඟා කරවීම

- විෂයමාලාව ක්‍රියාත්මක කිරීම හා නියාමනයට අදාළ ප්‍රතිපත්ති, චක්‍රලේඛ, මාර්ගෝපදේශ හා උපදෙස් සකස් කිරීම
- විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී එහි ප්‍රමුඛ අවශ්‍යතා හා ජාතික මට්ටමේ උපාය මාර්ග හඳුනාගනිමින් කෙටිකාලීන හා දිගුකාලීන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය
- විෂය සංවර්ධනය සඳහා විවිධ ව්‍යාපෘති සිදු කිරීම
- පාසල පදනම් කරගත් තක්සේරුකරණ හා ඇගයීම් ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විවිධ උපාය මාර්ග භාවිතා කරමින් සිසුන්ගේ සාධන මට්ටම් සංවර්ධනය සඳහා විවිධ ව්‍යාපෘති / වැඩසටහන් /ක්‍රියාකාරකම් සිදු කිරීම
- සිසු අවශ්‍යතා අනුව ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල විශ්ලේෂණය තුළින් අවශ්‍යතා හඳුනාගැනීම හා ඒ අනුව ප්‍රතිඵල සංවර්ධනය සඳහා ක්‍රියාමාර්ග ගැනීම

**02.** ඉගෙනුම් සම්පත්, ඉගෙනුම් අවස්ථා හා පහසුකම් සැපයීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත්ව ක්‍රියාත්මක කිරීම

- දුරස්ථ හා සම්මිශ්‍රිත (Blended) ඉගෙනුම් ක්‍රමවේද හඳුන්වා දෙමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සහාය වීම
- විවිධ ඉගෙනුම් සම්පත් හා ද්‍රව්‍ය සම්පාදනය කිරීම
- ගුණාත්මක ඉගෙනුම් පරිසරයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් හා උපකරණ ලබා දීමට කටයුතු කිරීම

**03.** විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධ වන සියලු පාර්ශවයන්ගේ වගකීම හා වගවීම මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම

- විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම පිණිස සම්බන්ධ වන සියලු ආයතන සමග සම්බන්ධීකරණය සිදු කිරීම
- විෂයමාලාව ක්‍රියාත්මක කරවීමට අදාළ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. පළාත් හා කලාප නිලධාරීන් සම්බන්ධීකරණය, ප්‍රගති සමාලෝචනය මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම
- අධ්‍යාපනයෙහි මානව සම්පත් හා නිපුණතා සකස් කර ක්‍රියාත්මක කිරීම

**4.** නිර්මාණාත්මක නව නිපැයුම් හා නවෝත්පාදන හා පර්යේෂණ සඳහා දිරිගැන්වීම තුළින් දේශීය මෙන්ම අන්තර් ජාතික අවශ්‍යතා සපුරා ගැනීමට පාසල් ප්‍රජාව යොමු කිරීම

- නව නිර්මාණ හා නවෝත්පාදන දිරිගැන්වීම
- විෂයානුබද්ධ පර්යේෂණ / සමුළු / ශාස්ත්‍රීය වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම

**05.** ආගමික සංස්කෘතික වටිනාකම් හා විනයගරුක සමබර පෞරුෂයකින් යුත් පුරවැසියන් නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම

- සිසුන්ගේ විවිධ කුසලතා සංවර්ධනය සඳහා විෂයානුබද්ධ හා විෂය සමගාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කායික, මානසික චිත්තවේග සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සමස්ත ලංකා පාසල් තරග වාර්ෂිකව පැවැත්වීම මගින් සිසුන්ගේ සුවිශේෂී දක්ෂතා ඇගයීමට කටයුතු කිරීම
- විවිධ අන්තර්ජාතික තරග සඳහා සිසුන් සම්බන්ධ කිරීම
- සිසුන්ගේ සෞන්දර්ය කුසලතා වර්ධනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සර්වාගමික සැලසුම් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය

**06.** විවිධ ඇගයීම් තුළින් සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මක තහවුරුව **(Quality Assurance)** සහ පිළිගැනීම් **(Accreditation)** ක්‍රියාවලිය තහවුරු කිරීම.

- පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට අදාළ ප්‍රගති වාර්තා / වාර්ෂික වාර්තා / සඟරා හා ප්‍රකාශන සකස් කිරීම.
- පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර හා බාහිර ඇගයීම් සිදු කිරීම
- විශිෂ්ට සේවා හා ව්‍යවහාර ඇගයීමට ලක් කිරීම

අංශය යටතේ පවතින ශාඛා

- ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන ශාඛාව
- විද්‍යා ශාඛාව
- ගණිත ශාඛාව
- ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව
- වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව
- සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව
- තාක්ෂණ අධ්‍යාපන ශාඛාව
- කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව
- ද්විභාෂා අධ්‍යාපන ශාඛාව
- කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව
- ආගමික හා සාරධර්ම ශාඛාව
- අධ්‍යාපන සංවර්ධන ශාඛාව
- ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම

ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

- ශ්‍රී ලාංකේය ළමා පරපුරෙහි සිංහල භාෂා ඥානය පෝෂණය කිරීම හා චතුර්විධ භාෂා කුසලතා නිවැරදිව වර්ධනය කර ගැනීමට මග පෙන්වීම සඳහා සමස්ත ලංකා සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලිය පැවැත්වීම
- නිරවද්‍ය භාෂා ව්‍යවහාර හා නිර්මාණශීලී සාහිත්‍යකරණයෙන් විශිෂ්ටයන් තෝරා ගනිමින් ඔවුන්ගේ සුවිශේෂී භාෂා හැකියාවන් වාර්ෂිකව සමස්ත ලංකා මට්ටමින් ඇගයීමට ලක් කිරීම සඳහා සමස්ත ලංකා දෙමළ භාෂා තරගාවලිය පැවැත්වීම
- සමස්ත ලංකා දෙවන ජාතික භාෂා තරගාවලිය පැවැත්වීම
- තර්ක ශාස්ත්‍රය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, ඉතිහාසය, පුරාවිද්‍යා අධ්‍යයනය යන මානව ශාස්ත්‍ර විෂයන් පිළිබඳ නිර්මාණශීලී මානව සම්පතක් සමාජයට දායාද කිරීම සඳහා සමස්ත ලංකා සමාජ විද්‍යා තරගාවලිය පැවැත්වීම
- අ.පො.ස (සා.පෙළ) සිංහල භාෂාව හා සාහිත්‍ය, දෙමළ භාෂාව හා සාහිත්‍ය, ඉතිහාසය , භූගෝල විද්‍යාව, පුරාවිද්‍යා අධ්‍යයනය, දෙවන බස දෙමළ, දෙවන බස සිංහල, සිංහල සාහිත්‍ය රසාස්වාදය විෂයන් සඳහා සහ අ.පො.ස (උ.පෙළ) සිංහල විෂය, දෙමළ විෂය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය යන විෂයන් සඳහා අනුහුරු ප්‍රශ්න පත්‍ර සැකසීම
- ශිල්ප කේන්ද්‍රීය ඉගෙනුම් පිවිසුම ආශ්‍රිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම පිළිබඳ කුසලතා සංවර්ධනය සඳහා සබරගමුව පළාත් අ.පො.ස.(උ.පෙළ) සිංහල විෂය හා අ.පො.ස.(උ.පෙළ) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය උගන්වන ගුරුවරුන් සඳහා විෂය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- දෙමළ භාෂා ගුරුවරුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීම තුළින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට සබරගමුව පළාත් හා උතුරු පළාත් අ.පො.ස. (උ.පෙළ) දෙමළ විෂය උගන්වන ගුරුවරුන් සඳහා විෂය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- ගුරුවරුන්ගේ විෂය දැනුම සහ පංති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම සඳහා සමාජ විද්‍යා ගුරු උපදේශකවරුන් සහ ගුරුවරුන්ගේ විෂය දැනුම සංවර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- සෑම වසරකම පෙබරවාරි 21 වන දින ලෝක මව්භාෂා දිනය සැමරීම

විද්‍යා ශාඛාව

**2024 වර්ෂයේ ලබා ගත් විශේෂ ජයග්‍රහණ**

- චීනයේ පැවති අන්තර්ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලිය සඳහා සිසුන් 09 දෙනකු ඉදිරිපත් කිරීම සහ එම සිසුන්ගෙන් දෙදෙනෙකු ලෝකඩ පදක්කම් ලබා ගැනීම

වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන්වල ප්‍රගතිය (ධාරිතා සංවර්ධන නොවන )

- විද්‍යාව ප්‍රචලිත කිරීමේ ශිෂ්‍ය වැඩසටහන "STEAM student camp Star Gate"
- විද්‍යා අධ්‍යාපනය ජාතික මට්ටමෙන් දියත් කිරීමට පළාත් කලාප මට්ටමින් Best Practices හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම

- 2024 අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සඳහා විද්‍යා ආදර්ශ ප්‍රශ්න පත්‍ර සකස් කර බෙදා දීම
- නවක රසායන විද්‍යා ගුරුවරුන් සඳහා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැසියක් පැවැත් වීම
- ගාල්ල රුමස්සල රක්ෂිතය ආශ්‍රිතව පරිසර ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සමඟ සම්බන්ධීකරණය මගින් පුංචි කෘෂි විද්‍යාඥයා වැඩසටහන මගින් ව්‍යවසායකත්ව චර්යා අවස්ථා සිසුන්ට ලබාදීම
- ජාතික ගොඩනැගිලි පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් නායයෑම් අවදානම් ඇති ප්‍රදේශවල පාසල් සිසුන් සඳහා වැඩමුළු පැවැත්වීම
- ජාතික ඔලිම්පියාඩ් තරගාවලිය සංවිධානය කිරීම සහ ජාත්‍යන්තර තරගවලට සිසුන් ඉදිරිපත් කිරීම
- තරුණ විද්‍යාඥයා තරගාවලිය සංවිධානය
- සුනිත්‍ය බලශක්තිය අධිකාරිය සමඟ ශක්ති පරිභෝජනය පිළිබඳ වැඩ සටහනක් පැවැත්වීම

<u>ගණිත ශාඛාව</u>

- සිසුන්ගේ කාර්ය සාධනය සහ ඉහළ පෙළේ චින්තන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් මත පදනම් වූ ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රම හරහා රසවත් හා ප්‍රීතිමත් ගණිත ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම සඳහා ගුරුවරුන් සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ වැඩසටහන පැවැත්වීම
- සුනම්‍ය ඉගෙනුම් ප්‍රවේශයන් හරහා ගණිතය ඉගෙනීමට සිසුන් පෙළඹවීම සඳහා පාසල් ගණිත සමාජ (SMCs) පිහිටුවීම
- සිසුන්ගේ ඉහළ මට්ටමේ චින්තන කුසලතා සංවර්ධනය කිරීම සහ සුහග සිසුන් හඳුනාගෙන ජාතික හා ජාත්‍යන්තර තලයේ ගෞරවණීය ස්ථානයක් හිමිකර ගැනීමට ශක්‍යතා වර්ධනය කිරීම සඳහා ඔලිම්පියාඩ් ගණිත වැඩසටහන පැවැත්වීම
- සිසුන්ගේ සංකල්පීය දැනුම සවිබල ගැන්වීම සඳහා බහුතල ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රමය භාවිත කිරීම පිළිබඳ වැඩසටහන් පැවැත්වීම
- සියලුම සිසුන් ගණිතයේ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්පත් කරගැනීම සඳහා ගණිතය ප්‍රතිකාර්ය ඉගෙනුම් වැඩසටහන පැවැත්වීම
- ඩිජිටල්කරණය වූ ගණිත අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා මිශ්‍ර ඉගෙනුම් වැඩසටහන පැවැත්වීම
- විෂයමාලා සම්බන්ධතා හරහා දරුවන්ගේ පෞරුෂ වර්ධනය සහ ව්‍යවසායකයින් ගොඩනැගීම තුළින් රටේ ආර්ථිකයට දායක විය හැකි පුරවැසියකු බිහිකිරීම සඳහා STEAM ඉගෙනුම් වැඩසටහන පැවැත්වීම
- ගණිතය විෂයය සම්බන්ධව ගුරු සිසු දෙපිරිසගේ ම බුද්ධි කලම්බන අවස්ථාව ඇති කිරීම තුළින් දැනුම හා කුසලතා සංවර්ධනය සඳහා සමස්ත ලංකා ගණිත තරගාවලිය පැවැත්වීම

- සාක්ෂි මත පදනම් වූ තීරණ ගනු ලබන සංස්කෘතියක් ඇති කිරීමට ගුරුවරුන්ගේ සහ නිලධාරීන්ගේ පර්යේෂණ සම්බන්ධ න්‍යායික හා ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීම සඳහා ගණිත අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ වැඩසටහන පැවැත්වීම
- විෂය නිර්දේශයේ සංඛ්‍යාලේඛන සහ සම්භාවිතා කොටස පිළිබඳ ගුරුවරුන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාලේඛන ආයතනය සමඟ උසස් පෙළ සංයුක්ත ගණිතය සහ ගණිතය විෂයය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- සිසුන් පෙලඹවීම තුළින් ප්‍රායෝගික යෙදුම් සඳහා සිසුන්ගේ සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සමඟ එක්ව උසස් පෙළ සංයුක්ත ගණිතය සහ ගණිතය විෂයය ප්‍රායෝගික යෙදුම් ප්‍රවර්ධනය කිරීමට "ගණිතයේ අලංකාරය" ලෙස වැඩසටහන් පැවැත්වීම
- ගුරු සිසුන් ඔවුන්ගේ වෘත්තිය ආරම්භයේදී අලුතින් හඳුන්වා දුන් ක්‍රමවේදයන්, අන්තර්ගතය සහ ඇගයීම් පිළිබඳව බලගැන්වීමට ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ගණිත කථිකාචාර්යවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම
- විශ්ව විද්‍යාල සිසුන්ගේ දායකත්වයෙන් වැඩි සිසුන් ගණනක් අසමත් වන හා සම්පත් අවම පාසල්වල ප්‍රතිඵල ඉහළ නැංවීමට එම සිසුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා සස්නක සංසදය සමඟ එක්ව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

<u>ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව</u>

- ජාතික මට්ටමේ ඉංග්‍රීසි භාෂා සහ නාට්‍ය තරග
- 'English for Future Success ' සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා පෙනී සිටි සහ පාසල් හැර ගිය සිසුන් සඳහා ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානවලපැය 100 ක ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම
- ප්‍රාථමික ශ්‍රේණි දරුවන් සඳහා වාග් මාලා කෝෂය සඳහා පින්තූර
- 'English for Future Success ' පාඨමාලාව සඳහා මොඩියුල සකස් කිරීම
- අ.පො.ස. ස. පෙළ ඉංග්‍රීසි විෂය උපකාරක ප්‍රශ්න පත්‍ර සැකසීම
- බ්‍රිතාන්‍ය කවුන්සලය සමග සහයෝගීතාවයෙන් ඉංග්‍රීසි ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන් සඳහා පර්යේෂණ සමුළුවක් (SLELTEC) පැවැත්වීම
- SPEAK වැඩසටහනේ කඳවුරු පැවැත්වීම සඳහා පළාත් නමයටම ප්‍රතිපාදන වෙන්කර දීම
- පාසල්වල විශිෂ්ට ව්‍යවහාර තෝරාගෙන ඒවාට ප්‍රතිපාදන ලබා දීම
- ජර්මන් භාෂා විෂය සඳහා 10 –11 ශ්‍රේණි පෙළපොත් නිෂ්පාදනය
- 3 ශ්‍රේණිය සඳහා අතිරේක කියවීම් ද්‍රව්‍ය සම්පාදනය

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

**2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය**

- කලාප මට්ටමින් වාණිජ ශිෂ්‍ය කඳවුරු පැවැත්වීම

ජාතික අධ්‍යාපන ශක්‍යතාවලට අනුකූලව වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ ක්‍රියාත්මක වනු ලබන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වාණිජ විෂයන් හදාරන අ.පො.ස. (උසස් පෙළ) සිසුන් වෙනුවෙන් කලාප මට්ටමින් වාණිජ ශිෂ්‍ය කඳවුරු පවත්වනු ලැබේ. මෙහිදි කලාප මට්ටමින් ශිෂ්‍ය කඳවුරු සඳහා සිසුන් හා ගුරුවරුන් 8000 ක් පමණ සහභාගි වූ අතර විෂයානුබද්ධ විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් පැවැත්වුණි.

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්

පාසල් සිසුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා, නව තාක්ෂණික කුසලතා හා වෘත්තීය නිපුණතා සංවර්ධනය කර ඵලදායී ආර්ථික කටයුතු සඳහා දායක වන ව්‍යවසායකයින් බිහි කිරීමේ අරමුණින් තෝරාගත් පාසල් කිහිපයක සිසුන් හා ගුරුවරුන් 1360 ක පමණ පිරිසක් සඳහා වැඩසටහන් පැවැත්වුනි.

- හොඳම පාසල් වාණිජ දින තරඟාවලිය

පාසල්වල පවත්වනු ලබන වාණිජ දිනය වඩාත් අර්ථාන්විතව හා ඵලදායී අයුරින් පැවැත්වීම දිරිගැන්වීමේ අරමුණින් ශ්‍රී ලංකා සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරී ආයතනය (CMA Sri Lanka) මගින් කලාප, පළාත් හා ජාතික මට්ටමින් පවත්වනු ලබන තරගාවලියකි.

- පාසල්වල හොඳම වාර්ෂික වාර්තාව තේරීමේ තරගාවලිය

දිවයිනේ අ.පො.ස.(උ.පෙළ) සහිත සියලුම පාසල්වල වාර්ෂික ගිණුම් වාර්තා හා මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ශ්‍රී ලංකා ගණකාධිකාරණ ශිල්පීය ආයතනය (AAT) විසින් පළාත් හා ජාතික මට්ටමින් පවත්වන ලදි.

- ප්‍රාග්ධන වෙළඳපොළ සංගම් සඳහා ප්‍රශ්න විචාරාත්මක තරඟය

ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) සහ කොළඹ කොටස් හුවමාරුව (CSE) අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගීත්වයෙන් පාසල් දරුවන්ගේ මූල්‍ය සාක්ෂරතාව ය හා මූල්‍ය විනය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රාග්ධන වෙළඳපොළ සංගම් පිහිට වූ පාසල් 100 අතර පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් ප්‍රශ්න විචාරාත්මක තරගාවලියක් පැවැත්වුණි.

තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

- උසස්පෙළ සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඇති විෂයන් හදාරන දිවයිනේ සියලු ම සිසුන් වෙනුවෙන් ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, නිර්මාණකරණ තාක්ෂණවේදය සහ ගෘහ ආර්ථික විද්‍යාව යන විෂයන්වල පෙරහුරු ප්‍රශ්න පත්‍ර සැකසීමේ වැඩසටහන් පැවැත්වීම

- ගෘහ ආර්ථික විද්‍යා පෙරහුරු ප්‍රශ්න පත්‍ර සැදීමට සහභාගි වන ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ඉංජිනේරු තාක්ෂණවේදය විෂය උගන්වනු ලබන ගුරුවරුන් සඳහා කෘතිම බුද්ධිය සහ රොබෝ තාක්ෂණය පිළිබඳ වැඩසටහනක් පැවැත්වීම
- සමස්ත ලංකා තරගාවලියේ ප්‍රශ්න පත්‍රය සැකසීම (ගෘහ ආර්ථික විද්‍යාව)
- අ.පො.ස. (සා.පෙ.) ගෘහ ආර්ථික විද්‍යාව පෙරහුරු ප්‍රශ්න පත්‍රය සැකසීමේ වැඩසටහන් පැවැත්වීම
- අ.පො.ස. (සා.පෙ.) නිර්මාණකරණ තාක්ෂණවේදය විෂයෙහි පෙරහුරු ප්‍රශ්න පත්‍රය සැකසීමේ වැඩසටහන් පැවැත්වීම
- නවෝත්පාදන විද්‍යාගාර 750 සහිත පාසල්වලට බෙදාදීම සඳහා ඊට අදාළ Portfolio මුද්‍රණය කිරීම
- ගෘහ ආර්ථික විද්‍යා විෂය උගන්වනු ලබන ඌව සහ සබරගමුව යන පළාත්වල ගුරුවරුන් පුහුණු කිරීම
- නවෝත්පාදන විද්‍යාගාර භාර ගුරුවරුන්ගේ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ඉංජිනේරු තාක්ෂණවේදය ඉගැන්වීම සඳහා බස්නාහිර,දකුණ,මධ්‍යම පළාත්වල නව පත්වීම්ලාභී ගුරුවරුන් පුහුණු කිරීම
- සමස්ත ලංකා ගෘහ ආර්ථික විද්‍යා දැනුම මිනුම තරගය පැවැත්වීම
- නවෝත්පාදන විද්‍යාගාර සහිත පාසල් 45ක් සඳහා තාක්ෂණ උපකරණ ලබාදීම සහ නවෝත්පාදන විද්‍යාගාර සහිත පාසල් 200ක් සඳහා රොබෝ කිට් මිලදී ගැනීම (මේ වන විට උතුරු මැද, මධ්‍යම හා වයඹ පළාත්වලට රොබෝ කට්ටල බෙදා දී අවසන් කර ඇත. ඉතිරි පළාත් සඳහා මේ වසරේ ජුනි මසට පෙර බෙදාදී අවසන් කිරීමට සැලසුම් කර ඇත. )
- ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව පවතින පාසල් 486ක් සඳහා අවශ්‍ය ක්ෂය ද්‍රව්‍ය ලබාගැනීමට ප්‍රදාන ලබාදීම
- සමස්ත ලංකා රොබෝ තාක්ෂණ හා නව නිපැයුම් තරගාවලිය පැවැත්වීම
- උසස් පෙළ ගෘහ ආර්ථික විද්‍යා විභාග මධ්‍යස්ථානවල ප්‍රායෝගික පරීක්ෂණ සඳහා උපකරණ මිලදී ගැනීමට ප්‍රදාන ලබාදීම

<u>කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව</u>

**2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්**

**1.**ප්‍රතිකාර්ය වැඩසටහන් පැවැත්වීම පිළිබඳ උපදෙස් අත්පොත්, මොඩියුල හා ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම හා ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**1.1** හරිත සංකල්පය ක්‍රියාත්මක වන පාසල් බිහි කිරීමේ අරමුණින් පාසල් පද්ධතියට මෙම වැඩසටහන හඳුන්වා දීම පිණිස නියාමක ලෙස තෝරා ගත් පාසල් 15ක විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සියලු පාසල්වල ක්‍රියාත්මක කිරීමට අදාළ නිර්ණායක ඇතුළත් නියාමන රාමුවක් සකස් කිරීම සිදු කරන ලදී.

1.2 2013 වර්ෂයේ ආරම්භ කරන ලද අ.පො.ස. (උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය 2015 සිට 2023 දක්වා ශිෂ්‍ය කණ්ඩායම් 08ක් අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින ලද අතර මෙම විෂය හැදෑරීමෙන් පසු ඔවුන් සිටින තත්ත්වය හඳුනා ගැනීමට හා ගුරුවරුන්ගේ හා ශිෂ්‍යයින්ට පවතින ගැටලු හඳුනා ගැනීමට පර්යේෂණයක් සිදු කිරීමේ අවශ්‍යතාව පැන නැඟී ඇති බැවින් ඒ සඳහා පර්යේෂණ සිදුකර ආදාළ පර්යේෂණ වාර්තාව සකස් කරන ලදි.

1.3. අ.පො.ස. (උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය හා කෘෂි විද්‍යාව යන විෂයය සිසුන් සඳහා පළාත් මට්ටමින් ප්‍රායෝගික පුහුණු කඳවුරු පවත්වන ලදි.

1.4 . අ.පො.ස.(උ.පෙළ) කෘෂි විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය, අ.පො.ස.(ස.පෙළ) කෘෂි හා ආහාර තාක්ෂණ විෂයය සඳහා ආදර්ශ ප්‍රශ්න පත්‍ර සකස් කිරිම හා පළාත් නිලධාරීන් හරහා සියලු ම ගුරුවරුන් හා පාසල් වෙත ලබා දීම සිදු කරන ලදි.

02. ලෝක ජල දිනය නිමිත්තෙන් පාසල්වල ග්ලෝබ් පරිසර අධ්‍යයන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජල හා වායුගෝල අධ්‍යයනය පිළිබඳ ගුරුවරුන් හා ශිෂ්‍යයින් සඳහා ප්‍රායෝගික වැඩසටහනක් පැවැත්වීම.

03. ජෛව පද්ධති තාක්ෂණවේදය ප්‍රයෝගික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පරිභෝජන හා රසායන ද්‍රව්‍ය මිලදී ගැනිම් සඳහා පාසල් 215ක් සඳහා රුපියල් මිලියන 15ක මූල්‍ය ප්‍රදානයක් ලබා දෙන ලදි.

04. සමස්ත ලංකා කෘෂි දැනුම මිනුම තරඟය 2024 වර්ෂය සඳහා පවත්වන ලද අතර එහිදි ජාතික මට්ටමින් තරගය සඳහා සිසු සිසුවියන් 45ක් සහභාගී විය. එම තරඟය පාසල්, කොට්ඨාසය, කලාප, පළාත් හා ජාතික මට්ටමින් පවත්වන ලදි.

05. ජෛව පද්ධති තාක්ෂණවේදය විද්‍යාගාර පවතින පාසල් 115ක් සඳහා රුපියල් මිලියන 59.16ක විද්‍යාගාර උපකරණ ලබා දෙන ලදි.

06. සමස්ත ලංකා කෘෂි විද්‍යා දැනුම මිනුම වැඩසටහන පැවැත්විම

<u>ද්විභාෂා අධ්‍යාපන ශාඛාව</u>

- ද්විභාෂා අධ්‍යාපනය පුළුල් කිරීම
- විවිධ පළාත්වල පාසල් 34ක ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කිරිම
- නව ද්විභාෂා අධ්‍යාපන චක්‍රලේඛයක් සකස් කොට නිකුත් කිරීම සහ පළාත් කලාප සම්බන්ධීකාරකවරුන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර ද්විභාෂා අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
- 5 ශ්‍රේණියේ සිසුන් සඳහා පවත්වන ලද ද්විභාෂා කඳවුරු 117ක් මගින් දරුවන් 10000කට ආසන්න ප්‍රමාණයක් දැනුවත් කිරීම
- අ.පො.ස සා/පෙළ හා උසස් පෙළ ඉගෙනුම් ද්‍රව්‍ය සහ වෙබිනාර් සම්මන්ත්‍රණ සහභාගීත්වය සඳහා ද්විතීක ශ්‍රේණි දරුවන් 10000කට පමණ අවස්ථාව ලබා දීම

| | ක්‍රියාකාරකම |
|---|---|
| 1 | ද්විභාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන සිසුන්ගේ ඉදිරිපත් කිරීමේ සහ වාර්තා ලිවීමේ කුසලතා වර්ධනය |
| 2 | පර්යේෂණ සමුළුව සහ සහතික පත්‍ර ප්‍රදානය |
| 3 | අ.පො.ස සා /පෙළ සහ උසස් පෙළ උපකාරක ප්‍රශ්න පත්‍ර සකස්කර ප්‍රදානය |
| 4 | වෙබිනාර් සංවිධානය |
| 5 | 5 ශ්‍රේණියේ සිසුන් සඳහා කඳවුරු පැවැත්වීම |

ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම නියාමනය හා අධීක්ෂණය

පාසල් 5ක් නිරීක්ෂණය කර පන්ති කාමර මට්ටමින් CLIL සහ පාසල් සන්දර්භය ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ නියාමන උපකාරක දෙකක් කෙටුම්පත් කර ඇත.

<u>කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව</u>

**<u>2024.12.31 දක්වා භෞතික ප්‍රගතිය</u>**

- දකුණ, බස්නාහිර,වයඹ,සබරගමුව, ඌව හා උතුර යන පළාත් වල පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය (SEQI) 50% අඩු පාසල් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- කොට්ඨාස අධ්‍යාපන කාර්යාල අධීක්ෂණ මෙවලම සකස් කිරීම
- පළාත් ප්‍රමිති සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම
- පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳව පර්යේෂණ පොත එළි දැක්වීම හා පර්යේෂණ සම්මන්ත්‍රණයක් (Symposium)පැවැත්වීම
- පාසල් ප්‍රමිති සහතික කිරීමේ ක්‍රියාවලියට අදාළ මාර්ගෝපදේශය සමාලෝචනය හා සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කළ ප්‍රශ්නාවලි විශ්ලේෂණය කර තේමා 6ක් සඳහා උප සංරචක අවසන් කිරීම
- පාසල් ලේඛන සඳහා සම්මත කේතීකරණ පද්ධතිය සකස් කිරීම සඳහා කේතනය අවශ්‍ය පාසල් ලේඛන හඳුනා ගැනීම
- 2023 වාර්ෂික වාර්තාව කෙටුම්පත් කිරීම
- සංශෝධිත කලාප අධ්‍යාපන කාර්යාල අධීක්ෂණ මෙවලම කෙටුම්පත සකස් කර ඇත.

- "ගුරු ප්‍රතිභා ප්‍රභා" ජාතික වැඩසටහන පැවැත්වීම
- ජාතික පාසල් 12ක බාහිර ඇගයීම් සිදු කිරීම
- ඉගෙනුම් සම්පත් ඒකක සඳහා සහ සුහසාධන හා පරිපාලන ඒකක සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමේ ලේඛන එක් රැස් කර මාර්ගෝපදේශ අවශ්‍යතා හඳුනාගෙන ඇත.
- පාසලේ තෝරාගත් අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නිපුණතා රාමුවක් සකස් කිරීම සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩ ක්ෂේත්‍රය හඳුනාගෙන ගැනීම.
- පාසල් ලේඛන සඳහා සම්මත කේතීකරණ පද්ධතිය සකස් කිරීම සඳහා පාසල් පද්ධතියේ භාවිතවන ලේඛණ හා ආකෘතිපත්‍ර රැස් කිරීම.
- 2023 වාර්ෂික වාර්තාව සකස් කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම සිදු කරමින් පවතී.
- කලාප අධ්‍යාපන කාර්යාල අධීක්ෂණ මෙවලම නැවත සංශෝධනය කිරීම සඳහා වන මූලික සැලසුම කෙටුම්පත් කර ඇත.
- "ගුරු ප්‍රතිභා ප්‍රභා" ජාතික වැඩසටහන පැවැත්වීමට ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් තෝරා අවසන් කර උත්සව කටයුතු සංවිධානය කරමින් පවතී.
- ජාතික පාසල් 07ක බාහිර ඇගයීම් සිදු කිරීම.
- ඉගෙනුම් සම්පත් ඒකක සඳහා සහ සුහසාධන හා පරිපාලන ඒකක සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමේ ලේඛන එක් රැස් කිරීම.

2024 වර්ෂය අවසන් වන විට අපේක්ෂිත කාර්යසාධනය

- පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දර්ශකය (SEQI) 50% අඩු පාසල් සඳහා පළාත් මට්ටමින් ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වා එම පාසල්වල අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ නැංවීමට කටයුතු කිරීම
- සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය( GEMP) සඳහා 2024 වර්ෂයට අදාළ ව පාසල් 600ක් තෝරා ඒවායේ විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ කටයුතු සංවිධානය කිරීම හා තෝරාගත් පාසල් 600ක අභ්‍යන්තර බාහිර ඇගයීම් ක්‍රියාත්මක කිරීම
- පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව - 2023 සම්බන්ධ වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම
- 2024 "ගුරු ප්‍රතිභා ප්‍රභා" ජාතික වැඩසටහන පැවැත්වීම
- ජාතික පාසල්වල බාහිර ඇගයීම් සිදු කිරීම
- කලාප අධ්‍යාපන කාර්යාල අධීක්ෂණ සඳහා වන මාර්ගෝපදේශය නිම කිරීම
- අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ කලාප ප්‍රමිති සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීම
- පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳව පර්යේෂණ පොත එළි දැක්වීම හා පර්යේෂණ සම්මන්ත්‍රණයක් (Symposium)පැවැත්වීම.
- පාසල් ලේඛන සඳහා සම්මත කේතීකරණ පද්ධතිය සකස් කිරීම
- පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක ඇගයීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා වන මාර්ගෝපදේශය සංශෝධනය කිරීම

- ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය සඳහා (SLISAS) නිපුණතා රාමුවක් සකස් කිරීම සඳහා කෙටුම්පතක් සකස් කිරීම

<u>ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව</u>

ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාවේ කාර්යයභාරයට අදාළව 2024 වර්ෂයේ ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන් හා ළඟාකරගත් කාර්යය සාධනය පිළිබඳ තොරතුරු

- O/L සඳහා සියලු ම ආගමික විෂයයන් සඳහා ප්‍රතිපෝෂණ පත්‍ර 64 ක් සකස් කිරීම
- ලකුණු 40ට අඩු සාමාන්‍ය පෙළ සිසුන් සඳහා මාර්ගගත ප්‍රතිපෝෂණ වැඩසටහන් පැවැත්වීම
- සියලු ම ආගමික විෂයයන් සඳහා අ.පො.ස (සා.පෙළ) සිසුන් සඳහා ආදර්ශ Google ආකෘති පත්‍ර පැවැත්වීම
- සිසුන් සඳහා සතිමත් බව පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ආගමික විෂයයන් පිළිබඳව, නිලධාරීන් සහ ISA සඳහා දැනුවත් කිරීමේ සහ ප්‍රගති සමාලෝචන වැඩසටහනක් පැවැත්වීම
- වෙසක් උත්සවය සැමරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩසටහන් පැවැත්වීම
- වෙසක් සතියක් විවිධ වැඩසටහන් ඇතුළත්ව ක්‍රියාත්මක කරන ලදි
- පාසල් සිසුන් සඳහා ගංගාරාම විහාරස්ථානයේ දායකත්වයෙන් වෙසක් කූඩු ඇගයීම් වැඩසටහනක් පැවැත්වීම
- නත්තල් උත්සවය සැමරීම සඳහා වැඩසටහන් පැවැත්වීම
- නව රාත්‍රී උත්සවය සැමරීම
- මිලාද් නබි උත්සවය සැමරීම
- ආගමික උපදේශක මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම
- සිසුන් සඳහා ආගමික විෂයයන් පිළිබඳ AL අයිතම විශ්ලේෂණය භාවිතා කරමින් උසස් පෙළ සම්මන්ත්‍රණ පැවැත්වීම
- සියලු ම ආගමික විෂයයන් සඳහා අ.පො.ස (උ.පෙළ) සිසුන් සඳහා ආදර්ශ Google ආකෘති ප්‍රශ්න පත්‍ර ලබා දීම.
- උසස් පෙළ ආගමික විෂයයන් සම්බන්ධයෙන් ගුරුවරුන් විෂය දැනුම ඉහළ නැංවීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම
- මිශ්‍ර ඉගෙනුම සඳහා උසස් පෙළ ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම
- විදුහල්පතිවරුන් සතිමත් බව පුහුණු කිරීම සඳහා පුහුණු කිරීම
- සති පාසල් පදනම සමග එක්ව ගෝලීය සති සම්මේලනය 2024 පැවැත්වීම

<u>අධ්‍යාපන සංවර්ධන ශාඛාව</u>

- අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශයේ අධ්‍යක්ෂවරුන්ගේ ගුණාත්මකභාවය සංවර්ධනය කිරිමට වැඩසටහන් සිදු කිරීම
- ජාතික විභාග ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම හා එම ප්‍රතිඵල විශලේෂණ යොදා ගනිමින් විෂය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරිම සඳහා අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශයේ ශාඛා වෙත තොරතුරු ලබා දීම.
- විෂය කාර්ය සාධන දර්ශක ඉහළ නැංවීම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල අධ්‍යාපන සංවර්ධන විෂය භාර නිලධාරීන් සමග කටයුතු කිරීම.
- ද්විතීක අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන සඳහා තොරා ගන්නා ලද පාසල් සඳහා විද්‍යා, තාක්ෂණ, ගණිත, වාණිජ (STMC) විෂය ධාරාවන් යටතේ විෂයන් 13ක් සංවර්ධනය කිරීමට මූල්‍ය ප්‍රදාන ලබා දීම. මේ යටතේ තෝරාගත් පාසල් 154ක විෂයයන් සංවර්ධනය සඳහා රු.මි. 8ක ප්‍රදානයක් ලබා දීම.
- ව්‍යවසායකත්ව සංකල්පය පාසල් ප්‍රජාව තුළ ස්ථාපිත කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලය සමග පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

<u>ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම</u>

**2024** වර්ෂයේ ලබාගත් විශේෂ ජයග්‍රහණ

- කාරක සභිකයින් තෝරාගැනීමේ නිලවරණය 2024 පෙබරවාරි 09 වන දින පැවැත්වීම
- ඉහළ සාධන මට්ටම් ඇති පිරිවෙන් 73ක් සඳහා විෂය නිර්දේශයට අදාළව රුපියල් ලක්ෂ 10ක් වටිනා පොත් කට්ටල බෙදාදීම
- ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන විභාග සමතුන් හට සහතිකපත්‍ර 852ක් නිකුත් කිරීම
- ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන විභාග සමතුන් 243කගේ ප්‍රතිඵල සනාථ සකස්කොට කලාප වෙත යොමු කිරීම

**2024** ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය

- කාරක සභා රැස්වීම් 02ක් පැවැත්වීම
- 2023 (2024) වර්ෂයේ ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන විභාග පැවති සියලු දිස්ත්‍රික්කවල විභාග අධීක්ෂණ කටයුතු සිදුකිරීම
- විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම හා ප්‍රාචීන අධ්‍යාපනයට අදාළ කාර්යයන් සිදුකිරීම සඳහා අධ්‍යාපන මණ්ඩල රැස්වීම් 6ක් පැවැත්වීම
- 2022 (2023) වර්ෂයේ ප්‍රාචීන විභාගවලින් විශිෂ්ට සාමර්ථ්‍ය ලබාගත් ශිෂ්‍යයින් හට 2024.08.13 වන දින ශිෂ්‍යාධාර ප්‍රදානෝත්සවය පැවැත්වීම

**විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන අංශය**

**විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන අංශය යටතේ අතිරේක ලේකම් ලෙස සුජාතා කුලේන්ද්‍රකුමාර් මහත්මිය කටයුතු කරනු ලබන අතර මෙම අංශය යටතේ ශාඛා හතරක වැඩසටහන් ක්‍රියාත්මක වේ. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධව, විෂය සමගාමී ක්‍රියාකාරකම් සම්බන්ධව,පාසල් ළමුන්ගේ සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධව, පාසල් ක්‍රීඩා සම්බන්ධව වැඩසටහන් මෙම අංශය මඟින් ක්‍රියාත්මක වේ.**

**අංශය යටතේ පවතින ශාඛා**

**පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව**

**ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව**

**විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන ශාඛාව**

**සෞඛ්‍ය ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව**

**2024 වර්ෂයේ ලබාගත් විශේෂ ජයග්‍රහණ**

**1. පාසල් ශිෂ්‍ය නායකයින් පත් කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව චක්‍රලේඛයක් හා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම.**

- **2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය පාසල් වෙත නිකුත්කර ඇත**

**2. පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම් විධිමත් කරලීම සඳහා චක්‍රලේඛයක් හා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම.**

- **චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය පාසල් වෙත නිකුත්කර ඇත**

**3. වෘත්තීය මාර්ගෝපදේශ සැපයීම සහ සහාය සේවාවන් හඳුන්වාදීමේ අරමුණින් අදාළ සියලු ආයතන සම්බන්ධීකරණය කරගනිමින් පාසල් සිසුන්, ගුරුවරුන් හා දෙමව්පියන් ඉලක්ක කරගෙන වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රදර්ශනය පැවැත්වීම**

- **එක් වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රදර්ශනයක් පවත්වා ඇත**

**4. පාසල් උපදේශන හා මාර්ගෝපදේශ ඒකක නගාසිටුවීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.**

- **පළාත් 5 ක් ආවරණය වන ලෙස පාසල් 50 ක් තෝරාගෙන ඇත.**

**5. 2024 වර්ෂයේ සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලියේ කණ්ඩායම් තරග ඉසව් 30 ක් හා මළල ක්‍රීඩා තරගාවලිය සාර්ථකව පවත්වා අවසන් කර ඇත.**

**6. ප්‍රාථමික සිසුන්ගේ මූලික භාෂා සහ ගණිත කුසලතා මත පදනම් වූ ඉගෙනුම් ප්‍රතිකාර්ය වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2024**

**7. ජාතික මට්ටමේ උපදේශකත්වය හා මගපෙන්වීම යටතේ වූ විශේෂ ප්‍රතිකාර්ය වැඩසටහන් පළාත් මට්ටමින් 2025 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීම සහ ඒ තුළින් ප්‍රාථමික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සක්‍රීය කිරීම හා ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් ඇති කිරීම.**

**8.** ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල් 185 සඳහා ප්‍රාථමික අංශ සඳහා ගුණාත්මක ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 8.0 ක මුදලක් ලබා දීම.

**9.** තෝරා ගත් ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සඳහා 1 වර්ගයේ සහ 2 වන වර්ගයේ ඩෙස්ක් / පුටු සහ ගුරු පුටු ලබා දීම.

**10.** ප්‍රාථමික සිසුන්ගේ මූලික භාෂා සහ ගණිත කුසලතා මත පදනම් වූ ඉගෙනුම් ප්‍රතිකාර්ය වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2024

- මෙම ප්‍රතිකාර්ය වැඩසටහන තුළින් ගුරුවරුන් 5924 ක්, විදුහල්පතිවරුන් 4236 ක්, ගුරු උපදේශකවරුන් / නිලධාරීන් 293ක්, සිසුන් 311,450 ක් සහ දෙමාපියන් 12,108 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇත.

**11.** ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සඳහා ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීම.

- ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල්185 ක් සඳහා ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීමට රු.මි. 8.0 ක් ලබා දීම

**12.** තෝරා ගත් ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල්වල සිසුන් සඳහා 1 වර්ගයේ සහ 2 වර්ගයේ ඩෙස්ක් සහ පුටු ලබා දීම සහ ගුරු පුටු ලබා දීම.

- 1 වර්ගයේ ඩෙස්ක් හා පුටු ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල් 40 ක සිසුන් සඳහා සහ 2 ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල් 84 ක් සඳහා ගුරු පුටු ලබා දීම.

- 2 වර්ගයේ ඩෙස්ක් හා පුටු ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල් 54 ක සිසුන් සඳහා ලබා දීම.

## අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අංශය

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන පද්ධතියේ දැවැන්ත පරිවර්තනීය වෙනසක් සිදු කරමින්, යෝජනා ඉදිරිපත් කරමින් අදාළ අංශ සමඟ ඒකාබද්ධව අවසන් තීරණවලට එළඹීම හා අදාළ පරිපාලන යාන්ත්‍රණයේ ප්‍රධානත්වය දැරීම මෙම අංශයේ කාර්ය භාරයයි.

අංශය යටතේ පවතින ශාඛා - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ශාඛාව (අධ්‍යාපන අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ විෂය පථ යටතේ ක්‍රියාත්මකයි.

**2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය (ධාරිතා සංවර්ධන වැඩ සටහන් නොවන) -**

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කිරීම
- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සැකසීමේ සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවීම
- අංශයේ කාර්ය භාරය සම්බන්ධ වාර්ෂික පාලන වාර්තා සැකසීමේ කටයුතු
- ප්‍රාථමික අධ්‍යාපනය, කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපන ජාලයන්හි විෂයමාලා ප්‍රතිසංස්කරණ මෙහෙයවීම
- පූර්ව ළමාවිය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු මෙහෙයවීම
- පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ සංවර්ධනය කරනු ලබන ඇඟයීම් හා තක්සේරු කරන ක්‍රියාවලිය සම්බන්ධීකරණය හා මෙහෙයවීම සඳහා සම්බන්ධ වීම
- නව විෂයමාලා මොඩියුල මුද්‍රණය කිරීම සම්බන්ධව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පරිපාලන ප්‍රතිසංස්කරණ කටයුතු මෙහෙය වීම
- ප්‍රමුඛ පාසල් පෝෂිත පාසල් සමඟ ඒකාබද්ධ කරමින් පාසල් පද්ධතිය මෙහෙය වීම
- ගුරු සංසද පිහිටුවීම පිළිබඳ සියලු සම්බන්ධීකරණ කටයුතු මෙහෙය වීම

ඉංජිනේරු අංශය

- භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජාතික පාසල් සඳහා, අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථාන, අදාළව කෙරෙන ඉදිකිරීම් හා අලුත්වැඩියා වැඩ සඳහා අනුඥා නිවේදන නිකුත් කිරීම හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ ඉංජිනේරු දෙපාර්තමේන්තු සහාය ඇතිව ප්‍රසම්පාදනය කරවීම
- ඉහත ආයතන සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයන් හා පාරිසරික ආරක්ෂණ ක්‍රම භාවිතයෙන් ගොඩනැඟිලි සැලසුම් පිළියෙල කිරීම(වාස්තු විද්‍යාත්මක සහ ඉංජිනේරු) සහ ශක්‍යතාව පරීක්ෂා කිරීම
- අධ්‍යාපන අමාත්‍යංශය යටතට ගැනෙන ජාතික පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ආරම්භකර අර්ධ වශයෙන් නිමකර ඇති ජාතික පාසල්වල ගොඩනැගිලිවල ඉදිකිරීම් නිමකිරීමේ කටයුතු
- ගොඩනැඟිලි ඉදිකිරීමට අදාළ ප්‍රතිමාන (Norms) සකස් කිරීම හා තාක්ෂණික උපදේශනය ලබාදීම
- ගොඩනැඟිලි කඩා ඉවත් කිරීම්, ගොඩනැඟිලි ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම් සහ පවත්වාගෙන යාමට අදාළ චක්‍රලේඛ(01/2012, 01/2013 ....ආදී) කාර්ය සංග්‍රහ සහ මාර්ගෝපදේශයන් නිකුත් කිරීම
- අධ්‍යාපන අමාත්‍යංශයේ සහ අමාත්‍යංශයට අනුබද්ධ සියලුම ආයතනවල ඉදිකිරීම්, නඩත්තු සහ මෙහෙයුම් කටයුතු ඉටුකිරීම (ඉසුරුපාය, අමාත්‍ය සහ ලේකම් නිල නිවස, ගබඩා සංකීර්ණ ආදිය..)
- අවශ්‍ය අවස්ථාවලදී ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටුවලට සහාය ලබාදීම.
- ලෝක බැංකු, ආසියානු සංවර්ධන බැංකු හා වෙනත් මූල්‍යාධාර සපයනු ලබන ආයතන සමඟ එම ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.

අංශය යටතේ පවතින ශාඛා :

- ඉංජිනේරු ශාඛාව
- ඉදිකිරීම් සේවා සැපයීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ශාඛාව

<u>"ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය</u>

- අර්ධ වශයෙන් නිමකර ඇති පළාත්සභා පාසල් ගොඩනැගිලි වැඩ 213ක් අදාළ පළාත්සභා වෙත ප්‍රදානයක් ලබාදී නිමකිරීමට කටයුතු කරමින් පවතී.
- අර්ධ වශයෙන් නිමකර ඇති ජාතික පාසල් ගොඩනැගිලි වැඩ 41ක් නිමකිරිමට කටයුතු කරමින් පවතී.

**2024 වර්ෂයේ ලබාගත් විශේෂ ජයග්‍රහණ :**

**<u>2024 වර්ෂයේ ක්‍රියාත්මක ඉදිකිරීම් කටයුතු සහ ප්‍රගතිය</u>**

| | වැය ශීර්ෂය හා විස්තරය | 2024 වර්ෂයෙන් අවිජේද වී ඇති වැඩ ගණන | 2024 වර්ෂයෙන් අවිච්ඡේද වී ඇති මුදල (රු.මිලියන) | සාමාන්‍ය භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | **126-01-02-00-2001(11)**<br>මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම (අලුත්වැඩියා) | **1** | **30.00** | **90%** |
| 2 | **126-01-02-00-2104(11)**<br>මූලධන වත්කම් අත්පත් කරගැනීම ( නව ඉදිකිරීම්) | **2** | **569.41** | **85%** |
| 3 | **126-02-03-01-2001(11)**<br>ප්‍රාථමික අධ්‍යාපන (අලුත්වැඩියා) | **20** | **72.81** | **35%** |
| 4 | **126-02-03-02-2001(11)**<br>ද්විතියික අධ්‍යාපන (අලුත්වැඩියා) | **104** | **689.24** | **45%** |
| 5 | **126-02-03-02-2104(11)**<br>ද්විතියික අධ්‍යාපන (නව ඉදිකිරීම්) | **9** | **1003.41** | **55%** |
| 6 | **126-02-03-04-2001(11)**<br>උසස්පෙළ වෘත්තීය ධාරාවේ සිසුන්ගේ අධ්‍යාපන හා පුහුණුව සඳහා පහසුකම් සැලසීම | **5** | **10.36** | **90%** |
| 7 | **126-02-03-04-2104(11)**<br>උසස්පෙළ වෘත්තීය ධාරාවේ සිසුන්ගේ අධ්‍යාපන හා පුහුණුව සඳහා පහසුකම් සැලසීම | **7** | **372.80** | **60%** |
| 8 | **126-02-05-01-2001(11)**<br>විශේෂ අධ්‍යාපන (අලුත්වැඩියා) | **-** | **16.26** | **-** |
| 8 | **126-02-05-01-2104(11)**<br>විශේෂ අධ්‍යාපන (නව ඉදිකිරීම්) | **1** | **16.26** | **35%** |
| 9 | **126-02-06-01-2001(11)**<br>ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන (අලුත්වැඩියා) | **13** | **76.58** | **70%** |
| 10 | **126-02-06-01-2104(11)**<br>ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන (නව ඉදිකිරීම්) | **3** | **59.23** | **50%** |
| 11 | **126-02-06-02-2001(11)**<br>ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ (අලුත්වැඩියා) | **40** | **374.87** | **80%** |
| 12 | **126-02-06-02-2104(11)**<br>ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ (නව ඉදිකිරීම්) | **13** | **74.57** | **50%** |
| 13 | **126-02-07-15-2001(11)**<br>වැවිලි ක්ෂේත්‍රයේ පාසල් ද්විතියික මට්ටමට උසස් කිරීම (අලුත්වැඩියා) | **4** | **20.13** | **30%** |

| | වැය ශීර්ෂය හා විස්තරය | 2024 වර්ෂයෙන් අවිජේද වී ඇති වැඩ ගණන | 2024 වර්ෂයෙන් අවිච්ඡෙද වී ඇති මුදල (රු.මිලියන) | සාමාන්‍ය භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 14 | 126-02-07-15-2104(11)<br>වැවිලි ක්ෂේත්‍රයේ පාසල් ද්විතියික මට්ටමට උසස් කිරීම (නව ඉදිකිරීම්) | 5 | 17.60 | 65% |
| 15 | 126-02-07-18-2104(11)<br>සියලුම පාසල් සඳහා සනීපාරක්ෂක සේවා හා ජල පහසුකම් සැපයීම | 3 | 2.83 | 20% |
| 16 | 126-02-07-19-2104(11)<br>ප්‍රාථමික පාසල් 3,577ක පහසුකම් වැඩිදියුණු කිරීම | 2 | 9.38 | 65% |
| 17 | 126-02-07-23-2104(11)<br>ප්‍රාදේශීය හා ග්‍රාමීය පාසල් සඳහා ගුරු නිවාස, විවේකාගාර ආදී පහසුකම් | 1 | 20.25 | 85% |
| 18 | 126-02-07-24-2001(11)<br>ද්විතියික පාසල් 1,000ක පහසුකම් වැඩිදියුණු කිරීම (අලුත්වැඩියා) | 7 | 83.94 | 45% |
| 19 | 126-02-07-24-2104(11)<br>ද්විතියික පාසල් 1,000ක පහසුකම් වැඩිදියුණු කිරීම (නව ඉදිකිරීම්) | 22 | 992.28 | 50% |
| 20 | 126-02-07-25-2001(11)<br>මෑතකාලීන ව්‍යාපෘතිවලට ඇතුළත් නොවූ පාසල් 1,360ක පහසුකම් දියුණු කිරීම (අලුත්වැඩියා) | 3 | 9.05 | 100% |
| 21 | 126-02-07-25-2104(11)<br>මෑතකාලීන ව්‍යාපෘතිවලට ඇතුළත් නොවූ පාසල් 1,360ක පහසුකම් දියුණු කිරීම (නව ඉදිකිරීම්) | 17 | 650.91 | 50% |
| 22 | 126-02-07-27-2104(11)<br>ත්‍රෛභාෂා බහුවාර්ගික පාසලක් පොළොන්නරුවේ ඉදිකිරීම (ශ්‍රී ලංකා රජය / ඉන්දියාව) | 1 | 245.93 | 40% |
| 23 | 126-02-07-27-2104(13)<br>ත්‍රෛභාෂා බහුවාර්ගික පාසලක් පොළොන්නරුවේ ඉදිකිරීම (ශ්‍රී ලංකා රජය / ඉන්දියාව) | 1 | 229.80 | 80% |
| 24 | 126-02-07-27-2104(17)<br>ත්‍රෛභාෂා බහුවාර්ගික පාසලක් පොළොන්නරුවේ ඉදිකිරීම (ශ්‍රී ලංකා රජය / ඉන්දියාව) (වැට්) | 1 | 41.36 | - |
| 25 | 126-02-07-55-2001(11)<br>ද්විතියික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන (ශ්‍රී ලංකා රජය / ABD) | 40 | 83.41 | 60% |

- වසර ගණනාවක් තිස්සේ ජාතික පාසල්වල ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත තුන් අවුරුදු ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර රු.මිලියන 9,600 ක ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කිරීම.

ආරක්ෂිත හා ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් සහතික කිරීම.

## CERC වැඩසටහන යටතේ පාසල් සඳහා ජල හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ වැඩසටහනට අදාළ ප්‍රතිපාදන පිළිබඳ විස්තර

සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ වැඩසටහන

| පළාත | පාසල් සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | සම්පූර්ණ වියදම රු. |
|---|---|---|---|
| බස්නාහිර | 107 | 115 | 78,925,123.34 |
| දකුණ | 88 | 88 | 64,265,974.74 |
| නැගෙනහිර | 87 | 87 | 56,427,000.00 |
| සබරගමුව | 99 | 116 | 76,667,000.00 |
| මධ්‍යම | 106 | 119 | 81,280,000.00 |
| උතුර | 96 | 117 | 76,865,479.00 |
| උතුරුමැද | 100 | 120 | 81,638,118.53 |
| වයඹ | 103 | 135 | 89,246,000.00 |
| ඌව | 58 | 63 | 46,431,357.00 |
| එකතුව | 844 | 960 | 651,746,052.61 |

ජල පහසුකම් ලබාදීමේ වැඩසටහන

| පළාත | පාසල් සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | සම්පූර්ණ වියදම රු. |
|---|---|---|---|
| බස්නාහිර | 4 | 4 | 7,567,706.97 |
| දකුණ | 18 | 18 | 27,895,061.16 |
| නැගෙනහිර | 38 | 38 | 81,665,631.28 |
| සබරගමුව | 22 | 22 | 30,610,020.23 |
| මධ්‍යම | 14 | 14 | 18,331,927.49 |
| උතුර | 65 | 65 | 93,504,678.71 |
| උතුරුමැද | 61 | 61 | 31,389,013.03 |
| වයඹ | 66 | 66 | 83,986,271.74 |
| ඌව | 29 | 29 | 74,682,774.38 |
| එකතුව | 317 | 317 | 449,633,084.99 |

# ශිෂ්‍ය කාර්ය සාධනය

## (අ) පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍ය සාධනය (2018 – 2024)**




**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (2018 – 2024)**

| | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 350,191 | 332,179 | 326,264 | 335,158 | 329,668 | 332,949 | 319,284 |
| ලකුණු 70ට වඩා ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 79.09 | 78.1 | 86.83 | 77.12 | 82.97 | 77.75 | 77.96 |
| මධ්‍යන්‍ය ලකුණ | 117.98 | 114.38 | 125.65 | 109.31 | 115.11 | 111.74 | 107.25 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

## (ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

**අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අ.පො.ස. (උ.පෙළ) සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2017 – 2023)**

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 296,812 | 296,029 | 305,427 | 308,134 | 311,321 | 317,326 | 322,537 |
| අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව | 216,815 | 222,281 | 225,539 | 236,015 | 231,982 | 236,041 | 244,228 |
| අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 73.05 | 75.09 | 73.84 | 76.59 | 74.52 | 74.38 | 75.72 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

**පළාත් අනුව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අ.පො.ස. (උ.පෙළ) සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2022 – 2023)**

| පළාත | 2022 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % |
| බස්නාහිර | 81,093 | 60,789 | 74.96 | 80,474 | 62,056 | 77.11 |
| උතුර | 16,802 | 12,275 | 73.06 | 17,852 | 12,868 | 72.08 |
| දකුණ | 41,446 | 32,165 | 77.61 | 41,302 | 32,301 | 78.21 |
| මධ්‍යම | 40,840 | 29,701 | 72.73 | 41,737 | 31,380 | 75.19 |
| සබරගමුව | 29,642 | 22,285 | 75.18 | 30,599 | 23,421 | 76.54 |
| වයඹ | 37,275 | 27,780 | 74.53 | 38,383 | 28,416 | 74.03 |
| ඌව | 21,367 | 15,876 | 74.3 | 22,217 | 16,465 | 74.11 |
| නැගෙනහිර | 26,874 | 19,819 | 73.75 | 26,780 | 26,780 | 77.36 |
| උතුරු මැද | 21,987 | 15,351 | 69.82 | 23,193 | 23,193 | 71.59 |
| එකතුව | 317,326 | 236,041 | 74.38 | 322,537 | 244,228 | 75.72 |

**අ.පො.ස. (සා.පෙළ) විභාගය (2018 –2023 ඒ ඒ විෂය සමත් ශිෂ්‍ය ප්‍රතිශතය )**




## (ඇ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

**අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය (පාසල් අයදුම්කරුවන්) 2019 - 2023**

| | 2019 (නව නිර්දේශය) | 2019 (පැරණි නිර්දේශය) | 2020 (නව නිර්දේශය) | 2020 (පැරණි නිර්දේශය) | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 173,781 | 61,769 | 251,168 | 24146 | 236,035 | 232,797 | 229,057 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාව | 108,353 | 46,552 | 165,711 | 15,960 | 149,946 | 149,487 | 151,343 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 62.35 | 75.36 | 65.98 | 66.1 | 63.53 | 64.21 | 66.07 |

මූලාශ්‍රය : ඇගයීම් වාර්තාව 2023, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**එක් එක් විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%)**
**( පළමු වරට පෙනී සිටින 2019 - 2023)**






















මූලාශ්‍රය : ඇගයීම් වාර්තාව 2023, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සෘජු ව ම බඳවා ගැනීම් පිළිබඳ පහත වගුවේ දැක්වේ.**

| සේවය හා ශ්‍රේණිය | බඳවාගත් සංඛ්‍යාව/ උසස් කළ සංඛ්‍යාව | වෙනත් කරුණු |
|---|---|---|
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය - III ශ්‍රේණිය | බඳවා ගැනීම් :- සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත - 67 | සීමිත පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් **442** ක් බඳවා ගැනීමට අදාළව සම්මුඛ පරීක්ෂණ පවත්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත ඊට අදාළ ලේඛන යොමු කර ඇත.<br>විවෘත පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට **113** ක් බඳවා ගැනීමට අදාළව සම්මුඛ පරීක්ෂණය පවත්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත ඊට අදාළ ලේඛන යොමු කර ඇත. |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය | උසස් කිරීම් :- 13 | 2024.01.01 දිනට - 05<br>2024.07.01 දිනට - 08 |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය - I ශ්‍රේණිය | උසස් කිරීම් :- 39 | |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය - II ශ්‍රේණිය | උසස් කිරීම් - 295 | |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා විදුහල්පති සේවය | III - 164 | I ශ්‍රේණියට - 511<br>II ශ්‍රේණියට - 1064 |
| ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | උසස් කිරීම් :- 74 | |

**ද්විතීයික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන (Secondary Education Sector Improvement Programme (SESIP) )**

| | | |
|---|---|---|
| DLI 1 | - | 21 වන සියවසේ කුසලතා නිරූපණය වන පරිදි ශිෂ්‍ය ඉගෙනුම් බලගැන්වීම උදෙසා නව ජාතික ශිෂ්‍ය ඇගයීම් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කරලීම. |
| DLI 2 | - | අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) සඳහා විමර්ශණාත්මක / ගවේශණාත්ම ඉගෙනුම් පදනම් කරගත් ජාතික නව විෂයමාලාවක් මිශ්‍රිත (Online / Face to Face) ඉගැන්වීම සඳහා උචිත වන පරිදි සංවර්ධනය කර ක්‍රියාත්මක කරවාලීම. |
| DLI 3 | - | අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) ඉගැන්වීමේ යෙදෙන ගුරුවරුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාදාම විමර්ශණාත්මක / ගවේශණාත්මක, අන්තර් ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද සහ මිශ්‍රිත ඉගෙනුම් ක්‍රමවේද සඳහා පුහුණු කිරීම සහ අ.පො.ස. (සා.පෙළ) විද්‍යාව සහ ගණිතය,අ.පො.ස.(උ.පෙළ) තෝරාගත් විෂයයන් මාර්ගගත හෝ දුරස්ථ හෝ මුහුණට මුහුණලා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම. |
| DLI 4 | - | අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) සඳහා ඉලක්ක සත්‍යාපනය කිරීම සඳහා තෝරාගනු ලබන විෂයයන් 13 ක් ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගත් නියැදි පාසල් 750ක් සඳහා ප්‍රමුඛතාවයකින් යුතු ව ගුරු තුලනය සහ සැපයුම තහවුරු කිරීම. |
| DLI 5 | - | ද්විතීයික අධ්‍යාපනය සඳහා යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමූහය ක්‍රියාත්මක කරනු වස් සමස්ත අධ්‍යාපන නායකත්වයේ සහාය ප්‍රශස්ත පරිදි ලබා ගැනීම සඳහා පුහුණු කිරීම හා බලගැන්වීම. |
| DLI 6 | - | ප්‍රමුඛතාවයකින් යුතුව හඳුනාගනු ලබන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉලක්ක ඉටු කරවාලීම සඳහා වාර්ෂික පදනමින් පළාත් අධ්‍යාපන බලධාරීන් සහ රේඛීය අමාත්‍යාංශ බලධාරීන් අතර කාර්යසාධන හවුල්කාර ගිවිසුම ඇති කරලීම සහ ඉලක්ක කරා ළඟා කරවාලීම. |
| DLI 7 | - | අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලු ම කාර්යසාධන වාර්තා ආංශික ප්‍රතිමාන (Sector Indicators) අධ්‍යාපන අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය තුළ ප්‍රසිද්ධ කිරීමට කටයුතු කිරීම. |

## 2024 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කළ චක්‍රලේඛ

| අනු අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛ අංකය | චක්‍රලේඛයේ මාතෘකාව | නිකුත් කළ ශාඛාව |
|---|---|---|---|---|
| 01 | 2024.01.09 | 01/2024 | පාසල්වල අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථානගත කිරීම සහ ස්ථාන මාරු විධිමත් කිරීම සඳහා පාසල් වර්ගීකරණය | ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව |
| 02 | 2024.01.31 | 02/2024 | පාසල් යටිතල පහසුකම් සහ පාරිසරික සැකැස්ම පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ සංග්‍රහය | නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව |
| 03 | 2024.02.09 | 03/2024 | සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2024 | සෞන්දර්ය ශාඛාව |
| 04 | 2024.02.09 | 04/2024 | සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2024 | සෞන්දර්ය ශාඛාව |
| 05 | 2024.02.20 | 05/2024 | මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීම - 2024 වර්ෂය | මුදල් ශාඛාව |
| 06 | 2024.02.21 | 06/2024 | පාසල් සිසුන්ට නොමිලේ පාසල් නිල ඇඳුම් රෙදි ලබා දීමේ වැඩසටහන - 2024 | ප්‍රසම්පාදන ශාඛාව |
| 07 | 2024.02.26 | 07/2024 | සමස්ත ලංකා පාසල් සංගීත තරගය - 2024 (සිංහල මාධ්‍යය) | සෞන්දර්ය ශාඛාව |
| 08 | 2024.02.26 | 08/2024 | සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය - 2024 (සිංහල මාධ්‍යය හා දෙමළ මාධ්‍ය ) | සෞන්දර්ය ශාඛාව |
| 09 | 2024.02.27 | 09/2024 | විද්‍යා ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන උපදෙස් සංග්‍රහය | විද්‍යා ශාඛාව |
| 10 | 2024.03.14 | 10/2024 | 2024 පාසල් අධ්‍යයන වර්ෂයේ දී පාසල් දරුවන් නාට්‍ය සහ චිත්‍රපට දර්ශන නැරඹීම සඳහා සහභාගි කරවීම | සෞන්දර්ය ශාඛාව |
| 11 | 2024.03.15 | 11/2024 | උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවේ සිසුන්ගේ වෘත්තීය පුහුණු කටයුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස සිදු කිරීම | සැමට අධ්‍යාපන ශාඛාව |
| 12 | 2024.03.22 | 12/2024 | පාසල් ශිෂ්‍ය නායක මණ්ඩල තෝරා ගැනීම පිළිබඳ උපදෙස් සංග්‍රහය | ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන, විෂය සමගාමී, මාර්ගෝපදේශ උපදේශන ශාඛාව |
| 13 | 2024.03.27 | 13/2024 | සමස්ත ලංකා ගණිත තරගාවලිය | ගණිත ශාඛාව |
| 14 | 2024.04.24 | 14/2024 | පාසල්වල යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම හා නව නිපැයුම් තරග පැවැත්වීම | තාක්ෂණ අධ්‍යාපන ශාඛාව |
| 15 | 2024.04.29 | 15/2024 | සමස්ත ලංකා පාසල් භරත නාට්‍යම් තරගය - 2024 | සෞන්දර්ය ශාඛාව |
| 16 | 2024.04.29 | 16/2024 | සමස්ත ලංකා පාසල් කරුණාටක සංගීත තරගය - 2024 | සෞන්දර්ය ශාඛාව |

| අනු අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛ අංකය | චක්‍රලේඛයේ මාතෘකාව | නිකුත් කළ ශාඛාව |
|---|---|---|---|---|
| 17 | 2024.04.29 | 17/2024 | පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා මිලදී ගැනීමට තිළිණපත් නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | පාසල් සෞඛ්‍ය හා පෝෂණශාඛාව |
| 18 | 2024.05.13 | 18/2024 | ශ්‍රී බුද්ධ වර්ෂ 2568 වන වෙසක් සතිය | ආගමික හා සාර්ධර්ම ශාඛාව |
| 19 | 2024.05.13 | 19/2024 | විද්‍යා ඔලිම්පියාඩ් වැඩසටහන | විද්‍යා ශාඛාව |
| 20 | 2024.05.15 | 20/2024 | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය අවසන් වීමෙන් පසුව අ.පො.ස. (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීම | පාසල් කටයුතු ශාඛාව |
| 21 | 2024.05.22 | 21/2024 | අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2025 | ඒකාබද්ධ සේවා ශාඛාව |
| 22 | 2024.05.28 | 22/2024 | සුහග සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන | පාසල් කටයුතු ශාඛාව |
| 23 | 2024.06.20 | 23/2024 | උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවේ සිසුන්ගේ වෘත්තීය පුහුණුව පාසල් මඟින් නියාමනය අනිවාර්ය කිරීම | සැමට අධ්‍යාපන ශාඛාව |
| 24 | 2024.06.20 | 24/2024 | "කර්මාන්ත ව්‍යවසායකත්ව කව වැඩසටහන " | වානිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව |
| 25 | 2024.06.25 | 25/2024 | පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම | පාසල් කටයුතු ශාඛාව |
| 26 | 2024.07.04 | 26/2024 | තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථානවල පරිපාලනමය හා මූල්‍ය කළමනාකරණ පිළිබඳ චක්‍රලේඛ සඳහා අංක ලබා ගැනීම | දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව |
| 27 | 2024.07.10 | 27/2024 | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2025 | ගුරු අධ්‍යාපනඥ ශාඛාව |
| 28 | 2024.07.10 | 54/2023 (I) | පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොත - 54/2023 | පාසල් කටයුතු ශාඛාව |
| 29 | 2024.07.25 | 28/2024 | උපකෘත විශේෂ පාසල්වල ගුණාත්මක අධ්‍යාපනය තහවුරුව සඳහා චක්‍රලේඛය | නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව |
| 30 | 2024.07.31 | 06/2021 (I) | පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය තීරණය කිරීම | දත්ත කළමනාකරණ ශාඛාව |
| 31 | 2024.08.02 | 29/2024 | සුරක්ෂා සිසු රක්ෂණාවරණය | පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව |
| 32 | 2024.08.12 | 30/2024 | "හරිත නායක වැඩසටහන අධ්‍යාපන විද්‍යාපීඨ තුළ ක්‍රියාත්මක කිරීම " | අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාව |

| අනු අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛ අංකය | චක්‍රලේඛයේ මාතෘකාව | නිකුත් කළ ශාඛාව |
|---|---|---|---|---|
| 33 | 2024.09.09 | 31/2024 | පාසල්වල විෂය සමගාමී කටයුතු සංවිධානය හා කළමනාකරණය | විෂය සමගාමී, මාර්ගෝපදේශ උපදේශන ශාඛාව |
| 34 | 2024.09.11 | 03/2022 (II) | පාසල් ක්‍රීඩා චක්‍රලේඛය සංශෝධනය කිරීම | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව |
| 35 | 2024.10.15 | 32/2024 | 2025 - පාසල් වාර සටහන | පාසල් කටයුතු ශාඛාව |
| 36 | 2024.10.16 | 33/2024 | පාසල් අධ්‍යාපන කටයුතු හා සන්නිවේදන සඳහා "සමාජ සන්නිවේදන යෙදවුම්" භාවිත කිරීම | පාසල් කටයුතු ශාඛාව |
| 37 | 2024.11.11 | 34/2024 | ද්විතියික ශ්‍රේණි (6-11) සඳහා ද්වි භාෂා අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම | ද්වි භාෂා අධ්‍යාපන ශාඛාව |
| 38 | 2024.11.12 | 35/2024 | විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා විශේෂ විභාග පහසුකම් සැපයීම (2025.01.01 දින අවලංගු කරන ලදී) | නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව |
| 39 | 2024.11.28 | 36/2024 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ටවර්හෝල් රඟහල පදනම විසින් 30 වැනි වරට සංවිධානය කරන ලද සමස්ථ ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරගාවලිය 2024/2025 | සෞන්දර්ය ශාඛාව |
| 40 | 2024.12.06 | 37/2024 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරීන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 | ඒකාබද්ධ සේවා ශාඛාව |
| 41 | 2024.12.23 | 38/2024 | පාසල් දන්ත සේවාව බල ගැන්වීමේ ජාතික වැඩසටහන | පොසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව |
| 42 | 2024.12.31 | 39/2024 | විද්‍යාපීඨ වාර සටහන - 2025 | ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව |

ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව 2024-12-31 දක්වා ඉටු කරන ලද රාජකාරිවල ප්‍රගතිය

- 1949 දී යුනෙස්කෝ සාමාජිකත්වය ලබා ගත් ශ්‍රී ලංකාව 2024 දී ශ්‍රී ලංකා යුනෙස්කෝ හවුල්කාරිත්වයේ 75 වසර උත්සවාකාරයෙන් සමරන ලදී.
- යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා 2024 ජූලි මස මැද දී පැවති සංවත්සර සැමරුම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීම
- ශ්‍රී ලංකාව දැනට යුනෙස්කෝවේ විධායක මණ්ඩලයේ සාමාජික රජයක් ලෙස කටයුතු සේවය කිරීම.
- යුනෙස්කෝ ව්‍යවස්ථාවට අනුව නීත්‍යනුකූල ආයතනයක් ලෙස "යුනෙස්කෝ සඳහා ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පිහිටුවීමේ 2024 අංක 38" දරන පනත 2024 ජූලි මාසයේ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.
- 2024 දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම කොමිෂන් සභාව සඳහා තනතුරු හතක් අනුමත කරන ලදී.

USD 58 000 වටිනා යුනෙස්කෝ 2024-2025 ද්වි වාර්ෂික ව්‍යාපෘති යෝජනා 3ක් සම්මතව ඇති අතර දැනට ඒවායේ මූලික කටයුතු ආරම්භ කර ඇත.

අධ්‍යාපනය අංශය:

UNESCO අධ්‍යාපනය පිළිබඳ මෑතකාලීන ක්‍රියාකාරකම්:

- යුනෙස්කෝ මාර්ගෝපදේශයන්ට අනුව ජාතික හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් ශ්‍රී ලංකාව සඳහා හරිත පාසල් සහතික කිරීමේ වැඩසටහන සංවර්ධනය කිරීමත් සමඟ හරිතකරණ අධ්‍යාපන හවුල්කාරිත්ව වැඩසටහන ආරම්භ කරන ලදී.
- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද SDG 4 ( තිරසාර සංවර්ධන ඉලක්ක) පිළිබඳ මධ්‍ය කාලීන සමාලෝචන වාර්තාව සහ යුනෙස්කෝව විසින් 2024 සඳහා සකස් කරන ලද අධ්‍යාපනය පිළිබඳ ගෝලීය අධීක්ෂණ වාර්තාව සඳහා සම්බන්ධීකරණය.
- SDG 4.7 - තිරසාර සංවර්ධන ආශ්‍රිත ව්‍යාපෘති සඳහා පුරවැසි අධ්‍යාපනය සහ අධ්‍යාපනය සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ SDG 4 අධීක්ෂණය
- යුනෙස්කෝ පුහුණු අත්පොත් සිංහල සහ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම
- උසස් අධ්‍යාපනයට අදාළ සුදුසුකම් පිළිගැනීම පිළිබඳ ගෝලීය සම්මුතිය අනුමත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
- අධ්‍යාපනය පිළිබඳ පැසිෆික් රැස්වීම සම්බන්ධීකරණය 2030 (APMED 6), 2024 සැප්තැම්බර් 10 සිට 13 දක්වා තායිලන්තයේ බැංකොක්හි පවත්වන ලද සමුළු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- සම්බන්ධීකරණය කරන ලද වැඩසටහන්

o **Road to Right** සංවිධානය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර කාන්තා දින සංසදය සහ විවෘත මයික් නයිට් වැඩසටහන

o ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වන ලද **"Curriculum Piloting program"** සඳහා වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.

o **2024** ග්‍රීසියේ පස්වන ලෝක සංස්කෘතික උරුමයන් පිළිබඳ තරුණ සම්මන්ත්‍රණය සම්බන්ධීකරණය කිරීම

o හරිතකරණය අධ්‍යාපන හවුල්කාරිත්වය පිළිබඳ තොරතුරු වැඩසටහන සම්බන්ධීකරණය කිරීම

o පාසල් නායකත්ව පැතිකඩ සංශෝධනය කිරීම සඳහා නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව සමග සම්බන්ධීකරණය කිරීම **(SCHOOL PROFILE) GEMP Report** සඳහා දායක වීම

o **1960** සම්මුතිය ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යාපනයේ වෙනස් කොට සැලකීමට එරෙහිව නිර්දේශ කිරීම පිළිබඳ **11** වැනි උපදේශනය **- NEC** සමඟ සම්බන්ධීකරණය කර වාර්තාව ඉදිරිපත් කිරීම

- සහභාගී වූ සමීක්ෂණ

o විධිමත් අධ්‍යාපනය පිළිබඳ සමීක්ෂණය අමාත්‍යාංශයේ දත්ත කළමනාකරණ ශාඛාව වෙත යොමු කිරීම,

o **ASP net** හි ජාතික සම්බන්ධීකාරකවරුන් සහ පාසල් සාමාජිකයින් සඳහා වන සමීක්ෂණය

o නව ඩිජිටල් මෙවලම් භාවිතය පිළිබඳ **IIEP-UNESCO** සමීක්ෂණය

අධ්‍යාපන ක්ෂේත්‍රයේ සැලසුම් සහ කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා (මෙම සමීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයෙහි දත්ත කළමනාකරණ ශාඛාව වෙත බෙදා හරින ලදී)

**UNESCO A S P net පාසල් සමඟ සිදු කරන ලද ක්‍රියාකාරකම්**

- Mitsubishi Asian Children's Enikki Festa ජපාන ජාතික කොමිෂන් සභාව සමඟ ASP Net පාසල් ඇතුළු ශ්‍රී ලංකාවේ පාසල් අතර පවත්වන ජාත්‍යන්තර ළමා චිත්‍ර තරගය සඳහා මූලික කටයුතු සූදානම් කරන ලදී.
- **2024** දී ග්‍රීසියේ ඇතන්ස්හි ASP net **70** වැනි සංවත්සර උත්සවයට ගුරුවරුන් සමඟ සිසුන් **12** දෙනෙකු සහභාගී විය.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත ශාඛාවේ නිලධාරීන් දත්ත කළමනාකරණය සඳහා පුහුණු වැඩසටහන් කිහිපයකට සහභාගී විය
- පෝලන්ත ජාතික කොමිෂන් සභාව සහ හර්බිච් පදනම විසින් **2** වැනි වරටත් ආරම්භ කරන ලද කවි වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
- Mitsubishi Asian Children's Enikki Festa 2024-2025 චිත්‍ර තරගයේ වැඩ කටයුතු සම්බන්ධ සම්බන්ධීකරණය කිරීම.
- Greening Education Partnership(GEP) වැඩසටහන යටතේ ජාතික වශයෙන් ශ්‍රී ලංකාවේ පාසල් හරිත පාසල් (Green Schools) ලෙස නම් කිරීම සඳහා Green Building Council of Sri Lanka සහ MAS Holdings Pvt. Ltd. සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම, ඒ සම්බන්ධ අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- UNESCO MGIEP ආයතනය වෙත ගුරු පුහුණු වැඩසටහනක් සඳහා නාමයෝජනා යැවීම,
- 6th World Cultural Heritage Youth Symposium 2025 වැඩසටහනට අදාළ කටයුතු සම්බන්ධ සම්බන්ධීකරණය කිරීම.
- Sri Lanka Association of the Advancement of Science(SLAAS) දියත් කරන "Young Agriculturist" වැඩසටහනයෙහි ජයග්‍රාහිකයින් සඳහා වූ සහතිකපත් මුද්‍රණය සඳහා වූ අනුග්‍රහය ලබා දීමට වැඩසටහනට අදාළ කටයුතු සම්බන්ධ සම්බන්ධීකරණය කිරීම.
- ASPnet schools සඳහා වූ වැඩසටහන් සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධ සම්බන්ධීකරණය කිරීම.

යුනෙස්කෝ ස්වභාවික විද්‍යා අංශය

- යුනෙස්කෝ මිනිසා සහ ජෛවගෝල වැඩසටහන සඳහා ජාතික කමිටුව -
- යුනෙස්කෝ ජෛවගෝල රක්ෂිත 4ක කාලාන්තර සමාලෝචන වාර්තා සකස් කිරීම
- පෘථිවි ජෛවජනක ව්‍යාපෘතියට සම්බන්ධ වීම සඳහා SWOT විශ්ලේෂණය
- UNESCO භූ විද්‍යා සහ භූ උද්‍යාන සඳහා වන ජාතික කමිටුව -
- යුනෙස්කෝ භූ උද්‍යාන/ ලෝක උරුම ලැයිස්තුගත කිරීම සඳහා උස්සන්ගොඩ සහ නාමල් උයන නම් කිරීම සලකා බැලීම
- යුනෙස්කෝ මූලික විද්‍යා වැඩසටහන සමඟ සම්බන්ධ කිරීම සඳහා මූලික විද්‍යා වැඩසටහනක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විද්‍යාවේ දියුණුව සඳහා වූ සංගමය (SLAAS) සමඟ එක්ව කටයුතු කිරීම

♦**UNESCO** - දකුණු ආසියා ජල කළමනාකරණ මධ්‍යස්ථානය මොරටුව විශ්වවිද්‍යාලය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ යුනෙස්කෝ ජාත්‍යන්තර ජල විද්‍යා වැඩසටහන සමඟ සම්බන්ධීකරණය කිරීම.

♦**Bioethics Program** –

♦ශ්‍රී ලංකාව යුනෙස්කෝ මූලස්ථානයේ ජාත්‍යන්තර ජෛව ආචාර ධර්ම කමිටුවේ සාමාජිකයෙක් ලෙස සේවය කරයි.

♦**IHP-WWAP** ජලය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය වැඩසටහන, නාභීය ලක්ෂ වෙත කැඳවා තිබූ මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම.

♦ජලය සහ ස්ත්‍රී පුරුෂ කේන්ද්‍රස්ථානය ශ්‍රී ලංකාව සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීම

♦ප්‍රවේණික ජීව විද්‍යාව සඳහා වූ ආයතනය - **Genomic Biology** සඳහා **Carl R. Woese** ආයතනය සමඟ සාකච්ඡාව, **Earth Bio Genome** ව්‍යාපෘතියේ සම-නිර්මාතෘවරයා වන **IGB** අධ්‍යක්ෂ මහාචාර්ය ජීන් රොබින්සන් සමඟ සම්බන්ධ වී සහ ශ්‍රී ලාංකීය ජාතික ව්‍යාපෘතියක් සඳහා කරුණු විශ්ලේෂණය

♦**IGBC, IBC, COMEST** ඒකාබද්ධ රැස්වීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීම - මහාචාර්ය ශමණී ප්‍රතාපන්) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

♦ඉන්දියානු සාගර සංගමය (**IORA**)

♦සමස්ත ලංකා චිත්‍ර තරගය සංවිධානය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කිරීම සහ මූල්‍යමය ඉල්ලීම් සඳහා සහාය වීම. වැඩසටහන සඳහා **SLNCU** මහලේකම්වරයාගේ ඉල්ලීම පරිදි **UNESCO- New Delhi** කාර්යාලයෙන් **USD 6000** ක අරමුදලක් අනුමත කරන ලදී.

♦**IORA** වැඩ සටහන අවසානයේ ඉතිරිව ඇති මුදල් **(4800.00 USD)** යුනෙස්කෝ ජෛවගෝල පද්ධති පිළිබඳව වීඩියෝ පටයක් නිපදවීම සඳහා යොදා ගැනීමට නව කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීම. **(2024-12-17)**

♦**UNESCO National Science & Geopark Committee** යුනෙස්කෝ භූ විද්‍යා හා භූ උද්‍යාන සඳහා ජාතික කමිටුව සඳහා **(TOR)** සැකසීම හා සාමාජිකයින් හඳුනා ගැනීම සහ නව යෝජනා සලකා බැලීම

♦ජාතික නාමල් උයන යුනෙස්කෝ උරුමයක් ලෙස හෝ භූ උද්‍යානයක් ලෙස නම් කිරීමට ඇති හැකියාව සලකා බැලීම සඳහා සාකච්ඡා කිරීම

♦**UNESCO Basic Science (** යුනෙස්කෝ මූලික විද්‍යා වැඩසටහනට අදාළ ව විද්‍යාත්මක උපදේශක මණ්ඩලය වෙත හිටපු ලේකම් ජනරාල් සිරිමලි ප්‍රනාන්දු මැතිණිය නම්කර යැවීම.

යුනෙස්කෝ සංස්කෘතික අංශය

දඹුල්ල, සීගිරිය, ගාල්ල සහ පොළොන්නරුව යන ස්ථාන වල ඇති ලෝක උරුම සඳහා සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

**75** වැනි සංවත්සර උළෙල සඳහා පොත් **2**ක් ප්‍රකාශයට පත් කර එළිදැක්වීම සඳහා කටයුතු කිරීම.

වසර **75** ක ඓතිහාසික සන්ධිස්ථාන සඳහා -

**UNESCO** විසින් ශ්‍රී ලංකාවේ නම් කරන ලද අඩවි සහ අයිතම - පොතක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාවංශය ජාත්‍යන්තර මතකය පිළිබඳ ලෝක වැඩසටහනට ඇතුළත් කර තිබීම පිළිබඳ ව සමරු පාලකයක් යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් නිරාවරණය කරන ලදී.

ලෝක මතකය සඳහා ජාතික ලැයිස්තු සකස් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග මූලික කටයුතු සූදානම් කරන ලදී.

• අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සඳහා ජාතික ලැයිස්තුව සකස් කිරීමට සංස්කෘතික අමාත්‍යාංශයට සහාය වීම.

• අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාලානුරූප වාර්තාව සකස් කිරීම සඳහා සංස්කෘතික අමාත්‍යාංශය වෙත සහය දැක්වීම.

• වින්ඩ් ඔෆ් ද මියුසික් - නිකොලෝ ෆරාසි ඉතාලි නිර්මාපකයාගේ නිර්මාණ ඉදිරිපත් කිරීමට, ශ්‍රී ලංකාවේ ඉතාලි තානාපති කාර්යාලය සමඟ එක් ව **2024** මැයි **31** දින ගාලු කොටුවේ ලන්දේසි ප්‍රතිසංස්කරණ දේවස්ථානයේ දී පැවැත්වූ ප්‍රසංගයට අනුග්‍රහය දක්වන ලදී.

**2024** ලෝක දර්ශන දිනය සැමරීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයන අංශය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය **(SLMA)** සමඟ සංවිධානය කර ඇත.

ලෝක උරුම කාලාවර්තන වාර්තාකරණය **2023-2024** සම්බන්ධයෙන් දෙදින වැඩමුළුවක් දකුණු ආසියානු ගුරුපුහුණු මධ්‍යස්ථානයේ දී **2024-12-09** සහ **2024-12-10** පැවැත්වීම.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශ කරන ලද "ලෝක භාවනා දිනය" **2024-12-21** වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ භාවනා පරීක්ෂණ මධ්‍යස්ථානය හා එක්ව මාර්ගගත සම්මන්ත්‍රණයක් අන්තර්ජාතික භාවනා ප්‍රවීණයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීම **(On line Webinar)**

## 2.2 පවත්නා අභියෝග

- පසුගිය වර්ෂවල දේශය මුහුණ දුන් අභියෝග හේතුවෙන් නියමිත කාලයට විභාග පැවැත්වීමට නොහැකි වීම නිසා පාසල් වාර සටහනේ සිදු වූ අක්‍රමවත් බව තුරන් කර නියමිත පරිදි පාසල් පැවැත්වීම සහ විභාග පැවැත්වීමේ කටයුතු ක්‍රමයෙන් යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- අධ්‍යාපන පද්ධතියේ පවතින පුරප්පාඩු පිරවීම පිණිස අදාළ බඳවා ගැනීම් කිරීමට කටයුතු සිදු කිරීම
- ආර්ථික හා සමාජීය ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා සාමාන්‍ය අධ්‍යාපනය ලබන සිසුන් සඳහා නොමිලේ අධ්‍යාපන අවස්ථා සැලසීම / නොමිලේ පෙළ පොත්, ලිපි ද්‍රව්‍ය , පාසල් පාවහන් , නිල ඇඳුම්, දිවා ආහාර සහ රක්ෂණ පහසුකම් ආදී ප්‍රතිලාභ ලබා දීම තුළින් පාසල් අධ්‍යාපනයේ පවතින අභියෝග අවම කිරීමට කටයුතු කිරීම
- වසර 13ක අධ්‍යාපනය සම්පූර්ණ නොකර අතරමග පාසලින් ඉවත් වීමේ ප්‍රතිශතය ඉහළ යාම
- පාසල් පද්ධතිය තුළ මානව හා භෞතික සම්පත් බෙදී යාමේ විෂමතාව ය නිසා පාසල් පද්ධතිය කෙරෙහි ඇති දෙමාපිය විශ්වාසය බිඳ වැටීම.
- පළමු වසර සිට ප්‍රථම උපාධිය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දෙන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ ද දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමාපියන්ට සිය ආදායමින් ඉහළ වැයබරක් දරන්නට සිදු වීම

## 2.3 ඉදිරි ඉලක්ක

ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් මඟින් ශිෂ්ටසම්පන්න හා වගකීම් සහගත පුරවැසි සමාජයක් බිහි කිරීම සහ සංවර්ධනය සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික අභිප්‍රායයි. ඒ අනුව සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ පහත වැඩසටහන් ඉදිරි වසර තුළ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය අංශ ගණනාවකින් වැඩිදියුණු කිරීමට පියවරයන් ගනිමින් පවති.
- සාක්ෂරතාව / සංඛ්‍යාත්මක දැනුම / නිර්මාණශීලිත්වය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් ලබා දීමට කටයුතු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය බුද්ධිමය තත්වයන් හා කුසලතා වර්ධනය වන ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනයක් තුළින් දරුවන්ගේ කායික හා මානසික තත්වයන්ට උචිත වන පරිදි හා සමාජ ජීවිතයට අවශ්‍ය වන යහපත් පුරුදු , ආකල්ප හා ආචාරධර්ම වර්ධනය කරන ක්‍රියාකරකම් ඇතුළත් වැඩසටහන් තුළින් ලබා දීමට කටයුතු කිරීම හා ගුණාත්මක වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීමට කටයුතු කිරීම.
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය, නවෝත්පාදනය / ජීවන නිපුණතා හා සමාජානුයෝජනයට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය වූ සමබර දරුවෙකු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සුනම්‍ය විෂයමාලාවක් යටතේ ක්‍රියත්මක කිරීමට කටයුතු කිරීම.
- නිදහස් අධ්‍යාපන අයිතීන් තවදුරටත් සුරක්ෂිත කිරීම.
- නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදි වාර්ෂික ප්‍රතිපාදන යටතේ පහත අවශ්‍යතාවයන් කෙරෙහි ප්‍රමුඛතාවයක් ලබා දීමට අපේක්ෂා කරීම.
- (නොමිලේ අධ්‍යාපන අවස්ථා සැලසීම / නොමිලේ පෙළ පොත්, ලිපි ද්‍රව්‍ය , පාසල් පාවහන් , නිල ඇඳුම්, සනීපාරක්ෂක තුවා, දිවා ආහාර සහ රක්ෂණ පහසුකම් ආදී )
- පාසල් පද්ධතිය තුළ මානව හා භෞතික සම්පත් බෙදීයාමේ විෂයමතාවය අවම කිරීම හා පාසල් පද්ධතිය කෙරෙහි විශ්වාසය තහවුරු කිරීම.
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට අදාළව විෂයමාලා ප්‍රතිසංස්කරණය සකස් කිරීම.
- විදුහල්පති වරුන් සහ ගුරුවරුන් සඳහා විධිමත් ධාරිතා පුහුණු වීම් ලබා දීම / පාසල් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සහ උසස් අධ්‍යාපනය සඳහා අදාළ පහසුකම් ලබා දීම.
- සෞන්දර්ය ගුරු පුහුණු / ප්‍රායෝගික කුසලතා සංවර්ධන / දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම.
- ආර්ථිකයේ ප්‍රධාන කුලුනු වන කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශයන්හි රැකියා වෙළඳපොළ අවශ්‍යතාවයන් සහ අධ්‍යාපනය අතර පවත්නා නොගැලපීම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- පවිත්‍ර හා හරිත පරිසරයක් තුළ වඩා තිරසාර අනාගතයක් නිර්මාණය කිරීම සඳහා පැහැදිලි දැක්මක් සහිතව ක්‍රියාකිරීමටත් කායික හා මානසික වශයෙන් නිරෝගී පුරවැසියකු ලෙස සවිබල ගැන්වීමටත්, සදාචාරාත්මක වගකීම් සඳහා උරදිය හැකි ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය අඩිතාලම දැමීම ප්‍රමුඛ අරමුණු කරගනිමින් Clean Sri Lanka ජාතික වැඩසටහන අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම.
- තිරසර අනාගතයක් ගොඩනැඟීම සඳහා දේශගුණික ක්‍රියාකාරකම්වලට මුහුණ දීම පාරිසරික සංරක්ෂණය සඳහා අනාගත පරපුර සවිබල ගැන්වීම යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘතීන් සිදු කිරීමට සැලසුම් කිරීම.
- පෞද්ගලික අධ්‍යාපනය නියාමන ක්‍රමවේදය ශක්තිමත් කිරීම තුළින් එහි ගුණාත්මක භාවය ඉහළ නැංවීම.
- ජාතික මට්ටමේ ඇගයීම් විධිමත් කිරීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ මානව සම්පත් ප්‍රවර්ධනය හා ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම හා වෘත්තීය පහසුකම් සැලසීමට කටයුතු කිරීම
- වෘත්තීය අධ්‍යාපනය, රැකියා වෙළඳපොළ හා ලෝක ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන හා තාක්ෂණය යන ක්ෂේත්‍ර ඔස්සේ පුළුල් කිරීම.
- උපකෘත පාසල් සඳහා ප්‍රතිපාදන ඉහළ නැංවීම හා උසස් අධ්‍යාපනය ජාත්‍යන්තර මට්ටමේ උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදෙන පරිදි දියත් කිරීමට කටයුතු කිරීම.
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මූලික අදියර 2025 දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම හා 2026 වර්ෂයේ සිට ක්‍රමානුකූලව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනය තුළ පහත සුවිශේෂ කරුණු 2025 වර්ෂයේ දී ළගා කර ගැනීමට අපේක්ෂා කෙරේ.
- අන්තර්කරණ අධ්‍යාපන පරිසරයක් ඇති කිරීම හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රාථමික අධ්‍යාපනය තුළ පුළුල් කිරීම.
- ප්‍රාථමික අංශයන්හි භෞතික පහසුකම් සංවර්ධනය.
- ඩිජිටල් නවෝත්පාදනය හරහා සිසුන්ගේ වාචික කුසලතාව ශක්තිමත් කිරීම හා ගණිතමය නිපුණතා ඉලක්ක කරගත් ප්‍රතිකාර්යය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කරගැනීමේ නියාමන රාමුව ශක්තිමත් කිරීම.
- පාසල් දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.
- රජයේ සියලුම ප්‍රාථමික පාසල් සඳහා " පාසල් ආහාර වැඩසටහන " ක්‍රියාත්මක කිරීම.
- සිසු රක්ෂණාවරණ ක්‍රියාත්මක කිරීම, ප්‍රජනක සෞඛ්‍ය හා ලිංගික අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කිරීම සහ රජයේ පාසල් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණික අධ්‍යාපනයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් විධිමත් පරිදි පැවැත්වීමට කටයුතු කිරීම.
- නව නිපැයුම් ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.
- NVQ සුදුසුකම් ලබාදීමට කටයුතු කිරීම හා තෘතීයික අධ්‍යාපනයට පෙළ ගැසීම.

- එලදායී පාසල් ජාලයක් නිර්මාණය කිරීම උදෙසා පාසල් ප්‍රතිසංවිධාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම.
- පාසල් සිතියම්කරණය තුළින් පාසල් ප්‍රතිසංවිධානය කිරිම හා පාසල්වල ගුණාත්මකභාවය සහතික කිරීමේ අරමුණින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් එලදායී පාසල් ජාලයක් ගොඩනැගීම.
- එලදායී පාසල් ජාලයක් ගොඩනැගීම සඳහා ප්‍රාථමික පාසල් අතුරින් නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- වැඩිදියුණු කළ යුතු ද්විතීයික පාසල් හඳුනා ගැනීම හා අවශ්‍යතා හඳුනා ගැනීම.

<u>2025 වර්ෂය සඳහා වූ සුවිශේෂ ඉලක්ක/ප්‍රමුඛ ක්ෂේත්‍ර</u>

ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් මඟින් ශිෂ්ටසම්පන්න හා වගකීම් සහගත පුරවැසි සමාජයක් බිහි කිරීම සහ සංවර්ධනය සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික අභිප්‍රායයි. ඒ අනුව සාමාන්‍ය අධ්‍යාපන සඳහා වූ පහත වැඩ සටහන් ඉදිරි වසර තුළ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- නිදහස් අධ්‍යාපන අයිතීන් තවදුරටත් සුරක්ෂිත කිරීම.

- නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වාර්ෂික ප්‍රතිපාදන යටතේ අග්‍ර ප්‍රමුඛතාවක් පිරිනැමීමට කටයුතු කිරීමට අපේක්ෂිතය (උදා: නොමිලේ අධ්‍යාපන අවස්ථා සැලසීම, නොමිලේ පෙළ පොත්, ලිපි ද්‍රව්‍ය , පාසල් පාවහන් , නිල ඇඳුම්, දිවා ආහාර සහ රක්ෂණ පහසුකම් ආදී)

- පාසල් පද්ධතිය තුළ මානව හා භෞතික සම්පත් බෙදීයාමේ විෂමතාව අවම කිරීම හා පාසල් පද්ධතිය කෙරෙහි විශ්වාසය තහවුරු කිරීම.

- අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට අදාළව විෂයමාලා සංවර්ධනය , ගුරු පුහුණුව සහ පාසල් සඳහා යටිතල පහසුකම් සහ උසස් අධ්‍යාපන ක්‍රියාවලියට අදාළ පහසුකම් සැලසීමට යෝජිතව ඇත.

    - විභාග කේන්ද්‍රීය ක්‍රමවේදයක් වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන පද්ධතියක් සකස් කිරීම.

    - දරුවන්ගේ කුසලතා ඉහළ නැංවීම හා දැනුම් ආර්ථිකයටත් ගැළපෙන පරිදි හා තිරසර ලෙස විෂයමාලා රාමුව සකස් වී ඇති ද යන්න පිළිබඳව සමාලෝචනය හා විෂයමාලා රාමුව සකස් කිරීම.

    - ඒ අනුව, විෂයමාලා නවීකරණය හා සංවර්ධනය හා විවිධාංගීකරණය.

- දරුවන්ගේ කුසලතා ඔප් නැංවෙන පරිදි ශිෂ්‍ය පාදක ලෙස විෂයමාලාව සංශෝධනය කිරිම.

- අදාළ ගුරු භවතුන් විෂයමාලා නවීකරණය සංශෝධනය පිළිබඳව දැනුවත් කිරීම.

මේ වන විට ප්‍රතිසංස්කරණ ශාඛාවේ මූලිකත්වයෙන් ජාතික අධ්‍යාපන ආයතනය මඟින්, නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2026 වර්ෂයේ සිට හඳුන්වා දීමට පියවර ගෙන ඇති අතර, විෂය මාලාව පාසල් පද්ධතිය තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා පියවරයන් දියත් කරමින් ඇත.

- ශ්‍රී ලංකා අධ්‍යාපන විශ්වවිද්‍යාලය පිහිටුවා සියලු ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල මණ්ඩප බවට පත් කර අධ්‍යාපනවේදී උපාධිය ලබාදීමේ තත්වයට උසස් කිරීම  සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගනිමින්, ඊට අදාළ පනත කෙටුම්පත් කිරීම අවසන් කර නීති කෙටුම්පත් සම්පාදක විසින් නව රජයේ අනුමැතිය ඉල්ලා ඇති අතර, ඒ සම්බන්ධ මේ වන විට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.

- ආර්ථිකයේ ප්‍රධාන කුලුනු වන කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශයන්හි රැකියා වෙළඳපොළ අවශ්‍යතාවන් සහ අධ්‍යාපනය අතර පවත්නා නොගැළපීම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස පාරිසරික තිරසරභාවය ඉහළ නැංවීම, නාස්තිය අවම කිරීම හා සදාචාරාත්මක වටිනාකම් ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් Clean Sri Lanka ව්‍යාපෘතියට සමගාමී ව 2025 දී එහි අධ්‍යාපන මුලපිරීම ආරම්භ කිරීමට නියමිත ය. ඒ අනුව දියත් කෙරෙන වැඩසටහන වාර්ෂික ක්‍රියාකාරකම් යටතේ (සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත් සියලු ම ආයතනයන්හි) ක්‍රියාත්මක කිරීමට නියමිත ය. ඊට අදාළ චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය මේ වන විට සකස් කරමින් පවතී.

- අධ්‍යාපන පද්ධතියේ ඉදිරි ක්‍රියාමාර්ග පහත කරුණු සඳහා මූලිකත්වය දෙමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

  <u>ක්‍රියාමාර්ග</u>

- පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය අංශ ගණනාවකින් වැඩිදියුණු කිරීමට පියවර ගනිමින් පවතී.
- ප්‍රාථමික අධ්‍යාපනය සාක්ෂරතාව, සංඛ්‍යාත්මක දැනුම, නිර්මාණශීලීත්වය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සිදු කිරීම.
- කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය බුද්ධිමය තත්වයන් හා කුසලතා වර්ධනයවන ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනයක් තුළින් දරුවන්ගේ කායික හා මානසික තත්වයන්ට උචිත වන පරිදි හා සමාජ ජීවිතයට අවශ්‍ය වන යහපත් පුරුදු , ආකල්ප හා ආචාරධර්ම වර්ධනය කරන ක්‍රියාකරකම් ඇතුළත් වැඩසටහන් තුළින් ලබා දීම.
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය නවෝත්පාදනය, ජීවන නිපුණතා හා සමාජානුයෝජනයට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය වූ සමබර දරුවෙකු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සුනම්‍ය විෂයමාලාවක් යටතේ ක්‍රියත්මක කිරීම.
- ජාතික මට්ටමේ ඇගයීම් විධිමත් කිරීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ මානව සම්පත් ප්‍රවර්ධනය හා ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම හා වෘත්තීය පහසුකම් සැලසීම.
- වෘත්තීය අධ්‍යාපනය රැකියා වෙළඳපොළ හා ලෝක ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන හා තාක්ෂණය යන ක්ෂේත්‍ර ඔස්සේ පුළුල් කිරීම.
- උපකෘත පාසල් සඳහා ප්‍රතිපාදන ඉහළ නැංවීම හා උසස් අධ්‍යාපනය ජාත්‍යන්තර මට්ටමේ උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදෙන පරිදි දියත් කිරීමට කටයුතු කිරීම.
- පෞද්ගලික අධ්‍යාපනය නියාමන ක්‍රමවේදය ශක්තිමත් කිරීම තුළින් එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- වර්තමානයේ අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුගත වන පරිදි සාමාන්‍ය අධ්‍යාපනයේ ඉදිරි ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන් පහත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.
  - සමාජ ආර්ථික අවශ්‍යතාවට යෝග්‍ය පරිදි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සකස් විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදීම.
  - ඒ අනුව මානව සම්පත් සංවර්ධනය, අධ්‍යාපනයේ ව්‍යුහාත්මක වෙනස්කම් හා විෂයමාලා ප්‍රතිසංස්කරණයට මූලිකත්වය ලබා දීම.
  - විදුහල්පතිවරු සහ ගුරු පුහුණුව, ධාරිතා සංවර්ධනය සිදු කිරීම.
  - අධ්‍යාපන පද්ධතියේ ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා සැලසුම් සකස් කිරීම.

- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මූලික අදියර 2025 දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම හා 2026 වර්ෂයේ සිට ක්‍රමානුකූල ව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

♦ ප්‍රාථමික අධ්‍යාපනය තුළ පහත සුවිශේෂ කරුණු 2025 වර්ෂයේ දී ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

♦ අන්තර්කරණ අධ්‍යාපන පරිසරයක් ඇති කිරීම හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රාථමික අධ්‍යාපනය තුළ පුළුල් කිරීම.

- කියවීම, බහුතල ඉගෙනුම ප්‍රචලිත කිරීම.
- ප්‍රාථමික අංශවල භෞතික පහසුකම් සංවර්ධනය.
- ඩිජිටල් නවෝත්පාදනය හරහා සිසුන්ගේ වාචික කුසලතාව ශක්තිමත් කිරීම හා ගණිතමය නිපුණතා ඉලක්ක කර ගත් ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ නියාමන රාමුව ශක්තිමත් කිරීම.

♦ සෞන්දර්ය ගුරු පුහුණු, ප්‍රායෝගික කුසලතා සංවර්ධන, දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

♦ පාසල් සෞඛ්‍ය හා පෝෂණය ප්‍රවර්ධනය කිරීම.

- රජයේ සියලු ම ප්‍රාථමික පාසල් සඳහා " පාසල් ආහාර වැඩසටහන " ක්‍රියාත්මක කිරීම.
- සිසු රක්ෂණාවරණ ක්‍රියාත්මක කිරීම, ප්‍රජනක සෞඛ්‍ය හා ලිංගික අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කිරීම සහ රජයේ පාසල් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

♦ තාක්ෂණික අධ්‍යාපනයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් විධිමත් පරිදි පැවැත්වීම.

- නව නිපැයුම් ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.
- NVQ සුදුසුකම් ලබාදීමට කටයුතු කිරීම හා තෘතීක අධ්‍යාපනයට පෙළ ගැසීම.

<u>2025 වර්ෂය අවසන් වන විට ඉටු කිරීමට අපේක්ෂිත වැඩසටහන්</u>

♦ ලෝක බැංකු නිරීක්ෂණ වැඩසටහන් හා GEMP ව්‍යාපෘතියේ අවසන් රැස්වීම (GEMP Wrap-up meeting).

♦ Clean Sri Lanka වැඩසටහන අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම.

♦ ඵලදායී පාසල් ජාලයක් නිර්මාණය කිරීම උදෙසා පාසල් ප්‍රතිසංවිධාන වැඩසටහන.

♦ 2026 වර්ෂයට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගැනීම.

# 03. පරිච්ඡේදය
# 2024 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | | |
|---|---|---|---|---|---|
| | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | | | රු. | |
| අයවැය 2024 | | සටහන | තථ්‍ය 2024 | තථ්‍ය 2023 | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ACA-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ACA-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ACA-1 |
| - | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | - | - | ACA-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | ACA-1 |
| - | ආදායම් නොවන ලැබීම් | | - | | |
| 99,533,139,960 | භාණ්ඩාගාර අග්‍රිම | | 82,829,979,402 | 72,471,564,934 | |
| - | තැන්පතු | | 1,322,636,903 | 15,187,985,595 | ACA-3 |
| 1,120,000,000 | අත්තිකාරම් ගිණුම | | 1,483,434,280 | 1,334,531,178 | ACA-4 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | ACA-5 |
| 100,653,139,960 | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 85,636,050,586 | 88,994,081,707 | |
| 100,653,139,960 | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 85,636,050,586 | 88,994,081,707 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 873,301,528 | 126,510,854 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඉ)= (ඇ)-(ඈ) | | 84,762,749,057 | 88,867,570,853 | |
| | අඩුකළා: වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | - | - | ACA-2 (ii) |
| 62,292,365,000 | වේතන, වැටුප් හා අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 60,809,021,693 | 54,481,659,264 | ACA-2 (ii) |
| 2,085,075,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 1,734,970,291 | 1,567,305,508 | ACA-2 (ii) |
| 56,775,939,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 39,825,213,200 | 39,683,622,240 | ACA-2 (ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ACA-2 (ii) |
| 300,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 150,000 | 112,500 | ACA-2 (ii) |
| 121,153,679,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 102,369,355,183 | 95,732,699,513 | ACA-2 (ii) |
| | මූලධන වියදම් | | | | |
| 3,897,314,762 | මූලධන වත්කම් පුනරුත්තාපන හා වැඩි දියුණු කිරීම | 10 | 1,904,027,408 | 484,001,870 | ACA-2 (ii) |
| 38,086,237,238 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 28,278,791,473 | 20,502,458,615 | ACA-2 (ii) |
| 2,120,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 1,206,897,011 | 758,553,000 | ACA-2 (ii) |
| 70,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | 69,420,000 | 14,598,131 | ACA-2 (ii) |
| 1,260,902,000 | හැකියා වර්ධනය | 14 | 303,561,138 | 1,945,359,006 | ACA-2 (ii) |
| 5,323,677,000 | වෙනත් මූලධන වියදම් | 15 | 2,608,531,625 | 3,752,285,510 | ACA-2 (ii) |
| 50,758,131,000 | මුළු මූලධන වියදම් (උ) | | 34,371,228,655 | 27,457,256,132 | ACA-2 (ii) |
| | තැන්පතු ගෙවීම් | | 1,202,208,779 | 14,951,511,980 | |
| 3,154,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 1,707,619,401 | 1,353,318,689 | ACA-4 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | ACA-5 |
| 3,154,000,000 | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 2,909,828,180 | 16,304,830,669 | |
| 175,065,810,000 | මුළු වියදම් (එ)=(ඊ+උ+ඌ) | | 139,650,412,019 | 139,494,786,314 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය (ඒ)=(ඉ-එ) | | (54,887,662,961) | (50,627,215,460) | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (54,896,898,328) | (50,627,215,460) | |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 9,235,366 | 356,000 | ACA-7 |
| | | | (54,887,662,961) | (50,627,215,460) | ACA-3 |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තථ්‍ය | |
|---|---|---|---|
| | | 2024 (රු.) | 2023 ( රු.) |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපල, පිරියත හා උපකරණ | ACA-6 | 196,644,948,902 | 180,717,729,391 |
| | | | |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ACA-5/5(a) | 3,104,620,779 | 2,880,435,658 |
| මුදල් හා මුදල් සමාන දෑ | ACA-3 | 9,235,366 | 356,000 |
| | | | |
| මුළු වත්කම් | | 199,758,805,047 | 183,598,521,049 |
| | | | |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 1,840,568,874 | 1,736,811,876 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 196,644,948,902 | 180,717,729,391 |
| කුලී වැඩ හා අත්තිකාරම් සංචිතය | ACA-5(b) | - | - |
| | | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ACA-4 | 1,264,051,905 | 1,143,623,782 |
| අග්‍රිම ශේෂය | ACA-3 | 9,235,366 | 356,000 |
| මුළු වගකීම් | | 199,758,805,047 | 183,598,521,049 |

පිටු අංක 001 සිට 235 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 237 සිට 444 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| .......................... | .......................... | .......................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2025/02/27 | දිනය : 2025/02/27 | දිනය : 2025 . |
| නාලක කලුවැව<br>ලේකම්<br>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | නාලක කලුවැව<br>ලේකම්<br>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | ඊ.එම්.ඩී. අළුත්ගේ<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී I<br>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය<br>"ඉසුරුපාය" බත්තරමුල්ල. |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තථ්‍ය | |
|---|---|---|
| | 2024 වර්ෂය රු. | 2023 වර්ෂය රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 3,262,140,595 | 2,854,227,827 |
| අග්‍රිම ලැබීම් | 82,829,979,402 | 72,471,564,934 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 1,465,824,702 | 1,314,735,688 |
| තැන්පතු ලැබීම් | 1,322,636,834 | 13,580,811,740 |
| විවිධ | 523,213,303 | 396,914,812 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 89,403,794,836 | 90,618,255,002 |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 65,436,081,181 | 57,431,244,924 |
| සහනාධාර සහ මාරුකිරීම් | 7,862,350,620 | 11,738,209,660 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 928,662,171 | 243,817,293 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 873,301,528 | 126,510,854 |
| අත්තිකාරම් ගෙවීම් | 1,705,622,741 | 1,342,983,574 |
| තැන්පතු ගෙවීම් | 1,202,208,710 | 13,361,449,868 |
| විවිධ | 727,733 | 6,762,375 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 78,008,954,704 | 84,250,978,547 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | 11,394,840,132 | 6,367,276,454 |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| | | |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| මූලධන වියදම් | 11,385,604,766 | 6,366,920,454 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 11,385,604,766 | 6,366,920,454 |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | (11,385,604,766) | (6,366,920,454 ) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | 9,235,366 | 356,000 |

| | තථ්‍ය | |
|---|---|---|
| | 2024 වර්ෂය<br>රු. | 2023 වර්ෂය<br>රු. |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| | | |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | 9,235,366 | 356,000 |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

**1)** පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2024.12.16** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **06/2024** විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

**2)** වාර්තාකරණ කාලපරිච්ඡේදය

**2024** ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**3)** මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

**4)** ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**5)** දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**6)** දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**7)** මුදල් හා මුදල් සමාන දෑ

**2024** දෙසැම්බර් **31** දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.
- තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුව% ලෙස |
| අදාළ නොවේ | | | | | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු '000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 104,415,000 | 121,153,679 | 102,369,355 | 84.50 |
| ප්‍රාග්ධන | 50,140,000 | 50,758,131 | 34,371,228 | 67.72 |

**3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (පුනරාවර්තන)**

රු '000

| ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදනය | | තථ්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල% ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| ජනාධිපති කාර්යාලය | වව්නියාව,මන්නාරම,පුත්තලම පාසල් ගොඩනැගිලි ඉදිකිරීම | 64,800 | 64,800 | 32,606 | 50 |
| ජනාධිපති කාර්යාලය | Expenses of the Video wall, Sound Generator & Lighting System | 270 | 270 | 270 | 100 |
| ජනාධිපති කාර්යාලය | STEM Teacher Training | 10,808 | 10,808 | 7,586 | 70 |
| මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | ITMIS Training | 3,015 | 3,015 | 2,703 | 90 |
| ජනමාධ්‍ය අමාත්‍යාංශය | ජාත්‍යන්තර RTI දිනයට සමගාමීව පවත්වන ලද කෙටි චිත්‍රපට තරඟාවලියේ විනිශ්චය මණ්ඩල දීමනා ගෙවීම | 180 | 180 | 180 | 100 |
| රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | 2024 වර්ෂයේ බහු කාර්ය සංවර්ධන සහයකවරුන්ගේ වැටුප් ගෙවීම | 103,002 | 103,002 | 90,254 | 88 |
| රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | 2025 වර්ෂයේ බහු කාර්ය සංවර්ධන සහයකවරුන්ගේ දීමනා ගෙවීම | 115,012 | 115,012 | 99,3601 | 86 |
| රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | 76 වන නිදහස් දින සැමරුම් උත්සවයට සමගාමීව ජාතික ගීය හා ජයමංගල ගාථා ඉදිරිපත් කිරීමට අදාළ වියදම් සඳහා | 1,595 | 1,595 | 1,431 | 90 |
| තාක්ෂණ අමාත්‍යාංශය | පිරිවෙන් අධ්‍යාපනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම හා කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ශිෂ්‍ය සමාජ පිහිටුවීම | 418,000 | 418,000 | 407,935 | 98 |
| විභාග දෙපාර්තමේන්තුව | අ.පො.ස. උසස් පෙළ හා අ.පො.ස. සා. පෙළ විභාග වලට අදාළ කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලබාදීම | | | | |

රු '000

| ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදනය | | තථ්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල% ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| විභාග දෙපාර්තමේන්තුව | අ.පො.ස. උසස් පෙළ | **232,841** | **232,841** | **211,536** | **91** |
| | අ.පො.ස. සා. පෙළ විභාග වලට අදාළ කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලබාදීම | **2,345** | **2,345** | **375** | **16** |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම ප්‍රතිලාභ සඳහා | **74,426** | **74,426** | **74,426** | **100** |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | **2024.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **2024.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහයන් | **56,188,383,856.52** | **56,188,383,856.52** | - | - |
| **9152** | යන්ත්‍රෝපකරණ | **15,479,085,357.15** | **15,479,085,357.15** | - | **100** |
| **9153** | ඉඩම් | **111,003,115,765.00** | **111,003,115,765.00** | - | |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | **3,975,500.00** | **3,975,500.00** | - | |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | |
| **9160** | කෙරීගෙන යන වැඩ | **13,970,388,422.90** | **13,970,388,422,90** | - | |
| **9180** | බදු දෙන ලද වත්කම් | - | - | - | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } EDU/A//MOE/2024/FA/2025/22 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 මැයි 31 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ශීර්ෂය 126 - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කල මතය**

ශීර්ෂය 126- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව, යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් , මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම ,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම සඳහා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන යෝජනාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු (TVET) ක්ෂේත්‍රයේ රැකියා සැලසීමේ පසුබිමක් සකස් කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය / කොයිකා) වෙනුවෙන් වර්ෂය තුළ වැය විෂයය 126- 2-21-19-2401 සහ 126-2-21-19-2509 යටතේ අයවැයගත ප්‍රතිපාදන රු.300,000,000 බැගින් එකතුව රු.600,000,000 ක් වෙනුවෙන් හා කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ ගම්පහ කාර්මික විද්‍යාලය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් (කොයිකා සහ PMC ආයතන) වැය විෂයය 126-2-21-20-2103 සඳහා රු.400,000,000 ක් වශයෙන් රු.1,000,000,000ක් ප්‍රතිපාදන වෙන්කර වියදම් දරා තිබියදී එම වියදම් හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර II හි වැඩිදියුණු කිරීම් කටයුතුවල වැඩ අවසන් කිරීමට කොන්ත්‍රාත් සමාගම විසින් 2025 මාර්තු 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු අතුරු ගෙවීම් සහතිකය (IPC) II අනුව අවසන් වරට ගෙවීම් කර තිබුණු වටිනාකම්හි එකතුව රු. 218,489,181 ක් කෙරීගෙන යන වැඩ (WIP) යටතේ සටහන් කර වැඩිදියුණු කිරීම අවසානයේදී ප්‍රාග්ධනීත කල යුතු වුවද එය අළුත්වැඩියා වියදමක් ලෙස 126-1-2-0-2001 වැය විෂයය තුල ගිණුම්ගත කර තිබුණි.

(ඇ) KOICA ආධාර ව්‍යාපෘතිය යටතේ නාරංගොල්ලේ ඉදිවන තාක්ෂණික ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අදියර 04ක් යටතේ භාණ්ඩ හා උපකරණ ආධාර ලබාදීමට ගිවිසුම්ගත වී තිබුණ අතර ඒ අනුව 2024 වර්ෂය තුලදී ලැබී තිබුණු රු.384,457,544ක් වටිනාකමැති භාණ්ඩ හා උපකරණ සඳහා නව වැය විෂයයක් යටතේ ප්‍රතිපාදන වෙන් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 01 වන අදියර වෙනුවෙන් ඉන්දියානු රජය විසින් 2022 වර්ෂය සඳහා දරන ලද රු. 10,033,206 ක වියදමද 2024 වර්ෂයට දරන ලද රු. 11,862,704 ක වියදමද පිළිවෙලින් 2022 හා 2024 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු. 21,895,910 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) විද්‍යාපීඨ සිසුන් තෝරාගැනීම සඳහා බාහිර ආයතනයක් විසින් නොමිලේ සකස් කර විද්‍යාපීඨ ශාඛාව විසින් 2024 දෙසැම්බර් 03 දින භාරගැනීම සම්පූර්ණ කල පරිගණක පද්ධතිය තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

3

(ඊ) සමාලෝචිත වර්ෂය වන විට අමාත්‍යාංශයේ ඒ ඒ අංශවල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් භාවිතා කරනු ලබන එක් එක් පරිගණක මෘදුකාංග, පරිගණක වැඩසටහන්, පරිගණක දත්ත පද්ධති තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(උ) යුරෝ මිලියන 9.5 කට සමාන රු.1,936,290,000 ක වත්කම හා පුහුණුවීම ලබාදීමට එකඟ වෙමින් ඔස්ට්‍රියානු ව්‍යාපෘතිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියට අයත් කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ආරම්භ කර එය 2021 පෙබරවාරි 27 දින අධිකාරිය වෙත භාරදී තිබුණි. නමුත් නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන අංශයේ නිසි අවධානය මෙම ව්‍යාපෘතිය කෙරෙහි යොමු නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘතියේ පිරිවැයෙන් රු.464,714,557ක වත්කම් සඳහා වූ වියදම ගිණුම්ගත කර නොතිබුණි

(ඌ) කොරියානු වොන් මිලියන 2.15 ක ඇස්තමේන්තු වියදමක් යටතේ 2023 මැයි මස ආරම්භ වූ නියාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2025 මැයි මස අවසන් කිරීමට නියමිතව ඇත. සමාලෝචිත වර්ෂයේ රු.478,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු මෙම අවසන් අදියරේ පවතින ව්‍යාපෘතිය වෙනුවෙන් කාලපරිච්ඡේදයට අදාලව දරන ලද වියදම් හඳුනාගැනීමට නොහැකිවීම මත වර්ෂයේ වියදම රු.17,486,809 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර පොත් (ACA 6 / SA 82) අනුව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.180,717,729,388 ක් වූ අතර 2024 ජනවාරි 01 දිනට එම ශේෂය රු.182,425,248,155 ක් වීමෙන් රු.1,707,518,767 ක වෙනසක් පැවතුණි.

(ආ) භාණ්ඩාගාර SA 82 සමුච්චිත ජංගම නොවන වත්කම් ආකෘතිය ප්‍රකාරව 2024 වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.11,382,867,648 ක් වන අතර මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුලත් 2102, 2103, 2104, 2106 වැය විෂයන් යටතේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දැරූ වියදම රු.28,242,879,684 ක් වීමෙන් රු.16,860,012,036 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව ප්‍රාග්ධනීත නොකළ වත්කම් වටිනාකම රු.16,860,012,036 වී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර SA 82 වාර්තාවේ හි ඇතුලත් වර්ෂ අවසාන ශුද්ධ වත්කම් ශේෂය මගින් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඇතුලත් ශුද්ධ වත්කම් ශේෂය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය සතු සත්‍ය වත්කම් ප්‍රමාණය නිරූපණය වී නොතිබුණි.

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ජාතික පාසල් 396 න් දිස්ත්‍රික්ක 13කට අයත් පාසල් 39 ක ඉඩම්වල වටිනාකම 2024 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) අංක අමප/24/1473/630/009-1 දරන හා 2024 අගෝස්තු 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ආධාර යටතේ අදාල පාසල්වල සවිකිරීමේ කොන්දේසි මත සුහුරු පුවරු 1,000ක් මිලදීගැනීමට 2024 ජූලි 03 දින සිට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර 2024 ජූලි 31 දින තෝරාගත් ලංසුකරුට ප්‍රදානය ලබා දී 2024 ඔක්තෝබර් 07 දින පත්තලගෙදර ගබඩාවට සුහුරු පුවරු 1,000ක් භාරගෙන තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.1,493,310,697කට ලංසුව පිරිනමා 2024 ඔක්තෝබර් 07 දින භාරගත් සුහුරු පුවරු 1,000ක් පිළිබඳව වූ ගණුදෙනුව ශීර්ෂය 126 යටතේ ගිණුම්ගත කිරීමට අවශ්‍ය වැය විෂයය සඳහා 2024 වර්ෂයට භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන්කරවාගෙන සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.6.3 මූල්‍ය වත්කම්

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ශේෂය රු.3,049,180,294ක් ද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට අනුව ශේෂය රු. 3,043,666,518 ක් ද වීමෙන් රු. 5,513,776 ක වෙනසක් පැවතුණි. මෙය පාලන ගිණුම් ශේෂයට ඇතුලත්ව ඇති 1983 හා 1990 ගිණුම් සැසඳුම් ප්‍රකාශවලින් ඉදිරියට ගෙන එන ශේෂවල බලපෑම මත ඇති වූවක් ලෙස පෙර වර්ෂයේ පිළිතුරු ලිපියේ සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදිද මෙම වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් බී ගිණුමේ ශේෂය රු. 3,104,620,780 ක් හා නිවැරදි කල අත්තිකාරම් පාලන බී ගිණුමේ ශේෂය රු.3,049,180,295ක් වීමෙන් මෙම ශේෂයන් දෙක අතර රු.55,440,485 ක වෙනසක් පැවතුණි.

(ඇ) භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් බී ගිණුමේ ශේෂය රු. 3,104,620,780 ක් වන අතර ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට අනුව ශේෂය රු. 3,043,666,518 ක් වීමෙන් රු.60,954,262 ක වෙනසක් පැවතුණි.

(ඈ) අත්තිකාරම් බී පාලන ගිණුමේ සංශෝධිත ශේෂය රු. 3,104,620,780 ක් වන අතර සංශෝධිත කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු. 3,079,081,965 ක් වීමෙන් මෙම ශේෂයන් දෙක අතර රු.25,538,815 ක වෙනසක් පැවති අතර පසුගිය වර්ෂයේ සැසඳුම් ප්‍රකාශයේ වෙනස්කම් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව වාර්තාවට පිළිතුරු ලෙස දක්වා තිබුණ ද මේ දක්වා එය නිවැරදි කර නොමැති අතර ඉකුත් වසරට වඩා සමාලෝචිත වර්ෂයේ එම අගය රු. 595,886 කින් තව දුරටත් වැඩි වී තිබුණි.

### 1.6.4 තොග සමීක්ෂණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා, නිල ඇඳුම් ආදී වශයෙන් වූ පරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය සමීක්ෂණය සිදුකර එදිනට පැවති තොගයේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කර නොතිබුණි.

### 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව, පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂ සමග සැසදීමේ ප්‍රකාශයේ අඩුකර ඇති රු. 22,424,325 ක් වූ නැගෙනහිර පළාතේ 1990 කාලවලට අයත් පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරීම හා එකතු කර ඇති රු.48,909,855 ක් වශයෙන් වූ භාණ්ඩාගාර 7004 ගිණුම හරහා පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරීම ලෙස දක්වා ඇති එම අයිතමයන් දෙක සැදුම්ලත් ආකාරය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) භාණ්ඩාගාර පොත්වල සටහන් අනුව සමුච්චිත ස්ථාවර වත්කම් වාර්තාවට (SA 82 ආකෘතිය) 2024 වර්ෂයේ දී අලුතින් තක්සේරු කර ප්‍රාග්ධනීත කරන ලද ඉඩම් හා ගොඩනැගිලි ශේෂය රු.7,564,717,100 ක් වන අතර විගණනයට ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තා අනුව ශේෂ වටිනාකම රු.4,717,266,100 ක් වීමෙන් රු.2,847,451,100 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. එමෙන්ම සමුච්චිත ස්ථාවර වත්කම් වාර්තාවට (SA 82 ආකෘතිය) 2024 වර්ෂයේ දී අලුතින් තක්සේරු කර ප්‍රාග්ධනීත කරන ලද ඉඩම් හා ගොඩනැගිලි ශේෂය තුල වෙනත් ආයතන විසින් ගිණුම්ගත කරන ලද වර්ෂය තුල මිලදීගත් රු.2,975,379,780ක

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ස්ථාවර වත්කම් ශේෂයක්ද ඇතුලත්ව පවතින බව පිළිතුර අනුව නිරීක්ෂණය විය.

(ඇ) ස්ථාවර වත්කම් දෛනිකව සාමාන්‍ය මෙහෙයුම් කටයුතුවලදී ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයට පරිබාහිරව ගිණුම්ගත නොවූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේ දී, එනම් ස්ථාවර වත්කම් සම්බන්ධ වැරදි නිවැරදි කිරීමේදී, ශේෂ සැසඳීමේදී වශයෙන් සිගාස් පද්ධතියෙහි පවතින භාණ්ඩාගාර පොත් අනුව සමුච්චිත ස්ථාවර වත්කම් වාර්තාවට (SA 82 ආකෘතිය) යොදනු ලබන එක් එක් ගිණුම්කරණ සටහන් සඳහා නිශ්චිත සාක්ෂි සහිතව වගකිවයුතු නිලධාරියකු විසින් සහතික කරන ලද එක් එක් තහවුරු කිරීමේ සියළුම සටහන්, පිළියෙල කර විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී සමුච්චිත ස්ථාවර වත්කම් වාර්තාවට (SA 82 ආකෘතිය) ගලපන ලද රු.4,751,888,743 ක් හා අඩු කරන ලද රු. 13,976,886 ක් තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය II අදියර සඳහා වූ අතුරු ගෙවීම් සහතික 11 අනුව වැඩබිමේ පවතින අමුද්‍රව්‍ය යටතේ ශබ්ද විකාශන පද්ධතියක් (Sound system) සඳහා රු.8,000,000ක් හා ශ්‍රවනාගාර පුටු (Auditorium chairs) 859ක් සඳහා රු. 17,554,377ක් ගෙවීම් කර තිබුණු නමුත් එම උපකරණ විගණනයට භෞතිකව පෙන්වා තහවුරු කිරීමට අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය අපොහොසත් විය. ඒ අනුව එම උපකරණ අමාත්‍යාංශය තුළ පවතින බව තහවුරු නොවුණි.

### 1.6.6 ලේඛන හා පොත්පත් යාවත්කාලීනව පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛනය | පරිගණක මෘදු පිටපතක් ලෙස හෝ පවත්වා නොතිබුණු අතර සිගාස් පරිගණක වැඩසටහන තුල හෝ යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) | වාහන ලොග් සටහන් පොත | මුදල් රෙගුලාසි 1645 (අ) | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඇ) | හානි පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඇ) | කොන්ත්‍රාත් ලේඛනය | මුදල් රෙගුලාසි 127, 128, 133, 137 (අභ්‍යන්තර පාලන ක්‍රමවේදයකි) | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

### 1.6.7 පහත සඳහන් හේතූන් මත දුර්වල පාලන පරිසරයක් පවතින බව නිරීක්ෂණය විය.

I. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2025 මැයි 31 දින දක්වා දරන ලද වියදම හා එම වියදමේ ක්‍රියාකාරකම් අනුව වූ මූල්‍ය හා භෞතික ප්‍රගතිය නිසි පරිදි හඳුනාගැනීමට හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම.

II. අධ්‍යාපන අංශයට අදාලව විවිධ වූ මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ කළමනාකරණ තීරණ ගැනීමට හා නිසි පාලනයන් මනාව පවත්වා ගැනීමට හැකි ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් 2025 මැයි 31 දින වන විටත් නොතිබීම.

6

### 1.6.8 පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 104(4) වාර්තා තුලින් ඉදිරිපත් කරන ලද රු. 742,500 ක හානි හා පාඩු , මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හා පොත්වලින් කපා හැරීමෙ ප්‍රකාශයේ ඇතුලත් වී නොතිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති අවසන් ශේෂය හා 2024 ජනවාරි 1 දිනට පෙන්වා ඇති ආරම්භක ශේෂ අතර රු.471,127 ක වෙනසක් පැවතුණි.

### 1.6.9 හෙළිදරව් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගණුදෙනු ඇති අවස්ථාවලදී එම විශේෂිත ගණුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් "වාර්තාකරණ පදනම" යටතේ සිදුකල යුතු බවට, 2025 පෙබරවාරි 18 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් SA/MAA/02/01/01 දරන ලිපිය මඟින් නිකුත් කර ඇති 06/2024 දරන චක්‍රලේඛයට සිදුකරන ලද සංශෝධන යටතේ සඳහන් කර තිබුණු නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම ලිපිය ප්‍රකාරව කටයුතු කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කර නොතිබුණු අවස්ථා පහත පරිදි වී තිබුණි.

(i) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ඉදිකිරීම් කටයුතු අතරින් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකරමින් පවතින කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කරන ලද, කොන්ත්‍රාත් ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නිමකල වැඩවල රු.13,970,388,423 ක් වූ වටිනාකම ඒ ඒ ව්‍යාපෘති අනුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය නොකිරීම.

(ii) NEMIS දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් SESIP වැඩසටහනේ උප විසර්ජන සබැඳි දර්ශක 53 ළඟාකර ගැනීම සඳහා ප්‍රසම්පාදනය කර තිබුණු ලැප්ටොප් 328ක් සම්බන්ධයෙන් වූ නඩු කටයුත්තක් හේතුවෙන් අමාත්‍යාංශය විසින් 2023 වර්ෂයේ භාරගත් දින සිට අවුරුදු එකහමාරක කාලයක් තිස්සේ මධ්‍යම ගබඩාව තුල ගබඩා කර තිබෙන රු78,392,000ක් වටිනාකමැති ලැප්ටොප් පරිගණක 328 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය නොකිරීම.

(iii) සුරක්ෂා සිසු රක්ෂණය යටතේ 2021/2022 කාලච්ඡේදයට අයත් රු. 67,794,566ක නොගෙවූ හිමිකම 2024 දෙසැම්බර් 31 දිනටද පවතින නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කිරීමට කටයුතු නොකිරීම.

(iv) මොඩියුල 9කින් යුක්තව ජාතික අධ්‍යාපන කළමණාකරන තොරතුරු පද්ධතියේ (NEMIS) නිම කරන ලද මොඩියුලවල පිරිවැය හා එම පද්ධතියේ වර්තමාන තත්වය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර පෞද්ගලික ආයතනයක් විසින් සංවර්ධනය කරන ලද Cloud Smart School මෘදුකාංගය සමාජ යත්කාරක ව්‍යාපෘතියක් (CSR) ලෙස ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය ලෙස භාවිතා කල හැකි පරිදි සැකසීමට 2024 පෙබරවාරි 01 දින අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එළඹි ගිවිසුම පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය නොකිරීම.

(v) නිපුණතා අංශයට අයත් 2020 හා 2022 කාලවලදී පිළිවෙලින් බාහිර පාර්ශවයන්ට ලබා දී තිබුණු පිරිවැය රු.15,000,000ක් වූ වාහන 06ක් හා වටිනාකම සඳහන් නොවන ජනාධිපති කාර්යාලයට ලබාදුන් වාහනයක්ද පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කිරීමට කටයුතු නොකිරීම.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1. ආ (i) | අවසන් හා ආරම්භක ශේෂ සමාන වන ලෙස නිවැරදි ගිණුම් පිලියෙල කල යුතුය. | 1.6.2.(අ) |
| 1.6.1 ආ (ii) | අත්පත් කරගන්නා ලද මූලධන වත්කම් වර්ෂය තුලදී ප්‍රාග්ධනිත කල යුතුය. | 1.6.2.(ආ) |
| 1.6.1 අ (i),(iii) | ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ පාලන ගිණුම් ශේෂය හා කෝවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය අතර වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. ණය ශේෂවල පවතින වෙනස්කම් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. | 1.6.3 (අ) (ඇ) |
| 1.6.1 ඇ (iii) | ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | 1.6.5 (අ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

### 3.1.1 ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සඳහා 2024 වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.50,758,131,000 ක් හා පුනරාවර්තන වියදම් වෙනුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.121,153,679,000 ක් ලැබී තිබුණු අතර වර්ෂයේ දැරූ ප්‍රාග්ධන වියදම රු.34,371,228,655 ක් හා පුනරාවර්තන වියදම රු.102,369,355,183 ක් වී තිබුණි. ඒ අනුව ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 32 ක් ලෙස රු.16,386,902,345 ක් ද පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක් ලෙස රු. 18,784,323,817 ක් ද වශයෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතුණි.

(ආ) නිසි පුරෝකථනයකින් හා කිසිදු තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කර මුදල් ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් අමාත්‍යාංශයේ වැය විෂයයන් 36ක රු.3,741,399,238 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරිව පැවතුණු අතර ඉන් 32 ක් ම ප්‍රාග්ධන වැය විෂයයන් වී තිබුණි.

8

(ඈ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2020 සැප්තැම්බර් 08 දිනැති 24/2020 චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාත්මක ක්‍රීඩා පාසල් සඳහා පසුගිය වසර කිහිපය පුරා ළමුන් ඇතුලත් කර ගැනීමට කටයුතු නොකිරීමත්, ක්‍රීඩා පාසල් සිසුන් සඳහා පෝෂ්‍යදායී ආහාර වැඩසටහන සඳහා 126-01-02-019-1501 වැය විෂයය යටතේ රු.51,900,000 ක ප්‍රතිපාදන අනවබෝධයෙන් යුතුව වෙන්කර ගැනීමත් හේතුවෙන් රු. 24,141,282 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා 126-01-02-000-2104 වැය විෂය යටතේ අවශ්‍යතාවය නොසලකා වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන ලෙස රු. 50,000,000 ක් සලසාගෙන තිබුණි. ඉන් රු. 17,300,000ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කරගෙන තිබුණු අතර තවදුරටත් රු.32,700,000 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම්වලට හේතුව ලෙස අමාත්‍යාංශයේ කාර්යාල ගොඩනැගිල්ලේ 6 සහ 7 මහල් සඳහා ස්ථාවර මිල කමිටුවේ අනුමැතිය නොලැබීම නිසා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවීම් කිරීමට නොහැකි වී ඇති බව දක්වා තිබුණි. එහෙත් 2024 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත අදාල ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමට නොමැති අතර එම සංස්ථාවට වැඩිපුර ගෙවීම් ලෙස රු.6,759,826ක් පැවතුණි.

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතන 14 ක පුද්ගල පඩිනඩි වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දි ලබා දි ඇති ප්‍රතිපාදනයන්ට අමතරව රු. 76,435,000 ක පරිපූරකයක් ලබාගෙන තිබුණු නමුත් වර්ෂය අවසානයේ දි යාපනය විශ්ව විද්‍යාලය වෙත ලබා දුන් පරිපූරක ප්‍රමාණයෙන් සියයට 56 ක් , ජාතික මූලික අධ්‍යයන ආයතනය වෙත ලබාදුන් පරිපූරක ප්‍රමාණයෙන් සියයට 34 ක් සහ අනෙකුත් ආයතන 12ක් වෙත ලබා දුන් මුළු පරිපූරක ප්‍රමාණයම ඉතිරි වී තිබුණු අතර පරිපූරක ඇස්තමේන්තු නිසි පුරෝකථනයකින් තොරව සකස් කර අනුමත කරගෙන තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලාවල ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වන 126-2-21-014-2001(17) වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂයේ දි ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු අතර රු. 3,000,000 ක පරිපූරකයක් ලබාගෙන තිබුණි. නිසි පුරෝකථනයකින් හා කිසිදු තාර්කික පදනමකින් තොරව අනවබෝධයෙන් යුතුව පරිපූරක ප්‍රතිපාදන අනුමත කිරීමට කටයුතු කිරීම හේතුවෙන් අනුමත පරිපූරක ප්‍රතිපාදනයෙන් රු.2,656,697 ක් හෙවත් සියයට 89 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ දි ඉතිරි වී තිබුණි.

### 3.1.2 අනවධානයෙන් යුතුව ප්‍රතිපාදන හා පරිපූරක ප්‍රතිපාදන අනුමත කරගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) පාසල් සෞඛ්‍ය පෝෂණ වැඩසටහන

(i) පාසල් පෝෂණ වැඩසටහන වෙනුවෙන් 126-01-02-001-1501 වැය විෂයය සඳහා රු. 100,000,000 ක ප්‍රතිපාදනයක් ලබා දි තිබිය දි 2024 දෙසැම්බර් 11 දිනැතිව රු.1,800,000,000 ක පරිපූරකයක් ද ලබාගෙන තිබුණි. එමෙන්ම මෙම වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි මාරු කිරීම යටතේ රු.4,606,300,000 ක මුදලක් මාරුකර තිබුණු අතර ඒ අනුව මුළු ශුද්ධ ප්‍රතිපාදනය මුදල රු.6,506,300,000 වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ දි මෙම වැය විෂයය යටතේ රු.1,801,715,378 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වී තිබුණු අතර ඒ අනුව දින 20කට පෙර අනුමත කරගත් රු. 1,800,000,000 ක මුළු පරිපූරකයම ඉතිරි වී තිබුණි.

(ii) 2024 වර්ෂයේ පාසල් සෞඛ්‍ය පෝෂණ වැඩසටහන සඳහා රු.6,506,300,000 ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද වැඩසටහන අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණු අතර විගණන නියැදි පරීක්ෂණයට අනුව පළාත් 03 ක පාසල් 25ක පාසල් පෝෂණ වැඩසටහන මනාව කලමනාකරණය නොකිරීම හේතුවෙන් අතරමඟ නැවති තිබුණු අතර අමාත්‍යාංශය විසින් පාසල් පෝෂණ වැඩසටහන, මෙහෙයුම් සැලැස්මකට අනුව මෙහෙයවා ප්‍රගතිය සමාලෝචනය කිරීමද සිදුකර නොතිබුණි.

9

**(ආ) ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය**

ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේදී රු.2,078,750,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර වර්ෂය තුළදී දැරූ වියදම රු. 883,587,143 ක් වීමෙන් රු. 1,190,162,613 ක් හෙවත් සියයට 57 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් නොවීම මත 2021 මාර්තු 31 දිනෙන් පසු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වැඩ අවසන් කරන ලද හා 2021 දෙසැම්බර් 31 දිනට බිල්පත් ඉදිරිපත් කළ කර්මාන්ත සඳහා පමණක් ප්‍රතිපාදන ලබාදීම හේතුවෙන්ද, කොන්ත්‍රාත්කරුවන්ට මුදල් නොගෙවීම හේතුවෙන්ද බොහෝ ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම අතරමග නවතා දමා තිබුණු බව 2024 වර්ෂයේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව අනුව නිරීක්ෂණය විය. ඒ ඒ කොන්ත්‍රාත් කාර්යයන් වලින් නීත්‍යානුකූලව ඉවත් වීම සහ ගෙවීමට තිබෙන වටිනාකම නිශ්චිතව හඳුනාගෙන නොතිබියදී 2022 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති 34 ක්ද පළාත් සභා මගින් ව්‍යාපෘති 213 ක්ද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් ව්‍යාපෘති 41 ක්ද වශයෙන් ව්‍යාපෘති 288ක් සඳහා ප්‍රතිපාදන වෙන් කරගෙන ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉදිකිරීම්, සේවා සැපයීම්, යටිතල පහසුකම් සංවර්ධන අංශයෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලබාගත් තොරතුරු අනුව දක්වා තිබුණද අදාළ කාර්යයන් ඉටුකරවා ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. පාසල් භූමිය තුළ වැඩ නිම නොවූ ඉදිකිරීම දීර්ඝකාලීනව පැවතීම හේතුවෙන්, සිසුන්ට අනතුරුවලට මුහුණ පෑමට සිදුවිය හැකි අවධානමක් පැවතුණද ඒ පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කර නොතිබුණි.

**3.1.3 විදේශ ආධාර සඳහා ගිණුම්ගත කිරීමට ප්‍රතිපාදන අනුමත කර නොගැනීම**

ඉන්දියානු රජයේ ආධාර යටතේ පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය මහා විද්‍යාලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය රු.74,905,900 ක වියදමින් 2024 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු අතර එම ආධාර යටතේ ඉතිරි මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,765,700ක වටිනාකමැති තොරතුරු තාක්ෂණ උපකරණද, රු.2,896,176ක වටිනාකමැති විද්‍යාගාර උපකරණද මිලදීගැනීම සඳහා ඉන්දියානු රජය අනුමත කර තිබුණි. මෙම කාර්යයන් 02 හි කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණු නමුත් නියමිත පරිදි සැලසුම් තුලට එම කාර්යයන් 02 ඇතුලත් කර 2024 හා 2025 වර්ෂ සඳහා නව වැය විෂයයන් ඇති කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉන්දියානු රජය 2019 වර්ෂයේදී මිලදීගැනීමට අනුමැතිය ලබා දී තිබුණු රු.3,765,700ක් (වැට් රහිත) වටිනාකමැති තොරතුරු තාක්ෂණ උපකරණ වර්ෂ 06ක ප්‍රමාදයකින් පසුව 2025 ජනවාරි 22 දින සරස්වතී මධ්‍ය මහා විද්‍යාලය වෙත භාරදී තිබුණු අතර ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු වැය විෂයයන් අනුමත කරගෙන නොතිබියදී 2024 වර්ෂය තුළ ආරම්භ කර තිබුණි. තවද, රු.2,896,176ක් (වැට් රහිත) වූ විද්‍යාගාර උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2025 මැයි 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

**3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ආ) ඡේදය අනුව යම් මුදල් වර්ෂයකට අදාළව සියළුම බැරකම් එම වර්ෂය තුළදී මුදල් ගෙවා නිදහස් කළ යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළදී නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු වුවද 2024 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු. 13,968,799,197 ක බැරකමක්ද රු. 1,513,512 ක බැදීම්ද ඇති කරගෙන තිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (අ) ඡේදයට අනුකූල නොවන ආකාරයට ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයයන් 10 ක රු. 517,319,335 ක බැරකම් ඇති කරගෙන තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 94 (1) හි පරිදි වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැඳී සිටිය යුතු වුවත්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

බැරකම් ශේෂ නිරාකරණය කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වී නොතිබියදී, 2023, 2019 හා 2018 වර්ෂවලට අදාළ රු.1,265,600,289 ක බැරකම් ඇති කරගෙන තිබුණි.

(ඈ) භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ (SA 92) අනුව ඉකුත් වර්ෂවල එනම් 2018,2019 සහ 2020 වර්ෂවල රු.77,282,522 ක බැරකම් සමාලෝචිත වර්ෂයේ බැරකම් ලේඛනයේ ඇතුළත් වී තිබුණි. එමෙන්ම 2023 වර්ෂයට අදාළ රු. 1,335,448 ක බැඳීම් හා රු. 4,002,423,494 ක බැරකම්ද භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශයේ ඇතුළත් වී තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයන්ට අදාල බැරකම්, ගෙවීම් කර නිදහස් කර තිබේද යන්න ගෙවීම් පාලනය හා බැරකම් ලේඛනය පවත්වාගෙන යන අංශ අතර සැසඳීමක් මාසයකට වරක් හෝ සිදුකර නොතිබුණු බැවින් එම අංශ දෙක අතර තොරතුරු 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පරීක්ෂා කර නිශ්චිත සාක්ෂි සහිතව ලේඛන යාවත්කාලීන කිරීම, ඉදිරි කටයුතු සිදුකිරීම සහ සාක්ෂි සහිත තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීම සිදුකල යුතුව පවතින බව විගණනය නිරීක්ෂණය කෙරේ.

(ඊ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 ට අනුව සියළු බැරකම් ලේඛනගත කළයුතු වුවත් රු.870,325 ක් වටිනා නිපුණතා අංශයේ බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

### 3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචන සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආයතනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.8 (අ) (ආ) ඡේද වල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.

(ඇ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.7 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 හි සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

11

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීතිරීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>ආයතන සංග්‍රහයේ **V** වන පරිච්ඡේදයේ 7.1 හා 7.4 උප වගන්ති | නිවාඩු ලබා නොගෙන රාජකාරියට නොපැමිණෙන නිලධාරියෙකු එලෙස නොපැමිණි දින සිට සිය තනතුර අත්හැර ගියා සේ සලකා ඒ බව එකී නිලධාරියාට වහාම දන්වා නොතිබුණු අතර සේවයට වාර්තා නොකර මාස 03කට වැඩි කාලයක් සේවයෙන් බැහැරව සිටි ක්‍රීඩා පුහුණුකරුවන් පිළිගත නොහැකි සාක්ෂි මත පදනම්ව නැවත සේවයේ පිහිටුවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104(3) සහ 104(4) | පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරිමට දින 7 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ නම්, ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොමැති සිද්ධීන් 18 ක් හා අලාභය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුලත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත් එසේ කටයුතු කර නොමැති සිද්ධීන් 52 ක් පැවතුණි. මෙම විෂයයට අදාල අංශ විසින් ප්‍රමාණවත් අධීක්ෂණයන් සිදු නොකිරීම මීට හේතු වී තිබුණි. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ<br>2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 වගන්තිය | නිපුණතා අංශයේ සමාලෝචිත වර්ෂය අවසානයට දේපල පිරියත හා උපකරණ වටිනාකම තුල බාහිර පාර්ශවයන්ට පරිහරණය සඳහා 2020 වර්ෂයේ සිට ලබාදුන් රු. 13,000,000 ක් වටිනා වාහන 05 ක්ද 2022 වර්ෂයේ සිට ජාතික වෘත්තීය පුහුණු අධිකාරියට ලබාදුන් රු. 2,000,000 වටිනා වාහනයක්ද වටිනාකම හා ලබා දුන් කාලය සඳහන් නොවන ජනාධිපති ලේකම් කාර්යාලයට ලබාදුන් මෝටර් රථයක්ද ආර්ථික කටයුතු අමාත්‍යාංශය සතු රු. 4,300,000 ක් වටිනා වාහනයක් නිපුණතා අංශය විසින් 2020 වර්ෂයේ සිට භාවිතා කරනු ලැබුවත් චක්‍රලේඛය පරිදි වාහන පවරාදීම හෝ පවරාගැනීම සිදුකර නොතිබුණි. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛ<br>ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017 අප්‍රේල් 27 දිනැති හා අංක EST/7/EXAMS/05/1007-6 දරන හා 2016 දෙසැම්බර් 28 දිනැති අංක EST/T/ALLOW/05/0037-4 දරන ලිපි | විෂයානුබද්ධ රාජකාරියට අයත් විවිධ අත්පොත් සැකසීම, මාර්ගෝපදේශ සංග්‍රහයන් සකස් කිරීම, චක්‍රලේඛ සකස් කිරීම, ගුරු පුහුණු මොඩියුල් සකස් කිරීම වැනි දේශන ස්වරූපයේ නොවන කාර්යයන් වෙනුවෙන් සහභාගී වූ නිලධාරීන්ට රු 7,418,540 ක් ආයතන අධ්‍යක්ෂ ජනරාල් සනාවන ලද විධිවිධානවලට පටහැනිව සම්පත් දායක දීමනා ලෙස ගෙවීමට කටයුතු කර තිබුණි. |
| (ඉ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ<br>(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 දරන චක්‍රලේඛය හා 2009 පෙබරවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇති කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදය | (i) ඒ ඒ පාසලේ නියමිත සේවා කාලය ඉක්ම වූවද පාසල් විදුහල්පතිවරුන් විසින් එම තොරතුරු චක්‍රලේඛ ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් නොකිරීම, නිවැරදිව ඉදිරිපත් නොකිරීම හා අමාත්‍යාංශ මට්ටමින් දත්ත පද්ධතියක් පවත්වා නොතිබීමද හේතුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ වාර්ෂික |

12

ජාතික විගණන කාර්යාලය
දේශිය கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| සහ අංක PSC/EST/02-04-34/01/2017 සහ 2017 ජුනි 21 දිනැති ලිපිය, 2024 මැයි 30 දිනැති අංක 21/2024 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ v(ඇ) (i) ඡේදය | ස්ථාන මාරු ප්‍රතිපත්තිය නියමිත පරිදි සිදු කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.<br>(ii) සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට එකම පාසලේ වසර 5 කට වඩා සේවා කාලයක් සම්පූර්ණ වන ගුරුවරුන්ගේ තොරතුරු ඇතුලත් ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කර අදාළ විදුහල්පතිවරුන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කල යුතු වුවත් බහුතරයක් වූ විදුහල්පතිවරුන් එපරිදි කටයුතු කර නොතිබුණු නමුත්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවරක් ගෙන නොතිබුණි. |
| (ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීති 28 සහ 32 | අනුමත සේවා ව්‍යවස්ථාවක් හෝ බඳවා ගැනීම් පටිපාටියක් නොමැති තනතුරු සඳහා වැඩ බැලීමේ පත්කිරීමක් සිදුකල නොහැකි වුවද, අධ්‍යක්ෂ (පිරිවෙන්) තනතුර සඳහා වැඩ බැලීමේ පත් කිරීමක් සිදුකර තිබුණි. |
| (ඊ) ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමයේ II අදියරෙහි ගිවිසුම 2016 මාර්තු 29 දිනැති ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමයේ II අදියරෙහි ගිවිසුම 3.2 ඡේදයේ වගන්තිය (f) | (i) II වැනි ගිණුම් වර්ෂය අවසන් වී තුන් මාසයක් ඇතුලත SEPI Loan Scheme – Phase 11 සම්බන්ධයෙන් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ වගකීම මහ බැංකුව සතු විය යුතු වුවත් 2016 සිට මෙ දක්වා නිපුණතා අංශය විසින් ඒ සම්බන්ධයෙන් මැදිහත් වී අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි |
| ගිවිසුමේ (b) ඡේදය | (ii) අත්‍යාවශ්‍ය ණය ලබාදීමේදී සම්බන්ධ වන මූල්‍ය ආයතන වෙත ඒකාබද්ධ අරමුදල් යටතේ වෙන් කරන ලද අරමුදල් ලබාගැනීමේ හැකියාව පිළිබඳ හා අනුමත සත්‍ය අවශ්‍යතා සැලකිල්ලට ගැනීමෙන් පසුව ණය ලබාදිය යුතු වුවත්, නිපුණතා අංශය විසින් එසේ නිසි සැලසුම් කිරීමක් සහිතව මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන බවට විගණනයේදී තහවුරු නොවුණි. |
| (උ) අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ<br>(i) 2023 අප්‍රේල් 25 දිනැති අංක 17/2023 දරන චක්‍රලේඛය | |
| a) 3.4.5.1 වගන්තිය | බස්නාහිර පළාතේ පාසල් කිහිපයක සිදුකල නියැදි පරීක්ෂාවේදී පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා 2024 මාර්තු 07 දිනට පැවති පුරප්පාඩු පදනම් කරගෙන සිසුන් ඇතුලත් කිරීමේදී, චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කලයුතු නව හා පැරණි පදිංචිය සනාථ කිරීමේ ලේඛනවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව විදුහල්පතිතුමා ඇතුළු සම්මුඛ පරීක්ෂණ කමිටු සාමාජිකයින් නිවැරදිව කටයුතු නොකර පාසල් සඳහා ළමුන් 28 ක් ඇතුලත් කිරීමට කටයුතු කර තිබුණි. |
| b) 6.0 ඡේදය | සම්මුඛ පරීක්ෂණයට දින නියමවීමට ආසන්නතම කාලසීමාවක් වූ 2024 අප්‍රේල් 25 දින සිට 2024 ජූලි 26 දින දක්වා කාලය තුලදී චක්‍රලේඛ විධිවිධාන පරිදි අතරමැදි පන්ති සඳහා සිසුන් ඇතුලත් කල හැකි බාණ්ඩ 07 ට සුදුසුකම් නොලබන විට එම චක්‍රලේඛයේ 6.0 මඟින් අධිකරණ තීන්දු හි අනෙකුත් නෛතික ක්‍රියාමාර්ගවලට අනුකූලව නියම කෙරෙන සිසුන් ඇතුළත් කිරීම මෙන්ම මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන යම් විශේෂ හේතුවක් මත ශිෂ්‍යයෙකුගේ දැනට ඉගෙනුම ලබන පාසල |

13

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| | වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ශිෂ්‍යයාගේ අඛණ්ඩ අධ්‍යාපන අවස්ථාව තහවුරු වන පරිදි අවස්ථානුකූලව තීරණ ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය යනුවෙන් සලසන ලද ප්‍රතිපාදන යටතට අයත් නොවන සාධාරණීකරනය කල නොහැකි හේතූන් පදනම් කරගෙන දිවයිනේ ජනප්‍රිය පාසල් 106 කට සිසුන් 528 ක් ඇතුලත් කිරීමට අධ්‍යාපන ලේකම්වරයා විසින් කටයුතු කර තිබුණි. ඒ අනුව, චක්‍රලේඛයේ 6.0 වගන්තිය අවභාවිතා කර තිබුණි. |
| (ii) 2023 දෙසැම්බර් 29 දිනැති අංක 52/2023 දරන චක්‍රලේඛයේ 3.3 වගන්තිය | (i) චක්‍රලේඛය ප්‍රකාරව පිහිනුම් තටාක ආදායම පාසල් සංවර්ධන ගිණුමට බැර කල යුතු වුවත් කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. ආදායමින් රු. 491,332ක මුදලක් චක්‍රලේඛයට පටහැනිව වියදම් කර තිබුණු අතර රු.78,190ක් ආදි ශිෂ්‍ය සංගමයට ලබා දී තිබුණි.<br>(ii) 2024 ඔක්තෝබර් 08 දින පිහිනුම් තටාක ආදායම් වියදම් පිළිබඳ ලේඛන අනුව පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කල යුතු රු. 287,540 ක ආදායමින් රු.70,000ක් පිහිණුම් තටාක කළමණාකරු අතැතිව තිබුණු නමුත්, රු.147,540ක මූල්‍ය ඌණතාවයක් පැවතුණු, අතර විදුහල්පතිවරයා විසින් නිසි මූල්‍ය පාලනයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. |
| (iii) 2015 ජනවාරි 19 දිනැති අංක 05/2015 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | 2024 උසස් පෙළ පන්ති සඳහා බාහිරින් පැමිණෙන ශිෂ්‍යයකුගෙන් රු.4,000 ක් ද, පාසලේ අභ්‍යන්තරව සිටි සිසුවකුගෙන් රු. 3,000 ක් ද වශයෙන් රු.1,171,000 ක මුදලක් 2024 ඔක්තෝබර් 25 සිට නොවැම්බර් 25 දක්වා කාලය තුල අයකර ගැනීමට කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති විසින් කටයුතු කර තිබුණි. මෙවැනි ආකාරයට පාසලේ දරුවන් හා දෙමාපියන්ගෙන් මුදල් අය කිරීම බොහෝ පාසල්වල විදුහල්පතිවරුන් විසින් සිදුකරන දෙමාපියන්ට පීඩාකාරී වූ කටයුත්තක් ලෙස හඳුනාගත හැකි වුවත්, අමාත්‍යාංශය විසින් එම තත්ත්වය නිවැරදි කිරීමට අපොහොසත් වී තිබුණි. |
| (iv) 1961 නොවැම්බර් 20 දිනැති හා 1995 ජුනි 21 දිනැති ආදි ශිෂ්‍ය සංගම් චක්‍රලේඛය සහ ආයතන සංග්‍රහයේ II වැනි බාණ්ඩයේ XLV II පරිච්ඡේදයේ 1.3 ඡේදය | නියමිත ආකෘතිපත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පුරවා පිලියෙල කරන ලද වවුචර් සියළුම ගෙවීම් සඳහා ඉදිරිපත් කල යුතු වුවද, කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය මඟින් 2022, 2023 හා 2024 වර්ෂවල චෙක්පත් මඟින් ගෙවූ, එකතුව රු. 1,736,049ක් වූ වියදම් වෙනුවෙන් වවුචර් පිලියෙල කර නොතිබියදී විදුහල්පතිවරයා විසින් එම වවුචර් සඳහා ගෙවීම් කර තිබුණි. තවද, 2017-2024 කාලසීමාවේදී උක්ත පරිදි රු.2,404,700ක මුදලක් ආදි ශිෂ්‍ය සංගමයේ ගිණුමෙන් වවුචර් නොතිබියදී ගෙවීම් කර තිබුණි. |

14

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 3.5 තැන්පතු

මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැම්පත් කල දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුව ද සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ආදායමට බැර නොකල තැන්පතු ගිණුම් 09 ක වටිනාකම රු.427,548,509 ක් වූ අතර, එම වටිනාකම තුල වර්ෂ 5ක් ඉක්ම වූ රු.146,146,818 ක ශේෂයක් ඇතුලත් වී තිබුණි.

### 3.6 අධිභාර

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 ජුනි 27 දිනැති අංක 18/2015 (V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදයෙහි විධිවිධාන අනුව විදුහල්පති තනතුර දරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන්ට, විදුහල්පතිවරුන්ට හිමිවන විශේෂ දීමනාව ගෙවිය නොහැකි වුවද, බස්නාහිර පළාතට අයත් කලාප අධ්‍යාපන කාර්යාල 11 න් ලබා ගත් තොරතුරු අනුව 2024 ජූලි මස සිට 2024 දෙසැම්බර් මස දක්වා පාසල් 72ක අධ්‍යාපන පරිපාලන සේවයට අයත් විදුහල්පතිවරුන් 58 දෙනෙකුට විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට හිමි විශේෂ දීමනාව සහ විදුහල්පති දීමනාව යන දීමනා දෙවර්ගයම, චක්‍රලේඛයට පටහැනිව ගෙවීම් කිරීම හේතුවෙන් රු. 2,151,500 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2019 මැයි 06 දිනැතිව බඳවාගෙන තිබුණු ක්‍රීඩා පුහුණුකරුවන්ගේ පත්වීම් ලිපියෙහි 24 ඡේදය යටතේ දක්වා ඇති පරිදි වසර 05 ක් තුළ මෙම තනතුරෙන් ඉල්ලා අස්වීම හෝ වෙනත් තනතුරක වැඩභාර ගැනීමට මෙම තනතුරෙන් මුදා හරින ලෙස ඉල්ලා සිටියහොත් සමාරම්භක පුහුණුව සඳහා රජය විසින් එක් පුහුණුකරුවකු වෙනුවෙන් දැරූ රු.163,053 ක මුදල නැවත රජයට ගෙවිය යුතු බව දන්වා තිබුණි. ඒකාබද්ධ සේවා නොවන අංශය තුල ක්‍රමවත් දත්ත පද්ධතියක් නොමැතිවීම තුල නිශ්චිතව සේවය හැර ගිය ක්‍රීඩා පුහුණුකරුවන් ගණන අනාවරණය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී නොසිටි පුහුණුකරුවන් ප්‍රමාණය සේවය හැර ගොස් ඇතැයි යන පදනම මත එවැනි නිලධාරීන් 892ක් සඳහා සමාරම්භක පුහුණුව වෙනුවෙන් දරන ලද රු.145,443,276ක මුදල් ප්‍රමාණයක් රජයට අහිමි වී තිබුණි.

(ඇ) විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි සේවය හැර ගිය ක්‍රීඩා පුහුණුකරුවන්ට සේවය හැර ගිය මාස සඳහාද වැටුප් ගෙවීම් සිදුකර තිබුණු අතර එසේ ගෙවන ලද රු.46,774 ක් නැවත අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. තවද, ලබා ගත් ආපදා ණය හා අතිකුත් ණය වාරික රු.474,800ක් අයකර ගැනීමට ද නොහැකි වී තිබුණු අතර සේවය හැර ගිය සමස්ථ නිලධාරීන්ට උක්ත පරිදි වැඩිපුර ගෙවූ වැටුප් හා ඔවුන්ගේ හිඟ ණය ශේෂ අනාවරණය කරගෙන රජයට සිදු වූ සමස්ථ පාඩුව අනාවරණය කර අයකර ගැනීමටත්, විගණනයට වාර්තා කිරීමක් සිදුකරන ලෙසත් නිරීක්ෂණය කරන අතර අනවධානයෙන් යුතුව වැටුප් ගෙවූ හා එය අයකර නොගන්නා ලද නිලධාරීන් රජයට සිදුකල පාඩුව සම්බන්ධයෙන් වගකිව යුතුව පැවතුණි.

(ඈ) රාජ්‍ය සේවා කොමිෂන් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වැටුප් පිළිබඳ අත්පොතෙහි 9 ඡේදයට අනුව රාජකාරී ආවරණය සඳහා කිසිදු අමතර දීමනා හා වරප්‍රසාද හිමිනොවන බව සඳහන් වුවද අවිධිමත් ලෙස පූර්ණකාලීන පදනමින් වැඩ බැලීමේ පත්වීමක් අධ්‍යක්ෂ (පිරිවෙන්) ලෙස ලබාදීමට කටයුතු කර 2023 ඔක්තෝබර් 04 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් රාජකාරී ආවරණය සඳහා පත්කළ අධ්‍යක්ෂ (පිරිවෙන්) හට වාහන,ඉන්ධන දීමනාව හා දුරකථන දීමනාව හා අනෙකුත් දීමනා ලෙස රු.492,780 ක් ගෙවා තිබුණු අතර අධ්‍යක්ෂ තනතුරට හිමි වාහනයද ලබාදීමට කටයුතු කර තිබුණි. තවද, තනතුර කොන්ත්‍රාත් පදනම මත පිහිටුවීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2024 ජූලි 01 දින අනුමත කර තිබුණද, ඊට පෙර නැවතත් අධ්‍යක්ෂ (පිරිවෙන්) තනතුර කොන්ත්‍රාත් පදනමට 2024 මැයි 15 ක්‍රියාත්මක වන පරිදි පත්වීම ලබා දී අනුමත නොවූ මාස එකහමාරක කාලපරිච්ඡේදයක් සඳහා සියලු දීමනා සහිතව රු.260,000 ක පමණ වැටුප් හා දීමනා ගෙවීමටත් නිල වාහනය ඇතුලු අනෙකුත් වරප්‍රසාද ලබාදීමටත් කටයුතු කර තිබුණි.

15

3.7 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිණුම් අංක 09 කට සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගිණුම් අංක 30 කට සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට අයත් බැංකු ගිණුම් 10 කට අදාලව හඳුනා නොගත් මුදල් ලැබීම්වල වටිනාකම රු. 20,806,126ක් වී තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ බැංකු ගිණුම් 04 කට, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති බැංකු ගිණුම් 09 කට සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට අයත් බැංකු ගිණුම් 03 කට අදාලව හඳුනානොගත් ගෙවීම්වල මුළු වටිනාකම රු. 1,192,227,355ක් වී තිබුණි.

(ඇ) සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ බැංකු ගිණුමට අදාල 2024 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුමේ 2021 වර්ෂයට අදාලව රු.2,150,000ක උපලබ්ධි නොවූ ලැබීමක් සහ ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ බැංකු ගිණුමට අදාල 2024 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුමේ 2023 වර්ෂයට අදාලව රු. 11,980ක උපලබ්ධි නොවූ ලැබීමක් තිබුණු අතර 2024 වර්ෂය වන විටත් මෙම උපලබ්ධි නොවූ ලැබීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ නේවාසිකාගාර ගිණුමට ලද මුදල්වලින් 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් තිබුණු, රු.6,800,423ක ශේෂයක් නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට පියවර නොගෙන නිෂ්කාර්යව නේවාසිකාගාර ජංගම ගිණුමේ රඳවා තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යයභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සම්පූර්ණයෙන් ඉටුකිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

(ආ) 1991 අප්‍රේල් 19 දිනැති අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003, 2016 හා 2021 වර්ෂවලදී අධ්‍යාපන අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2024 වර්ෂය අවසාන වන විටද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අනුමත කරගෙන නොතිබුණි.

(ඇ) "නිපුණතාවයෙන් සපිරි පර්යේෂණශීලී සමාජයක්" හා "දැනුමෙන් වෘත්තීය නිපුණතාවයෙන් සහ කුසලතාවයෙන් පිරි සුහුරු සමාජයක් බිහිකිරීම සහ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනයට හිතකර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මගින් කලාපීය හාව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් සඳහා පසුබිම සැකසීම" දැක්ම හා මෙහෙවර කරගත් නිපුණතා අංශයේ 2020, 2021, 2022 කාර්යසාධන වාර්තාවන් හා 2023 කෙටුම්පත් කාර්යසාධන වාර්තා පරීක්ෂා කිරීමේදී නිපුණතා අංශය පසුගිය වර්ෂ 04 පුරාවටම එකම අභියෝගයන්ට දිගින් දිගටම මුහුණ පා තිබුණද එම අභියෝගයන් සාර්ථකව ජයගැනීම සඳහා විධිමත් ස්ථිර ක්‍රමෝපාය සහිත සැලැස්මක් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක වී නොතිබුණි.

16

### 4.1.2 සැලසුම් කිරීම

2024 වර්ෂය සඳහා වූ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මෙහි වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලද අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යමණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

### 4.1.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව 2024 වර්ෂයේ අපේක්ෂිත කාර්යයන් සඳහා වූ මුළු ඇස්තමේන්තුගත වියදම රු.30,095,201,000 ක් වුවද ප්‍රගති වාර්තාව අනුව සත්‍ය වියදම රු.10,567,071,896 ක් වී තිබුණි. ඒ අනුව ලඟාකර නොගත් ක්‍රියාකාරකම් මුළු ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.19,528,129,104 ක් හෙවත් සියයට 65 ක් ඉතිරි වී තිබුණු අතර අපේක්ෂිත ඉලක්ක කරා ලගාවීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව අතර ඇස්තමේන්තුගත වියදමෙහි රු.8,979,789,000 ක වෙනසක්ද පැවතුණි.

(ආ) 2024 වර්ෂය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අවසන් කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 927ක් අතුරින් කිසිදු ප්‍රගතියක් ළගා කර නොගත් අංශ 26 කට අයත් කාර්යයන් 69 ක් පමණ වූ අතර එහි ඇස්තමේන්තු වටිනාකම රු.9,586,286,000 ක් වී තිබුණි.

(ඇ) නිපුණතා අංශයේ ප්‍රධානතම අරමුණක් වූ වෘත්තීය රැකියා ක්ෂේත්‍රයට යොමුවීම සම්බන්ධයෙන් කරන ලද ඇගයීමේදී මෙම අංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන හා ව්‍යාවස්ථාපිත ආයතන 20 න් වෘත්තීය පුහුණුව අවසන් කළ පුහුණුලාභීන්ගේ රැකියාගතවීම සම්බන්ධව පසුවිපරම් වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර පුහුණුලාභීන් රැකියාගතවීම පිළිබඳ දත්ත පද්ධතියක්ද ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව ඊට අදාල කාර්යක්ෂමතාව ඇගයීමට නොහැකි විය.

(ඈ) පුහුණුලාභීන් විදෙස් ශ්‍රම වෙළඳපොලේ රැකියාගත කිරීම සඳහා ඉංග්‍රීසි භාෂා නිපුණත්වය හා ක්ෂේත්‍රයට අදාලව එක් අවුරුද්දක පළපුරුද්ද අත්‍යාවශ්‍ය සුදුසුකම් ලෙස ආරම්භයේ සිටම හඳුනාගෙන තිබුණද මේ දක්වාම එම අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් අයුරින් කටයුතු නොකිරීම තුලින් විදේශීය රැකියා වෙළඳපොලේ පවතින ඉල්ලුමට සරිලන සැපයුමක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

### 4.1.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ ශාඛා 49 ක් අතරින් ශාඛා 25 කට අයත් කාර්යයන් 66 ක ප්‍රගතිය සියයට 1 සිට 50 දක්වා පරාසයක පැවති අතර ප්‍රගති වාර්තාව අනුව ලගාකර නොගත් කාර්යයන්හි ඇස්තමේන්තුගත වටිනාකම රු.2,750,096,000 ක් වී තිබුණි.

(ආ) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවා 2020, 2021 හා 2022 යන වර්ෂ තුළදී රු.5,219,297,390ක් හා ජාතික අධ්‍යාපන ආයතනය මගින් රු.350,552,393ක් වශයෙන් රු.5,569,849,783ක් වැය කර තිබුණද, සැලසුම් කළ පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. 2022 වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී තිබුණු අතර විෂයපථයට අයත් ව තිබුණු කාර්යයන් හා කර්තව්‍යයන් එදින සිට අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා තිබුණද, අමාත්‍යාංශයේ විගණන හා කළමණාකරන රැස්වීම පැවැත්වූ 2025 මාර්තු 26 දින වන විටත් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම හා කාල රාමුව සකස් කරමින් පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, සැලසුම් කර වර්ෂ 05ක ප්‍රමාදයක් තිබියදීත්, සියළු වියහැකි අවදානම්

17

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කළමණාකරණය කරමින් රටේ දරුවන් සියළු පැතිකඩවලින් ඔසවා ජාත්‍යන්තරය හා සමගාමීව ඉදිරියට යා හැකි පරිදි සකස් කල නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මාර්ග සිතියමක් (Road Map) අනුමත කර ගනිමින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල විධිමත්ව ක්‍රියාත්මක වන බව විගණනයට හඳුනාගත නොහැකි විය.

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශය තුල 2025 මාර්තු 31 දින වන විට නොවිසිඳී ඇති විනය විමර්ශන සංඛ්‍යාව 39ක් වී තිබුණි. මෙ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වීම තුල එහි ඇති වූ ප්‍රතිවිපාක පාසල් පද්ධතියේ ළමුන්ගේ ජීවිත අනාරක්ෂිත තත්ත්වයට පත්වීම දක්වාම පැතිර යාමක් වර්තමානයේ දක්නට ලැබුණි.

(ඈ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ් අඩවි වාර්තා අනුව 2025 මාර්තු වන විට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන 3,916 ක් අතරින් ආයතන 1,722 ක් පමණක් ක්‍රියාකාරී මට්ටමේ පැවතුණි. ආයතන 1,304 ක ලියාපදිංචි කාලය ඉකුත් වී තිබුණු අතර ආයතන 844 ක් වසා දමා තිබුණි. එමෙන්ම 2024 වර්ෂයේ තුලදී එසේ ලියාපදිංචි කාලය ඉකුත් වූ ආයතන අතුරින් ආයතන 601 ක් පමණක් නැවත ලියාපදිංචිය අලුත් කර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුල කොමිෂන් සභාව විසින් ජාතික නිපුණතා සම්මත සහ පාඨමාලා 50 ක් අලුතින් සංවර්ධනය කිරීමට හා 30 ක් යාවත්කාලීන කිරීමට ඉලක්කගත කර තිබුණද ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීම 26 ක් හා යාවත්කාලීන කිරීම 22 ක් පමණක් සිදුකර තිබුණු අතර 2025 මාර්තු මස වන විට තව දුරටත් නිපුණතා සම්මත 100 ක් යාවත්කාලීන නොකර ඉතිරිව පැවති තිබුණු අතර මේ පිළිබඳව නිපුණතා අංශයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණු කටයුතු වැඩිදියුණු කිරීම පිළිබඳ ඔස්ට්‍රියානු ව්‍යාපෘතිය යටතේ සැලසුම් කර ඉදිකිරීමේ ක්‍රමවේදය අනුව ඉදිකළ තුන්මහල් නව ගොඩනැගිල්ලක් සහ වැඩහල් ගොඩනැගිල්ලක් වැඩ අවසන් කර 2021 පෙබරවාරි 27 දින ආයතනයේ භාවිතයට ගෙන තිබුණු අතර එම ව්‍යාපෘතිය සඳහා ගෙවන ලද මුළු වටිනාකම රු. 326,155,114 ක් වී තිබුණි. 2021 දෙසැම්බර් 06 දිනට රජයේ තක්සේරු දෙපාර්තමේන්තු තක්සේරු වාර්තා අනුව එම ගොඩනැගිලි දෙකෙහි තක්සේරු වටිනාකම රු.51,750,000 ක් වී තිබුණි. ඒ අනුව ගොඩනැගිලි භාවිතයට ගැනීම ආරම්භ කර වසරක් තුල එම ඉදිකිරීම වටිනාකමට වඩා තක්සේරු වටිනාකම රු.274,405,114 කින් අසාමාන්‍ය ලෙස අඩු වී තිබුණි. ඉහත ව්‍යාපෘතිය යටතේම ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ගොඩනැගිලි 03 ක නවීකරණ කටයුතු 2021 පෙබරවාරි 27 දින වන විට අවසන් කර තිබුණු අතර ඒ වෙනුවෙන් දැරූ වියදම රු.101,910,000 ක් වී තිබුණි. 2022 දෙසැම්බර් 06 දිනට රජයේ තක්සේරු දෙපාර්තමේන්තු වාර්තා අනුව එම ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම රු.78,250,000 ක් වූයෙන් මෙසේ නවීකරණය කිරීමෙන් පසු එම ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම නවීකරණ වියදමට වඩා රු. 23,660,000 ක් අඩු බව නිරීක්ෂණය විය. ඉහත කරුණු අනුව මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද ඉදිකිරීම් හා නවීකරණය කිරීම කටයුතු ආර්ථිකභාවයකින් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ඊ) ඉහත ව්‍යාපෘතිය යටතේ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මඟින් එතෙක් ලැබී නොතිබුණු පුහුණු උපකරණ ලැබීමට යටත්ව ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ ලිපිය නිකුත් කර තිබුණු අතර එම උපකරණ කොවිඩ් වසංගත තත්ත්වය අවසන් වී සංචරණ සීමා ලිහිල් කළ පසු ලබාදීමට කටයුතු කරන බව ව්‍යාපෘති භාරව කටයුතු කළ විදේශ නියෝජිත ආයතනය දන්වා තිබුණද විගණිත දිනය වූ 2025 මාර්තු 12 දින දක්වාම වටිනාකම රු. 13,730,656 ක් වූ පුහුණු උපකරණ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වෙත ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය. රු.13,730,656 ක් වූ මෙම උපකරණ වටිනාකමද ව්‍යාපෘති වටිනාකමට ඇතුලත් කර තිබුණු නමුත් වසර 03 ක් ඉක්ම ගියද උපකරණ ලබාගැනීම සම්බන්ධයෙන් නිපුණතා අංශය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) 2024 වර්ෂයේ අපේක්ෂිත පරිදි නිපුණතා අංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතන සඳහා සිසුන් බඳවාගැනීම පෙර වර්ෂයට සාපේක්ෂව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී තිබුණි. එනම් 2023 වර්ෂයේ 120,255 ක් හා සමාලෝචිත වර්ෂයේ එය 105,258 ක් වී තිබුණි.

18

(ඍ) 2024 වර්ෂයට අදාලව වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ඇති ආයතන 13 ක් වෙනුවෙන් ව්‍යාපෘති 496 ක් සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘති 368 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. සම්පූර්ණ නොකරන ලද ව්‍යාපෘති 128 සැලසුම් අදියරේ සිට සම්පූර්ණ කිරීම දක්වාම වූ විවිධ අදියරවල පැවතිව තිබුණි.

(එ) 2024 වර්ෂයේ වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ පවතින ආයතනවල සමස්ත ඉලක්කගත ශිෂ්‍ය බඳවාගැනීම් 130,318 ක් වුවද සත්‍ය බඳවාගැනීම 105,058 ක් වී තිබුණි. මේ අනුව ශිෂ්‍යයන් 25,060 ක් ඉලක්කගත ප්‍රමාණයට වඩා අඩුවෙන් බඳවාගෙන තිබුණි. වෘත්තීය අධ්‍යාපන අංශය විසින් 2024 වර්ෂය තුල නිපුණතා සංවර්ධන නිලධාරීන්ගේ දායකත්වයෙන් ප්‍රතිලාභීන් 218,563 දෙනෙකු සඳහා වැඩසටහන් 12,775 ක් පවත්වා තිබුණද, ඉලක්කගත බඳවාගැනීම් ප්‍රමාණය හා සත්‍ය බඳවාගැනීම් ප්‍රමාණය අතර වෙනස ආයතන අනුව සියයට 12 සිට සියයට 70 ක් දක්වා පරාසයක පැවතුණි.

(ඒ) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා කර්මාන්ත හා සේවා අංශවල දායකත්වය ප්‍රමුඛ වන අතර ඒ සඳහා නිපුණතාවයෙන් සපිරි ශ්‍රම බලකායක් එක් කිරීම අමාත්‍යාංශයේ නිපුණතා අංශය හා ඒ යටතේ ඇති ආයතනවල ප්‍රමුඛ කාර්යයකි. එම කාර්යයභාරය ඉටුකර ගැනීමට ප්‍රබල දායකත්වයක් නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගෙන් ලබාගත යුතු වූ අතර ඒ සඳහා දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 474 ක් සඳහා නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන් 317 දෙනෙක්ද දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා එම නිලධාරීන් 58 දෙනෙක්ද අනුයුක්ත කර තිබුණි. එම නිලධාරීන්ගේ 2023 වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධ පරික්ෂාවේදී, එම නිලධාරීන්ට පවරා තිබුණු ප්‍රධාන කාර්යයන් 22 න් 18 කට අදාලව වර්ෂයේ ප්‍රගතිය සියයට 0 සිට සියයට 35 දක්වා වූ පහළ අගයක් වී තිබුණු අතර 2024 කාර්යසාධනය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඔ) ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යටතේ 2016 වර්ෂයේ සිට 2027 වර්ෂය දක්වා රු.950,000,000 ක් ණය ලබාදීම ඉලක්ක කරගෙන තිබුණු අතර 2024 වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන් 1,193 දෙනෙකු සඳහා රු. 571,011,586 ක් පමණක් ලබාදී තිබුණි. 2024 වර්ෂය සඳහා ලබාගෙන තිබුණු අයවැයගත ප්‍රතිපාදන ප්‍රමාණවත් වී නොමැති බව නිරීක්ෂණය වූ අතර ප්‍රතිපාදන රු.70,000,000 ක් ප්‍රතිලාභීන් 82 ක් සඳහා පමණක් ප්‍රමාණවත් වී තිබුණි. 2024 වර්ෂයේ මැයි මස අග වනවිට ලබාදී අවසන්ව තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුල ණය නිකුත් කිරිමේදී සියළුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි ව්‍යවසායකයින් ඉලක්ක කර ගත යුතු වුවත් මන්නාරම, නුවරඑළිය, යාපනය සහ හම්බන්තොට ප්‍රදේශවල ණය ලබාදීම සිදුවී නොතිබුණි.

(ඕ) රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 12 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරිම.

කරාපිටිය වෛද්‍ය පීඨය සඳහා ඇතුළත් කරන සිසුන් සංඛ්‍යාව ඉහළදැමීම හා පර්යේෂණ ධාරිතාවය (Research Capabilities) වර්ධනය කිරීමේ අරමුණින් මහල් 12 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරිමේ කොන්ත්‍රාත්තුව 2020 ජුනි 01 දින මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යංශය වෙත පවරා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ නිමකර 2021 සැප්තැම්බර් 06 දින වන විට විශ්වවිද්‍යාලය වෙත පවරාදිය යුතු වුවත් ගිණුම් වර්ෂය අවසාන දින වන විට අවස්ථා 06කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. කෙසේ නමුත් මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 60කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ක) කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය.

2018 අයවැය යෝජනාවක් මත වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව 300 කින් වැඩි කිරීම, ජාතික සෞඛ්‍ය සේවා, වෛද්‍ය හා හෙද වෘත්තිය වැඩිදියුණු කිරීම, පශ්චාත් වෛද්‍ය උපාධි අභ්‍යාසලාභීන් බඳවාගැනීම වැඩිදියුණු කිරීම, සායනික පුහුණුව පිළිබඳ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම යන ඉලක්ක ළඟාකර ගැනීමේ අරමුණ මත 2019 ජූනි 24 දින රු.1,138,500,000 ක වටිනාකමකට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත මෙම ඒකකය පිහිටුවීමේ ව්‍යාපෘතිය පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2022 ජුනි 16 දින වැඩ නිම කිරිමට අපේක්ෂා කර තිබුණි. අවස්ථා කිහිපයකදී මෙම ව්‍යාපෘතිය සඳහා දින දීර්ඝ කිරීම් ලබාගෙන තිබුණු අතර 2025 ජුනි මස 13 වන දින දක්වා දින දීර්ඝ

කර තිබුණි. 2025 මැයි මස වන විටත් මෙම ව්‍යාපෘතියේ යාන්ත්‍රික, විදුලි හා වායු සමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ ගැටලු පැවති අතර ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 87 ක් විය.

(ච) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල (KFAED) සමඟ 2016 මාර්තු 24 දින අත්සන් තබන ලද අංක 940 දරන ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන අතර එමඟින් කුවේට් ඩිනාර් මිලියන 10ක ණය මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදීමට එකඟ වී තිබුණි. පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම අවසන් කර තිබුණද ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොන්ත්‍රාත්තුව අක්‍රීය වී එහි භෞතික ප්‍රගතිය සියයට 10 මට්ටමේ පැවතිණි.ව්‍යාපෘතිය තුළින් මිලදී ගතයුතු ඉගෙනුම් උපකරණ මිලදීගැනීමේ ප්‍රගතිය සියයට 40 මට්ටමේ පැවති අතර 2022 ජුනි 08 වන දින සිට ණය මුදල ලබාදීම අත්හිටුවා තිබුණු බැවින් ව්‍යාපෘති කටයුතු තාවකාලිකව නතර කර තිබුණි.

(ඡ) ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය

අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ වයඹ විශ්ව විද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2017 ඔක්තෝබර් 24 දින ශ්‍රී ලංකා රජය හා සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල (SFD) අතර අත්සන් කරන ලද ණය ගිවිසුම අංක 13/712 මඟින් සෞදි රියාල් මිලියන 105 ක මුදලක් ලබාදීමට එකඟතාවය ඇති කරගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2021 අගෝස්තු 24 දින ආරම්භ කරන ලද අතර 2023 පෙබරවාරි 22 දින නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. 2025 අප්‍රේල්30 දක්වා අවස්ථා 3 කදී දින දීර්ඝ කිරීම ලබා තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 95 මට්ටමේ පැවතුණි.

### 4.1.5 වෘත්තීය පුහුණු අංශයේ අධීක්ෂණයක් හා ප්‍රමාණවත් මැදිහත් වීමක් නොමැති ව්‍යාපෘති

(අ) වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යන ආයතන එක්ව මුළු දිවයින පුරා සංචාරක ක්ෂේත්‍රයේ වෘත්තීය පුහුණු අගයදාමයන් ප්‍රවර්ධනය හා විශේෂ අවශ්‍යතා සහිත ආගන්තික ප්‍රජාව ප්‍රමුඛ කර ගනිමින් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අරමුණු කරගෙන ඕස්ට්‍රේලියානු රජයේ ආධාර වැඩසටහන යටතේ ලද ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 12 ක මූල්‍ය ප්‍රදානයන් මත ආරම්භ කර තිබුණු අන්තර්ගෘහිත ආර්ථික වර්ධනයක් සඳහා නිපුණතා ව්‍යාපෘතිය (S4IG) දෙවන අදියර යටතේ සමාලෝචිත වර්ෂය සඳහා රු.146,000,000 (VAT ඇතුළුව) ක ශුද්ධ ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණු වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මුළු වියදම රු.145,000,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. නමුත් අදාල අංශය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව වාර්ෂික ප්‍රතිපාදන රු.145,000,000 සිට රු.154,450,000 දක්වා වැඩි කර තිබුණු බවත් වාර්ෂික මුළු වියදම රු.162,940,000 ක් බවත් දක්වා තිබුණි. මේ අනුව අමාත්‍යාංශයේ වෘත්තීය පුහුණු අංශය මෙම ව්‍යාපෘතිය පිළිබඳව පරස්පර තොරතුරු ඉදිරිපත් කර තිබුණු බවත් නිපුණතා අංශය ව්‍යාපෘතිය පිළිබඳව මැදිහත් වීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) මුළු ඇස්තමේන්තු වියදම යුරෝ මිලියන 8.24 ක් වූ ජර්මානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වෘත්තීය පුහුණු වැඩසටහන (GIZ) 2023 ජුනි ආරම්භ වී 2026 නොවැම්බර් මස දක්වා ක්‍රියාත්මක වීමට නියමිත වේ. මේ සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු. 600,000,000 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණු අතර මුළු වියදම රු. 600,000,000 ක් බව මූල්‍ය ප්‍රකාශන අනුව නිරීක්ෂණය විය. නමුත් අදාල අංශ විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රගති වාර්තා අනුව වියදම රු.640,728,692 ක් බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව රු.40,728,692 ක් ප්‍රතිපාදන ඉක්මවා වියදම් කර තිබුණි. එමෙන්ම මූල්‍ය ප්‍රකාශන අනුව වැට් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු. 21,500,000 ක්ද වියදම රු.16,222,821 ක් ද ලෙස දක්වා තිබුණු නමුත් ප්‍රගති වාර්තා අනුව වැට් සඳහා ප්‍රතිපාදනය රු.37,000,000 ක් ලෙස දක්වා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඈ) You lead Phase II ව්‍යාපෘතිය තරුණ සේවක හැකියා වර්ධනය, කෘතියික වෘත්තීය අධ්‍යාපන හා ස්වයං රැකියා සාර්ථකත්වය යන ප්‍රතිඵල අපේක්ෂා කරමින් ඇමෙරිකා එක්සත් ජනපද රජයෙන් ඩොලර් මිලියන 06 ක ආධාරයෙන් 2021 – 2024 කාල පරිච්ඡේදය වෙනුවෙන් ක්‍රියාත්මක කර 2024 මැයි මස 30 දින වන විට අවසන්ව තිබුණි. ව්‍යාපෘතිය පිළිබඳ මහපෙන්වීම හා අධීක්ෂණය කිරීමේ වගකීම නිපුණතා අංශයට පැවරී තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාකාරී මැදිහත් වීමක් නිරීක්ෂණය නොවුණි. සමාලෝචිත වර්ෂය තුල ශුද්ධ ප්‍රතිපාදන රු.215,300,000 ක්ව පැවතියදී ව්‍යාපෘතිය සඳහා වියදම මූල්‍ය ප්‍රකාශන අනුව රු.213,673,651 ක් ලෙසත් අදාල අංශයේ ප්‍රගති වාර්තා අනුව මූල්‍ය ප්‍රගතිය රු.274,380,000 ක් ලෙසත් පරස්පර සංඛ්‍යා දෙකක් වාර්තා විය. ඒ අනුව අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශය විසින් මෙම ව්‍යාපෘතිය පිළිබඳ නිසි අධීක්ෂණයක් හා පසු විපරම් කටයුතු යාවත්කාලීනව සිදු නොවී තිබුණි.

### 4.1.6 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උසස් පෙළ සිසුන්ගේ අධ්‍යයන වර්ෂ දෙක පුරාම පාසැල් අධ්‍යාපනයට නැඹුරු කරවීමට අපොහොසත් වීම.

EDU/A/MOE/2019/PER/01 අංක දරන හා 2021 පෙබරවාරි 08 දිනැතිව "ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල උසස් පෙළ සිසුන් පාසැල් අධ්‍යාපනයට නැඹුරු කරවීම" මැයෙන් වූ කාර්යසාධන විගණන වාර්තාව අධ්‍යාපන ලේකම්වරයාට නිකුත් කර 2025 අප්‍රේල් 30 දින වනවිට වර්ෂ 04 කට අධික කාලයක් ගත වුවද, එම වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂන 14ක් හා නිර්දේශ 13ක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර නොගැනීම හේතුවෙන් 2025 මැයි මාසය වන විටත් උසස් පෙළ අධ්‍යාපන කටයුතුවල වර්ෂ 2 ක් වූ පාසල් අධ්‍යාපන කාලය පුරාම, සිසුන් පාසැල් අධ්‍යාපනයට නැඹුරු කරවීමට අවශ්‍ය ගුණාත්මක, කාලීන හා ආකර්ශනීය වශයෙන් වූ වැඩපිළිවෙලක් හා නියාමන වැඩසටහන් හඳුන්වා දී සිසුන් හා දෙමාපියන් ද ගුරුවරුන් ද සම්බන්ධ කරමින් පාසල් පද්ධතිය තුලට උසස් පෙළ සිසුන් නැඹුරු කර ගැනීමට හැකි වැඩපිළිවෙලක් සකස් කර මෙහෙයවීමට අධ්‍යාපන අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. 2025 මැයි මාසය වන විට, උසස් පෙළ සිසුන් පමණක් නොව 11 වසර සිසුන්ද පාසලට පැමිණීම සීමාවෙමින් පවතින තත්ත්වයක් විගණනයට නිරීක්ෂනය විය. ඒ අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරුවරුන් ඇතුළු කළමණාකරණය වෙනුවෙන් දරන වැටුප්, වේතන, දීමනා වෙනුවෙන්ද හා පාසල් පද්ධතියේ යටිතල පහසුකම් වෙනුවෙන්ද දරන වියදම් දීර්ඝකාලීනව ඌණ උපයෝජිතව භාවිතාවීම සිදු වුවත්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් උසස් පෙළ සිසුන් වර්ෂ 2 පුරාම පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීමට අපොහොසත් වී තිබුණි.

(ආ) රජයේ නොවන පාසල් නියාමනයට වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබීම

2022 මාර්තු 02 දිනැති "රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය" මැයෙන් වූ කාර්යසාධන විගණනයට අදාලව නිර්දේශ 18ක් ලබා දී වර්ෂ 03කට අධික කාලයක් ගත වී ඇතත් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග 2025 අප්‍රේල් 30 වන විටත් ගෙන නොතිබුණි.

(ඇ) සිසු සුරක්ෂා රක්ෂණාවරණය සැලසීම පරීක්ෂාව

(i) 2024/2025 කාලසීමාවේ සිසු සුරක්ෂා රක්ෂණාවරණය සැලසීම පරීක්ෂාව

(a) පාසල් යන වයසේ පසුවන දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීමත් ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා තහවුරු කිරීම පිණිසත් දෙමාපියන්ට සහය වීමත් අරමුණු කරගෙන 2024 ජූලි 01 දින සිට වසර 03ක කාලයක් දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා සුරක්ෂා සිසු රක්ෂණය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ රු. 2,292,702,575 ක බදු සහිත වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණි. 2025 මාර්තු 28 දින දක්වා මාස 09 ක කාලයට අදාලව හිමිකම් ඉල්ලීම් අයදුම්පත් 18,552 ක් ලැබී තිබුණු අතර ඉන් අයදුම්පත් 9,315 ක් සඳහා රු. 330,005,674 ක මුදලක් ප්‍රතිලාභ ලෙස ගෙවා තිබුණි. එම ගෙවීම

21

2024 / 2025 වර්ෂයට අදාලව වාරික මුදල වන රු. 1,777,786,325 ක මුදලින් සියයට 19ක පමණ අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(b) ගිවිසුම් ප්‍රකාරව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ශ්‍රව්‍ය දෘෂ්‍ය හා වෙනත් මාධ්‍ය භාවිත කරමින් සුරක්ෂා සිසු රක්ෂණය පිළිබඳව ප්‍රචාරණ කටයුතු සිදු කළ යුතුව ඇති අතර ඒ වෙනුවෙන් 2024/2025 වර්ෂයට අදාලව රු.60,000,000ක මුදලක් රක්ෂණ සංස්ථාවට ගෙවා තිබුණි. රක්ෂණය වලංගු දින සිට මාස 02ක් ඇතුලත ප්‍රචාරණය සඳහා දුන් මුදලින් සියයට 50 ක මුදලක් ගිවිසුම් ප්‍රකාරව වියදම් කල යුතු වුවත් රු.1,833,926 ක වියදමක් පමණක් රක්ෂණ සංස්ථාව ප්‍රචාරණය වෙනුවෙන් වැය කර තිබුණු අතර මෙ හේතුවෙන් සිසුන්ගේ හිමිකම් ඉල්ලුම් කිරීම ඉතා අවම මට්ටමක් ගෙන තිබුණි.

(c) 2024 අගෝස්තු 02 දිනැති අංක 29/2024 දරන චක්‍රලේඛයේ 4.2 හා 5.1 ප්‍රකාරව පාසල් හරහා රක්ෂණ ආයතනයට ඉදිරිපත් කරන සිසුන්ගේ ප්‍රතිලාභ ඉල්ලුම්පත්‍ර පිළිබඳ තොරතුරු ලබා දී ඇති ආකෘතිපත්‍රය පරිදි කලාප කාර්යාල හරහා පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවීම සිදුකර නොතිබුණි.

(ii) 2018-2020 කාලසීමාවේ සිසු සුරක්ෂා රක්ෂණාවරණය සැලසීම පරීක්ෂාව

(a) 2018 දෙසැම්බර් 01 දින සිට 2020 මැයි 30 දක්වා සුරක්ෂා සිසු රක්ෂණාවරණය අලියාන්ස් ඉන්ෂුරන්ස් ලංකා ලිමිටඩ් ආයතනය වෙතින් ක්‍රියාත්මක වී තිබුණු අතර එම කාලපරිච්ඡේදයට අදාළ අයදුම්පත් 8,000 ක ප්‍රමාණයක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි. එම අයදුම්පත් සඳහා හිමිකම් ගෙවීම් සිදු කරලීම වෙනුවෙන් එක් ඇස්තමේන්තුවක් සකස් කිරීම වෙනුවෙන් රු.1,500 බැගින් ලිපිගොනු 8,000 ක් සඳහා රු.12,000,000 ක මුදලක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඉල්ලීම් කර තිබුණු අතර ඒ සඳහා හිමිකම් ගෙවීමට අනුමැතිය ලද විට අදාළ හිමිකම් ගෙවීම් මුදලින් සියයට 3 ක ප්‍රතිශතයක්ද ඉල්ලීම් කර තිබුණි.

(b) 2018 දෙසැම්බර් 01 දින සිට 2020 මැයි 30 දින දක්වා කාල පරිච්ඡේදයේදී හා 2021/ 2022 කාලපරිච්ඡේදයේදී සුරක්ෂා සිසු රක්ෂණ හිමිකම් සලසා ගැනීම පිළිවෙලින් අලියාන්ස් රක්ෂණ සමාගම හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් සිදුකර තිබුණු නමුත් පිළිවෙලින් උක්ත කාලසීමාවන්වලදී අලියාන්ස් රක්ෂණ සමාගම විසින් සිසුන්ට නොගෙවන ලද රක්ෂණ හිමිකම් ඉල්ලුම්පත්‍ර 8,000 ක ප්‍රමාණයක් හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හිමිකම් සැලසූ 2021/2022 කාලයට අදාල සිසුන්ට නොගෙවන ලද රු.67,794,566ක් වටිනා හිමිකම් ප්‍රතිලාභ තිබුණි. සිසු සුරක්ෂා රක්ෂණයන් සලසා ගන්නා ලද උක්ත කාලසීමාවන්ට අදාල ගිවිසුම්ගත පරිදි හිමිකම් සඳහා ප්‍රතිලාභ ගෙවන බවට වගබලා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම වගකිව යුතු නිලධාරීන් ඇතුළු ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිදුකල යුතු වුවත් ප්‍රමාණවත් අවධානයකින් යුතුව කටයුතු කර නොතිබීම මත රජයට සිදුවන මූල්‍යමය හානියට අමතරව පාසල් යන වයසේ පසුවන දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා තහවුරු කිරීම පිණිසත්, දෙමාපියන්ට සහාය වීම පිණිසත්, ආරම්භ කර තිබුණු සිසු සුරක්ෂා රක්ෂණයේ අරමුණු නිසි පරිදි ඉටු කරගැනීමට නොහැකි වී තිබුණි.

#### 4.1.7 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

(අ) 2021 ජනවාරි 04 දිනැති අංක 2209/14 දරන ගැසට්පත්‍රයේ සුවිශේෂී ප්‍රමුඛතා යටතේ හඳුනාගන්නා ලද නගර විශ්වවිද්‍යාල 05 ක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2021, 2022 සහ 2023 වර්ෂයන්හි පිළිවෙලින් රු. 100,000,000 ක් රු. 200,000,000 ක් සහ රු. 200,000,000 ක් නිපුණතා අංශය වෙන්කර තිබුණි. 2022 වර්ෂයේ කෑගල්ල ප්‍රදේශයේ ගොඩනැගිලි සංකීර්ණයක් තෝරාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් ජලබිල්, විදුලි බිල්, ආරක්ෂක වියදම් සඳහා රු.16,738,000 ක් හා 2023 වර්ෂයේදී ඉහත වියදම් වෙනුවෙන් රු.1,202,375 ක් දරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.

(ආ) 2016 පෙබරවාරි 11 දිනැති අංක අමප/16/0167/716/008 දරන කැබිනට් පත්‍රිකාවෙන් ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබුණු අනුමැතිය මත අවශ්‍ය ඉඩම් කොටස පවරා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත නිපුණතා අංශය විසින් රු.280,000,000 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2022 වර්ෂයේද විස්තරාත්මක ඉලක්ක (Descriptive Target) යටතේ අවස්ථා 07 ක් ඉලක්ක කරමින් රු.60,000,000 ක් වෙන්කර තිබුණු අතර මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු මාස 24 ක් තුල නිම කිරීමට යෝජනා වී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි.

### 4.1.8 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) තරුණ පරපුර වෘත්තීය පුහුණුව සඳහා ආකර්ෂණය කරගැනීම සඳහා වෙක් උදාන වැඩසටහන යටතේ කාර්මික විද්‍යාල හා තාක්ෂණික විද්‍යායතන ඒකීය ගෘහ නිර්මාණ ශිල්පීය ආකෘතියක් යටතේ සංවර්ධන කටයුතු සිදුකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.225,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද වර්ෂය අවසානයට එහි වියදම රු.159,124,609 ක් වී තිබුණු අතර මූල්‍ය ප්‍රගතිය සියයට 70 ක් පමණක් වී තිබුණි.

(ආ) නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ක්‍රියාත්මක නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (SSDP) මගින් 2014 – 2018 කාලය තුල ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය යන ආයතනවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 11 ක බිම් මහල පමණක් ඉදිකර තිබුණි. අර්ධව නිම කරන ලද මෙම ගොඩනැගිලි වෙත සෘජු හිරු එළිය හා වර්ෂාව හේතුවෙන් සිදුවන හානි වළක්වා ගැනීම සඳහාත් පහත මාලයේ පුහුණුව ලබන සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත් මෙම ඉදිකිරීම සම්පූර්ණ කළයුතුව තිබුණ අතර ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරියෙහි ගොඩනැගිලි 04 ක සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ගොඩනැගිලි 07 ක උඩු මහල ඉදිකර සම්පූර්ණ වැඩ නිම කිරීමට ආයතනය විසින් සකස් කළ ඇස්තමේන්තු වියදම රු.මිලියන 870 ක් වී තිබුණි. 2023 – 2025 කාලපරිච්ඡේදය තුල අදියර කිහිපයකදී මෙම සියළු ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීම සඳහා සැලසුම් කර තිබුණද 2024 වර්ෂයේ වෘත්තීය පුහුණු අධිකාරියේ ගොඩනැගිලි 04 ක් හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ ගොඩනැගිලි 02 ක් සඳහා වෙන් කරන ලද රු.145,000,000 ක මුදලින් රු. 89,690,000 ක මූල්‍ය ප්‍රගතියක් පමණක් අත්පත් කරගෙන තිබුණි.

(ඇ) ශ්‍රම වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් සහිත පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීම ඉහළ නැංවීම පිණිස අමාත්‍යාංශයේ මෙම අංශය විසින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට තීරණය කර තිබුණි.ඒ අනුව 2021 වර්ෂයේදී පන්ති කාමර, වැඩහල්, විද්‍යාගාර, ආපනශාලා, විවේක කාමර, ඇඳුම් මාරුකරන කාමර, සනීපාරක්ෂක ඒකක සහ ශිෂ්‍ය, ගුරු නිල නිවාසවල අළුත්වැඩියා කටයුතු සහ වැඩිදියුණු කිරීම ආරම්භ කර තිබුණු අතර 2024 වර්ෂයට අදාලව අවිච්ඡේද ව්‍යාපෘති 07 ක් සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය වෙත ඒ සඳහා රු.50,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද අත්කරගත් මූල්‍ය ප්‍රගතිය රු.19,030,000 ක් පමණක් වී තිබුණි.

## 4.2 විදේශ ආධාර ව්‍යාපෘති

### 4.2.1 විදේශ ණය ව්‍යාපෘතිවල කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ද්විතීයික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහනට අදාළ (SESIP) අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය

(i) ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනෙහි විසර්ජන සබැඳි දර්ශක 07 ට අදාළව නියාමන හා ඇගයීම් රාමුව මූලික කාර්යසාධන දර්ශක (KPIS ) 65 කින් සමන්විත වන අතර ඊට අදාළ දත්ත රැස් කිරීම සඳහා පළාත් 09 ම ආවරණය වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය තුළ දත්ත පද්ධතියක් නිර්මාණය කළ යුතුව පැවතියද විගණිත දින වන විටත් අදාළ කාර්යයන් ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) දත්ත කළමනාකරණ පද්ධතියක ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් දත්ත පාදකයන් සකස් කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සතුව සුදුසුකම් ලත් මෘදුකාංග ඉංජිනේරුවරයෙකු නොමැති වීම හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් බඳවාගැනීම සඳහා වන උපදේශක කළමනාකරණ පද්ධතිය මගින් උපදේශකවරුන් 04 දෙනෙකු තෝරාගෙන තිබුණු අතර අදාළ උපදේශකවරුන් විසින් මාස 06 ක කාලසීමාවක් ඇතුළත දත්ත පාදකය නිර්මාණය කළ යුතු අතර ඒ සඳහා වන වියදම ශ්‍රී ලංකා රජයට වැය බරක් නොවන අතර ඒ සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන සෘජුවම ආසියානු සංවර්ධන බැංකුව විසින් දරනු ලබනු ඇත. අදාළ උපදේශකයින් බඳවාගෙන දත්ත පාදකය නිර්මාණය කර ගනිමින් විසර්ජන සබැඳි දර්ශක ඉටුකර ගැනීම ඉතා වැදගත් වන නමුත් අදාළ කාර්යයන් ඉටුකර ගැනීමට ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් අපොහොසත් වී තිබුණි. එසේම මෙම දර්ශක ඉටුකර නොගැනීම හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුවට එම දර්ශකවලට නියමිත වාරික භාණ්ඩාගාරයට ප්‍රතිපූර්ණය කිරීමට හැකි වී නොතිබුණි.

### 4.2.2 විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීම.

ඉන්දියානු ජනරජයේ ආධාර යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීම සඳහා 2016 දෙසැම්බර් 07 වන දින අමප/16/24/66/742/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය යටතේ ගොඩනැගිලි දෙකක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව අදියර 01 ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම ඉන්දියානු ආධාර යටතේ සිදු කරනු ලබන අතර එම කොන්ත්‍රාත්තුවට අදාල එකතු කල අගය මත බදු (VAT) සහ උපදේශන ගාස්තු පමණක් දේශීය අරමුදලින්ද එසේම අදියර 02 ගොඩනැගිල්ලේ සම්පූර්ණ වියදම දේශීය අරමුදල් වලින්ද සිදු කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ව්‍යාපෘතිය ප්‍රමාද වීම හේතුවෙන් රජයට සිදු වූ අලාභ

පාසලේ ඉදිකිරීම් කටයුතු සඳහා 2017 ඔක්තෝබර් 25 දින රු. 297,843,626 ක කොන්ත්‍රාත් මුදලකට පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර 2018 වර්ෂයේ ආරම්භක අත්තිකාරම් ලෙස රු. 59,568,725 ක් සහ එයට අදාල වැට් බදු මුදල් ලෙස රු. 8,935,309 ක් ගෙවා තිබුණි. වැට් බදු මුදලට අදාල අත්තිකාරම් සුරක්ෂණයක් ලබාගැනීමෙන් හෝ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ වැට් මුදලට අදාල අත්තිකාරම් සුරක්ෂණය පිළිබඳව තහවුරු කර ගැනීමකින් තොරව අමාත්‍යාංශය විසින් වැට් බදු මුදල් ගෙවීමට කටයුතු කර තිබුණි. ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් 2020 ජනවාරි 22 දින මෙම ගිවිසුම අවසන් කර තිබුණු අතර මේ හේතුවෙන් ආරම්භක අත්තිකාරම් මුදල සමඟ ගෙවන ලද වැට් බදු මුදලින් රු. 6,127,600 ක අලාභයක් රජයට සිදු වී තිබුණි. අනවධානයෙන් යුතුව වැට් බදු ගෙවීමට කටයුතු කරන ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් වගකීමට

යටත් වන අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අදාල වැට් බදු මුදල් රජයට ලැබීම තහවුරු කරගැනීම හෝ නොඑසේ නම් රජයට සිදු වූ පාඩුව කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ii) 2024 දෙසැම්බර් 31 දින වන විට අදියර 01 ගොඩනැගිල්ල සඳහා රු. 227,219,237 (වැට් සහිතව) ක මුදලක් දරා විෂයපථය සීමාකිරීම් සහිතව සියයට 100 ක භෞතික ප්‍රගතියක්ද අදියර 02 ගොඩනැගිල්ල සඳහා රු. 111,426,123 (වැට් සහිතව) ක මුදලක්ද දරා සියයට 42 ක පමණ භෞතික ප්‍රගතියක්ද ලබාගෙන තිබුණි. මෙලෙස ව්‍යාපෘතියේ අදියර 01, ගොඩනැගිල්ලේ වහලය සහ පළමු මහල පමණක් අවසන් කර අදාල කොන්ත්‍රාත්කරු විසින් අමාත්‍යාංශය වෙත භාරදී තිබුණු අතර අදියර 02 ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය එකඟතාවය මත අවලංගු කිරීම සඳහා 2025 අප්‍රේල් 03 දින අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව රු.535,700,350 ක පමණ වියදමක් දරා සැලසුම් කරන ලද ගොඩනැගිල්ල අපේක්ෂිත ත්‍රෛභාෂා ජාතික පාසලක් ආරම්භ කිරීම සඳහා මට්ටමින් නිම කිරීමට නොහැකි වීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට අවුරුදු 07ක් ප්‍රමාදව පැවතියද ව්‍යාපෘතියේ අරමුණ මෙතෙක් ඉටු කරගෙන නොතිබුණි. තවද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාල පාර්ශවයන් සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹී ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ගැනීම සිදු කල යුතු වුවත් මෙම ව්‍යාපෘතිය සඳහා ඉන්දියානු රජය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමක් විගණනයට ඉදිරිපත් නොවුණු අතර ඉදිකිරීම් කටයුතු අවසන් කර ව්‍යාපෘතියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා වූ වගකීම ඉටුකිරීම සඳහා අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය ඇතුළු කොන්ත්‍රාත් කළමනාකරණ කටයුත්ත ප්‍රමාණවත් පරිදි සිදු නොකරන ලද නිලධාරීන්ගේ අසමත් බව ව්‍යාපෘතිය අකාර්යක්ෂම වීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

### 4.2.3 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

(අ) ද්විතියික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා වූ විස්තීරණ යෝජනාවලියක ප්‍රතිඵලයක් ලෙස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන (ICT Hub) ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඇ.ඩො. මිලියන 35ක ණය ආධාර යටතේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ඉදිකිරීමට අදාල වූ යෝජිත ඉඩම්, තාක්ෂණික කරුණු මත වරින් වර වෙනස් වී තිබුණු හෙයින් ව්‍යාපෘතියට අදාල ණය ගිවිසුම 2019 වර්ෂයේ අත්සන් කලද ව්‍යාපෘතිය සක්‍රිය කිරීමට නොහැකි වී තිබුණි. 2024 සැප්තැම්බර් 18 දින මෙම ව්‍යාපෘතිය නැවත සක්‍රීය කර තිබුණු අතර ව්‍යාපෘති කාලසීමාව 2026 මැයි මස 10 දින දක්වා දීර්ඝ කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ව්‍යාපෘතියට අදාල ව්‍යාපෘති කළමනාකරණ ඒකකයන් පිහිටුවීම, උපදේශන ආයතනයක් තෝරාගැනීම වැනි ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොමැති නිසාත් මෙම ව්‍යාපෘතිය යෝජනා වී වර්ෂ 11 ක් සහ ගිවිසුම්ගතව වර්ෂ 07 ක් වශයෙන් ප්‍රමාද වී පවතින නිසාත්, විදේශ ණය ව්‍යාපෘතියක් ලෙස තවදුරටත් ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යා යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් සමාලෝචනයකින් පසුව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉන්දියානු රජයේ ආධාර යටතේ වතු පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

ඉන්දියානු රජයේ ආධාර යටතේ මධ්‍යම, ඌව, සබරගමුව හා දකුණ යන පළාත්වල තෝරාගත් වතු පාසල් 09 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.300,000,000 ක් වූ මෙම ව්‍යාපාතියට 2019 ජූනි 19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු නමුත් එකී කාර්යයට රු.300,000,000 ක ආධාර ප්‍රමාණවත් නොවීම හා මිල ගණන් ඉහල යාම හේතු ලෙස දක්වමින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අවස්ථා තුනකදී රු.632,770,000 දක්වා ඇස්තමේන්තු සංශෝධනය කර තිබියදී හා සමාලෝචිත වර්ෂයට රු.2,350,000ක ප්‍රතිපාදන වෙන්කර අවුරුදු 06ක් ප්‍රමාද වී තිබියදීත් සමාලෝචිත වර්ෂයේදී ද ව්‍යාපෘතියට අදාලව කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. 2025 මාර්තු 31 දින වන විටත් ප්‍රසම්පාදනයේ මූලික කොටස් පමණක් ඉටුකර තිබුණු අතර මෙම ඉන්දියානු ආධාර ව්‍යාපෘතිය

කාර්යක්ෂමව ඉටුකර රටක් ලෙස ප්‍රතිලාභ කාලීනව ලබා කර ගැනීමට වගකිව යුතු නිලධාරීන් අපොහොසත් වී තිබුණි.

### 4.2.4 ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම

නිපුණතා අංශයේ ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂය තුල විදේශ ආධාර ව්‍යාපෘති 03ක රු.40,728,692 ක්, රු.16,940,000 ක් සහ රු.59,080,000 ක් බැගින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.

## 4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 4.3.1 කෝඩ්ජෙන් ආයතනය මගින් හඳුන්වා දී ඇති EDU Ne1 මෘදුකාංගය හා එහි ක්‍රියාකාරීත්වය

(අ) 2023 ජූලි 07 දිනැති රජයේ ගිණුම් කාරක සභාව මගින් ලබාදුන් නියෝගයට අනුව අධ්‍යාපන පද්ධතිය තුළ තීරණ ගැනීම සඳහා වඩාත් විස්තීර්ණ නව දත්ත අවශ්‍යතා පවතින අතර 2010 වර්ෂයේදී ඒ සඳහා හඳුනාගත් දත්ත අවශ්‍යතාවලින් ඉදිරි කටයුතු සිදුකිරීමට හැකියාවක් නොමැති බවත් ඒ හේතුවෙන් යාවත්කාලීන නව පද්ධතියක් වෙත යොමු විය යුතු බවත් කාරක සභාවට වාර්තා කර තිබුණි. රජයේ ගිණුම් කාරක සභාවට දැනුම් දුන් පරිදි අවශ්‍ය වන නව දත්ත පද්ධතියක් විධිමත්ව ස්ථාපිත කර ගැනීමට පියවර ගැනීමකින් තොරව පෞද්ගලික සමාගමක යෝජනාවකට අනුගතවීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබෙන බව නිරීක්ෂණය විය. Codegen නමැති ආයතනයේ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ රජයේ හා පෞද්ගලික පාසල් 18 ක පමණ භාවිතා කරන Cloud Smart School මෘදුකාංගය අමාත්‍යාංශයේ දත්ත අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි සංවර්ධනය කිරීමටත්, ඒ අනුව සකස් කළ EDUNET මෘදුකාංගය වසර 5 ක කාලයක් සඳහා සමාජ සත්කාරක ව්‍යාපෘතියක් (CSR) ලෙස ලබාදීමටත් යෝජනාවක් ඉදිරිපත් කර තිබුණු අතර එම යෝජනාව සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නිර්දේශ ලබාගැනීමට 2024 පෙබරවාරි 09 දින පත්කල කමිටුවේ නිර්දේශ 2024 අප්‍රේල් 19 දින ලැබී තිබුණු අතර Codegen ආයතනය විසින් ඉදිරිපත් කළ යෝජනාවලිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතුළත් නෛතික විධිවිධාන ගතයුතු බව කමිටු නිර්දේශවල සඳහන් කර තිබුණු නමුත් කමිටු නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර පෞද්ගලික සමාගම සමඟ හෙළිදරව් නොකිරීමේ එකඟතාවයට එළඹ තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැතිව ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 1.3 ට පටහැනිව එම ආයතනය සමග හෙළිදරව් නොකිරීමේ අන්‍යොන්‍ය එකඟතාවයට විධිමත් අනුමැතියක් නොමැතිව 2024 පෙබරවාරි 1 දින අතිරේක ලේකම්, (තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන) විසින් ඔහුගේ බලය අනිසි ලෙස භාවිතා කරමින් තනි මතයට ගිවිසුම් ගත වී තිබුණි.

(ආ) 2016 පෙබරවාරි 12 දිනැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් නියෝග අංක 09 පරිදි පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළත් ක්‍රමවත් පරිගණක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස නියෝග කර තිබුණු නමුත් මේ දක්වා ක්‍රමවත් ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය වී නොතිබුණි. අධ්‍යාපනයේ ඉදිරි මහ සැලසුම් කිරීමේදී හා ප්‍රතිපත්ති සකස් කිරීමේදී සමස්ථ අධ්‍යාපන පද්ධතිය ඩිජිටල්කරණයට ලක්වීම අනිවාර්ය වන අතර ඒ සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂයපථයට අදාල විවිධ වූ කළමණාකරණ තීරණ ගැනීමට අවශ්‍ය දත්ත පැවතිය යුතු ප්‍රධාන මොඩියුල අනුව සකස් කල යාවත්කාලීන හා නිවැරදි දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් සකස් කරලීමට වර්තමානය වන විටත් අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) ජාතික අවශ්‍යතාවයක් ලෙස සකස් කරන නව දත්ත පද්ධතිය පෞද්ගලික සමාගම්වල අවශ්‍යතා මත පදනම් නොවී අධ්‍යාපන අමාත්‍යාංශයේ දීර්ඝකාලීන සැලසුම්වලට අනුව විද්‍යානුකූලව සකස් කල යුත්තක් බවත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා දත්ත විධිමත් අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් සතු වීම සුදුසු නොවන බවත්, තම බලය ඉක්මවා මෙලෙස පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගත වූ

අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන) සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගතයුතු බවත් විගණනය නිරීක්ෂණය කෙරේ.

(ඇ) නියැදිමය වශයෙන් සිදුකල පරීක්ෂාවේදී බස්නාහිර පළාතේ ජාතික පාසල් 18 ක Codegen ආයතනය විසින් හඳුන්වාදෙන ලද Cloud Smart School මෘදුකාංගය භාවිතා කිරීමට එම පාසල්වල විදුහල්පතිවරුන් කටයුතු කර තිබුණු අතර දුවා දරුවන්ගේ, දෙමව්පියන්ගේ, ගුරුභවතුන්ගේ වටිනා දත්ත බාහිර පාර්ශවයක් අතට පත්කරමින් පාසල් විසින් මෙම මෘදුකාංගය භාවිතයට අංක 54/2023 දරන හා 2023 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයට අදාල මාර්ගෝපදේශ අත්පොතෙහි CEX 6 වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර එම විදුහල්පතිවරුන් සම්බන්ධයෙන්ද ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුව පැවතුණි.

## 4.3.2 නවෝත්පාදන විද්‍යාගාර සඳහා අධි තාක්ෂණික උපකරණ මිලදීගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පිහිටුවීමට යෝජිත නවෝත්පාදන විද්‍යාගාර සඳහා අවශ්‍ය වන උපකරණ අතරින් ඉහළ ගුණාත්මක ප්‍රමිතියකින් හා වගකීමක් යටතේ සැපයිය යුත් අධි තාක්ෂණික උපකරණ පාසල් 750 ක් සඳහා මිලදීගැනීමට සැලසුම් කර තිබුණි. වර්තමානයේ නවෝත්පාදන විද්‍යාගාර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත මට්ටමට ළඟා වී නොමැති පසුබිමක අධි සාම්පල ප්‍රමාණයක් යොදවා නියමු ව්‍යාපෘතියක් ඇසුව ප්‍රගතිය සලකා බැලීමකින්ද තොරව හා අවශ්‍යතා තක්සේරුවක් සිදුනොකර පාසල් 45ක් සඳහා රු.79,955,673 ක විශාල පිරිවැයක් දරමින් ඉතා ඉහළ ජීවන චක්‍ර පිරිවැයක් සහිත ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍ර (3D Printers) ඇතුළු අනෙකුත් අධි තාක්ෂණික උපකරණ 2024 දෙසැම්බර් 30 දිනැතිව මිලදීගැනීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණද, එම උපකරණ පාසල් තුල ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් සැලැස්මක්, කාලවකවානු සහිතව පිළියෙල කර නොතිබීම නිසා මෙම උපකරණ මාස 04 ක කාලයක් 2025 අප්‍රේල් 30 දින වන විටත් ඌණ උපයෝජිතව පැවතුණි. මෙම උපකරණ මිලදීගැනීමට සැලසුම් කරන විට රටේ පවතින ආර්ථික පසුබිමක, පාසල් පද්ධතිය එවැනි උපකරණ ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් පරිදි සැකසී නොපවතින තත්ත්වයකදී විද්‍යානුකූල පදනම්වලින් බැහැරව මිලදීගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව දීර්ඝකාලීන සැලැස්මක් අනුව මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු බවත් විධිමත් වැඩපිළිවෙලකින් තොරව ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍ර 750ක් පාසල් වල ස්ථාපිත කිරීමට යෝජනා කල හා ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍ර 45ක් මිලදීගැනීමට තීරණය කරන ලද හා උපකරණවල පිරිවිතර තීරණය කල නිලධාරීන් මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල රටට අත්කරලීම සම්බන්ධයෙන් වගකීම දැරිය යුතුව පැවතුණි.

(ආ) තාක්ෂණ නවෝත්පාදන රසායනාගාර සඳහා උපකරණ ප්‍රසම්පාදනය (සැපයීම, ගෙනවිත් භාරදීම හා ස්ථාපනය) කාර්යය සඳහා ලංසු ආරාධනා කර තිබුණු අතර ලංසු ලේඛනයෙහි වගන්ති vii හි CC 15.1 ප්‍රකාරව භාණ්ඩ බාර දී ඇති බවටත් ගිවිසුම්ගත සේවාවන් සියල්ල සිදුකර ඇති බවටත් තහවුරු කිරීමෙන් පසු දින 30ක් ඇතුලත කොන්ත්‍රාත්තුවේ මිලෙන් සියයට සියයක් සැපයුම්කරු වෙත ගෙවිය යුතු බව සඳහන් කර තිබුණි. නමුත් ඊට පටහැනිව ලැප්ටොප් පරිගණක හා ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍ර ලැබීම පමණක් පදනම් කරගෙන හා අදාල පාසලට භාරදීම, ස්ථාපනය යන කාර්යයන් ඉටුකර නොතිබියදී 2024 දෙසැම්බර් 31 දින රු. 50,555,820 ක මුදලක් සැපයුම්කාර ආයතනය වෙත ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 ප්‍රකාරව විභව ලංසුකරුවන් දැනුවත් කිරීම සහ ඔවුනට උපදෙස් සැපයීම මෙන්ම සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අපේක්ෂිත අවශ්‍යතාවයන් ගැන දෙපාර්ශවයම දැනුවත් කිරීම සඳහා සෑම ප්‍රසම්පාදනයක් සඳහාම ලංසු කැඳවීමේ ලේඛන සකස් කිරීම ප්‍රසම්පාදන කමිටුවලින් අපේක්ෂා කරන බව සඳහන් වේ. ඒ අනුව මෙම ලංසු ප්‍රදානය වර්ෂයේ අවසානයේදී ක්‍රියාත්මක වන බැවින් ඇති විය හැකි අහිත අවිනිශ්චිතතාවයන්ට ගැළපෙන පරිදි ලංසු සඳහා ගෙවීම සම්බන්ධයෙන් වන කොන්දේසි සකස් කර ලංසු ලේඛනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී මෙලෙස ගිවිසුමට පටහැනිව රු.50,555,820 ක් ගෙවීම සිදුකිරීම

සම්බන්ධයෙන් ගෙවීම නිර්දේශ කල ප්‍රධාන ගණකාධිකාරී (ප්‍රසම්පාදන), ගෙවීම අනුමත කල අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) සහ ගෙවීම සහතික කළ නිලධාරියා වගකිව යුතුව තිබුණි.

(ඇ) ලංසු පිරිනැමීමේ ලිපියෙහි සඳහන් පරිදි අදාල උපකරණ පාසල් වෙත බෙදාහැරීම 2024 දෙසැම්බර් 31 දිනට පෙර සිදුකල යුතු වුවද, භාණ්ඩ බෙදාහැරීම 2024 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණු අතර ලංසු ලේඛනයෙහි වගන්ති vii CC 26.1 ප්‍රකාරව මේ සම්බන්ධයෙන් වන ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කටයුතුව පැවතුණි.

**4.3.3 චීන රජයේ රු. ඩො. මිලියන 20ක ප්‍රදානයක් මඟින් ලබාගන්නා සුහුරු පුවරු 500 පාසල් පද්ධතිය තුල නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකර සුහුරු පුවරු 1000ක් මිලදීගැනීම පමණක් සිදු කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂාව**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) චීන ආධාර යටතේ සුහුරු පුවරු 500ක් ලබාගෙන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල යුතු වුවත්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් චීන ප්‍රදානය ලබාගැනීමට කටයුතු නොකර අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් අධ්‍යාපන) විසින් වටිනාකම රු. 1,762,106,622 (බදු සහිත) ක් වූ සුහුරු පුවරු 1000ක් මිලදීගැනීමට කටයුතු මෙහෙයවා 2024 අගෝස්තු 08 දින මිලදීගෙන තිබුණි. චීන ආධාර යටතේ ලැබීමට නියමිත සුහුරු පුවරු 500, 2025 මැයි 31 වන විටත් ලබාගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන කමිටුව, තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කාල රාමු

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.2, 4.2.2,4.2.3 හා 2.6 වගන්තිවල විධිවිධානවලට පටහැනිව ව්‍යාපෘතියේ කාර්යභාර නිලධාරියා වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් අධ්‍යාපන) තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයකු ලෙස පත්කිරීම, සැලසුම් කල ප්‍රසම්පාදන කාලරාමුවට සාපේක්ෂව මාසයක් වැනි ඉතා කෙටි කාලයක් තුල හේතු විරහිතව ප්‍රසම්පාදන රාමුව කෙටි කිරීම, ව්‍යාපෘති භාර අතිරේක ලේකම් කාර්යාලයෙන් ඉදිරිපත් කරන ලද තාක්ෂණික පිරිවිතර හා චීන නිෂ්පාදකයාගේ නම තාක්ෂණික ඇගයීම් කමිටුව සමාලෝචනයකින් තොරව ලංසු ලියවිලිවලට ඇතුලත් කිරීම සහ ප්‍රමාණාත්මක ප්‍රසම්පාදන පියවරයන් උල්ලංඝනය කරමින් සුහුරු පුවරු මිලදීගැනීම සිදුකර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(i). චීන ආධාර ව්‍යාපෘතිය යටතේ ලබාගැනීමට යෝජිත සුහුරු පුවරු හා උපකරණවලට තාක්ෂණිකව සමපාතික වන සේ අදාළ උපකරණ සපයාගැනීම පදනම්ව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සෘජු ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කිරීම සාධාරණීකරණය කර තිබුණු නමුත් එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 3.6 යටතට අයත් අවස්ථාවන්ට අනුකූල වී නොතිබුණි. එමෙන්ම යොමුව 3.5 සහ 3.6 හි ඉතා පැහැදිලිව භාවිතයේ පවත්නා උපකරණවලට සමවනු පිණිස නැවත ඇනවුම් කිරීම සාධාරණ වන අවස්ථාවක් විය යුතු බව සඳහන් කර තිබුණ ද මෙය භාවිතයේ පවත්නා උපකරණවලට සමවනු පිණිස කළ ප්‍රසම්පාදනයක් නොවන බව හා ඉදිරියේ දී ලැබීමට යෝජිත උපකරණවලට සමවනු පිණිස කළ ප්‍රසම්පාදනයක් වී තිබුණි.

(ii). මෙම ප්‍රසම්පාදනය ඉතා කෙටි කාලයක් තුල, ඉතා හදිසි ආකාරයෙන් ජනාධිපති මැතිවරණ කාලසීමාව ආසන්නයේ 2024 අගෝස්තු 06 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල තීරණය නිකුත් කිරීමට පෙර ඊට අදාල සංදේශය අමාත්‍ය මණ්ඩලය සාකච්ඡා කර 3.1 සිට 3.6 දක්වා වගන්ති යෝජිත පරිදි ඉටුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් බව 2024 ජූලි 30 දිනැති "හදිසි-රහසිගතයි" සඳහන් ලිපිය අනෙකුත් පාර්ශවයන්ට පිටපත් සහිතව අධ්‍යාපන ලේකම්වරයාට නිකුත් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ ලේකම් තනතුර දරන අතිරේක ලේකම් විසින් කටයුතු කිරීමද විගණනයේදී අතාත්ත්වික තත්ත්වයක් ලෙස නිරීක්ෂණය කෙරේ. ඒ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අනුව කිසිදු හදිසි ප්‍රසම්පාදන තත්ත්වයක් නොතිබියදී හදිසි තත්ත්වයක් ව්‍යාජ ලෙස ඇති කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 යටතේ සඳහන් හදිසි ප්‍රසම්පාදන අවස්ථාවන් ලෙස සලකා මෙම ප්‍රසම්පාදන කාර්යය සිදුකර තිබුණි.

(iii). සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් මුල් අවස්ථාවේ දී රු. 1,658,687,960ක මිල ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර මිල කේවල් කිරීමෙන් පසු රු.1,493,310,696 ක් ලෙස ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. ඒ අනුව කේවල් කිරීමෙන් පසු රු.165,377,264 කින් ඇස්තමේන්තු වටිනාකම අඩු වී තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 10ක් වී තිබුණි. ඒ අනුව රාජ්‍ය ආයතනයක් වශයෙන් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මුල් අවස්ථාවේදීම සර්ව සාධාරණ මිල ගණන් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv). ලංසු ලියවිල්ලෙහි 14.1 හා 14.2 ප්‍රකාරව වසර 03 ක ස්ථානීය සවිස්තර වගකීමක් සහ අවශ්‍ය සේවා සහ නඩත්තු කටයුතු නිෂ්පාදකයා සෘජු දිවයින පුරා සිටින නිෂ්පාදකයාගේ බලයලත් නියෝජිතයන් සැපයිය යුතු බවත් , පශ්චාත් වගකීම් අමතර කොටස් සැපයීම (Post - warranty – spare – supply ) වසර 05 ක කාලයක් සඳහා සහතික කල යුතු බවත් සඳහන් කර තිබුණද වගකීම් කාලය අතුරින් දෙවන සහ තුන්වන වසර තුළ නඩත්තු කටයුතු වෙනුවෙන් US$ 293,732 ක් හෙවත් රු.91,057,016 ක ඉහල මිල ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. තවද ලංසු ලියවිලිවල සඳහන් අවුරුදු 03ක වගකීම් කාලයට සැපයුම්කරු එකඟ නොවූ බැවින්, සැපයුම්කරු ලබාදෙන වර්ෂයක වගකීම් කාලයට අමතරව ලංසු ලියවිලිවල සඳහන් පරිදි වර්ෂ 03ක වගකීම් කාලය ලබාගැනීමට සැපයුම්කරුට රු.91,057,016ක අමතර ගෙවීමක් සිදුකල යුතු බවට වූ මූල්‍ය තොරතුරු අමාත්‍ය මණ්ඩල සංදේශයේ වෙන් වෙන්ව ඉදිරිපත් නොකර ප්‍රසම්පාදනයේ මුළු වටිනාකම පමණක් ඉදිරිපත් කරමින් අමාත්‍ය මණ්ඩලය නොමඟ යවන සුළු තොරතුරු ලබාදීමට අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ) ඇතුළු අදාළ වගකිව යුතු නිලධාරීන් කටයුතු කර තිබුණි.

(v). මිල ඇස්තමේන්තුව තුළ ඇතුලත් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවධ) නීතිගත සංස්ථාවේ ලාභ ආන්තිකය රු.51,154.382 ක් වී තිබුණු අතර ඉන් රු.26,575,717 ක් මෙම ප්‍රසම්පාදනයට අදාල ව්‍යාපාරික ලාභාන්තිකය වී තිබුණි. ප්‍රසම්පාදනයෙහි වටිනාකම රු.මිලියන 300 ඉක්මවා යන බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි යොමුව 3.1 ප්‍රකාරව මෙම ප්‍රසම්පාදනය සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය ද සුදුසු වන අතර එම ක්‍රමය අනුගමනය කළේ නම් චීන ආධාර ව්‍යාපෘතියෙහි උපකරණවල පිරිවිතරයන්ට සමගාමී වන අයුරින් තරඟකාරී මිල ගණන් යටතේ ප්‍රසම්පාදනයක් සිදුකර ඉහත පරිදි ආනයනකරුවන් සඳහා වන ව්‍යාපාරික ලාභාන්තිකයන් ගෙවීම වලක්වාගත හැකිව තිබුණි.

(ඇ) නිලධාරීන් පුහුණු කිරීම

2024 දෙසැම්බර් 31 දිනට පෙර 2024 දෙසැම්බර් පාසල් නිවාඩු කාලයේදී ඉංජිනේරුවරයෙකු හා පුහුණුවලත් කණ්ඩායමක් මඟින් පාසල් 20ක සුහුරු පුවරු සවිකිරීමට සැලසුම් කර තිබුණි. සුහුරු පුවරු ස්ථාපනයට අදාලව මෙරටට ගෙන්වාගෙන ඇති ඉංජිනේරුවරයා සති 06ක පමණ කාලයකට පැමිණ තිබුණද මෙරටට පැමිණි ඉංජිනේරුවරයාගෙන් අදාල කාර්යයන් ඉටුකරවා ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණු අතර සුහුරු පුවරු 1,000ක්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් පත්තලගෙදර ගබඩාවේ පාසල්වල ස්ථාපනය කිරීමකින් තොරව පැවතුණි. 2024 ඔක්තෝබර් මාසයේ ලද සුහුරු පුවරු 2024 නොවැම්බර් මහ මැතිවරණය පසුව 2025 මැයි 31 දින වන විට මාස 06ක් ගත වී තිබියදීත් ස්ථාපනය නොකර පැවතීම හේතුවෙන්, මැතිවරණ තත්ත්වයන් මත පාසල් තුල සුහුරු පුවරු ස්ථාපනය කිරීමට නොහැකි වූ බවට වූ පිළිතුර විගණනයේදී පිළිගත නොහැක.

29

(ඉ) නඩත්තු කටයුතු

(i). සුහුරු පුවරු මිලදීගැනීමේදී, ඉහළ ජීවන චක්‍ර පිරිවැය යන නිර්ණායකය පදනම්ව ඇගයීම සිදුකර නොතිබුණි. මෙම උපකරණවල නඩත්තු වියදම් වෙනුවෙන් රු.254,016,666 ක මුදලක් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් ඉල්ලුම් කර තිබුණු අතර ඒ අනුව මෙම ව්‍යාපෘතියේ නඩත්තු හා සේවා පහසුකම් සඳහා ඉතා අධික පිරිවැයක් දැරීමට සිදුවන බව නිරීක්ෂණය වූ අතර වසර 03 ක වගකීම් කාලයෙන් පසු ඉහත නඩත්තු වියදම් දැරීම සම්බන්ධව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තව දුරටත් දායකත්වය ලබාදෙන්නේද යන්න පිළිබඳ වූ නිශ්චිත එකඟතාවයකට එළඹ නොතිබුණි.

(ii). ආනයනය කරනු ලබන සුහුරු පුවරු 1000 සඳහා අඛණ්ඩව විදුලිය සපයා ගැනීම සඳහා අවශ්‍ය වන UPS 1000 සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් දේශීයව මිලදීගැනීමට ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් යෝජනා කර තිබුණි. ඒ අනුව රු.18,000,000 ක ඇස්තමේන්තු වටිනාකමට UPS 1000ක් මිලදීගැනීම සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ලංසු පිරිනමා තිබුණු අතර එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 3.5 හා 3.6 යටතේ ඇතුලත් සෘජු ප්‍රසම්පාදන මූලධර්මයන්ට අනුකූල වී නොතිබුණි.

(ඊ) පාසල් තුල අවශ්‍ය යටිතල පහසුකම්

අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය සම්බන්ධව පාසල් වෙත දැනුම් දීම සිදුකරන අවස්ථාව වන විටත් සුහුරු පුවරු ආනයනය කර අවසන් වී තිබුණි. එම ලිපිය ප්‍රකාරව සුහුරු පුවරු ස්ථාපනය සඳහා පාසලෙහි පැවතිය යුතු යටිතල පහසුකම් හා මානව සම්පත් පිළිබඳ අවධාරණය කර තිබුණු අතර රැහැන් සහිත Fiber අන්තර්ජාල පහසුකම් පැවතිය යුතු බව ද සඳහන් කර තිබුණි. එසේ වුවද තෝරාගන්නා ලද පාසල් 1000 අතුරින් පාසල් 121 ක Fiber අන්තර්ජාල පහසුකම් නොතිබුණි.

(උ) අරමුණුගතව නොයොදවා නිෂ්කාර්යව පැවතීම

සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයකට ලක් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා රු.1,493,310,696ක මුදලකට සුහුරු පුවරු 1,000ක් මිලදීගැනීමේදී එම සුහුරු පුවරු අරමුණුගතව යෙදවීමට අවශ්‍ය යටිතල පහසුකම් සපයා ගැනීමද ඇතුළුව දීර්ඝකාලීන මෙහෙයුම් සැලැසුමක් සකස්කර නොතිබීම හේතුවෙන් මිලදීගැනීමට සමගාමීව අනෙකුත් යටිතල පහසුකම් ඇතුළු මෙහෙයුම් කටයුතු සම්පූර්ණ වී නොතිබීම තුල රටක් ලෙස ඒ සම්බන්ධයෙන් ආවස්ථික පිරිවැයක් දරන අතර 2024 ඔක්තෝබර් 07 දින ගබඩාවට ලැබී තිබුණු සුහුරු පුවරු 2025 මැයි 31 දින වන විටත් මාස 08ක් උපයෝජනයකින් තොරව පැවතුණි. 2025 මැයි 31 දින වන විටත් උපකරණ ලැබී මාස 08ක කාලයක් උපයෝජනයකින් තොරව පැවතීම තුල අවුරුදු 01ක වගකීම් කාලයෙන් මාස 08ක් ගබඩාව තුලම ගත වී ඇත. උක්ත සඳහන් සියළුම විධිවිධාන උල්ලංඝනය කරමින්, චීන ආධාර යටතේ සුහුරු පුවරු 500ක් ලබා නොගනිමින් සිදුකරන ලද සුහුරු පුවරු මිලදීගැනීමේ හදිසි ප්‍රසම්පාදන සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් අධ්‍යාපන) තාක්ෂණ ඇගයීම් කමිටු සාමාජිකයින් වගකීමට යටත් වන අතර මෙම ව්‍යාපෘතිය ඉටුකරගත නොහැකි වීමේ තත්ත්වයක් තුල රජයට සිදුවන මූල්‍යමය හානිය ඉහත නිලධාරීන් දැරිය යුතුව පැවතුණි.

### 4.3.4 NEMIS දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලැප්ටොප් පරිගණක 328ක් මිලදී ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) NEMIS දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දත්ත කළමනාකරණ ශාඛාව සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ වටිනාකම රු.78,392,000 ක් වූ ලැප්ටොප් පරිගණක 328 ක් කොන්ත්‍රාත් සමාගමෙන් මිලදීගැනීමට කටයුතු කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2024 මාර්තු 08 දිනට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

භාණ්ඩ සැපයීම සිදුකර නොතිබුණු අතර ගිවිසුම ප්‍රකාරව ලැප්ටොප් පරිගණක සැපයීම, බෙදාහැරීම හා ස්ථාපනය කිරීම යන සියලුම කාර්යයන් පිරිනමා තිබුණද පිළිතුරෙහි සඳහන් පරිදි ප්‍රසම්පාදන කාර්යය මිලදීගැනීමට පමණක් සිදුකල ලෙස සඳහන් කිරීම ලංසු ලියකියවිලි හා ඒ ආශ්‍රිත ලියවිලි අනුව නිවැරදි නොවුනු අතර අමාත්‍යාංශයේ මධ්‍යම ගබඩාව වෙත 2024 මාර්තු 13,14,15 යන දිනයන්හී භාණ්ඩ සැපයීම සිදුකර තිබුණි. එම සපයා ඇති ලැප්ටොප් පරිගණක ලංසු ඇගයීමේදී ඉදිරිපත් කළ සාම්පල අනුව වූ පිරිවිතරවලට සර්වසම බව පිළිගත නොහැකිව තිබියදී අමාත්‍යාංශය විසින් භාණ්ඩ භාරගැනීමට කටයුතු කර තිබුණද, ගිවිසුම ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ නොසැපයීම හා භාණ්ඩ සැපයීමට පෙර සැපයුම්කරුගේ ගබඩාවේදී තත්ත්ව පරීක්ෂාවක් සිදුකිරීම යන ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත් සමාගමට නීත්‍යානුකූල පියවර ගැනීමට අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) ඇතුළු නිලධාරීන් කටයුතු කර නොතිබුණු අතර අදාල සමාගම් මුදල් නොගෙවීම සම්බන්ධයෙන් නඩු පැවරීම සිදුකර තිබුණි. 2025 අප්‍රේල් 30 වන විටද එම නඩු කටයුතු අවසන් වී නොතිබුණු අතර රු. 78,392,000 ක් වටිනා ලැප්ටොප් පරිගණක 328 අවුරුදු 1 1/2 ක පමණ කාලයක සිට ගබඩාවේ තාක්ෂණික තත්ත්වයන්ගෙන් බැහැර වෙමින් පැවතුණි.

(ආ) SESIP වැඩසටහනෙහි විසර්ජන සබැඳි දර්ශක 07 යටතේ කොට්ඨාස අධ්‍යාපන කාර්යාල වෙත ලැප්ටොප් පරිගණක 328 ක් මිලදීගැනීම, පළාත් 09 තුළ NEMIS දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුම කාර්යසාධන වාර්තා අංශික ප්‍රතිමාන (Sector Indicators) අධ්‍යාපන අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය තුළ ප්‍රසිද්ධ කිරීම යන කාර්යයන් 2025 වර්ෂය වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද ලැප්ටොප් 328 ක් මිලදීගැනීම සම්බන්ධයෙන් වූ මෙම ප්‍රසම්පාදන කාර්යය අසාර්ථක වීම හේතුවෙන් විසර්ජන සබැඳි දර්ශක 07හි උපවිසර්ජන සබැඳි දර්ශක 53 ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

### 4.3.5 ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 භාණ්ඩ හා වැඩ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 ප්‍රකාරව ප්‍රසම්පාදනයට අදාළව සියලුම ආශ්‍රිත වියදම් ඇතුළුව ප්‍රසම්පාදනයේ සූදානම් වීමේ කටයුතුවල වියදම්, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු කටයුතුවල වියදම්, අවිනිශ්චිත ප්‍රතිපාදන ඇතුළත්ව අදාළ වැට් බදු වෙන් වශයෙන් දක්වමින් වඩාත් නිවැරදි ලෙස මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ සඳහන් අදාල අධිකාරිය විසින් අනුමත කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කාර්යයන් සඳහා නිවැරදි ආකාරයේ මුළු පිරිවැය ඇස්තමේන්තු ඒ ඒ අංශ විසින් සකස් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී එවැනි භාණ්ඩ, වැඩ, සේවාවන්ට අදාල ප්‍රසම්පාදන කාර්යයන් 136ක් හඳුනාගත හැකිවිය. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රමය, අධිකාරී සීමාව ඉක්මවීම වැනි ප්‍රසම්පාදනයේ වැදගත් පියවරයන් බිඳවැටීම සිදුවී තිබුණි.

(ආ) 2023 අප්‍රේල් 19 දිනැති PED/චක්‍රලේඛ 08/2019(I) දරන චක්‍රලේඛය අනුව රු.මිලියන 200ට වැඩි ප්‍රසම්පාදන කාර්යයන් අනිවාර්යයෙන්ම e-GP පද්ධතිය හරහා සිදුකළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණු රු. මිලියන 200ට වැඩි ප්‍රසම්පාදන කාර්යයන් 05ක් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2024 ප්‍රසම්පාදන සැලැස්මට අනුව ශ්‍රවණාබාධිත දරුවන්ගේ ශ්‍රවණ මට්ටම මැන බැලීම සඳහා වෙනිවැල්කොළ ශිශෝද්‍යා මධ්‍යස්ථානය සඳහා මිලදීගෙන තිබුණු ශ්‍රවන මීටරය (Audio Meter) ඉන්වෙන්ට්‍රි ගතවීමක් සිදුවී නොතිබියදී 2024 ජූලි 26 දින රු. 1,745,000 ක් ගෙවීම කිරීමට ප්‍රසම්පාදන අංශයේ ගණකාධිකාරී විසින් කටයුතු කර තිබුණු අතර එය 2025 අප්‍රේල් 21 දින දක්වා ශිශෝද්‍යා මධ්‍යස්ථානය වෙත භාරදීමෙන් තොරව මාස 9 කට අධික කාලයක් විශේෂ අධ්‍යාපන ඒකකයේ රඳවාගෙන 2025 අප්‍රේල් 22 දින වෙනිවැල්කොළ ශිශෝද්‍යා මධ්‍යස්ථානයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර තිබුණි. තවද, මෙම උපකරණය භාවිතයට සුදුසු පරිදි සවිකිරීමේ ඉදිරි කටයුතු

31

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සම්බන්ධයෙන් අදාළ සැපයුම්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණු අතර එම උපකරණය භාවිතයට අදාළව පුහුණුවක්ද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.3.6 ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

(i) 2014 වර්ෂයේ සිට 2020 කාලපරිච්ඡේදය තුළ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය සිදුකළ යුතු ඉදිකිරීම් අධීක්ෂණ කටයුතුවල හා අමාත්‍යාංශයේ කළමනාකාරීත්වයේ පැවැති දුර්වලතා හේතුවෙන් ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 6 සහ 7 මහල් ඉදිකිරීමේ අදියර I හා II සම්බන්ධයෙන් 2014 වර්ෂයේ වැඩ ආරම්භ කර තිබුණු 2020 දෙසැම්බර් 31 දිනට ගෙවන ලද වටිනාකම රු. 422,744,188 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 2ක් විගණිත දිනය වූ 2025 මාර්තු 31 දින දක්වාම අවසන් කර උපයෝජනය කිරීමේ තත්ත්වයට පත් කිරීමට නොහැකි වී තිබුණි. එසේම අදියර ii හි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් මාසයේදී අතරමග නැවති තිබුණු අතර 2021 පෙබරවාරි සහ මැයි මාසවලදී කාලය දීර්ඝ කිරීම් ඉල්ලුම් කර තිබුණු නමුත් ඒ සඳහා අනුමැතිය ලබාදී නොතිබුණි. 2020 පෙබරවාරි 05 දින අදියර II හි රු. රු.9,900,848 ක් වූ කාර්යසාධන බැඳුම්කරයේ කාලය ඉකුත් වී තිබුණු නමුත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේදී කාර්යසාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ කිරීමට වගකිවයුතු නිළධාරින් කටයුතු කර නොතිබුණු අතර කාර්යසාධන සුරක්ෂණය තබා ගැනීමේ අරමුණු ඒ අනුව ඉටු වී නොතිබුණි.

(ii) ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතියෙහි පළමු අදියරට අදාල විචලනයන්හි “රේට” සඳහා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ පූර්ව අනුමැතිය ලබාගෙන ගෙවීම් කලයුතු වුවද, එසේ බලය හා අනුමැතිය ලබාගෙන නොතිබියදී ගෙවීම් බිල්පත් (IPC) 54ක් ඇතුළතදී විචලනයන් (Variations) වලට අදාලව රු. 65,481,554ක් හා වර්තමාන වටිනාකම ලෙස (P.S.) රු.6,149,743ක් සඳහා නිර්දේශය අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංජිනේරු විසින්ද, සහතික කිරීම අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින්ද, අනුමැතියද අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින්ද 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලසීමාවේදී සිදුකර තිබුණු අතර ඒ සඳහා වගකිව යුතු නිලධාරින් අධිකාරී බලයක් නොතිබියදී එසේ සිදුකර තිබුණි. එමෙන්ම විගණිත දිනය වූ 2025 මාර්තු 31 දින දක්වාම අදාල රේට සඳහා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබාගැනීමට නොහැකි වී තිබුණි. තවද, 2023 නොවැම්බර් 29 දිනැති ගෙවීම් සහතික 55 අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රු. 6,759,826ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(iii) ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතියෙහි 2014 ජූනි 12 දිනැති කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව මිල විචලතා සඳහා අදාල Input Percentages ඇතුළත් කර නොතිබියදී නීත්‍යානුකූල බලයකින් තොරව රු. 6,727,787 ක් ගෙවීම් කර තිබුණි.

(iii) ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය II අදියර සඳහා 2020 දෙසැම්බර් 28 දිනට අදාළ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු අතුරු ගෙවීම් සහතික (IPC) 11 බිල්පත අනුව වැඩබිමේ පවතින අමුද්‍රව්‍යවලින් සියයට 80ක් ලෙස රු. 21,028,627 ක් ගෙවීම් කර තිබුණද එම අමුද්‍රව්‍ය වැඩබිමේ සත්‍ය වශයෙන් පවතින බවට හා ඒවායේ ගුණත්වය සම්බන්ධයෙන් අධීක්ෂණ ඉංජිනේරුවරයාගේ සහතිකයක් ලබාගෙන නොතිබියදී ඉංජිනේරු අංශයේ හා ගෙවීම් අංශයේ නිලධාරීන් විසින් ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි.

32

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

4.4 **වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශයේ අකුණු සන්නායක පද්ධතිය හා සම්බන්ධ රු.7,015,973 ක ඇස්තමේන්තුගත වටිනාකමක් ඇති තඹ තහඩු හා අනිකුත් උපාංග පද්ධතිය අස්ථානගත වීම 2023 අප්‍රේල් මාසයට පෙරදී සිදුවී තිබුණු බව විගණනයට නිරීක්ෂණය වුවත් 2024 නොවැම්බර් 11 දින සිට ප්‍රමාදව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු ආරම්භ කර තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 103(1) හි නැතිවීම සිදුවන කල්හි ගත යුතු ක්‍රියාමාර්ග පිළිබද සාරාංශය ප්‍රකාරව 2025 මාර්තු 28 විගණිත දින වන විට මෙම අස්ථානගතවීම සිදු වී මාස 03 ක කාලයක් ගතවුවද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදුකර නොතිබුණි. 2023 අප්‍රේල් මාසයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර දුරකථන පද්ධතියට අකුණු සැර වැදීම හේතුවෙන් දුරකථන පද්ධතිය සම්පූර්ණයෙන් අක්‍රිය තත්ත්වයට පත්වීමට අකුණු සන්නායක පද්ධතිය නොමැති වීම හේතු වී තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට ලියාපදිංචි කරන ලද මෝටර් රථ 139 ක් අමාත්‍යාංශය සතුව නොපැවතුණි.

(ඇ) රුහුණු ජාතික විද්‍යාපීඨයේ අඩි 100 × 50 සහ අඩි 50 × 50 දිග පළලකින් යුත් ගෘහස්ථ ක්‍රීඩාගාරය ඌණ උපයෝජිතව පැවති අතර විදුලි ජනක යන්ත්‍රය 2022 වසරේ සිට අක්‍රීයවද, කැමරා පද්ධතියෙහි කැමරා 24න් 15ක් අක්‍රීයවද, අත්ට්‍රැක්ටරයක් වසර 10ක සිට නිෂ්ක්‍රියව ද පැවතුණි.

(ඈ) නිපුණතා අංශයේ සමාලෝචිත වර්ෂය තුල කෙරීගෙන යන වැඩ, ආරම්භක ශේෂය ලෙස සඳහන් වටිනාකමම අවසාන ශේෂය ලෙස පවතින බව නිරීක්ෂණය වූ බැවින් වර්ෂය තුල ශේෂය ලෙස පැවති රු.2,113,800,000 ක කෙරීගෙන යන වැඩ සම්බන්ධව කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

4.5 **මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

ප්‍රධාන ගබඩාගාරය ආශ්‍රිත කාර්යයන් ඉටුකර ගැනීමට ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ තොග ශේෂයක් පවත්වා ගැනීමට අදාලව නිසි අභ්‍යන්තර පාලනයන් පවත්වා නොගැනීම හේතුවෙන් A4 කොල පැකට් 132 ක් අස්ථානගත වීමක් හා ටෝනර් අවභාවිතා කිරීමක්ද සිදු වී තිබුණි.

4.6 **පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිරිවෙන් අංශයේ සවිකර තිබුණු CCTV කැමරා 02 ක් අස්ථානගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කර ඒ අනුව මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කල පිළිතුරෙහි සඳහන් පරිදි පිරිවෙන් අංශයේ අමාත්‍යාංශය විසින් මිලදීගත් හෝ රජයේ ප්‍රදානයක් ලෙස හෝ පරිත්‍යාගයක් ලෙස ලද CCTV කැමරා දෙකක් හැර වෙනත් කැමරා සවි වී නොතිබිය යුතු බැවින් ඉන් කුමන ආකාරයකින් ලැබුණද රජයේ නීතිරීති යටතේ පාලනය විය යුතු බවත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබෙන පරිත්‍යාග ලබා ගැනීමට නිසි ක්‍රමවේදයක් සකස් කල යුතු බවත් විගණනය නිරීක්ෂණය කෙරේ.

(ආ) දික්වැල්ල විජිත මහා විද්‍යාලයේ 2021 නොවැම්බර් 09 දින සිදු වී තිබුණු පරිගණක විද්‍යාගාර සොරකමට අදාළ අලාභයේ වටිනාකම රු.1,342,600 ක් බවත් උක්ත සිදුවීම සිදු වී, මේ වන විට වර්ෂ 3ක් ඉක්ම ගොස් තිබියදීත් මුදල් රෙගුලාසි 104 (4) අවසන් වාර්තාවක් නිකුත් කර අලාභ අයකර, අදාල වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල පොත්වලින් කපා හැරීමේ ප්‍රකාශයෙහි ආරම්භක ශේෂය ලෙස පෙන්වන රු.16,083,469 ක වටිනාකමක් ඇති හානි 07 කට අදාළව අලාභ අයකර ගැනීමක් හෝ ඉදිරි

33

පියවර ගැනීමක් ගිණුම් වර්ෂය තුල දී සිදුකර නොතිබුණු අතර එම ශේෂවලට අදාළ අයිතම 5 කින් 2023 වර්ෂයේදී ද කිසිදු මුදලක් අයකර ගැනීමට කටයුතු සිදුකර නොතිබුණි.

## 4.7 විගණන විමසුම්වලට පිළිතුරු ඉදිරිපත් නොකිරීම

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත 2021-2023 කාලසීමාවේදී නිකුත් කරන ලද පිළිතුරු සැපයීමේ ප්‍රමාද කාලය අවමය මාස 16 ක් හා උපරිමය මාස 42 ක් වූ විගණන විමසුම් 15 ක්ද සමාලෝචිත වර්ෂයේ නිකුත් කරන ලද පිළිතුරු සැපයීමේ ප්‍රමාද කාලය මාස 16 ක් වූ විගණන විමසුම් 66 ක් ද 2023 වර්ෂයේදී නිකුත් කරන ලද පිළිතුරු සැපයීමේ ප්‍රමාද කාලය මාස 18 ක් වූ **"ජාතික පාසල් දහසක් දක්වා වැඩිකිරීමේ විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව"** සඳහාද වශයෙන් විගණන විමසුම් 82 ක් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් පිළිතුරු ලබාදීමට කටයුතු කර නොතිබුණි.

## 4.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1999 අංක 44 දරන යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනතේ 9.2, 9.3 වගන්ති අනුව හා 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.4 (අ)ඡේදය ප්‍රකාරව ගිණුම් විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බවත් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුළත අරමුදලේ මූල්‍ය ප්‍රකාශන, කාර්යසාධන වාර්තාව සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බවත් දක්වා තිබුණද 2015-2024 කාලසීමාවට අදාල වර්ෂ 10 ක මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අවබෝධතා ගිවිසුමේ 10 ඡේදයට අනුව විදේශ ණය ව්‍යාපෘතියක් වූ තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහනට (TEDP) අදාල මූල්‍ය ප්‍රකාශනද වාර්ෂිකව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2022 වර්ෂයේ සිට එම මූල්‍ය ප්‍රකාශනද විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශයේ ලැබීමට ඇති ණය/ අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයේ සාරාංශයට අනුව ස්ථාන මාරු වී ගිය, මිය ගිය විශ්‍රාම ගිය, වැඩ තහනම් කර ඇති සහ සේවය හැරගිය නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු ණය ශේෂය රු. 149,632,600 ක් වන අතර ඉන් රු.3,959,518ක මුදලක් 2025 මාර්තු 31 දින වන විට නිරවුල් කර තිබීම හේතුවෙන් එම ශේෂය රු.145,673,082ක් වූ අතර ඉන් රු.19,062,561ක් වර්ෂ 20ට වැඩි කාලයක සිටද, රු.26,775,433ක් වර්ෂ 10ත් 20ත් අතර කාලයක සිටද,රු.20,960,167ක් වර්ෂ 5ත් 10ත් අතර කාලයක සිටද, රු.78,874,921ක් වර්ෂ 5කට අඩු කාලයක සිටද පැවතුණි.

(ඈ) 2024 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී පැමිණි, අනෙකුත් නිලධාරින්ගෙන් වැඩිපුර ගෙවීම් ලෙස අය කර ගැනීමට ඇති ණය ශේෂය රු. 28,818,349 ක් වන අතර 2025 මාර්තු 31 දින වන විට රු.20,000ක මුදලක් නිරවුල් කර ඇති අතර ශේෂය රු.28,798,349ක් විය. ඉන් රු. 7,611,408 ක් වසර 20කට වැඩි කාලය සිටද රු. 11,843,901 ක් වසර 10ත් 20ත් අතර කාලයක සිටද රු.1,624,213 ක් වර්ෂ 5ත් 10ත් අතර කාලයක සිටද රු7,718,827 ක් වර්ෂ 5ට අඩු කාලයක සිට ද පැවතුණි

(ඉ) පාසල් ආදි ශිෂ්‍ය සංගම්වල කාර්යයන් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය චක්‍රලේඛයක් නිකුත් කර වර්ෂ 30 ක් ගත වී තිබුණද ආදිශිෂ්‍ය සංගම්වල ක්‍රියාකාරකම් පිළිබඳව හඳුනාගන්නා ලද සියළු අවිධිමත් තත්ත්වයන් ආවරණය වන පරිදි ආදිශිෂ්‍ය සංගම්වල පාසල් තුල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පොදු උපදෙස් ඇතුලත් කර පැරණි චක්‍රලේඛයේ සංශෝධන සහිතව නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**5 යහපාලනය**

අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය (PABX පද්ධතිය) 2023 අප්‍රේල් 07 දින සිට අකුණු සැර වැදීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්‍රියාවිරහිත වී තිබුණු අතර පවතින පද්ධතියද යථා පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් නව පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2018 වර්ෂයේ සිට අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලැබී තිබුණද 2025 වර්ෂය වන තුරුත් නව පද්ධතියක් ස්ථාපිත කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. අභ්‍යන්තර දුරකථන පද්ධතිය බිඳ වැටීමට අදාලව කඩිනම් පියවර නොගැනීම හේතුවෙන් මාස 24 ක කාලසීමාවක සිට 2025 අප්‍රේල් මාසය දක්වාම දුරකථනය මගින් මහජනයා වෙත සපයන සේවා ඉටු කිරීම මැනවින් සිදු කිරීම නොහැකි වීමට සැලකිය යුතු මට්ටමේ අහිතකර බලපෑමක් වී තිබුණි.

**5.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශයේ 2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව, අවදානම් ඇගයීම මත අභ්‍යන්තර විගණනය විසින් හඳුනාගන්නා ලද විගණන ක්ෂේත්‍ර හා විගණන ක්‍රියාකාරකම් 29ක් දක්වා තිබුණද නිකුත් කරන ලද වාර්තා පරීක්ෂාවේදී සැලසුම් කල කාර්යයන් ඉටුකර නොතිබුණු අතර බොහොමයක් අභ්‍යන්තර විගණන වාර්තා ජාතික පාසල්වල මූල්‍ය විගණනයට සීමා වී තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 133 (1) ප්‍රකාරව අභ්‍යන්තර විගණන විසින් අමාත්‍යාංශයේ මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතුවල වැරදි හා වංචා වැලැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයුමක් පවත්වාගන යාම සිදුකල යුතු බව දක්වා තිබුණද, වැරදි හා වංචා වැලැක්වීමට සහ අනාවරණය කර ගැනීමට, අභ්‍යන්තර පාලන ක්‍රම පරීක්ෂා කිරීමට සහ නව අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදීමට අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය ප්‍රමාණවත් කාලයක් වැයකර නොමැති බව අභ්‍යන්තර විගණන සැලසුම් හා වාර්තා අනුව නිරීක්ෂණය විය.

(ඇ) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කලමනාකරණ පනතේ 33 (2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ අභ්‍යන්තර විගණකවරයාගේ තීරණය සඳහන් කරමින් අමාත්‍යාංශ ලේකම්වරයාට වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත් එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

**5.2 විගණන හා කළමනාකරණ කමිටුව**

2019 ජනවාරි 12 දිනැති අංක DMA/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 5.3 ඡේදය අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක්, එනම් වර්ෂයකට 4ක් වන පරිදි පැවැත්විය යුතු වුවද 2024 වර්ෂය සඳහා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි.

**6 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ ගොඩනැගිලි නඩත්තු කටයුතු මනාව පවත්වා ගැනීමට අත්‍යාවශ්‍ය තනතුරක් වූ ගොඩනැගිලි කළමනාකරු තනතුර 2023 දෙසැම්බර් 30 දින සිට පුරප්පාඩු වී තිබුණු අතර එම තනතුර පිරවීම සඳහා 2025 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ පාසල් සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් බඳවාගැනීම

(i) ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්ගේ අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව හා ගුරු සේවයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරු තනතුරු යටපත් කොට අමාත්‍යාංශය විසින් ක්‍රීඩා පුහුණුකරුවන් 3,888ක් 2019 වර්ෂයේදී බඳවාගැනීමට කටයුතු කර තිබුණි. ක්‍රීඩා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

පුහුණුකරුවන් ජාතික පාසල් හා පළාත් සභා වෙත අනුයුක්ත කිරීමට යාමේදී ඇති වූ ගැටළු හේතුවෙන් නැවතත් ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරු තනතුර යටපත් නොකිරීමට කටයුතු කර තිබුණි. මෙලෙස පාසල්වල ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් හා ක්‍රීඩා පුහුණුකරුවන් පාසල් වෙත අනුයුක්ත කර තිබියදීත් බොහෝ පාසල් විසින් චෙස්, ක්‍රිකට්, වොලිබෝල් වැනි ක්‍රීඩා සඳහා බාහිර පුහුණුකරුවන්ගේ සේවය ලබාගෙන ඒ සඳහා පාසල් සංවර්ධන සමිතියෙන් වැටුප් ගෙවීමට හා සිසුන්ගෙන් අමතර මුදල් අයකිරීමට කටයුතු කරන බව නිරීක්ෂණය විය.

(ii) ගුරු සේවයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරු තනතුරු යටපත් නොකොට, ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා 3,888 දෙනෙකු බඳවාගෙන තිබීමත් සමඟ ගුරු සේවයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරු දැනට අනුමත තනතුරු සංඛ්‍යාව සමාලෝචනය කර එම අනුමත තනතුරු සංඛ්‍යාව අඩු කල යුතු වුවත් මේ වන විටත් එවැනි සමාලෝචනයක් සිදුකර නොතිබුණි.

(iii) ක්‍රීඩා පුහුණුකරුවන් බඳවාගැනීමේ පටිපාටිය අනුව අදාළ පුහුණුකරුවන් III ශ්‍රේණියට පත්වී වර්ෂ 03 ක් ඉක්මවා යාමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් වීම හා බඳවාගැනීමේ පටිපාටියේ 8.2 වගන්තිය අනුව වසරකට දෙවරක් කාර්යක්ෂමතා කඩඉම පැවැත්විය යුතු ලෙස සඳහන් වුවද 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වාම කාර්යක්ෂමතා කඩඉම් විභාග එකක් පමණක් පවත්වා තිබුණි. ආයතන සංග්‍රහයේ 15 වන උප වගන්තියේ IX ට අනුව නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම සඳහා පත්වීම් බලධරයාද/පරිපාලන බලධරයාද එම වගකීමට බැඳී සිටින බව සඳහන් වුවද කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත වාර ගණනක් පැවැත්වීමට අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා) කටයුතු කර නොතිබුණි. ඒ අනුව ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපැවැත්වීම මත පත්වීම් ස්ථිර කර ගැනීමටද නොහැකි වී තිබුණි.

(iv) 2019 වර්ෂයේ බඳවාගත් ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය විභාග කොමසාරිස් විසින් 2023 දෙසැම්බර් 23 දින පවත්වා තිබුණි. බඳවාගත් මුළු පුහුණුකරුවන් අතුරින් ක්‍රීඩා පුහුණුකරුවන් 2,996 දෙනෙකු විභාගය සඳහා සහභාගී වී තිබුණු අතර ඉන් 293 දෙනෙකු එනම් සියයට 9.7ක් පමණක් විභාගය සමත් වී තිබුණු අතර 892 ක් විභාගය සඳහා ඉදිරිපත් වී නොතිබුණි. විභාගය සමත් වීමේ ප්‍රතිශතය දෙස බැලීමේදී ඒ පිළිබඳ ක්‍රමවේදයේ ගැටළුකාරී තත්ත්වයක් පවතින බව හඳුනාගත හැකිව තිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහ තෘතියික මට්ටමේ නිළධාරීන්ගේ පුරප්පාඩු 880 ක් හා ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 2,418 ක් පැවතුණි.

(ඈ) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 544ක් , තෘතියික මට්ටමේ පුරප්පාඩු 26ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 262 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 106 ක් පවතින බැවින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සමස්ත ක්‍රියාකාරීත්වය කෙරෙහි දැඩි බලපෑමක් ඇති වී තිබුණු අතර ඉහත පරිදි පුරප්පාඩු පැවතියද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2025 වර්ෂයේ අපේක්ෂිත බඳවාගැනීම් ලේඛනයට එම පුරප්පාඩු ඇතුලත් කර නොතිබුණු අතර එම පුරප්පාඩු තනතුරුවල අනුමත සංඛ්‍යාව පිළිබඳව සමාලෝචනයක්ද සිදුකර නොතිබුණි.

(ඉ) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට අදාළ විස්තරාත්මක කාර්යමණ්ඩල තොරතුරු අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ අනුමත කථිකාචාර්ය තනතුරු සංඛ්‍යාව 1,080 ක් බවත් 2025 අප්‍රේල් 30 දිනට සත්‍ය තනතුරු අප්‍රේල් 539 ක් බවත් නිරීක්ෂණය වූ අතර ඒ අනුව පුරප්පාඩු කථිකාචාර්ය තනතුරු සංඛ්‍යාව 541 ක් වී තිබුණු අතර බොහෝ විද්‍යාපීඨවල වයස අවුරුදු 63ත් 70ත් අතර වයසේ පසුවන බාහිර කථිකාචාර්යවරුන් මාස 06ත් 06ට කාලය දීර්ඝ කරමින් සේවයේ නිරතව සිටින බව නිරීක්ෂණය වුණි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ශික්ෂණලාභීන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි දැඩි බලපෑමක් කළද, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධව නිසි අවධානය යොමු කර නොතිබුණි.

36

NAOSL

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඊ) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා නේවාසිකාගාර අධිකාරි (පිරිමි/ගැහැණු) තනතුරු 73 ක්ද, නේවාසිකාගාර සහකාර අධිකාර(පිරිමි /ගැහැණු) 74 ක්ද, අනුමතව තිබුණු නමුත් 2025 අප්‍රේල් 30 දිනය වන විට නේවාසිකාගාර අධිකාරි (පිරිමි/ගැහැණු) තනතුරු 58 ක් සහ නේවාසිකාගාර සහකාර අධිකාරි (පිරිමි/ගැහැණු) තනතුරු 33 ක් පුරප්පාඩු වී පැවතුණි.

(උ) ජාතික පාසල්වල කාර්යමණ්ඩල තොරතුරු අනුව පාසල් සඳහා අනුමත සංවර්ධන නිලධාරී I, II, III ශ්‍රේණි තනතුරු සංඛ්‍යාව 1,297 ක් වන අතර 2024 දෙසැම්බර් 31 දිනට සත්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව 2,313 ක් වීමෙන් කාර්යමණ්ඩලය 1,016 ක් අතිරික්තව ද ගුරු මධ්‍යස්ථාන සඳහා ප්‍රාථමික මට්ටමේ තනතුරු 111 ක් අනුමතව තිබුණු අතර සත්‍ය කාර්ය මණ්ඩල ප්‍රමාණය 123 ක් වීමෙන් අතිරික්ත සේවකයන් 12ක් ද ගුරු විද්‍යාලවල ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ අතිරික්ත සංඛ්‍යාව 40ක් ද ලෙස නිලධාරීන් 1,068 ක් අතිරික්තව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුයුක්ත කර තිබුණි. 2022 වර්ෂයේදී පත්වීම් ලබාදෙන ලද සංවර්ධන නිලධාරීන් අතිරික්තයක් ඇති නොවන පරිදි අනුයුක්ත කිරීමට ප්‍රමාණවත් පියවර ගැනීමක් අමාත්‍යාංශය මඟින් සිදු වී නොමැති බව පිළිතුර අනුව නිරීක්ෂණය වන අතර එම නිලධාරීන්ට ගෙවන ලද වැටුප් හා දීමනා නිෂ්ඵලදායී වී තිබුණි.

(ඌ) ජාතික පාසල් සඳහා නේවාසිකාගාර පාලක පාලිකාවන් 258ක් අනුමත කර තිබුණද සත්‍ය ප්‍රමාණය 80ක් වීමෙන් තනතුරු 178 ක් පුරප්පාඩු වී පැවතුණි. පාසල් තුළ නේවාසිකව සිටින දරුවන්ගේ කටයුතු පාලනය, අධීක්ෂණය වෙනුවෙන් අවශ්‍ය මෙම තනතුර විශාල ලෙස පුරප්පාඩු වීම කෙරෙහි අධ්‍යාපන අමාත්‍යාංශය අවධානය යොමු කර නොතිබුණි.

(එ) ජාතික පාසල් සඳහා තාක්ෂණපීඨ සහකාර තනතුරු 338ක් අනුමතව තිබුණද සියළුම තනතුරු ප්‍රමාණය පුරප්පාඩු වී පැවතුණි. එමෙන්ම රසායනාගාර සහකාර තනතුරු 554 ක් අනුමත වී තිබුණු අතර ඉන් තනතුරු 390 ක් පුරප්පාඩු වී පැවතුණි. ඒ අනුව දරුවන්ට ප්‍රායෝගික විද්‍යාත්මක දැනුම නිසි පරිදි ලබා දීම, පාසල් විද්‍යාගාර පාලනය, නඩත්තුව, මෙහෙයවීම පිළිබඳ ගැටළු මතුව තිබුණි.

(ඒ) අධ්‍යාපන අමාත්‍යාංශය, ගුරු පුහුණු මධ්‍යස්ථාන හා ගුරු විද්‍යාලවල තනතුරු 11 ක් සඳහා අනුමත නොවන කාර්යයන්වල 57 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

අයි.ඩී.අයි. ප්‍රියදර්ශනී
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව),මුදල් අමාත්‍යාංශය

37

# 04. පරිච්ඡේදය
# කාර්යසාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම් ව)

| විශේෂිත දර්ශක | ළඟා කර ගත් නිමැවුම | තථ්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | 90% - 100 % | 75% - 89% | 50% - 74% |
| අධ්‍යාපනයට ප්‍රවේශවීම හා ඒ තුළ රැඳී සිටීම වර්ධනය කිරීම සහ ද්විතියික මට්ටම දක්වා අධ්‍යාපනය සම්පූර්ණ කිරීම | | | | |
| ශුද්ධ ලේඛනගත ශිෂ්‍ය අනුපාතය (Net Enrolment Rate ) | ප්‍රාථමික (1-5) : 83.12 %<br>කනිෂ්ඨ ද්විතීයික : 93.76 %<br>ජ්‍යෙෂ්ඨ ද්විතීයික : 93.70 %<br>ද්විතියික : 94.01 %<br>අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව : 89.57 % | √ | | |
| දළ ඇතුළත් කිරීමේ අනුපාතය (Gross Intake Rate) | ප්‍රාථමික (1-5) : 77.25 %<br>කනිෂ්ඨ ද්විතීයික : 92.4 %<br>ජ්‍යෙෂ්ඨ ද්විතීයික : 96.1 % | √ | | |
| අධ්‍යාපනයේ රැඳී සිටීමේ අනුපාතය (Gross Survival Rate) | ප්‍රාථමික (1-5) : 98 %<br>කනිෂ්ඨ ද්විතීයික : 99 %<br>ජ්‍යෙෂ්ඨ ද්විතීයික : 92 % | √ | | |
| අධ්‍යාපනයේ සංක්‍රාන්ති අනුපාතය (Transition Rate of Education) | ප්‍රාථමික (1-5) : 99 %<br>කනිෂ්ඨ ද්විතීයික : 98 %<br>උසස් පෙළ : 66 % | √ | | |
| අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අනුපාතය (Completion Rate of Education) | ප්‍රාථමික (1-5) : 91.32%<br>කනිෂ්ඨ ද්විතීයික : 94.39%<br>ජ්‍යෙෂ්ඨ ද්විතීයික : 93.01 % | √ | | |

සටහන : (ශුද්ධ ලේඛනගත ශිෂ්‍ය අනුපාතය) මෙම ගණනය කිරීම් සඳහා ජාත්‍යන්තර පාසල් සිසුන්, විශේෂ අධ්‍යාපන සිසුන්, පෞද්ගලික පාසල්වල ජාත්‍යන්තර විෂය මාලා හදාරන සිසුන්, සාමාන්‍ය පෙළ දෙවන වර සිසුන්, වෙනත් ආගමික අධ්‍යාපන මධ්‍යස්ථානවල ඉගෙනුම ලබන සිසුන් ඇතුළත් කර නොමැත. මෙම ගණනය කිරීම සඳහා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති වසර මැද ජනගහන ඇස්තමේන්තු සංඛ්‍යා භාවිතයට ගෙන ඇත.

*සටහන : (දළ ඇතුළත් කිරීමේ අනුපාතය) මෙම ගණනය කිරීම් සඳහා ජාත්‍යන්තර පාසල් සිසුන්, විශේෂ අධ්‍යාපන සිසුන්, වෙනත් ආගමික අධ්‍යාපන මධ්‍යස්ථානවල ඉගෙනුම ලබන සිසුන් ඇතුළත් කර නොමැත.*

| විශේෂිත දර්ශක | ළඟා කර ගත් නිමැවුම | තථ්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | 90% - 100% | 75% - 89% | 50% - 74% |
| **සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම** | | | | |
| 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ සිසුන්ගේ ප්‍රතිශතය 2024 | ලකුණු 70 හෝ ඊට වැඩි ශිෂ්‍ය ප්‍රතිශතය - 77.96 % | | √ | |
| අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අ.පො.ස. (උ.පෙළ)සඳහා සුදුසුකම් ලබන පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය (2023) | 75.72% | | √ | |
| අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එක් එක් විෂයන් සමත් පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය (2023) | සිංහල භාෂාව - 86.90 %<br>දෙමළ භාෂාව - 86.06 %<br>ගණිතය - 73.16 %<br>ඉංග්‍රීසි - 70.60 %<br>විද්‍යාව - 72.90 %<br>ඉතිහාසය – 83.80 % | | √ | |
| අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතය (2023) | ජීව විද්‍යා - 57.71 %<br>භෞතික විද්‍යාව - 57.98 %<br>කලා - 69.51 %<br>වාණිජ - 71.09%<br>ඉංජිනේරු තාක්ෂණවේදය - 68.12%<br>ජෛව පද්ධති තාක්ෂණවේදය - 76.21 %<br>වෙනත් - 48.66 % | | | √ |

## ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

| දර්ශකය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| පාසල් (a) | | | | | | |
| රජයේ පාසල් සංඛ්‍යාව | 10,175 | 10,165 | 10,155 | 10,146 | 10,126 | 10,096 |
| පාසල් වර්ගය අනුව (b) | | | | | | |
| 1ඒබී පාසල් | 1,044 | 1,012 | 1,000 | 1,011 | 1,008 | 988 |
| 1සී පාසල් | 1,845 | 1,899 | 1,932 | 1,941 | 1,951 | 1,975 |
| 2 වර්ගයේ පාසල් | 3,227 | 3,225 | 3,224 | 3,226 | 3,221 | 3,273 |
| 3 වර්ගයේ පාසල් | 4,059 | 4,029 | 3,999 | 3,968 | 3,946 | 3,860 |
| පන්ති පරාසය අනුව | | | | | | |
| ප්‍රාථමික පන්ති පමණක් | 3,890 | 3,891 | 3,884 | 3,893 | 3,883 | 3,860 |
| 1 ශ්‍රේණියේ සිට 8 ශ්‍රේණිය දක්වා | 169 | 138 | 115 | 75 | 63 | 64 |
| 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා | 3,207 | 3,207 | 3,204 | 3,206 | 3,202 | 3,185 |
| 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | 1,892 | 1,925 | 1,949 | 1,975 | 1,986 | 1,997 |
| 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා | 20 | 18 | 20 | 20 | 19 | 24 |
| 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | 997 | 986 | 983 | 977 | 973 | 966 |
| පරිපාලන අධිකාරිය අනුව | | | | | | |
| ජාතික පාසල් | 353 | 373 | 373 | 396 | 396 | 396 |
| පළාත් පාසල් | 9,822 | 9,792 | 9,782 | 9,750 | 9,730 | 9,700 |
| ඉගැන්වීමේ මාධ්‍ය අනුව | | | | | | |
| සිංහල පමණක් | 6,370 | 6,347 | 6,357 | 6,323 | 6,290 | 6,247 |
| දෙමළ පමණක් | 3,031 | 3,030 | 3,042 | 3,026 | 3,032 | 3,011 |
| සිංහල හා දෙමළ | 35 | 45 | 42 | 40 | 39 | 39 |
| සිංහල හා ඉංග්‍රීසි | 531 | 542 | 524 | 552 | 563 | 581 |
| දෙමළ හා ඉංග්‍රීසි | 170 | 168 | 157 | 170 | 168 | 183 |
| සිංහල,දෙමළ හා ඉංග්‍රීසි | 38 | 33 | 33 | 35 | 34 | 35 |
| පිහිටීම අනුව (c) | | | | | | |
| නාගරික | 1,037 | 1,035 | 1,034 | 1,032 | 1,039 | 1,037 |
| ග්‍රාමීය | 9,138 | 9,130 | 9,121 | 9,114 | 9,087 | 9,059 |
| ශිෂ්‍ය සංඛ්‍යාව අනුව | | | | | | |
| 1 - 50 | 1,480 | 1,468 | 1,439 | 1,419 | 1,473 | 1,506 |
| 51 - 500 | 6,319 | 6,388 | 6,382 | 6,418 | 6,406 | 6,404 |
| 501 - 2500 | 2,165 | 2,132 | 2,158 | 2,130 | 2,074 | 2,017 |
| 2501 - 5000 | 194 | 172 | 171 | 172 | 167 | 163 |
| 5000ට වැඩි | 17 | 5 | 5 | 7 | 6 | 6 |
| පෞද්ගලික පාසල් සංඛ්‍යාව (d) | 80 | 89 | 90 | 93 | 95 | 95 |
| විශේෂ පාසල් සංඛ්‍යාව (e) | 26 | 29 | 30 | 30 | 31 | 32 |
| පිරිවෙන් සංඛ්‍යාව | 763 | 801 | 816 | 819 | 822 | 822 |

| දර්ශකය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| ගුරුවරුන් (a) | | | | | | |
| රජයේ පාසල්වල ගුරුවරුන් සංඛ්‍යාව | 247,334 | 246,592 | 249,494 | 241,054 | 236,738 | 237,787 |
| ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | | | | | |
| ස්ත්‍රී | 183,024 | 184,125 | 187,747 | 182,519 | 56,817 | 181,217 |
| පුරුෂ | 64,310 | 62,467 | 61,747 | 58,535 | 179,921 | 56,570 |
| සුදුසුකම් අනුව | | | | | | |
| උපාධිධාරී | 110,741 | 119,323 | 121,569 | 136,998 | 138,339 | 139,056 |
| වෘත්තීයමය සුදුසුකම් සහිත (f) | 74,212 | 73,444 | n.a. | 90,371 | 101,603 | 101,261 |
| වෘත්තීයමය සුදුසුකම් රහිත | 36,529 | 22,855 | n.a. | 46,627 | 36,736 | 37,795 |
| පුහුණු ගුරුවරු (g) | 130,635 | 120,848 | 121,796 | 96,838 | 93,302 | 93,929 |
| නුපුහුණු / අභ්‍යාසලාභී / වෙනත් | 5,958 | 6,421 | 6,129 | 7,218 | 5,097 | 4,802 |
| | | | | | | |
| දර්ශකය | | | | | | |
| වෘත්තීයමය සුදුසුකම් සහිත ගුරුවරු ප්‍රතිශතය (h) | 83.0 | | n.a. | n.a | 82.3 | 82.1 |
| ගුරු ශිෂ්‍ය අනුපාතය | 17 | 17 | 16 | 17 | 17 | 16 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව | 19 | 19 | 19 | 19 | | |
| ගුරු විද්‍යාල සංඛ්‍යාව | 8 | 8 | 8 | 8 | | |
| ගුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව (i) | 111 | | | | | |
| ශිෂ්‍යයින් (a) | | | | | | |
| රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 4,214,772 | 4,061,653 | 4,063,685 | 4,048,937 | 3,969,597 | 3,882,688 |
| ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | | | | | |
| ස්ත්‍රී | 2,132,076 | 2,042,648 | 2,045,534 | 2,034,616 | 1,999,761 | 1,959,097 |
| පුරුෂ | 2,082,696 | 2,019,005 | 2,018,151 | 2,014,321 | 1,969,836 | 1,923,591 |
| ප්‍රධාන ඉගෙනුම් මාධ්‍ය අනුව | | | | | | |
| සිංහල | 3,098,539 | 2,981,235 | 2,978,133 | 2,968,086 | 2,900,802 | 2,827,538 |
| දෙමළ | 1,026,877 | 988,773 | 986,156 | 977,184 | 955,060 | 934,579 |
| ද්විභාෂා (w) | 89,356 | 91,645 | 99,396 | 103,667 | 113,735 | 120,571 |
| ඉගෙනුම් චක්‍රය අනුව | | | | | | |
| ප්‍රාථමික ( 1-5 ශ්‍රේණි) | 1,672,350 | 1,656,441 | 1,640,647 | 1,618,867 | 1,567,689 | 1,521,394 |
| කනිෂ්ඨ ද්විතීයික ( 6-9 ශ්‍රේණි) | 1,346,046 | 1,359,061 | 1,357,437 | 1,343,485 | 1,318,284 | 1,291,066 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 10-11ශ්‍රේණි) | 622,565 | 627,477 | 636,985 | 652,331 | 655,729 | 651,377 |

| දර්ශකය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| ගුරුවරුන් (a) | | | | | | |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 12-13ශ්‍රේණි) | 383,744 | 411,161 | 421,114 | 426,964 | 420,577 | 411,305 |
| විශේෂ අධ්‍යාපන ඒකකවල | 6,788 | 7,513 | 7,502 | 7,290 | 7,318 | 7,546 |
| පිරිවෙන්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 60,875 | 68,319 | 69,878 | 70,310 | 69,134 | 69,108 |
| පැවිදි | 32,160 | 35,264 | 36,497 | 37,360 | 36,574 | 36,565 |
| ගිහි | 28,715 | 33,055 | 33,381 | 32,950 | 32,560 | 32,543 |
| පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව (විශේෂ පාසල් ද ඇතුළුව) | 142,032 | 138,067 | 138,726 | 141,219 | 141,719 | 140,107 |
| පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 139,581 | 135,600 | 136,230 | 138,828 | 139,412 | 137,869 |
| විශේෂ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 2,451 | 2,467 | 2,496 | 2,391 | 2,307 | 2,238 |

(a) වාර්ෂික පාසල් සංගණන දත්ත ඇසුරිනි.

(b) 1AB : අ.පො.ස. (උ.පෙ) විද්‍යා විෂය ධාරාව සහිත (ජීව විද්‍යාව හා/ හෝ භෞතික විද්‍යා විෂය ධාරාව) පාසල් වේ.

1C : අ.පො.ස. (උ.පෙ) විද්‍යා විෂය ධාරාව හැර වෙනත් විෂය ධාරාවක් / කිහිපයක් සහිත හා /හෝ (උ.පෙ) වෘත්තීය විෂය ධාරාව සහිත පාසල් වේ.

2 වර්ගය : 1 සිට 11 හෝ 6 සිට 11 ශ්‍රේණි සහිත අ.පො.ස. (සා.පෙ) දක්වා වූ පාසල්

3 වර්ගය : 1 සිට 5 හෝ 8 ශ්‍රේණිය දක්වා ඇති ප්‍රාථමික හෝ කනිෂ්ඨ පාසල්

(c) නාගරික - මහ නගර සභා හෝ නගර සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

ග්‍රාමීය - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

(d) මුදල් අය කරනු ලබන හෝ අය කරනු නොලබන ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික අංශයෙන් පාලනය වන පාසල් ( මෙහි දී ජාත්‍යන්තර පාසල් ඇතුළත් නොවේ)

(e) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ( අන්ධ, ගොළු, බිහිරි, ඔටිසම් ) සඳහා වූ විශේෂ පාසල්

(f) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිත උපාධිධාරීන්

(g) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළින් හෝ ගුරු විද්‍යාල තුළින් පුහුණුව ලබා ඇති ගුරුවරුන්

(h) වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ පුහුණු ගුරුවරුන් සංඛ්‍යාව, සමස්ත ගුරුවරුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස

(i*) මෙයට අගී ගණ්‍ය ගුරු මධ්‍යස්ථාන වන බිබිල, යාකරවත්ත හා මන්නාරම යන මධ්‍යස්ථාන තුන ද ඇතුළත් වේ.

(j) වාර්ෂික පාසල් සංගණන දත්ත, සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජනගහන දත්ත හා ලෝක බැංකු දත්ත පාදකය ඇසුරිනි.

(k) අවුරුදු 5 සම්පූර්ණ වූ ජනගහනයෙන් රජයේ පාසල් හා පෞද්ගලික පාසල්වල පළමු ශ්‍රේණියට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

**(l)** අවුරුදු **5-10** වයස් සීමාවේ සිටින ජනගහනයෙන් රජයේ පාසල් හා පෞද්ගලික පාසල්වල ප්‍රාථමික අධ්‍යාපන චක්‍රයට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

**(m)** අවුරුදු **5-14** වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල් හා පෞද්ගලික පාසල්වල ප්‍රාථමික සිට කනිෂ්ඨ ද්විතීයික අවධිය දක්වා **(1-9** ශ්‍රේණිවලට **)** ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය.

**(n)** අවුරුදු **5-16** අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල් හා පෞද්ගලික පාසල්වල ප්‍රාථමික සිට ජ්‍යෙෂ්ඨ ද්විතීයික පළමු අවධිය දක්වා **(1-11**ශ්‍රේණිවලට **)** ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

**(o)** රජයේ පාසල්වලට පළමු ශ්‍රේණියට ඇතුළත් වන ශිෂ්‍යයින්ගෙන් **9** ශ්‍රේණිය හා **11** ශ්‍රේණිය දක්වා රැඳී සිටින ප්‍රතිශත

**(p)** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ප්‍රතිඵල දත්ත ඇසුරිනි.

**(q)** පාසල්වල පවතින යටිතල පහසුකම් අතරින් ප්‍රධාන කිහිපයක් පමණක් මෙහි සලකා ඇත.

(r) පාසල් සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ව සකස්කර ඇති ජාතික ප්‍රතිමානයන්ට අනුව අවශ්‍ය ප්‍රමාණයෙන් **50%** ක් හෝ ඇති පාසල්

**(s)** අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත සහ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ දත්ත ඇසුරිනි.

(t) කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල සියලු ම රජයේ පාසල් ද මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල ඇතැම් රජයේ පාසල් ද **2009** ජුනි **01** පාසල් සංගණන දිනය වන විට වසා තිබිණි.

**(u)** පළමු වර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

**(v)** පළමු වර හා දෙවන වර විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

**(w)** සිංහල හෝ දෙමළ මාධ්‍ය සහිත ව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද විෂයයන් කිහිපයක් හදාරන සිසුන්

**(x)** සලකා බලන වර්ෂයේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා කරන සමස්ත වියදම, වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බෙදීමෙන් ඒක පුද්ගල ශිෂ්‍ය වියදම ගණනය කරනු ලැබේ.

(y) සාමාන්‍ය පෙළ විද්‍යාගාර/ විද්‍යා කාමර හෝ මිනි ලැබ් සහිත **6-11/ 6-13** පාසල් ප්‍රතිශතය

N/A - අදාළ නොවේ

\# - කාන්තා හා ළමා සංවර්ධන හා පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා සේවා රාජ්‍ය අමාත්‍යාංශය මඟින් වියදම් දරා ඇත.

* - **2019** වර්ෂයේ දී අ.පො.ස.(උ.පෙළ) විභාගය, පැරණි හා නව විෂය නිර්දේශය යටතේ පැවැත්වුණු අතර එහි එකතුව මෙහි දක්වා ඇත.

# 05. පරිච්ඡේදය
# තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු (2023)

| අරමුණු | ඉලක්කය | දර්ශක | මේ දක්වා ළඟා කර ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100 % |
| අරමුණ 4. අන්තර්කරණ සහ සමසාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ සැමට යාවජීව ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම | 4.1 2030 වන විට, ප්‍රාථමික හා ද්විතීයික මට්ටම්වල නොමිලේ, සමසාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් සියලු ම දරුවන් විසින් සම්පූර්ණ කර ඇති බවට සහතික වන අතර, එය අදාළ සහ ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල | **4.1.2a** ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කළ අනුපාතය | | | √ |
| | | **4.1.2b** පහළ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කළ අනුපාතය | | | √ |
| | | **4.1.2c** ඉහළ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කළ අනුපාතය | | √ | |
| | | **4.1.3.a** ප්‍රාථමික අධ්‍යාපනය අවසාන ශ්‍රේණියට දළ බඳවා ගැනිමේ අනුපාතය | | | √ |
| | | **4.1.3.b** පහළ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන ශ්‍රේණියට දළ බඳවා ගැනීමේ අනුපාතය | | | √ |
| | | **4.1.4.a.** පාසල් යා යුතු වයසේ ළමුන්ගෙන් පාසල් නො යන ළමුන් ගේ අනුපාතය (ප්‍රාථමික අධ්‍යාපනය)<br>*ප්‍රගතිය-දර්ශක වටිනාකම 25% ට අඩු ය | | | √ |
| | | **4.1.4.b.** පාසල් යා යුතු වයසේ ළමුන්ගෙන් පාසල් නො යන ළමුන් ගේ අනුපාතය (පහළ ද්විතීයික අධ්‍යාපනය) *ප්‍රගතිය-දර්ශක වටිනාකම 25% ට අඩු ය | | | √ |
| | | **4.1.4. c** පාසල් යා යුතු වයසේ ළමුන්ගෙන් පාසල් නො යන ළමුන් ගේ අනුපාතය (ඉහළ ද්විතීයික අධ්‍යාපනය) ප්‍රගතිය - දර්ශක වටිනාකම 50% ට අඩුය | | √ | |

| අරමුණු | ඉලක්කය | දර්ශක | මේ දක්වා ළඟා කර ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | | **4.1.7.**නෛතික රාමුන් තුළ **(a)** නිදහස් හා **(b)** අනිවාර්ය අධ්‍යාපනය සහතික කෙරෙන වසර සංඛ්‍යාව (ප්‍රගතිය **a** - වසර **13**, **b** - වසර **11**) | | | √ |
| | **4.2 2030** වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මන වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම | **4.2.2** ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ නිල වයසට පෙර වසරක හෝ සංවිධානාත්මත ඉගනුම් ක්‍රියාවලියට සහභාගි වූ අනුපාතය | | | √ |
| | **4.6 2030** වන විට, සියලු ම තරුණයින් සහ වැඩිහිටියන්-ගෙන් සැලකිය යුතු ප්‍රතිශත-යක්, පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශ්වයෙන් ම, සාක්ෂරතා සහ සංඛ්‍යාමය දැනුම ලබා ගැනීම සහතික කිරීම | **4.6.2.**වැඩිහිටි සාක්ෂරතා අනුපාතය | | | √ |

| අරමුණු | ඉලක්කය | දර්ශක | මේ දක්වා ළඟා කර ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| **අරමුණ 4.** අන්තර්කරණ සහ සමසාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ සැමට යාවජීව ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම. | **4.a** ළමා, ආබාධිත සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වන අධ්‍යාපන පහසුකම් ගොඩ නැගීම සහ වැඩිදියුණු කිරීම සහ සැමට ආරක්ෂිත, ගැටුම්වලින් තොර, අන්තර්කරණ සහ ඵලදායී ඉගෙනුම් පරිසරයක් සැපයීම. | **4.a.1.a** විදුලිය ඇති පාසල් අනුපාතය (ප්‍රාථමික) | | | √ |
| | | **4.a.1.a** විදුලිය ඇති පාසල් අනුපාතය (ද්විතියික) | | | √ |
| | | **4.a.1.b** අධ්‍යාපනික අරමුණු සඳහා අන්තර්ජාලයට ප්‍රවේශය ඇති පාසල් අනුපාතය (ද්විතීයික) | | √ | |
| | | **4.a.1.c** අධ්‍යාපනික අරමුණු සඳහා පරිගණක සඳහා ප්‍රවේශය ඇති පාසල් අනුපාතය (ද්විතීයික) | | | √ |
| | | **4.a.1.e** මූලික පානීය ජල පහසුකම් සහිත පාසල් අනුපාතය(ප්‍රාථමික) | | | √ |
| | | **4.a.1.e** මූලික පානීය ජල පහසුකම් සහිත පාසල් අනුපාතය(ද්විතීයික) | | | √ |
| | | **4.a.1.f** පුම්තිරි බව අනුව වෙන් වූ මූලික සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රවේශය ඇති පාසල් අනුපාතය(ප්‍රාථමික) | | | √ |

| අරමුණු | ඉලක්කය | දර්ශක | මේ දක්වා ළඟා කර ගත් | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100 |
| අරමුණ 4. අන්තර්කරණ සහ සමසාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ සැමට යාවජීව ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම | 4.a ළමා, ආබාධිත සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වන අධ්‍යාපන පහසුකම් ගොඩ නැගීම සහ වැඩිදියුණු කිරීම සහ සැමට ආරක්ෂිත, ගැටුම්වලින් තොර, අන්තර්කරණ සහ ඵලදායී ඉගෙනුම් පරිසරයක් සැපයීම | 4.a.1.f පුමිතිරි බව අනුව වෙන් වූ මූලික සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රවේශය ඇති පාසල් අනුපාතය (ද්විතීයික) | | | √ |
| | | 4.a.1.i අත් සේදීමේ මූලික පහසුකම් ඇති පාසල් අනුපාතය (ප්‍රාථමික, ද්විතීයික) | | | √ |
| | | 4.a.1.i අත් සේදීමේ මූලික පහසුකම් ඇති පාසල් අනුපාතය (ද්විතීයික) | | | √ |
| | 4.c 2030 වන විට, සංවර්ධනය වෙමින් පවතින රටවල, විශේෂයෙන් ඌණ සංවර්ධිත රටවල සහ සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යවල ගුරු පුහුණුව සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ඇතුළුව සුදුසුකම් ලත් ගුරු සැපයුම සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම. | 4.c.3. සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ ප්‍රතිශතය (ප්‍රාථමික අධ්‍යාපනය) | | | √ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන අරමුණු අංක 4 යටතේ ගුණාත්මක අධ්‍යාපනය සඳහා සම සාධාරණ ප්‍රවේශය තහවුරු කිරීමට සකස් කර ඇති ඉලක්ක වෙත ශ්‍රී ලංකාව ළඟා වීමේ ප්‍රගතිය වාර්ෂික ව ගණනය කෙරේ. පසුගිය වසරේ දී මෙම ඉලක්ක අතරින් ඉලක්ක 19ක් සඳහා 2030 වසර වන විට ළඟා විය යුතු සන්ධිස්ථාන අගයන් (benchmark) තීරණය කරන ලදි. මෙහි ඉලක්ක 4.1 යටතේ 3 ශ්‍රේණිය, 6 ශ්‍රේණිය සහ 8 ශ්‍රේණිය සිසුන්ගේ කියවීම සහ ගණිතය සම්බන්ධ අවම සාධන මට්ටම්වලට ළඟා වූ සිසු ප්‍රතිශතය නිර්ණය කිරීමට අදාළ ව, 2021/2022 වසරේ ක්‍රියාත්මක කළ නියැදි අධ්‍යයනය සහ ගෝලීය සාධන මට්ටම් රාමුව පදනම් කරගනිමින්, ශ්‍රී ලංකාවේ සියලු 3 ශ්‍රේණිය සිසුන් සඳහා සිදු කළ ඇගයීම 2024 වසරේ නිමා කරන ලදි. එසේ ම, පාසල් සිසුන්ට උදේ ආහාර වේල ලබා දීම ප්‍රාථමික ශ්‍රේණිවල සියලු සිසුන් ආවරණය වන ලෙස පුළුල් කිරීම, සුරක්ෂා රක්ෂණාවරණය ඇතුළු වැඩසටහන්, සිසුවියන් සඳහා සනීපාරක්ෂක තුවා වවුචර ලබා දීමේ වැඩසටහන සහ සමාජ ආරක්ෂණ ක්‍රම පුළුල් කිරීම යනාදිය, ඉලක්ක 4.1 යටතේ අධ්‍යාපනයට ප්‍රවේශ වීම සහ අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ ශිෂ්‍ය අනුපාතය ඉහළ නැංවීම සඳහා සහය වේ. තව ද, උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවට 2023/24 අධ්‍යයන වසර සඳහා ඇතුළත් වූ සිසු සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂ ව 6%කින් වැඩි වී ඇත. ඒ අනුව, 4.1.2 දර්ශකය යටතේ ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අනුපාතය වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දර්ශක අංක 4.4.1. හි දැක්වෙන, ශ්‍රී ලංකාවේ ළමුන් සහ යෞවනයන්ගේ පරිගණක හා ඩිජිටල් සාක්ෂරතා මට්ටම් ඉහළ යාම ද සාධනීය වන අතර, එය 4. a.1 හි ද සඳහන් පරිදි පාසල්වල මූලික පහසුකම් ඉහළ නැංවීම ඉලක්ක කර ශ්‍රී ලංකාව ක්‍රම ක්‍රමයෙන් ළඟා වීමේ ප්‍රතිඵලයක් විය හැකි ය.

2025 සිට 2030 දක්වා වන කාලය තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමේ ක්‍රියාකාරකම් තීව්‍ර කළ යුතු කාල සීමාවක් බව ගෝලීය මට්ටමෙන්, හඳුන්වා දී ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ පසුගිය වසර 5 තුළ සිදු කළ සිසු සාධන මට්ටම් සම්බන්ධ අධ්‍යයන ඔස්සේ 2025 වසරේ, ගෝලීය ව සංසන්දනය කළ හැකි දත්ත සැකසෙන, අවම සාධන මට්ටම් ඇගයීමේ නියාමක ව්‍යාපෘති 2ක් සිදු කිරීමට සූදානම් ව ඇත. තව ද, සාමාන්‍ය අධ්‍යාපනය තුළ වෘත්තීය ප්‍රවේශය ලබා දීමේ ක්‍රමවේද තවදුරටත් පුළුල් කිරීම ද, තොරතුරු තාක්ෂණ නව්‍යතා ආදිය හඳුන්වාදීම සහ අධ්‍යාපනය සඳහා වෙන් වන ප්‍රතිපාදන හා ප්‍රතිපාදනවල ප්‍රතිශතය ඉහළ නැංවීම යානාදිය ද මඟින් තිරසර සංවර්ධන නිශ්චිත ඉලක්ක රැසක් ආමන්ත්‍රණය කළ හැකි වනු ඇත. ඇතැම් දර්ශක සඳහා ගුණාත්මක දත්ත රැස් කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම, ගෝලීය ව සසන්දනය කළ හැකි තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා සමීක්ෂණ, පරීක්ෂණ සිදු කිරීම, පූර්ව ළමා විය අධ්‍යාපනය සඳහා වූ ආයෝජන වැඩි කිරීම, STEM (විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත) අධ්‍යාපනයේ අංශ සහ වෘත්තීය අධ්‍යාපනය වෙත යොමු වන ගැහැණු දරුවන් සංඛ්‍යාව ද ද්විතියික අධ්‍යාපනය හා තෘතීයික අධ්‍යාපනය වෙත යොමු වන පිරිමි දරුවන් සංඛ්‍යාව ද ඉහළ නැංවීම, ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා රජය විසින් ආයෝජන වැඩි කිරීම යනාදිය ද අත්‍යවශ්‍ය වේ.

යෝජිත ඉලක්ක අගයන් වෙත ගමන් කිරීම සඳහා අධ්‍යාපන පද්ධතිය තුළ මානව සම්පත ප්‍රමාණවත් නොවීම හා විශාල ධාරිතා සංවර්ධනයක අවශ්‍යතාව අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට බාධාවක් ව ඇත. මෙවන් අභියෝග ආමන්ත්‍රණය කිරීම ද, නිවැරදි තොරතුරු අනාවරණය හා දත්ත මත පදනම් ව තීරණය ගැනීම කාර්යක්ෂම කිරීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් අතර මෙන් ම පරිබාහිර රජයේ, රාජ්‍ය නොවන අංශයේ, පෞද්ගලික අංශයේ පාර්ශවරුවන් සහ අදාළ ප්‍රජාවන් සමඟ සහයෝගීතාව වර්ධනය කිරීම යනාදිය තිරසර සංවර්ධන අරමුණුවලට ළඟා වීමේ උපායමාර්ග නිර්මාණය කිරීමට අවශ්‍ය වේ.

ඒ අනුව, ඉහළ ආර්ථික වර්ධනයක් හා තිරසර සංවර්ධනයක් අත් කර ගැනීමේ මූලික උපාය මාර්ගයක් ලෙස අධ්‍යාපනය යොදා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමත් නිර්මාණශීලී සැලසුම් ඔස්සේ එම තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යභාරයක් වේ.

# 06. පරිච්ඡේදය
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2024.12.31 දිනට )

අමාත්‍යාංශයේ ඒකාබද්ධ අංශයට අයත් නිළධාරීන්ට අයත් තොරතුරු

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඌනතා/අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 80 | 72 | 8 |
| තෘතියික | 22 | 10 | 12 |
| ද්විතියික | 789 | 717 | 72 |
| ප්‍රාථමික | 225 | 215 | 10 |
| එකතුව | 1116 | 1014 | 102 |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

ඉහත දක්වා ඇති සියලුම සේවා මට්ටම් සඳහා කාර්ය මණ්ඩලයේ ඌනතා ඇති වීමට පහත පොදු කරුණු හේතු වන බව නිරීක්ෂණය කරමි.

නිලධාරීන් සඳහා ශ්‍රේණිගත උසස්වීම් ලබා දීමේදි අදාල තනතුරු පුරප්පාඩු වීම.

නිලධාරීන් වෙනත් සේවාවන් සඳහා මුදා හැරීම.

ස්ථාන මාරු ලද නිලධාරීන් සඳහා අනුප්‍රාප්තිකයන් නොපැමිණීම.

ද්විතීයන පදනම මත නිලධාරීන් වෙනත් ආයතන වෙත මුදා හැරීම.

විශ්‍රාම ගැනීම.

සේවය අතහැර යෑම.

## 2024.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

### අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා අංශය

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු (-) / අතිරික්ත (+) |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | | | |
| • අධ්‍යාපන අමාත්‍යාංශය | 80 | 72 | (08) |
| • විද්‍යා පීඨ | - | - | - |
| • ජාතික පාසල් | - | - | - |
| • ගුරු විද්‍යාල | - | - | - |
| • ගුරු සංවර්ධන මධ්‍යස්ථාන | - | - | - |
| **තෘතීයික** | | | |
| • අධ්‍යාපන අමාත්‍යාංශය | 148 | 136 | (12) |
| • විද්‍යා පීඨ | 46 | 20 | (26) |
| • ජාතික පාසල් | 343 | 64 | (279) |
| • ගුරු විද්‍යාල | - | - | - |
| • ගුරු සංවර්ධන මධ්‍යස්ථාන | - | - | - |
| **ද්විතියික** | | | |
| • අධ්‍යාපන අමාත්‍යාංශය | 795 | 804 | 09 |
| • විද්‍යා පීඨ | 525 | 312 | (213) |
| • ජාතික පාසල් | 4494 | 4340 | (154) |
| • ගුරු විද්‍යාල | 40 | 40 | - |
| • ගුරු සංවර්ධන මධ්‍යස්ථාන | 336 | 33 | (303) |
| • වෙනිවැල්කොළ විශේෂ අධ්‍යාපන ආයතනය | 02 | - | (02) |
| **ප්‍රාථමික** | | | |
| • අධ්‍යාපන අමාත්‍යාංශය | 250 | 242 | (08) |
| • විද්‍යා පීඨ | 1021 | 808 | (213) |
| • ජාතික පාසල් | 8140 | 6819 | (1321) |
| • ගුරු විද්‍යාල | 96 | 71 | (25) |
| • ගුරු සංවර්ධන මධ්‍යස්ථාන | 112 | 170 | 58 |
| • වෙනිවැල්කොළ විශේෂ අධ්‍යාපන ආයතනය | 11 | 04 | (07) |
| | 16,439 | 13,935 | (2504) |

**2024.12.31 දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්- (අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික පාසල්)**

| 2024.12.31 දිනට | | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ- අධ්‍යාපන අමාත්‍යාංශය | විශේෂ | 8 | 4 | 4 | - |
| | I ශ්‍රේණිය | 44 | 65 | | 21 |
| | II/III ශ්‍රේණිය | 104 | 78 | 26 | - |
| ජ්‍යෙෂ්ඨ - ජාතික පාසල් | විශේෂ | 0 | 0 | 0 | - |
| | I ශ්‍රේණිය | 137 | 67 | 70 | - |
| | II/III ශ්‍රේණිය | 440 | 172 | 268 | - |
| එකතුව | | 733 | 386 | 368 | 21 |

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ මානව සම්පත් පැතිකඩට අදාල නිලධාරීන්ගේ තොරතුරු පහත පරිදි වේ.

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඌනතා/අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | | | |
| තෘතීයික | 16433 | *14823 | 1610 |
| ද්විතීයික | | | |
| ප්‍රාථමික | | | |
| එකතුව | 16433 | 14823 | 1610 |

දැනට පාසලවල රාජකාරි ආවරණය /වැඩ බලන (ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින්) **2494** දෙනාම අයත් වේ .

- **<u>2025 වර්ෂයෙහි අපේක්ෂිත බඳවා ගැනීම්</u>**

- අධ්‍යාපන පරිපාලන සේවයේ **III** ශ්‍රේණිය (විවෘත) - **113** (සීමිත) - **442**
- ශ්‍රී ලංකා ගුරු සේවයේ **3-1** (ආ) ශ්‍රේණියට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් **- 4140**
- සැමට ඉංග්‍රීසි වැඩසටහන යටතේ ඉංග්‍රීසි ගුරුවරු **- 2500**
- ජාතික හා පළාත් පාසල් සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ගුරු සේවයට **- 22000**

**(අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වීමට හෝ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්ව).**

- සේවා ව්‍යවස්ථාව අනුව ගුරු උපදේශකවරුන් **- 2100**
- දෙමළ මාධ්‍ය වතු පාසල් සඳහා ගුරු සහායකවරුන් - **2935** (අංක **2389** හා **2024-06-14** දිනැති *ගැසට්* නිවේදනය) .
- විශ්‍රාම යාම, ඉල්ලා අස්වීම හා සේවය අතහැර යාම හේතුවෙන් හා විදුහල්පති සේවය සඳහා උසස් වීම් ලැබීම් හේතුවෙන් ඇති වූ ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු සේවයට බඳවා ගැනීම.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් ද ඇතුළු ව, සමස්ත අධ්‍යාපන පද්ධතියේම නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය තුළින් අධ්‍යාපන සංවර්ධන හා කළමනාකරණ කටයුතු නිසි ආකාරයට පවත්වා ගෙන යාම සඳහා කටයුතු කර ඇත. මේ යටතේ සෘජු ම පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට දායක වන ගුරුභවතුන් ඇතුළු ව, අධ්‍යාපන පද්ධතියේ සෑම මට්ටමකම සිටින නිලධාරීන් සඳහා අදාළ පුහුණුවක් ලබා දීමට කටයුතු යොදා ඇත. අධ්‍යාපනයට අදාළ සියලු ම සේවාවන්ගේ සේවා ව්‍යවස්ථාවන්ට අදාළ වූ පුහුණු සහ රාජකාරී කටයුතු සඳහා අදාළ වන නිපුණතාවන් ද අත්පත් කර ගැනීමේ අරමුණින් නිලධාරීන් පුහුණු කිරීම සඳහා කටයුතු යොදා ඇත.

### 6.3.1 දේශීය වැඩසටහන්

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟා කර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| **විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය** | | | | | |
| වැඩිහිටි අධ්‍යාපනය, ජීවිත කාලය පුරා අධ්‍යාපනය පිළිබඳ නොවිධිමත් අධ්‍යාපන නව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම (වැඩසටහන් 03) | පළාත් 9හි නව නිලධාරීන් 127 | දින 08 | 0.769 | -- | • වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී කළ යුතු කාර්යයභාරය සහ උපායමාර්ග<br>• වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම |
| ප්‍රජා අධ්‍යාපනය පිළිබඳ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන නිලධාරීන් හා පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම (වැඩසටහන් 08) | ශිෂ්‍යයින්, ගුරුවරුන්, දෙමව්පියන් 2388 | දින 15 | 1.967 | -- | • අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම<br>• ළමයින් පාසලට ප්‍රවේශවීමේ ප්‍රතිශතය ඉහළ නැංවීම හා ළමයින් පාසලෙහි රඳවා තබා ගැනීමේ ප්‍රතිශතය ඉහළ නැංවීම සඳහා පාසල කමිටු සහ පාසල් ප්‍රජාව සක්‍රියව දායක වීම |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟා කර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| **විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය** | | | | | |
| ශ්‍රවණාබාධිත දරුවන්ගේ ශ්‍රවණ ප්‍රස්ථාර කියවීම සහ දෘශ්‍යාබාධිත දරුවන්ගේ දෘශ්‍ය පරීක්ෂණ වාර්තා කියවීම පිළිබඳ ගුරු පුහුණු වැඩසටහන පැවැත්වීම (වැඩසටහන් 03) | විශේෂ අධ්‍යාපන ගුරුවරුන් 215 | දින 06 | 0.377 | -- | • ශ්‍රවණාබාධිත දරුවන්ගේ ශ්‍රවණ ප්‍රස්ථාර කියවීම සහ දෘශ්‍යාබාධිත දරුවන්ගේ දෘශ්‍ය පරීක්ෂණ වාර්තා කියවීම පිළිබඳ පුහුණු කිරීම.<br>• පාසල් මට්ටමින් දෘශ්‍යාබාධිත සහ දෘශ්‍යාබාධිත ළමයින් හඳුනා ගැනීම |
| විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා බ්‍රේල් සහ සංඥා භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීම (වැඩසටහන් 03) | විශේෂ අධ්‍යාපන ගුරුවරුන් 215 | දින 09 | 1.128 | -- | • බ්‍රේල් සහ සංඥා භාෂාව පිළිබඳ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් පුහුණු කිරීම<br>• දෘශ්‍යාබාධිත සහ ශ්‍රවණාබාධිත සිසුන්ගේ ඉගෙනුම් අවස්ථා ඉහළ යාම |
| ශ්‍රවණ සහ දෘශ්‍යාබාධිත සිසුන්ට ඉගැන්වීම පිළිබඳ ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන (වැඩසටහන් 01) | විශේෂ අධ්‍යාපන ගුරුවරුන් 28 | දින 02) | 0.055 | -- | • දෘෂ්‍යාබාධිත සිසුන් සඳහා බ්‍රේල් මාධ්‍ය යොදා ගැනීම, ඇබකසය යොදා ගැනීම, සුදු සැරයටි භාවිතය, චලතාවය සහ දිශානතිය පුහුණු කිරීම<br>• ශ්‍රවණාබාධිත සිසුන් හඳුනා ගැනීම, සංඥා භාෂාව යොදා ගැනීම, ශ්‍රවණ උපකරණ භාවිතය |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟා කර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය | | | | | |
| විශේෂ අවශ්‍යතා සහිත ළමයින් වර්ගීකරණය අනුව හඳුනාගැනීම සඳහා මොඩියුලය පුහුණු කිරීම | බස්නාහිර සහ වයඹ පළාත්වල කලාපයීය තක්සේරු කමිටු සාමාජිකයින් 126 | දින 04 | 0.536 | -- | • විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ වර්ගීකරණ හඳුන්වා දීම (වර්ග 14)<br>• එම වර්ගවල දක්නට ලැබෙන ලක්ෂණ අනුව සිසුන් හඳුනා ගෙන තහවුරු කිරීම<br>• එම සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය උදෙසා ගුරුවරයා මැදිහත්විය යුතු ආකාරය |
| අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ගුරු පුහුණු වැඩසටහන (විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා ගුරු මාර්ගෝපදේශ පොත I කොටස සහ II කොටස පුහුණු කිරීම (GEMP) | වයඹ, දකුණ, ඌව සහ මධ්‍යම පළාත්වල විශේෂ අධ්‍යාපන ගුරුවරුන් 324 | දින 13 | -- | 1.996 | • බුද්ධිමය ඌනතා සහ උග්‍ර ආබාධිත ළමයින් සඳහා ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේද |
| අධ්‍යාපන කලාපවල විශේෂ අධ්‍යාපන වෘත්තිකයන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ පුහුණු වැඩසටහන (GEMP) | පළාත් සහ කලාප මට්ටමේ නිලධාරීන් 89 | දින 02 | -- | 0.258 | • අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අධ්‍යාපන වෘත්තිකයන්ගේ කාර්යභාරය |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ලබා කර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
